# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 නොවැම්බර් මස 17 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2017.11.22 දින නිකුත් කරන ලදී)**

# සුරැකුම්පත් විනිමය

**වෙළෙඳපොළ ආයතන, සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයන්, වෙළෙඳපොළ අතරමැදියන් නියාමනය කිරීම සඳහා ද; වෙළෙඳපොළ විෂමාචාර සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ද; කොටස් වෙළෙඳපොළවල් විසින් මුහුණපාන අභියෝග සම්බන්ධව ඵලදායී සහ කාර්යක්ෂම ආකාරයෙන් ක්‍රියා කිරීම සඳහා ද; ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම සඳහා සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 275.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 70.00 යි.**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

පටුන


| *වගන්තිය* | *ශීර්ෂය* | *පිටුව* |
|---|---|---|
| 1. | ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය | 1 |
| 2. | පනත අදාළ වීම | 1 |
| 3. | අර්ථ නිරූපණය | 2 |
| | I වන කොටස | |
| | **කොමිෂන් සභාව පිහිටුවීම** | |
| 4. | මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ | 18 |
| | 1 වන පරිච්ඡේදය | |
| | **ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව** | |
| 5. | ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම | 18 |
| 6. | කොමිෂන් සභාවේ සංයුතිය | 19 |
| 7. | පත් කළ හෝ නම් කළ සාමාජිකයන්ගේ ධුර කාලය | 20 |
| 8. | ඉල්ලා අස්වීම සහ කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටීමේ නුසුදුසුකම සහ ඉවත් කිරීම | 20 |
| 9. | සාමාජිකයන්ගේ පාරිශ්‍රමික | 22 |
| 10. | කොමිෂන් සභාවේ රැස්වීම් | 22 |
| 11. | කොමිෂන් සභාවේ සභාපතිවරයා | 23 |
| 12. | සාමාජිකයකු විසින් යම් සම්බන්ධතාවයක් හෙළිදරව් කිරීම | 23 |
| 13. | පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් ක්‍රියා, කටයුතු හෝ තීරණ බලරහිත නොවිය යුතු ය | 23 |
| 14. | කොමිෂන් සභාවේ මුද්‍රාව | 23 |
| | 2 වන පරිච්ඡේදය | |
| | **කොමිෂන් සභාවේ බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන්** | |
| 15. | කොමිෂන් සභාවේ ප්‍රධාන කර්තව්‍යයන්, බලතල සහ කාර්යයන් | 24 |
| 16. | කොමිෂන් සභාවේ අතිරේක බලතල | 27 |
| 17. | නීති කෘත්‍යයන් හි දී කොමිෂන් සභාව නියෝජනය කිරීම | 28 |

| වගන්තිය | ශීර්ෂය | පිටුව |
|---|---|---|
| | 3 වන පරිච්ඡේදය | |
| | **කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය** | |
| 18. | අධ්‍යක්ෂ ජනරාල්වරයා | 28 |
| 19. | කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය | 30 |
| 20. | කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සංස්ථාවල නිලධරයන් පත්කිරීම | 32 |
| 21. | කොමිෂන් සභාවේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය | 32 |
| 22. | අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව | 32 |
| | II වන කොටස | |
| | **වෙළෙඳපොළවල් සහ වෙළෙඳපොළ ආයතන** | |
| 23. | මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ | 32 |
| | 1 වන පරිච්ඡේදය | |
| | **විනිමය ස්ථාන** | |
| 24. | බලපත්‍ර නොලත් විනිමය ස්ථානයක් පිහිටුවීමට එරෙහි තහනම | 33 |
| 25. | විනිමය ස්ථානයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉල්ලුම් කිරීම | 33 |
| 26. | විනිමය ස්ථානයේ කාර්යය | 36 |
| 27. | විනිමය ස්ථානයක බලපත්‍රය අවලංගු කිරීම | 38 |
| 28. | විනිමය ස්ථානයක බලපත්‍රය අවලංගු කිරීමේ බලපෑම | 42 |
| 29. | හදිසි අවස්ථාවක දී විනිමය ස්ථානය වසා දැමීම | 42 |
| 30. | බලපත්‍රලත් විනිමය ස්ථානයක් ලැයිස්තුගත කිරීම සඳහා වන නියමයන් | 44 |
| | 2 වන පරිච්ඡේදය | |
| | **නිෂ්කාශනාගාරය** | |
| 31. | අර්ථ නිරූපණය | 45 |
| 32. | බලපත්‍ර නොලත් නිෂ්කාශනාගාරයක් පිහිටුවීමට එරෙහි තහනම | 47 |

| වගන්තිය | ශීර්ෂය | පිටුව |
|---|---|---|
| 33. | නිෂ්කාශනාගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම | 48 |
| 34. | නිෂ්කාශනාගාරයක වගකීම් | 50 |
| 35. | නිෂ්කාශනාගාරයක බලපත්‍රය අවලංගු කිරීම | 52 |
| 36. | නිෂ්කාශනාගාරයක බලපත්‍රය අවලංගු කිරීමේ බලපෑම | 55 |
| 37. | පැහැර හැරීමේ රීති | 56 |
| 38. | නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ නීති කෘත්‍ය ප්‍රමුඛ වීම | 56 |
| 39. | පැහැර හැරීමේ නීති කෘත්‍යවලට අදාළ අතිරේක විධිවිධාන | 57 |
| 40. | පැහැර හැරීමේ නීති කෘත්‍ය සම්පූර්ණ කිරීම පිළිබඳ වාර්තා කිරීමට වන වගකීම | 57 |
| 41. | පැහැර හැරීමේ නීති කෘත්‍ය සම්පූර්ණ කිරීමෙන් පසුව ගෙවිය යුතු ශුද්ධ මුදල් ප්‍රමාණය | 58 |
| 42. | යම් ගනුදෙනුවක් තුළින් හටගන්නා යම් මුදල් ප්‍රමාණ අයකර ගැනීම සඳහා අදාළ ධුර දරන්නාගේ අයිතිවාසිකම | 59 |
| 43. | ප්‍රධානයා වශයෙන් නිෂ්කාශන සාමාජිකයා යම් ගනුදෙනුවලට පාර්ශ්වයක් වීම | 61 |
| 44. | නිෂ්කාශනාගාරයකට සපයන ලද වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇප | 61 |
| 45. | සමපාර්ශ්වීය වෙළෙඳපොළ ඇපය වෙළෙඳපොළ ගාස්තුවකට අදාළ කිරීම | 61 |
| 46. | පියවීමේදී සුරැකුම්පත් මාරුකිරීම | 61 |
| 47. | සුරැකුම්පත් මිලට ගැනීම සහ විකිණීම | 62 |
| 48. | අපරාධමය සහ සිවිල් වගකීම් සඳහා විත්තිවාචක | 63 |

3 වන පරිච්ඡේදය

**මධ්‍යම තැන්පතුගාරය**

| | | |
|---|---|---|
| 49. | බලපත්‍ර නොලත් මධ්‍යම තැන්පතුගාරයක් ක්‍රියාත්මක කිරීමට එරෙහි තහනම | 64 |
| 50. | මධ්‍යම තැන්පතුගාරයක් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම් කිරීම | 64 |
| 51. | මධ්‍යම තැන්පතුගාරයේ කාර්යයන් | 66 |
| 52. | මධ්‍යම තැන්පතුගාරයක බලපත්‍රය අවලංගු කිරීම | 67 |

| වගන්තිය | ශීර්ෂය | පිටුව |
|---|---|---|
| 53. | මධ්‍යම තැන්පතුගාරයේ බලපත්‍රය අවලංගු කිරීමේ බලපෑම | 70 |
| 54. | සුරැකුම්පත් ගිණුම | 70 |
| 55. | මධ්‍යම තැන්පතුගාරයේ ගොනු කරන ලද පොත් සටහන් සුරැකුම්පත් | 71 |
| 56. | තැන්පතුකරුගේ ගිණුමේ සටහන් ඇතුළත් කිරීම | 71 |
| 57. | මධ්‍යම තැන්පතුගාරය විසින් භාරයක් ලෙස දරනු ලබන සුරැකුම්පත්වල බලපෑම | 71 |
| 58. | වලංගු කිරීම | 72 |


4 වන පරිච්ඡේදය

**සාමාන්‍ය විධිවිධාන**

| | | |
|---|---|---|
| 59. | වෙළෙඳපොළ ආයතනයක රීති | 72 |
| 60. | වෙළෙඳපොළ ආයතනයක රීති අනුගමනය කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට අණ කිරීමට අධිකරණයට ඇති බලය | 74 |
| 61. | වෙළෙඳපොළ ආයතනයක සැලකිය යුතු කොටස්කරුවන් පාලනය | 74 |
| 62. | තහනමක් පැනවීමට මූලික නියෝගයක් කිරීමේ කොමිෂන් සභාවේ බලය | 75 |
| 63. | වෙළෙඳපොළ ආයතනයකට අධ්‍යක්ෂවරුන් පත්කිරීම | 77 |
| 64. | වෙළෙඳපොළ ආයතනයක වැදගත් තොරතුරු වෙනස් කිරීම | 79 |
| 65. | විනිමය ස්ථානයක හෝ නිෂ්කාශනාගාරයක අයිතීන් | 80 |
| 66. | අපරාධමය සහ සිවිල් වගකීම් සඳහා විත්තිවාචක | 80 |
| 67. | කොමිෂන් සභාවට සහාය සැපයීම | 81 |
| 68. | වාර්ෂික වාර්තා | 81 |
| 69. | වෙළෙඳපොළ ආයතනයක විගණකවරයකුගේ කාර්යයන් | 82 |
| 70. | ආවර්ත වාර්තා ඉදිරිපත් කිරීමට ඇති වගකීම | 84 |
| 71. | වාර්ෂික ගාස්තු ගෙවීම | 84 |
| 72. | තත්ත්වයකින් පෙනී සිටීම සඳහා වන තහනම | 84 |

| *වගන්තිය* | *ශීර්ෂය* | *පිටුව* |
|---|---|---|
| 73. | සිය තීරණය සමාලෝචනය කිරීමට කොමිෂන් සභාව සතු බලය | 84 |
| | III වන කොටස | |
| | **සුරැකුම්පත් නිකුත් කිරීම** | |
| 74. | මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ | 85 |
| | 1 වන පරිච්ඡේදය | |
| | **සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම** | |
| 75. | සුරැකුම්පත් අර්පණය කිරීම | 85 |
| 76. | සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා කොමිෂන් සභාවේ අනුමතය | 86 |
| 77. | සංස්ථා ප්‍රකාශය හෝ සමාන ලේඛනය | 87 |
| 78. | කොමිෂන් සභාව විසින් තහනම් නියෝග නිකුත් කිරීම | 87 |
| 79. | සුරැකුම්පත් මිල දී ගැනීම, විකිණීම හෝ පැවරීම | 90 |
| 80. | ලේඛන ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමට කොමිෂන් සභාවට ඇති බලය | 90 |
| 81. | ලැයිස්තුගත පොදු සමාගම්වලට විධාන නිකුත් කිරීමට කොමිෂන් සභාව සතු බලය | 93 |
| 82. | කොමිෂන් සභාවට අසත්‍ය තොරතුරු ඉදිරිපත් නොකර සිටීමේ වගකීම | 93 |
| 83. | වෙළෙඳපොළ ආයතනවලට වැරදි ප්‍රකාශයන් නොකිරීමේ වගකීම | 94 |
| 84. | අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධරයා පත්කිරීම | 94 |
| 85. | ලැයිස්තුගත පොදු සමාගමක විගණකවරයාගේ කාර්යයන් | 94 |
| 86. | අනිසි බලපෑම සඳහා වන තහනම | 96 |
| | 2 වන පරිච්ඡේදය | |
| | **වෙළෙඳපොළ අතරමැදියන්** | |
| 87. | වෙළෙඳපොළ අතරමැදියකු සේ පෙනී සිටීමට එරෙහි තහනම | 97 |
| 88. | කොමිෂන් සභාවේ බලපත්‍රයක් ලබා ගැනීමට වන නියමය | 97 |
| 89. | වෙළෙඳපොළ අතරමැදියකු ලෙස බලපත්‍රයක් ලබාගැනීම සඳහා හෝ බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම | 97 |
| 90. | බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම | 98 |
| 91. | අවම මූල්‍ය නියමයන් | 101 |

| *වගන්තිය* | *ශීර්ෂය* | *පිටුව* |
|---|---|---|
| 92. | කොමිෂන් සභාවේ ලියාපදිංචි වීම සඳහා වන නියමය | 102 |
| 93. | ලියාපදිංචි වීම හෝ ලියාපදිංචිය අලුත් කරවා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රය | 102 |
| 94. | ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු | 103 |
| 95. | කොන්දේසි හෝ සීමා කිරීම් වෙනස් කිරීමේ බලය | 105 |
| 96. | බලපත්‍රයේ හෝ ලියාපදිංචියේ කාල සීමාව | 105 |
| 97. | කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අසත්‍ය සහ නොමඟ යවන සුලු ප්‍රකාශ | 106 |
| 98. | කොමිෂන් සභාවට දැනුම් දීමේ වගකීම | 106 |
| 99. | නියෝජිතයකු වශයෙන් පෙනී සිටීම සඳහා වන තහනම | 107 |
| 100. | බලපත්‍රය හෝ ලියාපදිංචිය අවලංගු කිරීම හෝ අත්හිටුවීම | 107 |
| 101. | වෙළෙඳපොළ අතරමැදියන් විසින් සුරැකුම්පත් වෙළෙඳාමේ යෙදීම | 108 |
| 102. | ගණුදෙනුකරුවාගේ කැමැත්ත නොමැතිව සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම | 109 |
| 103. | වෙළෙඳපොළ අතරමැදියකුගේ විගණකවරයාගේ වගකීම | 109 |


3 වන පරිච්ඡේදය

**ගණුදෙනුකරුවන්ගේ වත්කම්වල ආරක්ෂාව**


| | | |
|---|---|---|
| 104. | අර්ථ නිරූපණය | 111 |
| 105. | ගනුදෙනුකරුවාගේ වත්කම්වල ආරක්ෂාව | 111 |
| 106. | ව්‍යාපාර චර්යාව පිළිබඳ රීති | 112 |
| 107. | අසාධාරණ නිර්දේශ කිරීම් සඳහා වගකීම | 113 |
| 108. | සුරැකුම්පත්වල ඇතැම් සම්බන්ධතා අනාවරණය කිරීම | 114 |
| 109. | අභ්‍යන්තර කාර්යය පටිපාටි සහ ක්‍රියාවලි | 116 |
| 110. | වෙළෙඳපොළ අතරමැදියන් සහ ලියාපදිංචි තැනැත්තන්ගේ නාමලේඛනය | 116 |

| *වගන්තිය* | *ශීර්ෂය* | *පිටුව* |
|---|---|---|
| | IV වන කොටස | |
| | **ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම** | |
| 111. | මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ | 118 |
| | 1 වන පරිච්ඡේදය | |
| | **පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු පිහිටුවීම** | |
| 112. | පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු පිහිටුවීම | 118 |
| 113. | වෙළෙඳපොළ මෙහෙයවන්නකු ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය | 118 |
| 114. | ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම | 118 |
| | 2 වන පරිච්ඡේදය | |
| | **පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකුගේ කාර්යභාරය** | |
| 115. | පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකුගේ කර්තව්‍යය සහ කාර්යය | 119 |
| 116. | පරිශ්‍රයක් මත වෙළෙඳාම | 119 |
| 117. | කොමිෂන් සභාව විසින් සැකසිය යුතු රීති | 120 |
| 118. | ලියාපදිංචිය ඉවත්කර ගැනීම | 120 |
| 119. | පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකුගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම | 121 |
| 120. | වෙළෙඳපොළ මෙහෙයවන්නකු සඳහා ලැබෙන නිදහස් කිරීම | 122 |
| 121. | පනතේ විධිවිධාන ලැයිස්තුගත නොකළ සුරැකුම්පත්වලට අදාළ වීම | 122 |
| | V වන කොටස | |
| | **වෙළෙඳපොළ විෂමාචාරය** | |
| 122. | මේ කොටසේ පරමාර්ථ සහ අරමුණ | 122 |
| 123. | මේ කොටස අදාළ වීම | 123 |
| | 1 වන පරිච්ඡේදය | |
| | **තහනම් ක්‍රියා** | |
| 124. | ව්‍යාජ වෙළෙඳාම් කිරීමේ හා වෙළෙඳපොළ මිල ගණන් කෘත්‍රිම ලෙස උස් පහත් කිරීමේ ගනුදෙනු | 123 |

| *වගන්තිය* | *ශීර්ෂය* | *පිටුව* |
|---|---|---|
| 125. | කොටස් වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම් | 125 |
| 126. | ව්‍යාජ හෝ නොමඟ යවන සුලු ප්‍රකාශ | 126 |
| 127. | සුරැකුම්පත් පිළිබඳ ව කටයුතු කිරීමට වංචනික ලෙස පුද්ගලයන් පෙලඹවීම | 126 |
| 128. | අයුතු ලෙස හැසිරවීම සහ රැවටීමේ උපක්‍රම භාවිත කිරීම | 127 |
| 129. | ඇතැම් ගනුදෙනු පත්‍රි නිදහස් කිරීම | 127 |
| 130. | වැරදි සඳහා දණ්ඩනය | 128 |

2 වන පරිච්ඡේදය

**අභ්‍යන්තර තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම**

| | | |
|---|---|---|
| 131. | තොරතුරු | 128 |
| 132. | සාමාන්‍යයෙන් ලබා ගැනීමට හැකි තොරතුරු | 129 |
| 133. | සුරැකුම්පත්වල මිල හෝ වටිනාකමට වැදගත් වෙනසක් සිදුවීම | 129 |
| 134. | "සිදු කරවා ගැනීම" පිළිබඳ යොමුව | 129 |
| 135. | අභ්‍යන්තර තොරතුරු සන්තකයේ තබා සිටිනා යම් තැනැත්තකු විසින් සිදු කිරීමට තහනම් ක්‍රියා | 129 |
| 136. | සමාගමක නිලධරයකුගේ සන්තකයේ ඇති තොරතුරු | 131 |
| 137. | හවුල්කරුවකුගේ හෝ හවුල් ව්‍යාපාරයක සේවා නියුක්තයකුගේ සන්තකයේ ඇති තොරතුරු | 133 |
| 138. | ප්‍රතිරක්ෂණයට සහ උපප්‍රතිරක්ෂණයට අදාළ ව්‍යතිරේක | 135 |
| 139. | වැඩපිළිවෙළක යෝජනා ක්‍රමවලට අදාළව වූ ව්‍යතිරේක | 136 |
| 140. | ස්වකීය අරමුණු පිළිබඳ දැනුමක් ඇති සමාගමක් සඳහා වූ ව්‍යතිරේකය | 136 |
| 141. | පුද්ගලයකුට අදාළ ව ව්‍යතිරේකය | 136 |
| 142. | වෙළෙඳපොළ අතරමැදියන් විසින් ස්වේච්ඡාවෙන් කරන ලද ගනුදෙනුව | 137 |
| 143. | සාමූහික ආයෝජන යෝජනා ක්‍රමවලට අදාළව ව්‍යතිරේකය | 138 |
| 144. | තොරතුරු විත්තිවාචකයේ සාමාන්‍යය | 139 |
| 145. | පැමිණිල්ල මගින් විත්තිවාචක වැරදි බව ඔප්පු කිරීම අවශ්‍ය නොවන බව | 140 |
| 146. | අධිකරණවල අධිකරණ බලය | 140 |

| *වගන්තිය* | *ශීර්ෂය* | *පිටුව* |
|---|---|---|
| 147. | පැමිණිල්ල මෙහෙය විය හැක්කේ කවුරුන් විසින් ද | 140 |
| 148. | යම් වගන්ති උල්ලංඝනය කිරීම වෙනුවෙන් වන සිවිල් වගකීම | 141 |
| 149. | කොමිෂන් සභාව මඟින් සිවිල් නඩු කටයුතු පැවරීම | 141 |
| | VI වන කොටස | |
| | **මුදල්** | |
| 150. | මේ කොටසේ පරමාර්ථ සහ අරමුණු | 144 |
| | 1 වන පරිච්ඡේදය | |
| | **කොමිෂන් සභාවේ අරමුදල්** | |
| 151. | සෙස් බද්දක් පැනවීම | 144 |
| 152. | සෙස් බදු අරමුදල | 145 |
| 153. | කොමිෂන් සභාවේ අරමුදල | 145 |
| 154. | මුදල් වර්ෂය | 146 |
| 155. | ගිණුම් විගණනය කිරීම | 146 |
| | 2 වන පරිච්ඡේදය | |
| | **ආයෝජකයින්ට වන්දි ප්‍රදානය සඳහා වන අරමුදල** | |
| 156. | වන්දි අරමුදල | 147 |
| 157. | වන්දි කමිටුව පත් කිරීම | 147 |
| 158. | වන්දි සඳහා ඉල්ලීම් කිරීම | 148 |
| 159. | වන්දි ගෙවීම | 148 |
| | VII වන කොටස | |
| | **සාමාන්‍ය** | |
| 160. | මේ කොටසේ පරමාර්ථ සහ අරමුණු | 148 |
| | 1 වන පරිච්ඡේදය | |
| | **ආයතනික මූලික ව්‍යුහයට අදාළ විධිවිධාන** | |
| 161. | ලේඛන ඉදිරිපත් කිරීම සහ තොරතුරු අනාවරණය කිරීම | 149 |
| 162. | විමසුම් සහ විමර්ශන | 150 |

| වගන්තිය | ශීර්ෂය | පිටුව |
|---|---|---|
| 163. | ක්‍රියා විරහිත කිරීමේ නියෝග නිකුත් කිරීම | 152 |
| 164. | පැමිණිලි කළමනාකරණ කමිටුව විසින් විමසුම් පැවැත්වීම | 153 |
| 165. | අතිරේක සේවා සපයන්නන් | 155 |
| 166. | ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම | 155 |
| 167. | තොරතුරු බෙදා ගැනීම සහ සහයෝගීතාවය | 155 |
| 168. | ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීම | 157 |
| 169. | අමාත්‍යවරයා වෙත තොරතුරු සපයා දීම | 158 |
| 170. | පනත යටතේ සිදු කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව | 158 |
| | 2 වන පරිච්ඡේදය | |
| | **බලාත්මක කිරීමේ යාන්ත්‍රණය සම්බන්ධයෙන් වූ විධිවිධාන** | |
| 171. | වැරදි | 159 |
| 172. | අපරාධ නඩු පැවරීම සඳහා අදාළ විය හැකි පනත් | 162 |
| 173. | වැරදි සමථයකට පත් කිරීම | 162 |
| 174. | පරිපාලනමය දණ්ඩන නියම කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලය | 162 |
| 175. | ආයෝජකයින්ගේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලය | 166 |
| 176. | යම් නියෝග සඳහා අධිකරණයට අයදුම් කිරීමට කොමිෂන් සභාව සතු බලය | 167 |
| 177. | ආයෝජකයන් වෙනුවෙන් හානි පියවීම සඳහා කොමිෂන් සභාව සතු බලතල | 172 |
| 178. | තොරතුරු පළකිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතල | 173 |
| 179. | අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග | 173 |
| 180. | කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති | 174 |
| 181. | ව්‍යුත්පන්න, සුදු හෝ ඔට්ටු ඇල්ලීමේ ගිවිසුම් නොවන බව | 177 |
| 182. | ඉවත් කිරීම්, ඉතිරි කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන | 177 |
| 183. | අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව | 180 |

## සුරැකුම්පත් විනිමය

එල්. ඩී.—ඕ. 8/2017

**වෙළෙඳපොළ ආයතන, සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයන්, වෙළෙඳපොළ අතරමැදියන් නියාමනය කිරීම සඳහා ද; වෙළෙඳපොළ විෂමාචාර සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ද; කොටස් වෙළෙඳපොළවල් විසින් මුහුණපාන අභියෝග සම්බන්ධව ඵලදායී සහ කාර්යක්ෂම ආකාරයෙන් ක්‍රියා කිරීම සඳහා ද; ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම සඳහා සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

**1.** (1) මේ පනත 2017 අංක        දරන සුරැකුම්පත් විනිමය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය හැර මේ පනතේ විධිවිධාන ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක දී හෝ දිනවල සිට ක්‍රියාත්මක විය යුතු ය. මේ පනතේ විවිධ කොටස් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් විවිධ දින නියම කරනු ලැබිය හැකි ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාවට අනුව කථානායකවරයා විසින් සහතිකයක් ස්වකීය අත්සන සටහන් කළ දිනයේ දී (2) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය.

(4) මේ පනත අර්ථ නිරූපණය කිරීමේ දී, එක් එක් කොටස් ආරම්භයේ දී සඳහන් කර ඇති අරමුණු සහ කාර්යයන් සාකල්‍යවාදී ආකාරයෙන් සලකා බලනු ලැබිය යුතු අතර, එම කොටස සඳහා පමණක් සීමා කරනු නොලැබිය යුතු ය.

පනත අදාළ වීම.

**2.** මේ පනත යටතේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් හැර, මේ පනත ලැයිස්තුගත පොදු සමාගම් හා ලැයිස්තුගත විදේශීය ආස්ථිත්වයන් සඳහා අදාළ වේ.

2—PL 010435—475 (2017/11)

**3.** මේ පනතේ පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස - අර්ථ නිරූපණය.

"ප්‍රතීත ආයෝජකයා" යන්නට -

(i) (අ) ප්‍රාථමික නේවාසික දේපළ හැර ස්වකීය ශුද්ධ පුද්ගලික වත්කම් ප්‍රමාණයේ වටිනාකම රුපියල් මිලියන දෙසියයක් හෝ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ ඉහළ වටිනාකමක් ඉක්මවනු ලබන්නේ ද, ඒ පුද්ගලයා ; හෝ

(ආ) යම් පුද්ගලයකුගේ ඉහතින් ම වූ වර්ෂ තුනක් තුළ දී සාමාන්‍ය වාර්ෂික ආදායම රුපියල් මිලියන තිහකට නොඅඩු හෝ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ යම් ඉහළ වටිනාකමකට නොඅඩු වන්නේ ද, ඒ පුද්ගලයා; සහ

(ඇ) ආයෝජන අවදානම භාරගැනීමට ඇති සිය පළපුරුද්ද, හැකියාව සහ විදග්ධතාවය පිළිබඳව ප්‍රකාශනයක් කරනු ලබන යම් පුද්ගලයකු;

(ii) (අ) ආස්ථිත්‍යයේ මෑතකාලීන විගණනය කරන ලද ශේෂ පත්‍රයක් මගින්; හෝ

(ආ) විගණනය කරන ලද ශේෂපත්‍රයක් නොමැති අවස්ථාවක දී, ඉහතින් ම වූ මාස දොළහක කාලසීමාවක් ඇතුළත වූ යම් දිනයක් වන්නා වූ ශේෂ පත්‍ර දිනයේ දී ආස්ථිත්වයේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ ප්‍රතිරූපයක් ලබාදෙමින් ආස්ථිත්වය විසින් සහතික කරනු ලබන ආස්ථිත්‍යයේ වඩාත් මෑතකාලීන ශේෂ පත්‍රයක් මගින්,

වටිනාකම තීරණය කරනු ලබන රුපියල් මිලියන එක් දහසක් ඉක්මවන ශුද්ධ වත්කම් සහිත සංස්ථාපිත ආස්ථිත්‍යයක්;

(iii) එම තත්ත්වයෙන් ක්‍රියා කිරීමේ දී කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් භාරයක භාරකරුවකු; හෝ

(iv) රීති මගින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් ආයතනයක්,

ඇතුළත් වේ;

"මධ්‍යම තැන්පතුගාරය" යන්නට -

(අ) තැන්පතුකරුවන් වෙනුවෙන් තැනැත්තකුගේ නමින් හෝ ඔහුගේ නාමිකයකුගේ නමින් සියලු සුරැකුම්පත් තැන්පත් කර භාරයේ දරනු ලබන හෝ ලියාපදිංචි කර ඇති සහ එම සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු, කොටස්පත භෞතිකව භාරදීමෙන් තොරව ගිණුම්වල සටහන් තැබීම මගින් වලංගුතාවයක් ලැබෙන්නා වූ එම සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු කටයුතු; හෝ

(ආ) කොටස්පත භෞතිකව භාරදීමෙන් තොරව, සුරැකුම්පත් ගනුදෙනු හෝ සුරැකුම්පත් ගනුදෙනු කිරීම් නිරාකරණය කිරීම සඳහා අවසර දෙනු ලබන්නා වූ හෝ පහසුකම් සලසනු ලබන්නා වූ; සහ

(ඇ) ඒ සඳහා ආනුෂංගික වන්නා වූ වෙනත් පහසුකම් සහ සේවා සපයනු ලබන්නා වූ,

යම් විනිමය ස්ථානයක් මත සුරැකුම්පත් මධ්‍යම පාලනයක් සඳහා වූ පද්ධතියක් පිහිටුවීම සඳහා සහ පාලනය කිරීම සඳහා මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් බලපත්‍ර ප්‍රදානය කර ඇති යම් සංස්ථාවක් ඇතුළත් වේ;

නමුත්, එයට -

(i) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද යම් මධ්‍යම තැන්පතුගාරයක්; හෝ

(ii) නිදහස් කරන ලද සුරැකුම්පත් සඳහා මධ්‍යම තැන්පතුගාරයක් සපයනු ලබන හෝ සපයනු ලබන ලෙස පෙනී සිටින යම් තැනැත්තකු,

ඇතුළත් නොවිය යුතු ය;

"නිෂ්කාශනය කිරීමේ පහසුකම" යන්නෙන්, සුරැකුම් පත් ගනුදෙනු නිෂ්කාශනය කිරීම සඳහා හෝ බේරුම්කරණය සඳහා වූ යම් පහසුකමක් අදහස් වේ;

යම් නිෂ්කාශන පහසුකමක් සම්බන්ධයෙන් වන විට "නිෂ්කාශනය හෝ බේරුම්කරණය" යන්නට, පහත සඳහන් ආකාරයට ගනුදෙනු සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් සපයනු ලබන යම් වැඩපිළිවෙළක්, ක්‍රියාවලියක්, යාන්ත්‍රණයක් හෝ සේවාවක් ඇතුළත් වේ:- එනම්-

(අ) ගනුදෙනු තහවුරු කිරීමේ අරමුණින් යුතුව, එකී තැනැත්තා විසින් එම ගනුදෙනුවලට අදාළ විස්තර තහවුරු කිරීම සිදුකරන ගනුදෙනු සම්බන්ධයෙන්;

(ආ) නවීකරණය තුළින් හෝ අන්‍යාකාරයකින් එම ගනුදෙනුවලට අදාළ පාර්ශ්ව ආදේශ කරනු ලබන්නා වූ, පාර්ශ්වවල බැරකම් සඳහා වූ එම තැනැත්තාගේ බැරකම් සම්බන්ධයෙන්;

(ඇ) එම ගණනය කිරීම් සඳහා බහුපාර්ශ්වික තුලිත වැඩපිළිවෙළවල් අන්තර්ගත වන්නා වූ හෝ එසේ අන්තර්ගත නොවන්නා වූ ගනුදෙනු ගණනය කරනු ලබනුයේ යම් පාර්ශ්වවල බැඳීම් යටතේ ද, එම පාර්ශ්වවල බැඳීම් සම්බන්ධයෙන්; හෝ

(ඈ) පාර්ශ්ව අතර අරමුදල් පැවරීම හෝ සුරැකුම්පත් සඳහා හිමිකම් පැවරීම භාරදීම සඳහා වූ බැඳීම් ඇතුළුව එම ගනුදෙනු යටතේ ස්වකීය වගකීම් සපුරාලනු ලබන එම ගනුදෙනුවල පාර්ශ්ව සම්බන්ධයෙන්,

එහෙත් ඒ සඳහා-

(i) ඉහත සඳහන් ගනුදෙනුවල යම් පාර්ශ්වයක පසුපෙළ මෙහෙයුම් කටයුතු;

(ii) එම සේවාවන් සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු නිරාකරණය කිරීම සඳහා පරම වශයෙන් ආනුෂංගික වන අවස්ථාවක දී, ගනුදෙනුකරුගේ සුරැකුම්පත්වල සන්තකය

හෝ පාලනය දරනු ලබන්නා වූ (මෙහි මින්මතු "ගනුදෙනුකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් තැනැත්තකු සමඟ යම් ගිවිසුමක් යටතේ එම තැනැත්තා විසින් සපයනු ලබන සේවාවන්; හෝ

(iii) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් සේවාවන්,

ඇතුළත් නොවේ;

"නිෂ්කාශනාගාරය" යන්නෙන්, මේ පනත යටතේ බලපත්‍රලාභී ස්වකීය ක්‍රියාකාරකම් හෝ අරමුණුවල නිෂ්කාශන පහසුකම් සැපයීම ඇතුළත් වන්නා වූ යම් සංස්ථාවක් අදහස් වේ;

"නිෂ්කාශන සාමාජිකයා" යන්නෙන්, නිශ්කාශනාගාරයක රීති යටතේ තමා වෙනුවෙන් හෝ වෙනත් අය වෙනුවෙන් නිෂ්කාශනය සහ බේරුම්කරණය කිරීම සඳහා නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන සාමාජිකයකු වශයෙන් ඇතුළත් කර ගෙන ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"සාමූහික ආයෝජන යෝජනා ක්‍රමය" යන්නට -

(අ) ඕනෑම නාමයකින් ආයෝජකයන් විසින් සිදු කරනු ලබන දායකත්වයන් හෝ ගෙවීම් යෝජනා ක්‍රමය හෝ වැඩපිළිවෙළේ කාර්ය සඳහා පරම වශයෙන් රැස් කරනු ලබන සහ උපයෝජනය කරනු ලබන;

(ආ) එම යෝජනා ක්‍රමයෙන් හෝ වැඩපිළිවෙළින් ලාභ, ආදායම්, නිෂ්පාදන හෝ චංචල හෝ නිශ්චල දේපළ ලබා ගැනීමේ අරමුණින් ආයෝජකයන් විසින් එම යෝජනා ක්‍රමය හෝ වැඩපිළිවෙළ සඳහා කරනු ලබන දායකත්වයන් හෝ ගෙවීම් සඳහා;

(ඇ) පාර්ශ්ව විසින් යම් යෝජනා ක්‍රමයක ආයෝජන ප්‍රමාණය මත වූ ස්වකීය සහභාගීත්ව සම්බන්ධතාවයට ප්‍රමාණුකූලව හෝ ඔවුන් විසින් තීරණය කරනු ලබන වෙනත් පදනමක් මත ආයෝජනයේ අවදානම සහ ප්‍රතිලාභය ආයෝජකයන් විසින් බෙදාගැනීම සඳහා;

(ඈ) අනන්‍යකරණීය හෝ එසේ නොවන්නා වූ යම් යෝජනා ක්‍රමයක හෝ වැඩපිළිවෙළක කොටසක් වන්නා වූ යම් දේපළක්, දායකත්වයක් හෝ ආයෝජනයක්, ආයෝජකයන් වෙනුවෙන් කළමනාකරණය කිරීම සඳහා; සහ

(ඉ) යෝජනා ක්‍රමයේ හෝ වැඩපිළිවෙළේ කළමනාකරණය සහ මෙහෙයවීම සම්බන්ධයෙන් එදිනෙදා පාලනයක් නොමැති ආයෝජකයන් සඳහා,

සමාගමක් විසින් මහජනතාව වෙත යම් යෝජනා ක්‍රමයක් හෝ වැඩපිළිවෙළක් සකස් කර පිරිනමනු ලබනුයේ යම් කොන්දේසි යටතේ ද එම කොන්දේසි සපුරාලනු ලබන යම් යෝජනා ක්‍රමයක් හෝ වැඩපිළිවෙළක් ඇතුළත් වේ;

නමුත් එයට-

(i) තනිපුද්ගල ආයෝජන කළමනාකරණ වැඩපිළිවෙළවල්වලට;

(ii) ව්‍යවසායකත්ව ආරම්භක යෝජනා ක්‍රමවලට;

(iii) ශුද්ධ තැන්පතු පාදක වූ යෝජනා ක්‍රමවලට;

(iv) ව්‍යාපාර ආකාරයෙන් ක්‍රියාත්මක නොවන යෝජනා ක්‍රමවලට;

(v) ඍණපත්‍ර, බැඳුම්කර සහ ණය ප්‍රාග්ධනය වැනි ණය නිකුතුවලට;

(vi) සේවා නියුක්තිකයන්ගේ කොටස් යෝජනා ක්‍රමවලට;

(vii) සාමාජිකත්ව වැඩපිළිවෙළවල්වලට;

(viii) විශේෂිත කාලයක් සඳහා දේපළ මිලට ගැනීමේ යෝජනා ක්‍රමවලට;

(ix) නිෂ්කාශන සේවා සැපයීම්වලට;

(x) රක්ෂණ ගිවිසුම්වලට;

(xi) තනි පුද්ගල විශ්‍රාම ගිණුම්වලට;

(xii) වෘත්තීය සහ පුද්ගල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවලට;

(xiii) ගොඩනැගීම් සමිති, කාර්මික සහ අර්ථසාධක සමිති සහ ලියාපදිංචි මිත්‍රත්ව සමිති ඇතුළු ඇතැම් සංස්ථාවලට; හෝ

(xiv) ඉහත කී යෝජනා ක්‍රම හා සමාන වූ වැඩපිළිවෙළවලට,

අදාළ වන අරමුදල් සංචිත ඇතුළත් නොවේ.

"පාලකවරයා" යන්නෙන් -

(අ) කොටස් දරන්නාගේ ඡන්දහිමි කොටස් සඳහා සම්බන්ධකර ඇති අනුප්‍රමාණයෙන් සියයට විස්සකට නොඅඩු ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීම පාලනය කිරීම සඳහා හිමිකම් ඇත්තා වූ; හෝ

(ආ) එම දරන්නාගේ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයක් තෝරාගැනීම හෝ තෝරාපත් කිරීමට කටයුතු සැලැස්වීම සඳහා බලය ඇත්තා වූ; හෝ

(ඇ) වෙළෙඳපොළ ආයතනයක හෝ වෙළෙඳපොළ අතරමැදියකුගේ ව්‍යාපාර හෝ පරිපාලනය සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා හෝ තීරණ ගැනීමට කටයුතු සැලැස්වීම සඳහා බලය ඇත්තා

වූ සහ එම තීරණ බලාත්මක කිරීම සඳහා හෝ බලාත්මක කිරීමට කටයුතු සැලැස්වීම සඳහා බලය ඇත්තා වූ,

යම් තැනැත්තකු අදහස් වේ;

''අධිකරණය'' යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වගන්තිය යටතේ පළාතක් සඳහා පිහිටුවනු ලැබුවා වූ ද, 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මගින් එය පිහිටුවනු ලැබූ පළාත ඇතුළත සිවිල් අධිකරණ බලය පැවරුණා වූ ද මහාධිකරණයක් හෝ යම් පළාතක් සඳහා එවැනි සිවිල් අධිකරණ බලයක් පැවරුණු මහාධිකරණයක් පිහිටුවනු ලැබ නොමැති විටක බස්නාහිර පළාත සඳහා පිහිටුවනු ලැබූ මහාධිකරණයක් අදහස් වේ;

"අපලේඛනගත කිරීම" යන්නෙන්, හුවමාරුවක නිල ලැයිස්තුවෙන් ලැයිස්තුගත සුරැකුම්පත් ඉවත් කිරීම අදහස් වේ;

"තැන්පතුගාර සහභාගිවන්නා" යන්නෙන්, මධ්‍යම තැන්පතුගාරයක පහසුකම් සඳහා ප්‍රවේශ විය හැකි සහ මධ්‍යම තැන්පතුගාරයක රීති යටතේ තැන්පතුගාර සහභාගිවන්නකු වශයෙන් පිළිගෙන ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"ව්‍යුත්පන්න" යන්නට, ගැළපීම් ගිවිසුමක්, අනාගතයන්, වරණ සහ යෝග්‍ය විනිමය ස්ථාන වෙළෙඳ විකල්ප හෝ කොමිෂන් සභාව විසින් ව්‍යුත්පන්න ලෙස නිශ්චිතව දක්වනු ලබන යම් ගිවිසුම් පන්තියක වෙනත් යම් ගිවිසුමක් සංයුක්ත වන අනාගතයන් පිළිබඳ ගිවිසුම් ඇතුළත්වන නමුත් යම් ව්‍යුත්පන්න විනිමය ස්ථානයක අනාගතයන් වෙළෙඳපොළේ වෙළෙඳාම් කරනු නොලබන ව්‍යුත්පන්න ගිවිසුමක් ලෙස නිශ්චිතව දක්වනු ලබන යම් ගිවිසුමක් ඉන් බැහැර කරනු ලැබිය යුතු ය;

"ව්‍යුත්පන්න විනිමය ස්ථානය" යන්නෙන්, මේ පනත යටතේ ව්‍යුත්පන්න විනිමය ස්ථානයක් වශයෙන් බලපත්‍රලාභී යම් සංස්ථාවක් අදහස් වේ;

"ඉලෙක්ට්‍රොනික වාර්තාව" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් නිර්මාණය කරන ලද, ගබඩා කරන ලද, උත්පාදනය කරන ලද, ලැබුණු හෝ සන්නිවේදනය කරනු ලබන ලිඛිත ලේඛනයක් හෝ යම් වාර්තාවක් අදහස් වේ;

"විනිමය ස්ථානය" යන්නෙන්, මේ පනත යටතේ බලපත්‍රලාභී ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් හෝ ව්‍යුත්පන්න විනිමය ස්ථානයක් අදහස් වේ;

"නිකුත්කරන්නා" යන්නෙන්, මහජන අර්පණයක ආකාරයෙන් විකිණීම සඳහා සුරැකුම්පත් නිකුත් කරනු ලබන හෝ නිකුත් කිරීමට යෝජනා කරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

"ලැයිස්තුගත විදේශීය ආස්ථිත්‍ය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර නොමැත්තා වූ ද, ද්විතීය ලැයිස්තුගත කිරීමක් මගින් යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක නිල ලැයිස්තුවකට ඇතුළත් කර ගනු ලැබූ යම් ආස්ථිත්‍යයක් අදහස් වේ;

"ලැයිස්තුගත පොදු සමාගම" යන්නෙන්, ස්වකීය සුරැකුම්පත් යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇත්තා වූ යම් සමාගමක් අදහස් වන අතර එයට ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ස්වකීය සුරැකුම්පත් ලැයිස්තුගත කර ඇත්තා වූ රාජ්‍ය සංස්ථාවක් ද ඇතුළත් වේ;

"ලැයිස්තුගත සුරැකුම්පත්" යන්නෙන්, යම් විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇත්තා වූ සුරැකුම්පත් අදහස් වේ;

"කළමනාකරු" යන්න, ස්වකීය යම් සංස්ථාවක් සම්බන්ධයෙන් වනවිට ව්‍යාපාරයෙන් යම් කොටසක් කළමනාකරණ කිරීම සඳහා සංස්ථාව විසින් පත්කර ඇති තැනැත්තකු අදහස් වන අතර එයට (ප්‍රධාන විධායක නිලධරයා

හැර), යම් අධ්‍යක්ෂවරයකුගේ හෝ සංස්ථාවේ ප්‍රධාන විධායකනිලධරයාගේ ආසන්නතම අධිකාරී බලය යටතේ කළමනාකරණ කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලබන හෝ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යෑම හෝ වෙනත් වාර්තා සම්බන්ධයෙන් වගකිවයුතු සංස්ථාවේ යම් සේවා නියුක්තයකු ඇතුළත් වේ;

"ආන්තික ගිණුම" යන්නෙන්, ලැයිස්තුගත සුරැකුම්පත් මිල දී ගැනීම සඳහා සමපාර්ශ්වීය ඇප වශයෙන් පොදුවේ සේවා කරනු ලබන, යම් ආයෝජකයකු සඳහා ලැයිස්තුගත සුරැකුම්පත් මිල දී ගැනීම හෝ විකිණීම සඳහා ඉඩ ලබා දෙන්නා වූ යම් ගිණුමක් අදහස් වේ;

"වෙළෙඳපොළ ආයතනය" යන්නෙන්, මේ පනතේ II වන කොටස යටතේ බලපත්‍රලාභී යම් විනිමය ස්ථානයක්, නිෂ්කාශනාගාරයක් හෝ මධ්‍යම තැන්පතුගාරයක් අදහස් වේ;

"වෙළෙඳපොළ අතරමැදියා" යන්නට ණය ප්‍රමාණන නියෝජිත ආයතනයක්, ව්‍යුත්පන්න තැරැව්කරුවකු, මූල්‍ය සැලසුම්කරුවකු, ආයෝජන විශ්ලේෂකයකු, ආයෝජන කළමනාකරුවකු, කළමනාකාර සමාගමක්, ආන්තික සැපයුම්කරුවකු, වෙළෙඳපොළ සැකසුම් කරුවකු, සුරැකුම්පත් නිකුතු නියෝජිතයකු ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු, හෝ ඒ සමාන ක්‍රියාකාරකම් භාරගනු ලබන යම් තැනැත්තකු වශයෙන් 89 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී වූ ද කොමිෂන් සභාව විසින් එකී බලපත්‍රය නිකුත් කිරීමේ කාර්ය සඳහා රීති මගින් විස්තර කර ඇත්තා වූ ද යම් තැනැත්තකු ඇතුළත් වේ. මේ අර්ථ නිරූපණයේ කාර්ය සඳහා -

(අ) "ණය ප්‍රමාණන නියෝජිත ආයතනය" යන්නෙන්, යම් නිකුත්කරන්නකුගේ හෝ නිශ්චිත සුරැකුම්පත් නිකුතුවක බැරකම් වටිනාකම තක්සේරු කිරීමේ සහ ඇගයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් සංස්ථාවක් අදහස් වේ;

(ආ) "ව්‍යුත්පන්න තැරැව්කරුවා" යන්නෙන්, කොමිස් මුදල් පෙරළා ලබා ගනිමින් ආයෝජකයන් වෙනුවෙන් ව්‍යුත්පන්න මිල දී ගැනීමේ හෝ

විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

(ඇ) "මූල්‍ය සැලසුම්කරුවා" යන්නෙන්, යම් ගාස්තුවක් හෝ කොමිස් මුදලක් සඳහා සුරැකුම්පත්වල යම් ආයෝජන සැලසුම් ඇතුළුව වෙනත් තැනැත්තකුගේ මූල්‍ය අවස්ථා විශ්ලේෂණය කිරීමේ ව්‍යාපාරයේ සහ එම වෙනත් තැනැත්තාගේ මූල්‍ය අවශ්‍යතා සහ අරමුණු සපුරාලීම සඳහා සැලසුමක් සපයනු ලැබීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

(ඈ) "ආයෝජන විශ්ලේෂකයා" යන්නට, කොමිෂන් සභාව විසින් රීතිවල නියම කරනු ලබන පුවත්පත් හිමිකරුවන් හැර සුරැකුම්පත්වලට අදාළව වෙනත් තැනැත්තන්ට උපදෙස් ලබා දීම හෝ ව්‍යාපාරයේ කොටසක් වශයෙන් සුරැකුම්පත්වලට අදාළව විශ්ලේෂණයන් හෝ වාර්තා නිකුත් කරනු ලබන, ප්‍රකාශයට පත් කරනු ලබන යම් තැනැත්තකු ඇතුළත් වේ;

(ඉ) "ආයෝජන කළමනාකරුවා" යන්නට, යම් ගාස්තුවක් හෝ කොමිස් මුදලක් සඳහා ආයෝජකයකු වෙනුවෙන් සුරැකුම්පත් කළමනාකරණය කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු ඇතුළත් වන නමුත් එයට යම් සමූහ ආයෝජන යෝජනා ක්‍රමයක් කළමනාකරණය කිරීම ඇතුළත් නොවේ;

(ඊ) "කළමනාකාර සමාගම" යන්නෙන් -

සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක යම් ඒකකයක් සඳහා -

(i) දායකවීමට හෝ මිල දී ගැනීම සඳහා නිකුත් කිරීමට හෝ අර්පණය කිරීමට යෝජනා කර ඇති; හෝ

(ii) දායකවීම හෝ මිල දී ගැනීම සිදු කිරීමට ආරාධනාවක් ලැබී ඇත්තා වූ,

යම් සමාගමක් අදහස් වේ;

(උ) "ආන්තික සැපයුම්කරුවා" යන්නෙන්, යම් විනිමය ස්ථානයක වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත් මිල දී ගැනීම සඳහා ආයෝජකයන්ට ණය මුදල් සැපයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

(ඌ) "වෙළෙඳපොළ සැකසුම්කරුවා" යන්නෙන්, යම් විනිමය ස්ථානයක් විසින් නිශ්චිතව දක්වනු ලබන නියම කිරීම් මත පදනම් වූ නිශ්චිත සුරැකුම්පතක් සම්බන්ධයෙන් ස්වයංක්‍රීය වෙළෙඳ පද්ධතියක පවත්වාගෙන යනු ලබන ඇණවුම් පොතක ලංසු සහ අර්පණ මිල ගණන් ඇතුළත් කරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

(එ) "සුරැකුම්පත් නිකුතු නියෝජිතයා" යන්නෙන්, ප්‍රාථමික වෙළෙඳපොළේ ආයෝජනය කිරීම සඳහා පහසුකම් සැපයීමේ දී නිකුත්කරන්නා සහ ආයෝජකයන් අතර අතරමැදියකු වශයෙන් ක්‍රියාකරනු ලබන යම් තැනැත්තකු අදහස් වන අතර මහජනතාවට එම සුරැකුම්පත් අර්පණය කිරීමේ විශේෂිත අභිප්‍රායෙන් සමාගමේ එම නිකුතුව මිල දී ගන්නා තැනැත්තකු ඇතුළත් වේ;

(ඒ) "ව්‍යාපාර වස්තු තැරැව්කරුවා" යන්නෙන්, කොමිස් මුදලක් පෙරළා ලබා ගනිමින් ආයෝජකයන් වෙනුවෙන් ව්‍යුත්පන්න හැර, සුරැකුම්පත් මිල දී ගැනීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

"වෙළෙඳපොළ මෙහෙයුම්කරු" යන්නෙන්, IV වන කොටසේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට, ලැයිස්තුගත

නොකරන ලද සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම, නිෂ්කාශනය කිරීම හෝ බේරුම්කරණය කිරීම සඳහා පහසුකම් සලස්වනු ලබන වෙළෙඳපොළ යටිතල පහසුකම් පිහිටුවනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"අර්පණය" හෝ "අර්පණය කිරීම" යන්නට, සංස්ථා ප්‍රකාශයේ හෝ අන්‍යාකාරයකින් වටිනාකමක් සඳහා යම් සුරැකුම්පත් හෝ එම සුරැකුම්පත්වල යම් සම්බන්ධතාවක් විකිණීම හෝ බැහැර කිරීම සඳහා කරනු ලබන යම් උත්සාහයක් ඇතුළත් වන නමුත් එයට එකී සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රාරක්ෂක ගිවිසුමකට ඇතුළත්වන ලෙස යම් තැනැත්තකු වෙත කරනු ලබන සද්භාවී ආරාධනාවක් ඇතුළත් නොවේ;

"පෞද්ගලික නිකුතුව" යන්නෙන්, තථ්‍ය කොටස් හිමියන් සඳහා ඔවුන්ගේ කොටස් ප්‍රමාණයට සමානුපාතිකව ඉදිරිපත් කරනු ලබන හෝ දායකත්වය සඳහා පොදු මහජනතාවට සාමාන්‍ය අර්පණයක් මගින් අර්පණය කරනු ලබන කොටස් නිකුත් කිරීමක් හැර, හඳුනාගනු ලැබූ ආයෝජකයකු හෝ ආයෝජකයන් කාණ්ඩයක් වෙත සුරැකුම්පත් නිකුත් කිරීම අදහස් වේ;

"එක්ව ක්‍රියාකිරීමට සම්මුතියකට එළැඹී ක්‍රියාකරනු ලබන තැනැත්තන්" යන්නෙන්, යම් විධිමත් හෝ අවිධිමත් ආකාරයේ ගිවිසුමක් හෝ අවබෝධතාවක් අනුව, සමාගමක හෝ වෙනත් යම් සමාගමක කොටස්වල යම් සම්බන්ධතාවක් තමන් විසින් අත්කර ගැනීම හරහා සහයෝගීව කටයුතු කරනු ලබන හෝ සමාගමක් සඳහා වූ අර්පණයක සාර්ථක ප්‍රතිඵලය ව්‍යාර්ථ කරනු ලබන තැනැත්තන් අදහස් වේ;

මේ අර්ථ නිරූපණයේ පොදු අදාළ වීමට අගති විරහිතව, කොමිෂන් සභාව විසින් සෑහීමට පත්වන පරිදි පටහැනිව යම් දෙයක් තහවුරු වී ඇත්නම් මිස, පහත දැක්වෙන තැනැත්තන් එක්ව ක්‍රියා කිරීමට සම්මුතියකට එළැඹී ක්‍රියාකරනු ලබන තැනැත්තන් වශයෙන් අදහස් කරනු ලැබිය යුතු ය. එනම් -

(අ) සියල්ලම එකිනෙක සමඟ ආශ්‍රිත සමාගම් වශයෙන් සකස් වී ඇත්තා වූ යම් සමාගමක්, එහි මව් සමාගමක්, ආශ්‍රිත සමාගම් හෝ අනුගාමී ආශ්‍රිත සමාගම් සහ ඒවායේ ආශ්‍රිත සමාගම් සහ ඉහත සඳහන් යම් තැනැත්තකුට ඡන්ද අයිතිය මිල දී ගැනීම සඳහා (සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වල දී බැංකුවක් හැර) මූල්‍ය සහාය සපයනු ලැබූ යම් තැනැත්තෙක්;

(ආ) ස්වකීය ඕනෑම අධ්‍යක්ෂවරයකු සමග සමාගමක්, (ස්වකීය සමීපතම ඥාතීන්, සම්බන්ධිත භාර මෙන්ම ඕනෑම අධ්‍යක්ෂවරයකු, ඔවුන්ගේ සමීපතම ඥාතීන් සහ සම්බන්ධිත භාර විසින් පාලනය කරනු ලබන සමාගම් ද ඇතුළුව);

(ඇ) ස්වකීය විශ්‍රාම වැටුප් අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ කොටස් යෝජනා ක්‍රම සමගින් යම් සමාගමක්;

(ඈ) ආයෝජන සමාගමක් සමඟ අරමුදල් කළමනාකරුවකු, ඒකක භාරය හෝ වෙනත් තැනැත්තකුගේ ආයෝජන කළමනාකරණය කරනු ලබන අරමුදල් කළමනාකරුවකු; සහ

(ඉ) සියල්ලම එකිනෙක සමඟ යම් තැනැත්තකු, තැනැත්තාගේ ළඟම ඥාතීන් සහ ඉන් යම් අයකුගේ සම්බන්ධිත භාරයක්;

"සංස්ථා ප්‍රකාශය" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනතේ ඇති අර්ථය ම තිබිය යුත්තේ ය;

"ප්‍රසිද්ධ නිවේදනය" යන්නෙන් *ගැසට් පත්‍රයේ* අවම වශයෙන් එක් නිකුත් කිරීමක් පළ කිරීම මගින් සහ ශ්‍රී ලංකාව තුළ සංසරණය වන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් වූ එක් දෛනික පුවත්පතක පළකිරීම මගින් මේ පනත යටතේ ලබාදීමට නියමිත යම් කරුණක් පිළිබඳ නිවේදනයක් අදහස් වේ;

"ලියාපදිංචි තැනැත්තා" යන්නෙන්, වෙළෙඳපොළ අතරමැදියකු සඳහා සහ ඔහු වෙනුවෙන් සේවදායකයන් සමඟ ගනුදෙනු කරනු ලබන සහ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කරන ලද යම් තැනැත්තකු අදහස් වේ;

"සම්බන්ධිත සමාගම" යන්නෙන්, යම් සංස්ථාවක පාලිත සමාගමක්, ආශ්‍රිත සමාගමක් හෝ පාලනය කරන අනෙක් සමාගම්වල කොටස් දැරීමට ස්ථාපිත සමාගමක් නැතහොත් පාලනය කරන අනෙක් සමාගම්වල කොටස් දැරීමට ස්ථාපිත සමාගමේ පාලිත සමාගමක් අදහස් වේ;

"අයිතිවාසිකම් නිකුතුව" යන්නෙන්, සමාගමක වර්තමාන කොටස් හිමියන් සඳහා ලැයිස්තුගත පොදු සමාගමක කොටස් නිකුත් කිරීමක් හෝ අනාගත කොටස් නිකුත් කිරීමක් අදහස් වන නමුත් එම නිකුත් කිරීම, ප්‍රතිෂ්ඨාවක් සඳහා සහ එම අර්පණ දිනයේ දී ඔවුන් විසින් දරනු ලබන එම සමාගමේ සුරැකුම්පත් පංතියට ප්‍රාමාණික වශයෙන් විස්තර කරනු ලැබිය යුතු හෝ සඳහන් කරනු ලැබිය යුතු හෝ විය යුතු ය;

"සුරැකුම්පත්" යන්නට, යම් ආණ්ඩුවක් හෝ සංස්ථාවක් විසින් නිකුත් කරන ලද හෝ නිකුත් කිරීමට යෝජිත යම් අයිතිවාසිකමක්, විකල්පයක් හෝ (ඒකක වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ විස්තර කරන ලද්දේ වුව ද) එහි හෝ ඒ පිළිබඳ සම්බන්ධතාවයක් ද ඇතුළුව ඍණපත්‍ර, ව්‍යාපාර වස්තු, කොටස්, අරමුදල්, සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක ඒකක, විශ්වාසය තැබූ අවධාරණය කළ වත්කම් කුමන ස්වභාවයේ වුව ද, අනාගතයන් සහ වරණයන් ඇතුළත් ව්‍යුත්පන්න හෝ නෝට්ටු හෝ කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන වෙනත් යම් මෙවලම් හෝ මෙවලම් පන්ති අදහස් වන අතර කොමිෂන් සභාව විසින් සුරැකුම්පත් නොවන බවට නියම කරනු ලබන වෙනත් යම් මෙවලම් හෝ මෙවලම් පන්ති ඇතුළත් නොවේ;

"සුරැකුම්පත් වෙළෙඳපොළ" යන්නෙන් -

(අ) සුරැකුම්පත් විකිණීම, මිල දී ගැනීම හෝ හුවමාරු කිරීම සඳහා අර්පණයන් නිතිපතා ඉදිරිපත් කරනු ලබන හෝ පිළිගනු ලබන;

(ආ) සුරැකුම්පත් විකිණීම, මිල දී ගැනීම හෝ හුවමාරු කිරීම සිදු කිරීම හෝ ප්‍රතිග්‍රහණය සාමාන්‍යයෙන් සිදුවන්නා වූ ඍජුව හෝ වක්‍රව ප්‍රතිඵල අපේක්ෂා කරනු ලබන හෝ සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලබන යම් අර්පණ හෝ ආරාධනාවන්; හෝ

(ඇ) යම් නිශ්චිත තැනැත්තකු හෝ නිශ්චිත තැනැත්තන් පන්තියක් විසින් සුරැකුම්පත් විකිණීමට, මිල දී ගැනීමට හෝ හුවමාරු කිරීමට යෝජනා කරනු ලබන හෝ එසේ කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කිරීම සඳහා වන මිල ගණන් හෝ ප්‍රතිෂ්ඨාව පිළිබඳ තොරතුරු සාමාන්‍යයෙන් සපයනු ලබන,

යම් වෙළෙඳපොළක් හෝ වෙනත් ස්ථානයක් හෝ පහසුකමක් අදහස් වේ;

"කොටස" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනතේ ඒ සඳහා ලබා දී ඇති අර්ථය හෝ වෙනත් යම් අධිකරණ කලාපයක ස්වකීය නීති යටතේ පිළිගනු ලබන කොටසකට දී ඇති අර්ථය ම තිබිය යුත්තේ ය;

"ව්‍යාපාර වස්තු ණයගැතියා" යන්නෙන්, සුරැකුම්පත් ණයට ගැනීමේ ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තකු අදහස් වේ;

"ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය" යන්නෙන්, මේ පනත යටතේ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් බලපත්‍රලාභී යම් සංස්ථාවක් අදහස් වේ;

"අතිරේක සේවා සපයන්නා" යන්නට, යම් ජීවිතාරක්ෂණ උපදේශකයකු, විගණකවරයකු, සංස්ථා මූල්‍ය උපදේශකයකු, රැකවරණකරුවකු, භාරකරුවකු, ප්‍රතිරක්ෂිතයකු, තක්සේරුකරුවකු හෝ යම්

ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලැයිස්තුගත පොදු සමාගමක් සඳහා වෘත්තීය සේවා සපයනු ලබන කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන යම් තැනැත්තකු ඇතුළත් වේ;

මේ අර්ථ නිරූපණයේ කාර්ය සඳහා -

(අ) "සංස්ථා මූල්‍ය උපදේශක" යන්නට, වෙනත් කරුණු අතර -

(i) මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි අරමුදල් උත්පාදන නියමයන් සමඟ එකඟව ක්‍රියාකරන හෝ ඒ සම්බන්ධයෙන් වූ;

(ii) මේ පනත යටතේ බලපත්‍රලාභී යම් විනිමය ස්ථානය ලැයිස්තුගත කිරීමේ නියමයන්ට එකඟ වන්නා වූ;

(iii) මූල්‍ය මෙවලම් ව්‍යුහගත කරනු ලබන්නා වූ; හෝ

(iv) යම් ලැයිස්තුගත පොදු සමාගමක එකළස් කිරීමේ යෝජනා ක්‍රම, ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනා ක්‍රම හෝ අත්කර ගැනීමේ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් වූ,

ගාස්තුවක් හෝ කොමිස් මුදලක් අය කිරීම මත උපදෙස් සැපයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු අදහස් වේ;

(ආ) "ප්‍රතිරක්ෂිතයා" යන්නෙන්, ලැයිස්තුගත පොදු සමාගමක හෝ ලැයිස්තුගත කිරීම සඳහා ඉල්ලා ඇත්තා වූ යම් සමාගමක සුරැකුම්පත්වල පොදු නිකුතුව සම්බන්ධයෙන්, යම් ගාස්තුවක් හෝ කොමිස් මුදලක් සඳහා එම සමාගමේ මිල දී ගැනීම සඳහා අනුග්‍රහයක් නොලබන සුරැකුම්පත් මිල දී ගැනීම සඳහා සහතික වී ඇත්තා වූ හෝ

අර්පණය සඳහා සම්පූර්ණයෙන් ම අනුග්‍රහයක් දක්වා නොමැති අවස්ථාවක දී එම සුරැකුම්පත් මිල දී ගැනීම සඳහා සමාගම සමඟ එකඟතාවයකට පැමිණීමට කටයුතු කරන යම් තැනැත්තකු අදහස් වේ;

"වෙළෙඳ සහභාගිකයා" යන්නෙන්, යම් විනිමය ස්ථානයක පහසුකම් සඳහා ප්‍රවේශය ඇත්තා වූ ද, යම් විනිමය ස්ථානයක රීති යටතේ වෙළෙඳ සහභාගිකයකු වශයෙන් පිළිගෙන ඇත්තා වූ ද, යම් තැනැත්තකු අදහස් වේ.

## I වන කොටස

## කොමිෂන් සභාව පිහිටුවීම

**4.** මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ විය යුත්තේ- (මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ.)

(අ) සාධාරණ, කාර්යක්ෂම සහ පාරදෘශ්‍ය සුරැකුම්පත් වෙළෙඳ පොළක් ඇති කර පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම;

(ආ) දේශීය සහ විදේශීය යන දෙපාර්ශ්වයේ ආයෝජකයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම;

(ඇ) මේ පනත යටතේ සපයනු ලබන සේවාවන්හි උසස් වෘත්තීයමය ප්‍රමිතීන් පවත්වාගෙන යාම තහවුරු කිරීම; සහ

(ඈ) මූල්‍ය පද්ධතියේ සංස්ථානික අවදානම් අවම කිරීම ය.

## 1 වන පරිච්ඡේදය

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

**5.** (1) (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. (ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම.)

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය මගින් එයට පවරනු ලබන නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, ඒ නාමයෙන් නඩු පැවරීම හෝ පවරනු ලැබීම කළ හැකි ය.

කොමිෂන් සභාවේ සංයුතිය.

**6.** (1) කොමිෂන් සභාව -

(අ) (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන් යනුවෙන් සඳහන් කරනු ලබන") සාමාජිකයන් ලෙස අමාත්‍යවරයා විසින් පත්කළ යුතු කොමිෂන් සභාවේ බහු ශික්ෂණ ස්වභාවය විදහා දක්වනු පිණිස නීතිය, මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව, බැංකු සහ ව්‍යාපාර යන ක්ෂේත්‍රවල විශේෂ දැනුමක් හෝ පෘථුල පළපුරුද්දක් ඇති සහ නිපුණතාවයක් පෙන්නුම් කර ඇති සුරැකුම්පත් වෙළෙඳපොළට අදාළ කාරණා සම්බන්ධයෙන් වෘත්තීය ප්‍රවීණතාවයක් සහ කීර්තියක් දරන පෞද්ගලික අංශයේ තැනැත්තන් හය දෙනෙකුගෙන්;

(ආ) නම් කළ සාමාජිකයන් තුන් දෙනෙකුගෙන්, එනම් -

(i) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කළ භාණ්ඩාගාරයේ අතිරේක ලේකම්වරයකු;

(ii) ශ්‍රී ලංකා මුදල් මණ්ඩලය විසින් නම් කළ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය මහ බැංකු අධිපතිවරයකු; සහ

(iii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාව විසින් නම් කළ විගණකාධිවරයකු වශයෙන් සේවය නොකරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයකු;

(ඇ) නිල බලයෙන් පත් කළ සාමාජිකයකු විය යුතු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පත් කරනු ලැබූ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා,

යන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයන් අතරින් අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස එක් සාමාජිකයකු නම් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තැනැත්තන් පත් කිරීමේ දී හෝ නම් කිරීමේ දී, අමාත්‍යවරයා විසින්-

(අ) ඒ තැනැත්තාගේ අවංකභාවය සහ කීර්තිය; සහ

(ආ) කොමිෂන් සභාවේ අයිතීන් සහ ඒ තැනැත්තාට ඇති හෝ ඒ තැනැත්තා නියෝජනය කරන යම් අයිතියක් අතර යම් විරෝධතාවයක් ඇතිවීමේ සම්භාවිතාවය,

පිළිබඳව සැලකිල්ලට ගත යුතු ය.

**පත් කළ හෝ නම් කළ සාමාජිකයන්ගේ ධුර කාලය.**

7. කොමිෂන් සභාවේ පත් කළ හෝ නම් කළ සෑම සාමාජිකයකු ම මියයාම, නීතිමය ක්‍රියාමාර්ගයක් හේතුවෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ඔහු විසින් කලින් ධුරය හිස් කර ඇත්නම් මිස වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර උපරිම වශයෙන් යම් අනුක්‍රමික වාර දෙකක කාලසීමාවකට යටත්ව නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

**ඉල්ලා අස්වීම සහ කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටීමේ නුසුදුසුකම සහ ඉවත් කිරීම.**

8. (1) කොමිෂන් සභාවේ යම් පත් කළ හෝ නම් කළ සාමාජිකයකුට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර අමාත්‍යවරයා විසින් ලිඛිතව එය භාර ගැනීමෙන් පසුව ඒ ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(2) යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තුවේ, යම් පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයකු හෝ සභිකයකු වේ නම් හෝ මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වේ නම්;

(ආ) කොමිෂන් සභාව යටතේ බලපත්‍රලාභී හෝ ලියාපදිංචි ආස්ථිත්වයක අධ්‍යක්ෂවරයකු, හවුල්කරුවකු හෝ සේවා නියුක්තකයකු වේ නම් හෝ එවැනි තැනැත්තකු බවට පත් වේ නම්;

(ඈ) සිහිවිකල් තැනැත්තකු නම් හෝ සිහිවිකල්භාවයට පත්ව ඇත්නම් ඔහුගේ කාර්යයන් කරගෙන යාමට නොහැකි තත්ත්වයකට පත්ව ඇත්නම්;

(ඇ) නිදහස් කර නොමැති බුන්වත් තැනැත්තකු නම් හෝ බුන්වත්භාවයට පත්ව ඇත්නම්;

(ඉ) ඔහු ස්වකීය කාර්යයන්ට අදාළ බරපතළ අපචාරයන්ට වරදකරුවකු වේ නම්;

(ඊ) සදාචාර විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වන්නා වූ වරදකට වරදකරුවකු කරනු ලැබ ඇත්නම්;

(උ) ඔහුගේ ධූරය අනිසි ලෙස භාවිත කිරීම හේතුවෙන් කොමිෂන් සභාව තුළ ඔහු සිය ධූරයේ තවදුරටත් කටයුතු කිරීම කොමිෂන් සභාවේ යහපතට අනර්ථයක් වේ නම්;

(ඌ) සභාපතිවරයා සම්බන්ධයෙන් වනවිට, අමාත්‍යවරයා විසින් ප්‍රදානය කරන ලද අවසරයක් මත හැර ඔහු අනුක්‍රමික රැස්වීම් තුනක් සඳහා පැමිණ නොමැති නම්;

(එ) මේ පනතේ විධිවිධාන යටතේ ඔහුගේ වගකීම්වලට අනුකූලවීමට අපොහොසත් වී ඇත්නම්; හෝ

(ඒ) මේ වගන්තිය යටතේ ධූරයෙන් කලින් ඉවත් කරනු ලැබ ඇත්නම්,

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙසින් පත් කිරීමට හෝ නම් කිරීමට හෝ සාමාජිකයකු වශයෙන් දිගටම රැඳී සිටීමට නුසුදුස්සකු විය යුතු ය.

(3) නිල බලයෙන් පත් කළ සාමාජිකයකු හැර මියයාම, ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ මෙහි (5) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම හේතුවෙන් පත් කළ හෝ නම් කළ යම් සාමාජිකයකු ධූරය හිස් කරන අවස්ථාවක දී, 6 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු, ඔහු අනුප්‍රාප්ත වන්නා වූ සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඇති කාලසීමාව වෙනුවෙන් ධූරය දැරීම සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(4) සභාපතිවරයා හැර කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට, රෝගී තත්ත්වයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා මාස තුනකට වැඩි කාලයක් ඔහුගේ ධුරයේ කාර්යයන් ඉටුකිරීමට නොහැකි වී ඇත්නම්, අමාත්‍යවරයා විසින් 6 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ කාලසීමාව තුළ ඔහු වෙනුවට ක්‍රියාකිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාවෙන් කලින් ලබා ගත් අවසරයක් නොමැතිව කොමිෂන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට තමා සහභාගී වී නොමැති කොමිෂන් සභාවේ පත්කළ හෝ නම් කළ සාමාජිකයකු ඔහුගේ ධුරය හිස් කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(6) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසා, නිල බලයෙන් පත් වන සාමාජිකයා හැර වෙන යම් සාමාජිකයකු (2) වන උපවගන්තිය යටතේ දක්වා ඇති නුසුදුසුකමකට ලක්ව ඇත්නම්, ඉවත් කරනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**9.** කොමිෂන් සභාවේ සාමාජිකයන්ට, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ රැස්වීම්.

**10.** (1) කොමිෂන් සභාවේ සභාපතිවරයා පැමිණ සිටීනම්, කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීමේ මුලසුන දැරීමට සාමාජිකයන් අතුරින් එක් අයකු තෝරා පත් කර ගත යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ ක්‍රියාපටිපාටිය නියාමනය කරනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී සියලු ප්‍රශ්න සඳහා වන තීරණ පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. සමාන ඡන්ද ප්‍රමාණයක් ලැබී ඇති අවස්ථාවක දී මුලසුනේ සිටින සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

කොමිෂන් සභාවේ සභාපතිවරයා.

**11.** (1) කොමිෂන් සභාවේ සභාපතිවරයාට, රෝගීවීමක් හේතුවෙන් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් තාවකාලිකව ඔහුගේ ධුරයේ කාර්යයන් ඉටු කිරීමට නොහැකිව ඇත්නම්, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට කොමිෂන් සභාවේ වෙනත් සාමාජිකයකු නම් කළ යුතු ය.

(2) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඕනෑම අවස්ථාවක දී ඉල්ලා අස්විය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය කොමිෂන් සභාවේ ඔහුගේ සාමාජිකත්ව කාලසීමාව විය යුතු ය.

සාමාජිකයකු විසින් යම් සම්බන්ධතාවයක් හෙළිදරව් කිරීම.

**12.** කොමිෂන් සභාව විසින් යම් කාරණයක් පිළිබඳව ගනු ලබන යම් තීරණයක් සම්බන්ධයෙන් යම් සාමාජිකයකු කෙළින් ම හෝ වක්‍රාකාරයෙන් යම් උනන්දුවක් දක්වන්නේ ද ඒ සාමාජිකයා විසින් කොමිෂන් සභාවේ රැස්වීමේ දී ඒ තීරණය ගනු ලබන අවස්ථාවේ දී ඒ උනන්දුවේ ස්වභාවය හෙළිදරව් කළ යුතු ය. ඒ හෙළිදරව්ව කොමිෂන් සභාවේ රැස්වීමේ වාර්තාවේ සටහන් කරනු ලැබිය යුතු අතර ඒ කාරණය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ යම් සලකා බැලීමක දී හෝ තීරණයක් ගැනීමේ දී ඒ සාමාජිකයා එකී සලකා බැලීමට හෝ තීරණය ගැනීමට සහභාගි නොවිය යුතු අතර ඒ සලකා බැලීම හෝ තීරණය ගැනීම සිදු කරන අතරතුර දී ඒ රැස්වීමෙන් ඉවත් විය යුතු ය.

පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් ක්‍රියා, කටයුතු හෝ තීරණ බලරහිත නොවිය යුතු ය.

**13.** කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීම පිළිබඳ දෝෂයක් තිබීම හේතුවෙන් ම පමණක් කිසිදු ක්‍රියාවක්, කටයුත්තක් හෝ තීරණයක් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ මුද්‍රාව.

**14.** (1) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව භාරයේ තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු සහ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපිට දී හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා පැමිණ නොමැති අවස්ථාවක දී, කොමිෂන් සභාවේ යම් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අත්සන් නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටින බවට සාක්ෂියක් වශයෙන් එම සාමාජිකයන් දෙදෙනා විසින් එකී සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කරනු ලැබිය යුතු ය.

2 වන පරිච්ඡේදය

**කොමිෂන් සභාවේ බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන්**

කොමිෂන් සභාවේ ප්‍රධාන කර්තව්‍යයන්, බලතල සහ කාර්යයන්.

**15.** කොමිෂන් සභාව විසින් සිය පරමාර්ථ ඉටුකර ගැනීමේ කාර්යය සඳහා පහත දැක්වෙන බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් සියල්ල හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කරනු ලැබිය හැකි ය:-

(අ) සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීමට සහ සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තීන් සහ වැඩසටහන් ඵලදායීව ක්‍රියාවට නැංවීම සඳහා සහාය වීමට;

(ආ) ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළෙඳපොළවල් සම්බන්ධයෙන් පර්යේෂණ සහ පුහුණු කිරීම් ඇතුළුව ශ්‍රී ලංකාව තුළ සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම දිරිමත් කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට;

(ඇ) වෙළෙඳපොළ ආයතන, වෙළෙඳපොළ අතරමැදියන්, ලියාපදිංචි තැනැත්තන්, නිෂ්කාශන සාමාජිකයන්, වෙළෙඳ පොළ සහභාගිවන්නන්, තැන්පතුගාර සහභාගිවන්නන්, නිකුත්කරන්නන්, ආයෝජකයන් හෝ කලින් කලට පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නන් ඇතුළුව යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට සාමාන්‍ය හෝ විශේෂිත නියෝග ලබාදීමට;

(ඈ) වෙළෙඳපොළ ආයතනවල, වෙළෙඳපොළ අතරමැදියන්ගේ හෝ ලැයිස්තුගත පොදු සමාගම්වල අතිරේක සේවා

සැපයුම්කරුවන්ට කලින් කලට සාමාන්‍ය හෝ විශේෂිත නියෝග ලබා දීමට;

(ඉ) වෙළෙඳපොළ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට සංස්ථාවකට බලපත්‍රයක් ප්‍රදානය කිරීමට සහ එහි නිසි පැවැත්ම සහතික කිරීමට;

(ඊ) වෙළෙඳපොළ අතරමැදියකු ලෙස ක්‍රියාත්මක වීමට යම් තැනැත්තකුට බලපත්‍රයක් ප්‍රදානය කිරීමට සහ එහි පැවැත්ම සහතික කිරීමට;

(උ) වෙළෙඳපොළ අතරමැදියකු වෙනුවෙන් සුරැකුම්පත් විකිණීමට හෝ මිල දී ගැනීමට සේවාදායකයන්ට උපදෙස් ලබා දෙන්නා වූ තැනැත්තෙක් ලියාපදිංචි කිරීමට සහ ඔවුන්ගේ කාර්ය ඉටු කිරීමේ දී ඔවුන් ක්‍රියා කරනු ලබන ආකාරය නියාමනය කිරීමට;

(ඌ) කලින් කලට ලැයිස්තුගත පොදු සමාගම්වලට හෝ ලැයිස්තුගත විදේශීය ආස්ථිත්වයන්ට සාමාන්‍ය හෝ විශේෂිත නියෝග නිකුත් කිරීමට;

(එ) උපාර්ජකයකුට, අර්පණදායියකු හෝ අර්පණදායියකු හෝ අර්පණලාභියකු හා එක්ව ක්‍රියාකිරීමට සම්මුතියකට එළැඹී ක්‍රියාකරනු ලබන තැනැත්තන්ට හෝ ලැයිස්තුගත පොදු සමාගමක් අත්කර ගැනීමට හෝ ඒකාබද්ධවීමකට අදාළ වන්නා වූ ඉලක්ක සමාගමකට සාමාන්‍ය හෝ විශේෂිත නියෝග නිකුත් කිරීමට;

(ඒ) මේ පනත, නියෝග හෝ රීතිවල ආසන්න කඩවීම් වැළැක්වීමට සහ කඩවීම් මැඩපැවැත්වීමට යම් තැනැත්තකුට විශේෂිත නියෝග නිකුත් කිරීමට;

(ඔ) විනිමය ස්ථානයක දී සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ වෙළෙඳාම් කිරීම නියාමනය කිරීමට;

(ඕ) සුරැකුම්පත් නිකුත් කිරීම නියාමනය කිරීමට;

(ක) යම් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම තහනම් කිරීමට හෝ අත්හිටුවීමට හෝ ලැයිස්තුගත කළ සුරැකුම්පත්

අපලේඛනගත කිරීමට හෝ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම අත්හිටුවීමට හෝ ආයෝජකයන් ආරක්ෂා කිරීමට සාධාරණ සහ විධිමත් සුරැකුම්පත් වෙළෙඳපොළක් සහතික කිරීමට හෝ සුරැකුම්පත් වෙළෙඳපොළේ විශ්වාසනීයත්වය සහතික කිරීමට කොමිෂන් සභාව අවශ්‍ය යැයි තීරණය කරන පරිදි යම් පියවර ගැනීමට;

(ග) කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන යම් නිලධරයන් බඳවා ගැනීමට සහ එම නිලධරයන් විසින් කොමිෂන් සභාවේ අරමුණු සහ කර්තව්‍යයන් ක්‍රියාවට නැගීමේ අරමුණු උදෙසා එකී නිලධරයන්ගේ වේතන සහ පඩි හෝ අනිකුත් පාරිතෝෂික සහ යහපත වෙනුවෙන් කරන ක්‍රියා තීරණය කිරීමට;

(ච) යම් නිශ්චල හෝ චංචල දේපළක් කවරාකාරයෙන් අත්කර ගැනීමට සහ බද්දට ගැනීම හෝ කුලියට දීමට, උගස් කිරීමට, ඔඩපනය කිරීමට, විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට;

(ජ) ලැයිස්තුගත පොදු සමාගමක අත්කර ගැනීම හෝ ඒකාබද්ධවීම හෝ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු නියාමනය කිරීමට;

(ට) වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු, ලියාපදිංචි තැනැත්තකු, ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ලැයිස්තුගත විදේශීය අස්තිත්වයක යම් ක්‍රියාවක් පිළිබඳව විභාග කිරීමට සහ විමර්ශනය පැවැත්වීමට;

(ඩ) යම් තැනැත්තකු විසින් මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානයක් කඩකරන ලද බව පිළිබඳව හෝ උල්ලංඝනය කළ බවට වන යම් චෝදනාවක් පිළිබඳව සොයා බැලීමට සහ විමර්ශන පැවැත්වීමට සහ කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකන ලද පියවර බලාත්මක කිරීමට;

(ණ) මේ පනතේ විෂයය පථය තුළට ගැනෙන්නා වූ යම් කාරණාවකට අදාළව සංවිධානයක් හෝ විදේශීය නියාමන අධිකාරියක් සමග එකඟතාවයන් හෝ අවබෝධතා ගිවිසුමකට එළඹීමට;

(ත) යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචි තැනැත්තකු, අතිරේක සේවා සපයන්නකු යම් ලැයිස්තුගත පොදු සමාගමක් හෝ යම් ලැයිස්තුගත විදේශීය ආස්ථිත්වයක් විසින් සිදු කරන නීති විරෝධී චර්යා පිළිබඳ තීරණ ප්‍රකාශයට පත් කිරීමට;

(ද) සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳ ආවේක්ෂණය කරගෙන යාමට;

(න) කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද යම් සේවාවන් වෙනුවෙන් ගාස්තු හෝ අය කිරීම් අය කරගැනීමට; සහ

(ප) මේ පනත යටතේ කොමිෂන් සභාවේ පරමාර්ථ, බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීමට අවශ්‍ය ආනුෂංගික සහ අනුයාත වෙනත් යම් සියලු ක්‍රියා සිදු කිරීමට.

කොමිෂන් සභාවේ අතිරේක බලතල.

**16.** 15 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද බලතලවලට අමතරව කොමිෂන් සභාවට -

(අ) වෙළෙඳපොළ ආයතන හෝ වෙළෙඳපොළ අතරමැදියන් හෝ ලියාපදිංචි තැනැත්තන් හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමවල භාරකරුවන්ගේ කටයුතු මේ පනතේ විධිවිධාන, මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග, රීති හෝ විධානවලට අනුකූලව සිදු කරනු ලබන්නේ ද යන්න පිළිබඳව විමර්ශන කටයුතු සිදු කිරීමට සහ අවස්ථාවෝචිත පරිදි වෙළෙඳපොළ ආයතන, වෙළෙඳපොළ අතර මැදියන්ගෙන්, ලියාපදිංචි තැනැත්තන්ගෙන් හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමවල භාරකරුවන්ගෙන් එකී විමර්ශන කටයුතු සිදු කිරීමේ දී උපචිත වියදම් අය කර ගැනීමට;

(ආ) කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබූ ආකෘතියට හා ආකාරයට අනුකූලව සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරනු ලැබූ විගණනය කරන ලද මූල්‍ය වාර්තා සහ අතුරු මූල්‍ය වාර්තා කොමිෂන් සභාවේ ගොනු කරන ලෙස නියම කිරීමට;

(ඇ) සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක බලපත්‍රලාභී කළමනාකරණ සමාගමට සෑම වසරක් වෙනුවෙන් වාර්තා

සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක එම වසරේ කටයුතු පිළිබඳව අවම වශයෙන් වාර්තා දෙකක් ගොනු කිරීමට නියම කිරීම. කොමිෂන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකි යම් විස්තර එකී සෑම වාර්තාවකම ඇතුළත් විය යුතු ය. ප්‍රථම වාර්තාව එම වර්ෂයේ සැප්තැම්බර් තිස්වන දිනට පසු නොවන දිනයක දී සහ දෙවන වාර්තාව එළඹෙන වර්ෂයේ මාර්තු මස තිස්එක් වන දිනයට පසු නොවන දිනයක දී ගොනු කරනු ලැබිය යුතු ය;

(ඈ) කොමිෂන් සභාව විසින් අවස්ථාවෝචිත යැයි සලකනු ලබන ප්‍රවීණයන් පත් කිරීමට; සහ

(ඉ) ලැයිස්තුගත පොදු සමාගමක අත්කර ගැනීමක් හෝ ඒකාබද්ධ වීමක් සම්බන්ධයෙන් වන යම් කාරණයක් සම්බන්ධයෙන් උපදේශනයන් ලබා ගැනීමට සහ එම කටයුතු සමාලෝචනය කිරීමට උපදේශක කමිටුවක් පිහිටුවීමට,

බලතල තිබිය යුතු ය.

නීති කෘත්‍යයන් හි දී කොමිෂන් සභාව නියෝජනය කිරීම.

**17.** කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් කොමිෂන් සභාවේ යම් නිලධරයකු වන නීතිඥවරයකුට හෝ වෙන යම් නීතිඥවරයකුට කොමිෂන් සභාව වෙනුවෙන් කොමිෂන් සභාව විසින් හෝ එයට එරෙහිව වන යම් නීති කෘත්‍යයකට හෝ කොමිෂන් සභාවට ප්‍රමාණවත් සම්බන්ධතාවයක් ඇති වෙනත් නීති කෘත්‍යයකට පෙනී සිටීමට බලය ලබා දිය හැකි ය.

3 වන පරිච්ඡේදය

**කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය.**

අධ්‍යක්ෂ ජනරාල්වරයා.

**18.** (1) කොමිෂන් සභාව විසින් එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමික ඇතුළුව වෘත්තීමය කොන්දේසි කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු -

(අ) බරපතළ විෂමාචාර ක්‍රියාවකට වැරදිකරුවකු යැයි සොයා ගනු ලැබ ඇත්නම්;

(ආ) අයුතු ක්‍රියා සම්බන්ධයෙන් පෙර ධුරයෙන් පහකර ඇත්නම්; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග, රීති හෝ විධාන කඩකර ඇත්නම්,

කොමිෂන් සභාව විසින් එවැනි යම් තැනැත්තකු කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කොමිෂන් සභාවේ සාමාන්‍ය විධානයන්ට සහ පාලනයට යටත්ව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම, සභාවේ නිලධරයන් සහ සේවකයන් පරිපාලනය සහ පාලනය, කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ වගකිව යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, එසේ කිරීම අවශ්‍ය යැයි ඔහු විසින් තීරණය කරන විටක දී, ඔහු වෙත මේ පනත මගින් පනවන ලද හෝ අත්කර දෙන ලද යම් බලතල, කර්තව්‍යය හෝ කාර්යයන් යම් නිලධරයකුට සහ සේවකයකුට පවරනු ලැබිය හැකි අතර, ඒ නිලධරයා හෝ සේවකයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව ඒ බලතල, කර්තව්‍යය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කළ යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන, එනම් -

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවංකභාවය සහ කීර්තිය;

(ආ) කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව කොමිෂන් සභාව සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා අතර යම් මූල්‍යමය හෝ වෙනත් යම් අයිතියක් පිළිබඳව යම් විරෝධතාවයක් ඇතිවීමේ සම්භාවිතාව;

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා සිහිවිකලභාවයට පත්වීම හෝ ඔහුගේ කාර්යයන් කරගෙන යාමට නොහැකි බවට පත් වීම;

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්වරයා ඔහුගේ කාර්යයන්ට අදාළව බරපතළ විෂමාචාර ක්‍රියාවකට වරදකරුවකුවීම;

(ඉ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ කාර්යය ඉටු කිරීමේ දී ඔහුගේ ස්වාධීනභාවයට බාධා විය හැකි යම් කාර්යයකට සම්බන්ධ වීම,

යන හේතුවලින් ඕනෑම හේතුවක් සැලකිල්ලට ගනිමින් තුනෙන් දෙකක බහුතර ඡන්දයක් මගින් (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, කොමිෂන් සභාව විසින් ඉවත් කිරීමට පෙරාතුව අධ්‍යක්ෂ ජනරාල්වරයාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය.

**19.** (1) කොමිෂන් සභාව විසින් එහි කර්තව්‍යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි එය විසින් තීරණය කරන පරිදි යම් නිලධරයන් හෝ සේවකයන් පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු -

(අ) බරපතළ විෂමාචාර ක්‍රියාවකට වරදකරු යයි සොයා ගනු ලැබ ඇත්නම්;

(ආ) අයුතු ක්‍රියාවක් සිදු කිරීම නිසා ධුරයෙන් කලින් ඉවත් කරනු ලැබ ඇත්නම්; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග, රීති හෝ විධාන කඩකර ඇත්නම්,

කොමිෂන් සභාව විසින් එවැනි යම් තැනැත්තකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කිරීම නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද නිලධරයන්ට හෝ සේවකයන්ට, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, යම් ආකාරයන්ට සහ යම් පරිමාණයන්ට අනුව ගාස්තු ගෙවනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(4) කොමිෂන් සභාවේ ඉල්ලීම මත රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(5) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

(6) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

(7) නිශ්චිත කාලසීමාවක් සඳහා රජයට සේවය කිරීමට ගිවිසගෙන ඇති යම් තැනැත්තකු කොමිෂන් සභාව විසින් සේවයේ යොදවා ඇති අවස්ථාවක ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාවට සේවය කරන ලද යම් කාලසීමාවක් ඒ තැනැත්තා විසින් ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට කරන ලද සේවාවක් ලෙස සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(8) කොමිෂන් සභාව විසින් එහි කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටක වෙනත් රාජ්‍ය ආයතනවලට හෝ නියාමන අධිකාරිවලට, ඒ ආයතනය හෝ අධිකාරිය සහ කොමිෂන් සභාව අතර ගිවිසගත් ගිවිසුමක් මත කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා අනුයුක්ත කිරීමට යෝජනා කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සංස්ථාවල නිලධරයන් පත්කිරීම.

**20.** (1) කොමිෂන් සභාවේ ඉල්ලීම මත රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එම කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් ගිවිස ගනු ලැබිය හැකි පරිදි විශ්‍රාම වැටුප් සහ සේවක අර්ථසාධක අරමුදල්වලට අදාළ දේවල් ඇතුලුව යම් නියමයන් සහ කොන්දේසිවලට යටත්ව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ තාවකාලිකව නැතහොත් ස්ථිරවම කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලබන අවස්ථාවක දී ඔහු කාර්ය මණ්ඩලයේ අනෙක් යම් නිලධරයන් හෝ සේවකයන් ලෙසින් ම කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් විය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

**21.** දණ්ඩ නීති සංග්‍රහයේ සහ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**22.** අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතු ය.

## II වන කොටස

## වෙළෙඳපොළවල් සහ වෙළෙඳපොළ ආයතන

මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ.

**23.** මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ විය යුත්තේ-

(අ) වෙළෙඳපොළ ආයතන පිහිටුවීම මගින් ශ්‍රී ලංකාව තුළ සාධාරණ, විධිමත්, විනිවිදභාවයෙන් යුත් සහ කාර්යක්ෂම ව්‍යාපාර වස්තු වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම;

(ආ) ව්‍යාපාර වස්තු වෙළෙඳපොළක ඵලදායි සහ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම; සහ

(ඇ) ව්‍යාපාර වස්තු වෙළෙඳපොළවල් හා සම්බන්ධ සංස්ථානික අවදානම් අවම කිරීම.

1 වන පරිච්ඡේදය

**විනිමය ස්ථාන**

බලපත්‍ර නොලත් විනිමය ස්ථානයක් පිහිටුවීමට එරෙහි තහනම.

**24.** (1) කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද බලපත්‍රයක් මත හැර යම් තැනැත්තකු විසින්, විනිමය ස්ථානයක් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

විනිමය ස්ථානයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

**25.** (1) විනිමය ස්ථානයක් වශයෙන් ක්‍රියාත්මකවීමට බලපත්‍රයක් ලබා ගැනීමට සඳහා වන ඉල්ලුම්පත්‍රයක්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ලේඛන සහ ගාස්තු සමඟ එම ආකාරයට සහ ආකෘතියට අනුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා වන ඉල්ලුම් පත්‍රයක් සංස්ථාවක් විසින් පමණක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් යෝග්‍ය යැයි සලකනු ලබන නියමයන් සහ කොන්දේසිවලට යටත්ව -

(අ) විනිමය ස්ථානයේ පහසුකම් හරහා වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව විධිමත් සහ සාධාරණ වෙළෙඳ

පොළක් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරුට හැකියාව ඇති බවට;

(ආ) සිය ව්‍යාපාරයට සහ මෙහෙයුම්වලට සම්බන්ධ යම් අවදානම් විචක්ෂණව කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඉල්ලුම්කරු සතු වන බවට;

(ඇ) ඉල්ලුම්කරු විසින් (අ) ඡේදය යටතේ වන සිය බැඳීම් ඉටු කිරීමේ දී විනිමය ස්ථානය විසින් මහජන සුභසිද්ධියට පටහැනිව ක්‍රියා නොකරන බව සහතික කිරීම සඳහා අවශ්‍ය පාලනකරණ සැලැසුම් සතු වන බවට;

(ඈ) ඉල්ලුම්කරුවකු විසින් සාදනු ලබන රීතිවල -

(i) එහි පහසුකම් මගින් වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් සඳහා;

(ii) වෙළෙඳපොළ සහභාගිවන්නන් ඇතුළත් කර ගැනීම සඳහා;

(iii) සිය වෙළෙඳපොළ සහභාගිවන්නන් නිසි ලෙස නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා;

(iv) යහපත් චරිත ස්වභාවයෙන් සහ උසස් ව්‍යාපාරික විශ්වාසනීයත්වයෙන් යුතු නොවන තැනැත්තන් වෙළෙඳපොළ සහභාගිවන්නන් ලෙස සැලකීමෙන් බැහැර කිරීම සඳහා;

(v) මේ පනතේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන හෝ විනිමය ස්ථානයේ රීති උල්ලංඝනය කිරීම හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්වීම හෝ සාධාරණ සහ යුක්ති සහගත මූලධර්මවලට අනුකූල නොවන ලෙස ව්‍යාපාර ගනුදෙනුවල දී කටයුතු කිරීම හේතුවෙන් යම් වෙළෙඳපොළ සහභාගිවන්නකු හෝ එම වෙළෙඳපොළ සහභාගිවන්නා වෙනුවෙන් ක්‍රියා

කරන යම් තැනැත්තකු සඳහා දඩ නියම කිරීම ඇතුලුව එම තැනැත්තා ඉවත් කිරීම, අත්හිටුවීම හෝ විනය පාලනය සඳහා;

(vi) සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම හෝ අපලේඛනගත කිරීම සිදු කළ හැකි කොන්දේසි සම්බන්ධයෙන්;

(vii) වෙළෙඳපොළ සහභාගිවන්නන් විසින් සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම සම්බන්ධයෙන් වන නියාමන කොන්දේසි සම්බන්ධයෙන්;

(viii) සිය පහසුකම් තුළින් ගනුදෙනු කළ හැකි හෝ වෙළෙඳාම් කළ හැකි සුරැකුම්පත් පන්තිය හෝ පන්ති සම්බන්ධයෙන්;

(ix) වෙළෙඳපොළ විෂමාචාරය සම්බන්ධයෙන් වන තහනම සහ විමර්ශන සිදු කරන ආකාරය සම්බන්ධයෙන්;

(x) ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ විධිමත් සහ සාධාරණ වෙළෙඳාමක් පවත්වා ගැනීම සඳහා යම් නිශ්චිත සුරැකුම්පතක වෙළෙඳාම් කිරීම අත්හිටුවීම සඳහා;

(xi) සිය සාමාජිකයන්ගෙන් බහුතරය වෙළෙඳපොළ සහභාගිවන්නන් නොවන විට දී විනය කමිටුවක් පත් කිරීම සඳහා; සහ

(xii) සාමාන්‍යයෙන් ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා වන අවශ්‍යතාවය පිළිබඳ නිසි සැලකිල්ල දක්වමින් විනිමය ස්ථානයේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා;

වන විධිවිධාන ඇතුළත් වන බවට;

(ඉ) ඉල්ලුම්කරු විසින් -

(i) සිය පහසුකම් මගින් වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක්;

(ii) සිය ව්‍යාපාර කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් සහ නිසි ලෙස සම්පාදිත පරිශ්‍රයක්;

(iii) සිය ව්‍යාපාර කටයුතු කිරීම සඳහා ප්‍රවීණ සේවක පිරිසක්; සහ

(iv) හදිසි අවස්ථාවලට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් ධාරිතාවක්, ආරක්ෂක සැලසුම් සහ පහසුකම් සහිත ස්වයංක්‍රීය පද්ධතීන්,

සපයන බවට සහතික කිරීම සඳහා එම ඉල්ලුම්කරු සතුව ප්‍රමාණවත් මූල්‍යමය, මානව සහ වෙනත් සම්පත් ඇති බවට;

(ඊ) මහජන අයිතීන් හෝ වෙළෙඳපොළ මනා නියාමනය බලපත්‍රය ප්‍රදානය කිරීම මඟින් ඉටුවන බවට,

කොමිෂන් සභාව සෑහීමකට පත් වන විට දී, කොමිෂන් සභාව විසින්, විනිමය ස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක වීම සඳහා එම ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන යම් ඉල්ලුම්කරුවකු විසින්, ඉල්ලුම්පත්‍රයට අදාළව කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන අතිරේක තොරතුරු සපයනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් නියමයන් සහ කොන්දේසිවල ව්‍යාප්තිය සීමා නොවන පරිදි, කොමිෂන් සභාව විසින්, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළ නිසි ලෙස නියාමනය කිරීම සඳහා එසේ කිරීම සුදුසු බවට කොමිෂන් සභාව සෑහීමකට පත්ව ඇත්නම්, නියමයන් හෝ කොන්දේසි සංශෝධනය කිරීම, අහෝසි කිරීම හෝ නියමයන් හෝ කොන්දේසි පැනවීම කරනු ලැබිය හැකි ය.

විනිමය ස්ථානයේ කාර්යය.

**26.** (1) සිය පහසුකම් මගින් වෙළෙඳාම් කරනු ලබන සුරැකුම්පත් සඳහා විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් තහවුරු කිරීම විනිමය ස්ථානයක කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන සිය කාර්යය ඉටු කිරීමේ දී, විනිමය ස්ථානය විසින්-

(අ) ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා වන අවශ්‍යතාවය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුහසිද්ධිය උදෙසා කටයුතු කළ යුතු ය;

(ආ) සමාගම්වලට අදාළ යම් නීතියක් යටතේ එම විනිමය ස්ථානය විසින් කටයුතු කිරීමට නියමිත සුහසිද්ධිය, (අ) ඡේදයේ සඳහන් සුහසිද්ධිය සමඟ ගැටෙන විට දී, පසු සඳහන් සුහසිද්ධිය බලපැවැත්විය යුතු බවට සහතික විය යුතු ය; සහ

(ඇ) සිය ව්‍යාපාරය සහ මෙහෙයුම් හා සම්බන්ධ යම් අවදානම් විචක්ෂණව කළමනාකරණය කළ යුතු ය.

(3) වෙන යම් නීතියක කෙසේ සඳහන් වුව ද, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා වන අවශ්‍යතාවය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුහසිද්ධිය උදෙසා කටයුතු කිරීම විනිමය ස්ථානයක අධ්‍යක්ෂවරයකුගේ කාර්යය විය යුතු අතර, මේ පනත යටතේ කාර්යය සහ වෙනත් යම් පනතක් යටතේ අධ්‍යක්ෂවරයකුගේ කාර්යය අතර ගැටුමක් ඇති වූ විට මේ පනත යටතේ කාර්යය බලපැවැත්විය යුතු ය.

(4) සිය රීතිවලට අනුකූලව කටයුතු කිරීම, අධීක්ෂණය කිරීමේ හෝ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා සිය රීති යටතේ විධිවිධාන සලසා ඇති පරිදි සුදුසු පියවර ගැනීම විනිමය ස්ථානයේ කාර්යය විය යුතු ය.

(5) යම් විනිමය ස්ථානයක් විසින් -

(අ) මේ පනත යටතේ හෝ එහි රීති යටතේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අවම මූල්‍යමය නියමයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා යම් වෙළෙඳපොළ සහභාගිවන්නකු සතු හැකියාව ඇතුලුව සිය බලපත්‍රලත් ව්‍යාපාරය සම්බන්ධයෙන් වන බැඳීම් ඉටු කිරීම සඳහා යම් වෙළෙඳපොළ සහභාගිවන්නකු සතු හැකියාවට අහිතකර ලෙස බලපානු ලබන හෝ අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති යම් කරුණක්; හෝ

(ආ) විනිමය ස්ථානයේ අදහස අනුව, යම් වෙළෙඳපොළ සහභාගිවන්නකුගේ හෝ එම වෙළෙඳපොළ සහභාගිවන්නාගේ ප්‍රධාන විධායක නිලධරයාගේ හෝ අධ්‍යක්ෂවරුන්ගේ හෝ ප්‍රධාන කළමනාකරණ මණ්ඩලයේ මූල්‍යමය තත්ත්වය හෝ මූල්‍යමය සම්පූර්ණත්වය පෙන්නුම් කරනු ලබන හෝ පෙන්නුම් කරනු ලැබිය හැකි යම් අවිධිමත් ක්‍රියාවක්, මේ පනතේ විධිවිධාන, නියෝග, රීති, විධාන හෝ වෙන යම් කාරණයක් කඩකිරීමක්,

පිළිබඳ දැනගැනීමට ලැබුණහොත් වහාම ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු ය.

(6) විනිමය ස්ථානයක් විසින් (5) වන වගන්තියේ සඳහන් වූ කටයුතු සිදුවීම මත සිය වෙළෙඳපොළ සහභාගිවන්නන් කිසිවකු සම්බන්ධයෙන් අවවාදයක් ලබාදීමේ දී, දඩ පැනවීමේ දී, අත්හිටුවීමේ දී, ඉවත් කිරීමේ දී හෝ වෙනත් යම් විනය පියවරක් පැනවීමේ දී විනිමය ස්ථානය විසින් දින හතක් ඇතුළත පහත සඳහන් තොරතුරු ලිඛිතව කොමිෂන් සභාව වෙත ලබා දිය යුතු ය:-

(අ) වෙළෙඳපොළ සහභාගීවන්නාගේ ව්‍යාපාරයේ නම සහ ලිපිනය;

(ආ) ගන්නා ලද ක්‍රියාමාර්ගය සඳහා වූ හේතුව සහ එම ක්‍රියාමාර්ගයේ ස්වභාවය;

(ඇ) අදාළ වන්නේ නම්, අත්හිටුවන ලද කාලසීමාව සහ දඩයේ ප්‍රමාණය; සහ

(ඈ) ගන්නා ලද වෙනත් යම් විනය ක්‍රියාමාර්ගයක්.

**27.** (1) කොමිෂන් සභාව විසින්, ලිඛිත දැන්වීමක් මගින් - විනිමය ස්ථානයක බලපත්‍රය අවලංගු කිරීම.

(අ) එම දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයේ සිට බලාත්මක වන පරිදි මේ පනතේ 25 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීම; හෝ

(ආ) එම දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයේ සිට බලාත්මක වන පරිදි එම දැන්වීමේ නිශ්චිතව සඳහන් වන්නා වූ යම් පහසුකම් සැපයීම හෝ මෙහෙයවීම නතර කිරීමට හෝ යම් සේවාවන් සැපයීම නතර කිරීමට හෝ එම විනිමය ස්ථානය වෙත විධාන කිරීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(2) පහත සඳහන් අවස්ථානුගත කරුණු කිසිවක් උද්ගත වන අවස්ථාවක දී, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ මහජන සුභසිද්ධිය සඳහා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළ නිසි පරිදි නියාමනය කිරීම සඳහා හෝ එසේ කිරීම සුදුසු බවට කොමිෂන් සභාව විසින් සෑහීමකට පත් වන්නේ නම් මිස, කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානයක් නිකුත් කිරීම සිදු කරනු නොලැබිය යුතු යː-

(අ) විනිමය ස්ථානය විසින් සිය සුරැකුම්පත් වෙළෙඳපොළ මෙහෙයවීම නතර කිරීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී විනිමය ස්ථානය ඈවර කරනු ලැබීම හෝ අන්‍යාකාරයකින් විසුරුවාහරිනු ලැබීම;

(ඇ) විනිමය ස්ථානය විසින් මේ පනත යටතේ වන යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබීම හෝ සිය බලපත්‍රයේ වන යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝනය කර තිබීම;

(ඈ) මේ පනත යටතේ නිකුත් කරන ලද යම් කොන්දේසියකට, අවශ්‍යතාවයකට හෝ විධානයකට අනුකූලව කටයුතු කිරීමට විනිමය ස්ථානය අපොහොසත්වීම;

(ඉ) 25 වන වගන්තියේ කාර්ය සඳහා ලබා දෙන ලද යම් තොරතුරක, වැදගත් තොරතුරක් අසත්‍ය ලෙස හෝ නොමඟ යවන සුලු ලෙස ලබා දී තිබීම හෝ එම වැදගත් තොරතුරු ලබා දීම පැහැර හැර තිබීම;

(ඊ) විනිමය ස්ථානයට එදිරිව වන යම් විනිශ්චිත ණයක් සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් ගෙවා තෘප්ත කර නොතිබීම;

(ඌ) විනිමය ස්ථානයේ යම් දේපළකට අදාළව හෝ ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් භාරගැනුම්කරුවකු, භාරගැනුම්කරුවකු සහ කළමනාකරුවකු, ඇවරකරුවකු හෝ ඒ හා සමාන යම් තැනැත්තකු පත් කර තිබීම;

(ඍ) විනිමය ස්ථානය විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී සිය ණය හිමියන් සමග, සමථයකට හෝ විධිවිධාන යෙදීමේ යෝජනා ක්‍රමයකට එළඹ තිබීම; හෝ

(එ) විනිමය ස්ථානයක් විසින් ස්වකීය මෙහෙයවීම යටතේ, විනිමය ස්ථානයක් වශයෙන් වන සිය බලපත්‍රය අවලංගු කිරීම සඳහා කොමිෂන් සභාවෙන් ඉල්ලීම සහ කොමිෂන් සභාව විසින් එසේ කිරීම සුදුසු බවට සැළකීම.

(3) 2 වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා යම් විනිමය ස්ථානයක් විසින් සිය සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීම සති දෙකක් ඉක්ම වූ කාලසීමාවක් සඳහා නතර කර ඇති අවස්ථාවක දී, එම විනිමය ස්ථානය විසින් එසේ කිරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගෙන ඇත්තේ නම් මිස, එම විනිමය ස්ථානය විසින් සිය සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීම නතර කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ විධානයක් නිකුත් කිරීමක් සිදු වුව ද, එය නොතකා -

(අ) දැන්වීමෙහි නිශ්චිතව සඳහන් සේවා සැපයීම නතර කිරීමේ හෝ විනිමය ස්ථානයේ මෙහෙයුම් නවතා දැමීමේ කාර්යය සඳහා; හෝ

(ආ) ආයෝජකයන්ගේ සුභසිද්ධිය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා; හෝ

(ඇ) මහජන සුභසිද්ධිය සඳහා,

කොමිෂන් සභාව විසින් දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි එම අවලංගු කිරීමෙන් හෝ විධානයෙන් බලපෑමට ලක් වූ යම් ක්‍රියාකාරකම්, එම අවලංගු කිරීම හෝ විධානය බලාත්මක

වන දිනයේ දී හෝ ඉන්පසුව සිදු කරගෙන යාමට, කොමිෂන් සභාව විසින් එම විනිමය ස්ථානයට අවසර ලබා දෙනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ කටයුතු කරන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, අවශ්‍ය යයි සලකනු ලබන විට දී, නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරනු ලබන තෙක් විනිමය ස්ථානයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා වසරක කාලසීමාවක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි වන අතුරු අධ්‍යක්ෂ මණ්ඩලයක් මාස හයක කාලසීමාවක් දක්වා පත් කරනු ලැබිය හැකි ය.

(6) (4) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් යම් විනිමය ස්ථානයකට කටයුතු කරගෙන යාම සඳහා අවසර ලබා දී ඇති අවස්ථාවක දී එම අවසරයට අනුකූලව සිය කටයුතු කරගෙන යාම හේතුවෙන් එම විනිමය ස්ථානය විසින් (1) වන උපවගන්තිය උල්ලංඝනය කර ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(7) කරුණු දැක්වීම සඳහා විනිමය ස්ථානයට අවස්ථාවක් ලබාදීමෙන් තොරව කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ වන යම් ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණයකින් අගතියට පත් යම් විනිමය ස්ථානයක් විසින් එම තීරණය පිළිබඳව එම විනිමය ස්ථානයට දැනුම් දුන් දිනයෙන් පසු දින දාහතරක් ඇතුළත අමාත්‍යවරයාට අභියාචනා කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ගොනු කර ඇති වුව ද, එය නොතකා, අමාත්‍යවරයාගේ තීරණය ලබා දෙන තෙක් මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් බලාත්මකව පැවතිය යුතු ය.

(10) (8) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ අභියාචනයක දී, අමාත්‍යවරයා විසින්-

(අ) අභියාචනය පිළිගෙන බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට නියම කිරීම; හෝ

(ආ) අභියාචනය පිළිනොගැනීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(11) කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ විධානය බලාත්මක කරනු ලැබිය යුතු ය.

(12) (11) වන උපවගන්තියට යටත්ව, කොමිෂන් සභාව විසින් මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධානයක් පිළිබඳව හෝ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් නිකුත් කළ යුතු ය.

විනිමය ස්ථානයක බලපත්‍රය අවලංගු කිරීමේ බලපෑම.

**28.** 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ නිකුත් කරන ලද විධානයක්-

(අ) 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමට හෝ විධානයක් නිකුත් කිරීමට පෙර හෝ 27 වන වගන්තියේ (4) වන උපවගන්තිය අදාළ වන අවස්ථාවක දී හෝ ඉන් පසුව එම විනිමය ස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලබන සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධයෙන් එළඹ ඇති යම් ගිවිසුමක්, ගනුදෙනුවක් හෝ සැලැසුමක් වැළැක්වීම සඳහා හෝ ඊට බලපෑම් කිරීමට; හෝ

(ආ) එම ගිවිසුම, ගනුදෙනුව හෝ සැලසුම යටතේ පැන නගින යම් අයිතිවාසිකමක්, බැඳීමක් හෝ වගකීමක් සඳහා බලපෑමක් වන ලෙස ක්‍රියාත්මක නොවිය යුතු ය.

හදිසි අවස්ථාවක දී විනිමය ස්ථානය වසා දැමීම.

**29.** (1) කොමිෂන් සභාව විසින් -

(අ) ශ්‍රී ලංකාව තුළ යම් හදිසි අවස්ථාවක් හෝ ස්වභාවික ආපදාවක් ඇතිවීම; හෝ

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ආර්ථික හෝ මූල්‍යමය අර්බුදයක් හෝ වෙනත් යම් අවස්ථානුගත කරුණක් පැවතීම,

හේතුවෙන් සුරැකුම්පත් වෙළෙඳපොළෙහි සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම සඳහා විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් පැවතීම වැළැක්වෙමින් පවතින බවට හෝ වැළැක්වීමට ඉඩ ඇති බවට

අදහස් කරනු ලබන්නේ නම්, විනිමය ස්ථානය විමසීමෙන් පසු, කොමිෂන් සභාව විසින් විනිමය ස්ථානයට සිය සුරැකුම්පත් වෙළෙඳපොළ ව්‍යාපාරික දින පහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වසා දමනු ලැබීමට විධාන කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ වන සුරැකුම්පත් වෙළෙඳපොළ වසා දැමීම එක් එක් කාලසීමාව ව්‍යාපාරික දින පහක් නොඉක්මවන්නා වූ තවත් යම් කාලසීමාවන් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ ලබා දෙන ලද විධානයක එම වසා දැමීම සඳහා වූ හේතු සහ (2) වන උපවගන්ති යටතේ වන යම් වසා දැමීම දීර්ඝ කිරීමක් සඳහා වූ හේතු නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, ක්‍රියාවෙහි යෙදිය හැකිතාක් ඉක්මනින්, විනිමය ස්ථානය වෙත (1) වන උපවගන්තිය යටතේ වන විධානයක හෝ (2) වන උපවගන්තිය යටතේ වන දීර්ඝ කිරීමක පිටපතක් ලබා දිය යුතු අතර, (1) වන උපවගන්තිය යටතේ වන විධානය හෝ (2) වන උපවගන්තිය යටතේ වන දීර්ඝ කිරීම බලාත්මක කිරීම සඳහා එම විධානය හෝ දීර්ඝ කිරීම බලාත්මකව පවතින තෙක් එම විනිමය ස්ථානය විසින් සාධාරණ ලෙස ඉටු කරනු ලැබිය හැකි සියලු දේ කිරීම සඳහා එම විනිමය ස්ථානයට විධාන කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් මේ වගන්තිය යටතේ සිය බලතල ක්‍රියාත්මක කරනු ලබන විට දී මේ වගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා වන හේතු දක්වමින් කොමිෂන් සභාව විසින් වහාම අමාත්‍යවරයා වෙත වාර්තාවක් ලබා දිය යුතු ය.

(6) මේ වගන්තියේ -

"ව්‍යාපාරික දිනය" යන්නෙන් වසා දැමීම සිදු නොවූයේ නම් විනිමය ස්ථානයේ නිල වෙළෙඳාමක් පවතින යම් දිනයක් අදහස් වේ;

"සාධාරණ වෙළෙඳපොළ" යන්නට සැපයුම් සහ ඉල්ලුම් බලවේග පෙන්නුම් කරනු ලබන වෙළෙඳපොළක් ඇතුළත් වේ.

බලපත්‍රලත් විනිමය ස්ථානයක් ලැයිස්තුගත කිරීම සඳහා වන නියමයන්.

**30.** (1) යම් විනිමය ස්ථානයක් විසින් ලැයිස්තුගත කිරීමේ නියමයන්ට අනුකූලව කටයුතු කරන විට දී, සිය සුරැකුම්පත් එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවසර ලබා දිය යුතු ය. එම අවසරය ලබා දුන් විට දී විනිමය ස්ථානය විසින් -

(අ) අදාළ විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීමෙන් ඇති විය හැකි සබඳතාවක් අතර ගැටුම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා;

(ආ) විනිමය ස්ථානයේ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීමේ විශ්වාසනීයත්වය තහවුරු කිරීමේ කාර්යය සඳහා; සහ

(ඇ) විනිමය ස්ථානය ලැයිස්තුගත සමාගමක් බවට පත් වුවහොත් ලැයිස්තුගත සමාගමක් වශයෙන් වන බැඳීම්වලට අනුකූලව කටයුතු කිරීම සඳහා, කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි යම් සැලසුමකට එළඹිය යුතු අතර අදාළ විනිමය ස්ථානය විසින් එම නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතු ය.

(2) එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීමේ නියමයන්,-

(අ) එම විනිමය ස්ථානයේ නිල ලැයිස්තුවට විනිමය ස්ථානය ඇතුළත් කර ගැනීමට හෝ ඉන් විනිමය ස්ථානය ඉවත් කිරීමට;

(ආ) විනිමය ස්ථානයේ සුරැකුම්පත් විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීම හෝ විනිමය ස්ථානයේ වෙළෙඳාම් කිරීම නැවැත්වීමට හෝ අත්හිටුවීමට; හෝ

(ඇ) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් යෝග්‍ය යයි සලකනු ලබන වෙනත් කරුණුවලට,

අදාළව එම විනිමය ස්ථානය විසින් තීරණ ගැනීම සහ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට ඒ සඳහා කොමිෂන් සභාවට අවසර ලබා දෙනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වන යම් සැලසුමක් මගින් එම සැලසුම යටතේ හෝ අන්‍යාකාරයකින් කොමිෂන් සභාව විසින්

ලබා දෙන ලද සේවා සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ගාස්තුවක් කොමිෂන් සභාව වෙත ගෙවීම සඳහා එම සැලසුම මගින් විධිවිධාන සලසනු ලැබිය හැකි ය.

(4) යම් විනිමය ස්ථානයක රීති අනුමත කිරීම සඳහා හෝ සංශෝධනය කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතලවලට අගතියක් නොවන පරිදි කොමිෂන් සභාව විසින් ලිඛිත දැන්වීමක් මගින් -

(අ) එම විනිමය ස්ථානයේ සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සඳහා හෝ වෙළෙඳාම් කිරීම සඳහා ඉල්ලුම් කිරීමේ කාර්ය සඳහා එම විනිමය ස්ථානයේ ලැයිස්තුගත කිරීමේ නියමයන් විකරණය කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) එම විනිමය ස්ථානයේ යම් ලැයිස්තුගත කිරීමේ නියමයකින් විනිමය ස්ථානය නිදහස් කරනු ලැබිය හැකි ය.

2 වන පරිච්ඡේදය

**නිෂ්කාශනාගාරය**

**31.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ අධිකාරයේ - අර්ථ නිරූපණය.

"මධ්‍යම ප්‍රතිපාර්ශ්වය" යන්නෙන්, එක් එක් වෙළෙඳාම පිළිබඳ සහතික වීම මගින් සෑම විකුණුම්කරුවකුට ම ගැනුම්කරු වීමෙන් සහ සෑම ගැනුම්කරුවකුටම විකුණුම්කරුවීමෙන් සුරැකුම්පත් වෙළෙඳපොළෙහි වෙළෙඳාම් නිෂ්කාශනය කිරීමෙහි සහ පියවීමෙහි නිරත නෛතික තැනැත්තකු අදහස් වේ;

"පැහැර හැරීමේ නීති කෘත්‍ය" යන්නෙන්, සිය පැහැර හැරීමේ රීති යටතේ නිෂ්කාශනාගාරයක් විසින් පවරන ලද යම් නීති කෘත්‍යයක් හෝ ගන්නා ලද වෙනත් ක්‍රියාමාර්ගයක් අදහස් වේ;

"පැහැර හැරීමේ රීති" යන්නෙන්, නිෂ්කාශනාගාරයකට අදාළව, යම් නිෂ්කාශන සාමාජිකයකු පාර්ශ්වයක් වන්නා වූ

යම් නොපියවූ වෙළෙඳපොළ ගිවිසුම් සියල්ල හෝ ඉන් කිසිවකට අදාළ සිය බැඳීම් පියවීමට එම නිෂ්කාශන සාමාජිකයා අපොහොසත්ව ඇත්නම් පැහැර හැරීමේ නීති කෘත්‍ය ආරම්භ කිරීම සඳහා විධිවිධාන සලසනු ලබන යම් නිෂ්කාශනාගාර රීති අදහස් වේ;

"පැහැරහරින්නා" යන්නෙන්, යම් පැහැර හැරීමේ නීති කෘත්‍යයකට යටත් නිෂ්කාශන සාමාජිකයකු අදහස් වේ;

"වෙළෙඳපොළ ගාස්තුව" යන්නෙන් -

(අ) නිෂ්කාශනාගාරයක රීතිවල නිශ්චිතව සඳහන් වන පරිදි එම නිෂ්කාශනාගාරය විසින් දරනු ලබන හෝ එම නිෂ්කාශනාගාරයේ තැන්පත් කළ යම් දේපළක් සම්බන්ධයෙන්; සහ

(ආ) වෙළෙඳපොළ ගිවිසුමක් පියවනු ලබන බව සහතික කිරීම සඳහා නිෂ්කාශනාගාරය සම්බන්ධයෙන් සෘජුව පැන නගින වගකීම් පියවීමේ කාර්යය සඳහා,

නිෂ්කාශනාගාරයක් වෙනුවෙන් ප්‍රදානය කරන ස්ථාවර හෝ චල ගාස්තු අදහස් වේ;

"වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපය" යන්නෙන්, නිෂ්කාශනාගාරයේ වෙළෙඳපොළ ගිවිසුම් ඉටු කිරීම සහතික කිරීම සඳහා නිෂ්කාශනාගාරය සම්බන්ධයෙන් කෙළින්ම පැන නගින වගකීම් පියවීමේ කාර්යය සඳහා නිෂ්කාශනාගාරයක රීතිවල නිශ්චිතව සඳහන් වන පරිදි එම නිෂ්කාශනාගාරය විසින් දරනු ලබන හෝ එම නිෂ්කාශනාගාරයේ තැන්පත් කරනු ලබන යම් දේපළක් හෝ වෙනත් යම් සමපාර්ශ්වීය ඇපයක් අදහස් වේ;

"වෙළෙඳපොළ ගිවිසුම" යන්නෙන් -

(අ) නිෂ්කාශනාගාරයක නිෂ්කාශන පහසුකම භාවිත කරමින් ගනුදෙනු නිෂ්කාශනය කිරීමේ සහ පියවීමේ කාර්යය සඳහා නවීකරණයකින් පසු

නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන සාමාජිකයකු සමග එළඹෙන ලද නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුකූලවූ ගිවිසුමක් අදහස් වේ; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් නවීකරණයක් සිදු වනු ලැබුව ද එසේ නොවූව ද නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුකූලව නිෂ්කාශනාගාරයේ නිෂ්කාශන පහසුකම භාවිත කරමින් නිෂ්කාශනය කරනු ලබන හෝ නිෂ්කාශනය කරනු ලැබිය යුතු හෝ පියවනු ලබන හෝ පියවනු ලැබිය යුතු ගනුදෙනුවක් අදහස් වේ;

"අදාළ ධුර දරන්නා" යන්නෙන් -

(අ) යම් සමාගමකට අදාළව එහි ඇවරකරු, යාවකාලික ඇවරකරු, භාරගැනුම්කරු හෝ කළමනාකරු හෝ ඒ හා සමාන තැනැත්තකු; හෝ

(ආ) මියගිය තැනැත්තාගේ බුන්වත් දේපළ වස්තුභංගත්වයේ දී පරිපාලනය කිරීම සඳහා වන නියෝගයකට අනුකූලව පත් කළ යම් තැනැත්තකු,

අදහස් වේ.

බලපත්‍ර නොලත් නිෂ්කාශනාගාරයක් පිහිටුවීමට එරෙහි තහනම.

**32.** (1) මේ වගන්තිය යටතේ නිෂ්කාශනාගාරයක් පිහිටුවීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීම සඳහා යම් තැනැත්තකු විසින් බලපත්‍රයක් ලබා ගෙන ඇත්තේ නම් මිස එම තැනැත්තා විසින් නිෂ්කාශන පහසුකමක් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හෝ පවත්වා ගැනීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ නිදහස් කරන ලද සුරැකුම්පත් සඳහා නිෂ්කාශන පහසුකම් සපයනු ලබන යම් තැනැත්තකු සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

**33.** (1) නිෂ්කාශනය කිරීම සහ පියවීම සහතික කිරීම සඳහා හෝ අන්‍යාකාරයකට මධ්‍යම ප්‍රතිපාර්ශ්වය වශයෙන් ක්‍රියාකරන නිෂ්කාශනාගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම් පත්‍රයක් කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් ආකෘතියකට සහ ආකාරයට අනුව කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ගාස්තුවක් සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

නිෂ්කාශනාගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම.

(2) නිෂ්කාශනාගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක් සංස්ථාවක් විසින් පමණක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) බලය ලබා දෙන අවස්ථාවේ දී, මේ පනතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝගවල හෝ රීතිවල නියමයන්ට අනුකූලවීම සඳහා අවශ්‍ය සියලු වැඩපිළිවෙළ යම් ඉල්ලුම්කරුවකු විසින් තහවුරු කර ඇති බවට කොමිෂන් සභාව සෑහීමකට පත් කිරීම සඳහා අවශ්‍ය සියලු තොරතුරු එම ඉල්ලුම්කරු විසින් ලබාදෙනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් සෑහීමකට පත් වනු ලැබීමට යටත්ව යෝජිත නිෂ්කාශනාගාරයේ රීති මගින් -

(අ) සිය නිෂ්කාශන පහසුකම් මගින් නිෂ්කාශනය කරනු ලබන සුරැකුම්පත්වලට අදාළව කාර්යක්ෂම සහ ඵලදායී නිෂ්කාශනාගාර පහසුකම් සඳහා;

(ආ) සිය නිෂ්කාශන පහසුකම් භාවිත කරන සිය නිෂ්කාශන සාමාජිකයන් නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා;

(ඇ) එම නිෂ්කාශන සාමාජිකයන් නිෂ්කාශනාගාරයට ඇතුළත් කර ගැනීම සඳහා වන විනිවිදභාවයෙන් යුත් සහ වෙනස් ලෙස නොසැලකීමේ උපමාන ඇතුළුව ඇතුළත් කර ගනු ලැබිය හැකි නිෂ්කාශන සාමාජික වර්ග සඳහා;

(ඇ) (i) නිෂ්කාශනාගාරය සහ එහි නිෂ්කාශනාගාර සාමාජිකයන් අතර වන; සහ

(ii) නිෂ්කාශන සාමාජිකයන් අතර වන,

ගැටුම් ශීඝ්‍රව සහ සාධාරණ ලෙස නිරාකරණය කිරීම සඳහා වන රීති සඳහා;

(ඉ) නිෂ්කාශනාගාරයේ රීතිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්වීම හේතුවෙන් නිෂ්කාශන සාමාජිකයන් ඉවත් කිරීම, සාමාජිකත්වය අත්හිටුවීම, නිෂ්කාශන සාමාජිකයන් සඳහා දඩ පැනවීම හෝ ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සඳහා;

(ඊ) සිය පහසුකමෙහි නිෂ්කාශනය කළ හැකි සුරැකුම්පත් පන්තිය හෝ සුරැකුම්පත් පන්ති නිශ්චිතව සඳහන් කිරීම සඳහා;

(උ) පියවීම් ඇප අරමුදලක් පිහිටුවීම සහ පරිපාලනය කිරීම සඳහා;

(ඌ) සිය බැඳීම් පියවීම සඳහා නිෂ්කාශන සාමාජිකයකු අපොහොසත්ව ඇත්තේ නම් පැහැර හැරීමේ නීති කෘත්‍ය සහ නිෂ්කාශන සාමාජිකයකුට සිය බැඳීම් පියවීම සඳහා නොහැකි බවට හෝ නොහැකි වීමට ඉඩ ඇති බවට පෙනී යන විටක දී, අදාළ අවදානම් කළමනාකරණ කාර්ය පටිපාටි ආරම්භ කිරීම සඳහා;

(එ) පියවීම් නියෝග පියවීම් පද්ධතියට ඇතුළත් කිරීම සඳහා වන අවස්ථාව සහ එම නියෝග අවසාන සහ ප්‍රත්‍යාදිෂ්ට කළ නොහැකි වන බවට පත්වන අවස්ථාව සඳහා;

(ඒ) නිෂ්කාශනාගාරය මධ්‍යම ප්‍රතිපාර්ශ්වය වශයෙන් ක්‍රියා කරනු ලබන අවස්ථාවක, තුලනය කිරීමේ සැලසුම් තුළ ප්‍රතිපාර්ශ්ව ආදේශන කාලය, තුලනය කිරීමේ අවසානය සහ මධ්‍යම ප්‍රතිපාර්ශ්වයකට අදාළ වෙනත් යම් කාර්යයන් සහ කර්තව්‍යයන් සඳහා;

(ඔ) නිෂ්කාශනාගාරය නිෂ්කාශන සාමාජිකයකුගේ පැහැරහැරීමක් හෝ නිෂ්කාශනාගාරයක නුබුන්වත්භාවයට තර්ජනයක් ඇති කරනු ලබන වෙනත් යම් අවස්ථාගත තත්ත්වයන් හේතුවෙන් පාඩු විඳින අවස්ථාවක, නිෂ්කාශනාගාරයේ අඛණ්ඩ සේවා සැපයීම සඳහා පහසුකම් සැලසීම සඳහා පැහැර හැරීමේ රීති ඇතුළත් කිරීම සඳහා;

(ඕ) නිෂ්කාශන සාමාජිකයකුගේ පැහැර හැරීමක දී හෝ වස්තු භංගත්වයක දී සමපාර්ශ්වීය ඇප තැන්පත් කිරීම සහ සමපාර්ශවීය ඇප නිර්මාණය කිරීම සහ උපලබ්ධි කිරීම ඇතුළුව සමපාර්ශවීය ඇප පාලනය කිරීම සඳහා,

විධිවිධාන සැලැස්විය යුතු ය.

(5) මහජන සුභසිද්ධිය සඳහා හෝ නිෂ්කාශනාගාරයක නිවැරදි නියාමනය සඳහා එලෙස සිදුකිරීම උචිත බවට කොමිෂන් සභාව සෑහීමකට පත් වූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් එයට සුදුසුයැයි හැඟෙන එම නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව නිෂ්කාශනාගාරයක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ඉල්ලුම්කරුට බලපත්‍රයක් ලබාදෙනු ලැබිය හැකි ය.

(6) ආයෝජක සුභසිද්ධිය සඳහා හෝ නිෂ්කාශනාගාරය නිවැරදි නියාමනය සඳහා එලෙස සිදු කිරීම උචිත බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම්, කොමිෂන් සභාව විසින් නියම සහ කොන්දේසි සංශෝධනය කිරීම, ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ නියම සහ කොන්දේසි පැනවීම සිදු කරනු ලැබිය හැකි ය.

**34.** (1) නිෂ්කාශනාගාරයක් විසින් - නිෂ්කාශනාගාරයක වගකීම්.

(අ) නිෂ්කාශනය කිරීමේ හෝ ගනුදෙනු බේරුම් කිරීමේ අරමුණු උදෙසා, ආරක්ෂිත, කාර්යක්ෂම සහ ඵලදායී නිෂ්කාශන පහසුකමක් ක්‍රියාත්මක කිරීම;

(ආ) එහි ව්‍යාපාර සහ මෙහෙයුම් ආශ්‍රිත යම් අවදානම් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම; සහ

(ඇ) ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා වන අවශ්‍යතාවයට සැළකිල්ලක් දක්වමින් මහජන සුභසිද්ධි සඳහා ක්‍රියා කිරීම,

සිදු කරනු ලැබිය යුතු ය.

(2) වෙනත් යම් නීතියක විධිවිධානවල කෙසේ සඳහන් වුව ද, සංස්ථානික අවදානම අවම කිරීම සැළකිල්ලට ගනිමින් සියලු අවස්ථාවන්හි දී මහජන සුභසිද්ධිය උදෙසා ක්‍රියා කිරීමට නිෂ්කාශනාගාරයක අධ්‍යක්ෂවරයකු සතුව වගකීමක් ඇති අතර වෙනත් යම් නීතියක් යටතේ අධ්‍යක්ෂවරයකු සතු වගකීම සහ මේ පනත යටතේ අධ්‍යක්ෂවරයකුගේ වගකීම අතර ගැටුමක් ඇති වූ අවස්ථාවක, මේ පනතේ විධිවිධාන යටතේ වන වගකීම බලපැවැත්විය යුතු ය.

(3) නිෂ්කාශනාගාරයක් විසින් සියලු අවස්ථාවන්හි දී-

(අ) නිසි පරිදි විස්තර කරන ලද, විනිවිදභාවයෙන් යුක්ත වූ සහ ස්ථිර වගකීම් පෙළක් සහිත පැහැදිලි සංවිධානාත්මක ව්‍යුහයක් ඇතුළත් ශක්තිමත් පාලන සැලසුම් එයට මුහුණපාන්නට සිදුවන හෝ සිදුවිය හැකි අවදානම් හඳුනාගැනීමට, කළමනාකරණය කිරීමට, අභිමන්ත්‍රණය කිරීමට සහ වාර්තා කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග සහ මනා පරිපාලන සහ ගිණුම් කාර්ය පටිපාටිය ඇතුළු ශක්තිමත් අභ්‍යන්තර පාලන විධිවිධාන යෙදීම;

(ආ) මේ පනතට සහ පනත යටතේ සාදන ලද නියෝගයන්ට, රීතීන්ට සහ විධිවිධානයන්ට අනුකූලවීම තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත්ව ඵලදායී වන ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි යොදා ගැනීම;

(ඇ) එහි සේවාවන් සහ කටයුතු සිදුකිරීමෙහි අඛණ්ඩතාවය සහ විධිමත් ක්‍රියාකාරිත්වය තහවුරු කරනු ලබන සංවිධානාත්මක ව්‍යුහයක් පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා සුදුසු සහ සමානුපාතික පද්ධති, සම්පත් සහ කාර්ය පටිපාටි යොදා ගනු ලැබිය යුතු ය.

(ඇ) අවදානම් කළමනාකරණය සඳහා සහ නිෂ්කාශනාගාරයේ වෙනත් මෙහෙයුම් සඳහා වන වාර්තාකරණ රීති අතර පැහැදිලි වෙන් කිරීමක් පවත්වාගෙන යාම;

(ඉ) පවත්වාගෙන යනු ලබන තොරතුරුවල ආරක්ෂාව, විශ්වාසනීයත්වය සහ රහස්‍යභාවය පිළිබඳ ඉහළ ප්‍රමිතීන් තහවුරු කිරීම සඳහා සිදුකරනු ලබන සේවාවන්වල සහ ක්‍රියාකාරකම්වල සංකීර්ණත්වය, විවිධත්වය සහ වර්ගය සමඟ ගනුදෙනු කිරීමට ප්‍රමාණවත් වන තොරතුරු තාක්ෂණ පද්ධති පවත්වාගෙන යාම; සහ

(ඊ) එහි පාලන සැලසුම්, නිෂ්කාශනාගාරය පාලනය කරනු ලබන රීතීන්, සහ නිෂ්කාශන සාමාජිකත්වයට ඇතුළත් වීමේ උපමාන ඒ පිළිබඳ තොරතුරු මහජනයාට නොමිලේ ලබාදීම,

සිදුකරනු ලැබිය යුතු ය.

නිෂ්කාශනාගාරයක බලපත්‍රය අවලංගු කිරීම.

**35.** (1) කොමිෂන් සභාව විසින් ලිඛිත දැන්වීමක් මගින් -

(අ) දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති දින සිට බලාත්මක වන පරිදි 33 වන වගන්තිය යටතේ නිෂ්කාශනාගාරයකට ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීම; හෝ

(ආ) දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති දිනයේ සිට බලාත්මක වන පරිදි, දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි, එම පහසුකම් සැපයීම හෝ මෙහෙයවීම හෝ එම සේවාවන් සැපයීම අවසන් කිරීමට නිෂ්කාශනාගාරයට විධානය කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) පහත සඳහන් යම් අවස්ථානුගත කරුණක් සිදුවන අවස්ථාවක, එය ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා හෝ මහජන සුභසිද්ධිය සඳහා හෝ සුරැකුම්පත් ගනුදෙනු නිෂ්කාශනය සහ පියවීම නිසි පරිදි නියාමනය සඳහා එසේ කිරීම යෝග්‍ය බවට කොමිෂන් සභාව විසින් සෑහීමකට පත්වන්නේ නම් මිස, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීම හෝ විධාන නිකුත් කිරීම කොමිෂන් සභාව විසින් සිදු කරනු නොලැබිය යුතු යː-

(අ) නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශන පහසුකම් සැපයීම අවසන් කිරීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත නිෂ්කාශනාගාරය ඇවර කිරීම හෝ එසේ නැත්නම් විසුරුවා හැරීම;

(ඇ) නිෂ්කාශනාගාරය විසින් එහි බලපත්‍රයේ යම් නියම හෝ කොන්දේසි උල්ලංඝනය කරනු ලැබීම හෝ මේ පනතේ යම් වරදකට වරදකරු කරනු ලැබීම;

(ඈ) නිෂ්කාශනාගාරය විසින් මේ පනත යටතේ නිකුත් කරන ලද කොන්දේසියකට, නියමයකට හෝ විධානයකට අනුකූල වීමට අපොහොසත්වීම;

(ඉ) 33 වන වගන්තියේ කාර්ය සඳහා සපයන ලද යම් වැදගත් තොරතුරක් අසත්‍ය හෝ නොමඟ යවනසුලු ලෙස ලබා දී තිබීම හෝ එම වැදගත් තොරතුරු ලබාදීම පැහැර හැර තිබීම;

(ඊ) නිෂ්කාශනාගාරයකට එරෙහිවන නිශ්චිත ණයක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් තෘප්ත කර නොමැතිවීම;

(උ) නිෂ්කාශනාගාරයේ යම් දේපළකට අදාළව හෝ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාව තුළ හෝ පිටත, භාර ගැනුම්කරුවකු, භාරගැනුම්කරුවකු සහ කළමනාකරුවකු, ඇවරකරුවකු හෝ ඒ හා සමාන යම් තැනැත්තෙක් පත් කර තිබීම;

(ඌ) නිෂ්කාශනාගාරය විසින්, ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී එහි ණයහිමියන් සමඟ සමථයකට හෝ විධිවිධාන යෙදීමේ යෝජනා ක්‍රමයකට එළඹී තිබීම;

(එ) නිෂ්කාශනාගාරය විසින්, ස්වකීය මෙහෙයවීම යටතේ නිශ්කාශනාගාරය වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීම සඳහා කොමිෂන් සභාවට ඉල්ලුම් කර තිබීම.

(3) 2 වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා නිෂ්කාශනාගාරය නිෂ්කාශන පහසුකම් සැපයීම කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබා නොගෙන නිෂ්කාශන පහසුකම් සැපයීම සති දෙකක් ඉක්ම වූ කාලසීමාවක් සඳහා නවත්වා ඇත්නම්

නිෂ්කාශනාගාරය එම පහසුකම් සැපයීම නවත්වා ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීම හෝ විධානයක් නිකුත් කිරීම නොසලකා, කොමිෂන් සභාව විසින් -

(අ) නිෂ්කාශනාගාරයේ මෙහෙයුම් නවතා දැමීම හෝ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කර ඇති සේවාවන් සැපයීම අවසන් කිරීම සඳහා; හෝ

(ආ) ආයෝජකයන් හෝ මහජන සුභසිද්ධිය ආරක්ෂා කිරීම,

යන කාර්ය සඳහා දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි අවලංගු කිරීම හෝ විධානය මගින් බලපෑමට ලක් වී ඇති එම කටයුතු පවත්වාගෙන යාම සඳහා කොමිෂන් සභාව විසින් අවලංගු කිරීම හෝ විධානය බලාත්මක වන දින හෝ එම දිනයට පසුව නිෂ්කාශනාගාරය දිගටම පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදෙනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව (1) වන උපවගන්තිය යටතේ ක්‍රියා කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක, නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කරනු ලබන තුරු, නිෂ්කාශනාගාරයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා වසරක කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි අධ්‍යක්ෂ මණ්ඩලයක් මාස හයක කාලසීමාවක් සඳහා පත් කරනු ලැබිය හැකි ය.

(6) (4) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිෂ්කාශනාගාරයකට අවසරය ප්‍රදානය කර ඇති අවස්ථාවක දී, එම අවසරය අනුව කටයුතු සිදුකිරීම හේතුවෙන්, නිෂ්කාශනාගාරය (1) වන උපවගන්තිය උල්ලංඝනය කරනු ලැබුවේ යැයි සලකනු නොලැබිය යුතු ය.

(7) කොමිෂන් සභාව විසින් නිෂ්කාශනාගාරයට කරුණු කියා සිටීමේ අවස්ථාවක් ලබාදීමෙන් තොරව (1) වන උපවගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණය මගින් අගතියට පත් නිෂ්කාශනාගාරයක්, එම තීරණය

පිළිබඳ නිෂ්කාශනාගාරයට දැනුම්දීමෙන් පසු දින දාහතරක් ඇතුළත, අමාත්‍යවරයාට අභියාචනා කරනු ලැබිය හැකි ය.

(9) 8 වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කිරීම නොසලකමින්, මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් අමාත්‍යවරයාගේ තීරණය තෙක් තවදුරටත් බලාත්මක විය යුතු ය.

(10) (8) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ අභියාචනයක දී අමාත්‍යවරයා විසින් -

(අ) අභියාචනය පිළිගෙන බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට නියම කිරීම; හෝ

(ආ) අභියාචනය පිළිනොගැනීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(11) කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ විධානය බලාත්මක කරනු ලැබිය යුතු ය.

(12) කොමිෂන් සභාව විසින් (11) වන උපවගන්තියට යටත්ව මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් පිළිබඳව හෝ නිකුත් කරන ලද විධානයක් පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් ලබා දිය යුතු ය.

නිෂ්කාශනාගාරයක බලපත්‍රය අවලංගු කිරීමේ බලපෑම.

**36.** 35 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ නිකුත් කරන ලද විධානයක්-

(අ) 35 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමට හෝ විධානයක් නිකුත් කිරීමට පෙර හෝ 35 වන වගන්තියේ (4) වන උපවගන්තිය අදාළ වන අවස්ථාවක දී හෝ ඉන්පසුව හෝ නිෂ්කාශනාගාරය හරහා එළඹ ඇති යම් ගිවිසුමක්, ගනුදෙනුවක් හෝ සැලසුමක් වැළැක්වීම සඳහා හෝ ඊට බලපෑම් කිරීම සඳහා; හෝ

(ආ) එම ගිවිසුම, ගනුදෙනුව හෝ සැලසුම යටතේ පැන නගින යම් අයිතිවාසිකමක්, බැඳීමක් හෝ වගකීමක් සඳහා බලපෑමක් වන ලෙසට,

ක්‍රියාත්මක නොවිය යුතු ය.

**පැහැරහැරීමේ රීති.**

**37.** නිෂ්කාශනාගාරයක් විසින්, අවදානම් කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා, නිෂ්කාශන සාමාජිකයා පාර්ශ්වයක් වන සියලු හෝ යම් නොපියවූ වෙළෙඳපොළ ගිවිසුම්වලට අදාළ බැඳීම් ඉටුකිරීමට නිෂ්කාශන සාමාජිකයෙකුට නොහැකි වන්නේ නම් හෝ නොහැකි වීමට ඉඩ ඇත්නම්, පැහැර හැරීමේ රීති යටතේ පැහැර හැරීමේ නීති කෘත්‍ය ආරම්භ කරනු ලැබිය යුතු ය.

**නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ නීති කෘත්‍ය ප්‍රමුඛ වීම.**

**38.** (1) පහත දැක්වෙන -

(අ) වෙළෙඳපොළ ගිවිසුමක්;

(ආ) වෙළෙඳපොළ ගිවිසුමක් පියවීමට අදාළ නිෂ්කාශනාගාරයක රීති;

(ඇ) වෙළෙඳපොළ ගිවිසුමක් පියවීමට අදාළ නිෂ්කාශනාගාරයක රීති යටතේ කරන ලද යම් නීති කෘත්‍යයක් හෝ වෙනත් ක්‍රියාවලි;

(ඈ) වෙළෙඳපොළ ගාස්තුවක්;

(ඉ) වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයක්; හෝ

(ඊ) නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ රීති,

බුන්වත්භාවයට, වස්තු භංගත්වයට හෝ ඇවර කිරීමට අදාළව තැනැත්තකුගේ වත්කම් බෙදාගැනීමට හෝ භාරගැනුම්කරුවකු, භාර ගැනුම්කරුවකු සහ කළමනාකරුවකු හෝ එවැනිම සමාන හැකියාවකින් යුතු තැනැත්තකු යම් තැනැත්තකුගේ යම් වත්කම් සඳහා පත් කරනු ලැබ ඇති විට, එයට අදාළ වන යම් ලිඛිත නීතියක් සමග අනනුකූලතාවයක් තිබූ පමණින් නීතියෙහිලා කිසිදු ආකාරයකින් අවලංගු නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියට යටත්ව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ අදාළ ධුර දරන්නාගේ බලතල-

(අ) නිෂ්කාශනාගාරයක රීතීන් අනුව ගිවිසුමක් පියවීම; හෝ

(ආ) වෙනත් පැහැර හැරීමේ නීති කෘත්‍යයන්,

වළක්වන හෝ එයට බාධා කරන ආකාරයට ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

පැහැර හැරීමේ නීති කෘත්‍යවලට අදාළ අතිරේක විධිවිධාන.

**39.** (1) යම් අදාළ ධුර දරන්නකු විසින් ඉල්ලීමක් කිරීමේ දී පැහැර හැරීමේ නීති කෘත්‍ය විභාග වෙමින් පැවතීම හෝ පවත්වනු ලැබිය හැකි හෝ පවත්වනු ලැබ ඇති හෝ පවත්වනු ලැබිය හැකිව පැවතීම යන කරුණු මගින් බලපාන පරිදි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ස්වකීය ධුරයේ කර්තව්‍යවලට අනුකූල ආකාරයෙන්, අධිකරණය විසින් යෝග්‍ය බවට සලකන වෙනස් කිරීමක් කරමින් හෝ නිදහස් කරමින් යම් නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකි අතර ඒ අනුව, එම අදාළ ධුර දරන්නාගේ එකී කර්තව්‍ය එම නියෝගවලට යටත්වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 2007 අංක 7 දරන සමාගම් පනතේ ඇති කිසිවක් නිෂ්කාශනාගාරය මගින් යම් වෙළෙඳපොළසමපාර්ශ්වීය ඇපයක් උපලබ්ධි කිරීමේ දී සහ බැහැර කිරීමේ දී නිෂ්කාශනාගාරයක් විසින් පවරන ලද පැහැර හැරීමේ නීති කෘත්‍ය වැළැක්වීම හෝ ඒවාට බාධා කිරීම නොකරනු ලැබිය යුතු ය.

පැහැර හැරීමේ නීති කෘත්‍ය සම්පූර්ණ කිරීම පිළිබඳ වාර්තා කිරීමට වන වගකීම.

**40.** (1) යම් පැහැර හැරීමේ නීති කෘත්‍යයක් සම්පූර්ණ කිරීමෙන් පසු, නිෂ්කාශනාගාරය විසින් පහත කරුණුවලට අදාළව (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන් වෙත එක් එක් පැහැර හරින්නකුට අදාළව වාර්තාවක් සපයනු ලැබිය යුතු යː-

(අ) පැහැර හරින්නකු විසින් හෝ පැහැර හරින්නකුට ගෙවිය යුතු නිෂ්කාශනාගාරය විසින් සහතික කරන ලද යම් ශුද්ධ අගයක් ඇත්නම්, එම ශුද්ධ අගය;

(ආ) කිසිදු අගයක් එසේ නොගෙවිය යුතු බව; සහ

(ඇ) එය සුදුසු යයි සිතන පරිදි එම පැහැර හැරීමේ කාර්ය පටිපාටිවලට අදාළ වෙනත් යම් විස්තර.

(2) (1) වන උපවගන්තිය යටතේ සකස් කරන ලද වාර්තාව -

(අ) කොමිෂන් සභාවට;

(ආ) වාර්තාව අදාළ වන පැහැර හරින්නා වෙනුවෙන් ක්‍රියා කරනු ලබන අදාළ ධුර දරන්නා වෙත හෝ එම පැහැර හරින්නාගේ බූදලය වෙත; හෝ

(ඇ) (ආ) ඡේදයේ සඳහන් අදාළ ධුර දරන්නකු සඳහන් කර නොමැති විට, වාර්තාව අදාළ වන පැහැර හරින්නාට,

නොපමාව සපයනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියට අනුගාමීව කොමිෂන් සභාව වාර්තාවක් ලද අවස්ථාවක, කොමිෂන් සභාව විසින් වාර්තාව අදාළ වන පැහැර හරින්නාගේ ණය හිමියන්ගේ අවධානය පිණිස දැන්වීමක් පළකරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තියට අනුකූලව අදාළ ධුර දරන්නා වෙත හෝ පැහැර හරින්නා වෙත වාර්තාවක් ලද අවස්ථාවක, ඔහු විසින්, ඔහුගේ යම් ණය හිමියකුගේ ඉල්ලීම මත -

(අ) එම ඉල්ලීම ලැබීමෙන් දින දෙකක් ඇතුළත ණය හිමියාගේ පිරික්සුම සඳහා වාර්තාව ලබා දිය යුතු ය; හෝ

(ආ) අදාළ ධුර දරන්නා හෝ පැහැර හරින්නා විසින් තීරණය කරනු ලබන පරිදි අදාළ ගාස්තුව ගෙවීමෙන් පසු, ඉල්ලීම් කරන ලද පරිදි ණය හිමියාට එම මුළු වාර්තාව හෝ ඉන් කොටසක් සපයනු ලැබිය යුතු ය.

(5) (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල වාර්තාවක් යන්නෙන් එහි පිටපතක් ඇතුළත් වේ.

පැහැර හැරීමේ නීති කෘත්‍ය සම්පූර්ණ කිරීමෙන් පසුව ගෙවිය යුතු ශුද්ධ මුදල් ප්‍රමාණය.

**41.** (1) පැහැර හැරීමේ නීති කෘත්‍ය සම්පූර්ණ කළ පසු, 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නිෂ්කාශනාගාරයක් විසින් සහතික කරන ලද ශුද්ධ මුදල් ප්‍රමාණය පැහැර හරින්නා විසින් හෝ පැහැර හරින්නා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානවල කෙසේ සඳහන් වුව ද, භාර ගැනුම්කරුවකු සඳහා හෝ ඈවර කිරීමක් සඳහා නියෝගයක් සිදු කර ඇති අවස්ථාවක හෝ ස්වේච්ඡා විසුරුවා හැරීමක් සඳහා යෝජනාවක් සම්මත කරන ලද අවස්ථාවක, (1)

වන උපවගන්තියේ සඳහන් කරන ලද ශුද්ධ අගය පැහැර හරින්නාට හිමිවිය යුතු වන්නේ නම් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ඈවර කිරීමේ නඩු කටයුතුවලට අදාළව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

යම් ගනුදෙනුවක් තුළින් හටගන්නා යම් මුදල් ප්‍රමාණ අයකර ගැනීම සඳහා අදාළ ධුර දරන්නාගේ අයිතිවාසිකම.

**42.** (1) නිෂ්කාශන සාමාජිකයෙක් ("පළමු නිෂ්කාශන සාමාජිකයා") විසින් (3) වන උපවගන්තියේ විස්තර කරන ලද අවස්ථාවන්හි වෙනත් නිෂ්කාශන සාමාජිකයකුට ("දෙවන නිෂ්කාශන සාමාජිකයා") අධිඅගයකට සුරැකුම්පත් විකුණන්නේ නම්, හෝ එම සාමාජිකයාගෙන් අඩු අගයකට සුරැකුම්පත් මිල දී ගන්නේ නම් සහ ඉන්පසු අදාළ ධුර දරන්නා විසින්-

(අ) දෙවන නිෂ්කාශන සාමාජිකයා;

(ආ) විකිණීමේ දී හෝ මිල දී ගැනීමේ දී දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා; හෝ

(ඇ) දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ හෝ (ආ) ඡේදයේ සඳහන් කර ඇති තැනැත්තාගේ බූදලය,

වෙනුවෙන් ක්‍රියා කරන්නේ නම් අධිකරණය වෙනත් ලෙසකින් නියෝග කරන්නේ නම් මිස, අදාළ ධුර දරන්නා විසින් පළමු නිෂ්කාශන සාමාජිකයාගෙන් හෝ පළමු නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාගෙන් පළමු නිෂ්කාශන සාමාජිකයා හෝ නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා විසින් සිදු කරන ලද විකිණීම හෝ මිල දී ගැනීම යටතේ ලබා ගන්නා ලද හඳුනාගත් ලාභයට සමාන ප්‍රමාණයක් අය කර ගනු ලැබිය හැකි ය.

(2) විකිණීම හෝ මිල දී ගැනීම නිෂ්කාශනාගාරයේ රීතීන්ට අනුව ඉටු කරනු ලැබ වෙළෙඳපොළ ගිවිසුමක් මගින් ප්‍රතියෝජනය කරනු ලැබ තිබුණ ද හඳුනාගත් ලාභයට සමාන ප්‍රමාණයක් අයකර ගනු ලැබිය හැකි ය.

(3) විකිණීමක් හෝ මිල දී ගැනීමක් සඳහා (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති අවස්ථා-

(අ) දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාට අදාළව හඳුනාගන්නා ලද සිදුවීමක් සිදුවී ඇති විට; සහ

(ආ) (i) දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාට අදාළව හඳුනා ගන්නා ලද අවස්ථාවක් ඇතිවීමට ඉඩ ඇති බව පළමුවන නිෂ්කාශන සාමාජිකයා දැන සිටීම හෝ සාධාරණව දැන ගැනීමට හැකි අවස්ථාවක; හෝ

(ii) දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයාට හඳුනා ගන්නා ලද සිදුවීමක් සිදුවීමට ඉඩ ඇති බව පළමුවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා විසින් දැන සිටි හෝ සාධාරණව දැන ගැනීමට හැකි අවස්ථාවක,

සහ විකිණීම හෝ මිල දී ගැනීමට එළඹෙන ලද දිනයට ඉක්බිතිවම වන මාස හයක කාලසීමාව ඇතුළත හඳුනාගන්නා ලද අවස්ථාවට සිදු වී ඇති විට දී,

විය යුතු ය.

(4) මේ වගන්තියේ -

(අ) දෙවන නිෂ්කාශන සාමාජිකයකුට අදාළව හෝ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද විකිණීමකට හෝ මිල දී ගැනීමකට අදාළ වන්නා වූ හෝ වන තැනැත්තකු වන්නා වූ හෝ තැනැත්තකුට අදාළ වන "හඳුනාගන්නා ලද අවස්ථාවක්" යන්නෙන් -

(i) අවස්ථාවෝචිත පරිදි දෙවන නිෂ්කාශන සාමාජිකයා හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා විසින් සිදු කරන ලද වස්තු භංගත්ව ක්‍රියාවක්;

(ii) 2007 අංක 7 දරන සමාගම් පනතට අනුව, අවස්ථාවෝචිත පරිදි, දෙවන නිෂ්කාශන සාමාජිකයාට හෝ දෙවන නිෂ්කාශන සාමාජිකයාගේ නියෝජකට අදාළව කැඳවන ලද ණය හිමියන්ගේ රැස්වීමක්; හෝ

(iii) අධිකරණයක් විසින් අවස්ථාවෝචිත පරිදි නිෂ්කාශන සාමාජිකයා හෝ නිෂ්කාශන සාමාජිකයාගේ ප්‍රධානයා විසුරුවා හැරීම සඳහා පෙත්සමක් ඉදිරිපත් කිරීම;

අදහස් කරනු ලැබේ;

(ආ) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද විකිණීමකට හෝ මිල දී ගැනීමකට අදාළවන "හඳුනාගන්නා ලද ලාභය" යන්නෙන් -

(i) විකිණීමේ හෝ මිල දී ගැනීමේ විෂයය වන්නා වූ සුරැකුම්පත්වල වෙළෙඳපොළ අගයේ; සහ

(ii) විකිණීම හෝ මිල දී ගැනීමට එළඹුනු අවස්ථාවේ දී විකිණීම හෝ මිල දී ගැනීම සඳහා වන ප්‍රතිෂ්ඨාවේ අගය,

අතර වෙනස අදහස් වේ.

ප්‍රධානයා වශයෙන් නිෂ්කාශන සාමාජිකයා යම් ගනුදෙනුවලට පාර්ශ්වයක් වීම.

**43.** වෙළෙඳපොළ ගිවිසුමක් ඇතුළුව නිෂ්කාශනාගාරයක් සමඟ යම් ගනුදෙනුවකට එළඹෙන නිෂ්කාශන සාමාජිකයකු එම ගිවිසුමට නියෝජිතයකු වශයෙන් පාර්ශ්වයක් වුව ද නිෂ්කාශනාගාරය මඟින් හෝ එයට එරෙහිව වන හිමිකම්පෑමක් හෝ ඉල්ලීමක්, සිවිල් නඩු කටයුත්තක් ඇතුළු සියලු කාර්ය සඳහා වෙනත් යම් නීතියක විධිවිධානයක කෙසේ සඳහන් වුව ද, එම ගනුදෙනුව සඳහා නියෝජිතයකු වශයෙන් නොව ප්‍රධානයා වශයෙන් සලකනු ලැබිය යුතු ය.

නිෂ්කාශනාගාරයකට සපයන ලද වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇප.

**44.** වෙනත් යම් නීතියක විධිවිධානවල කෙසේ සඳහන් වුව ද, නිෂ්කාශනාගාරයක රීතිවලට අනුකූලව නිෂ්කාශන සාමාජිකයකු විසින් වෙළෙඳපොළ ගිවිසුමක් පියවීම සඳහා හෝ වෙළෙඳපොළ ගාස්තුවක් යටතේ නිෂ්කාශනාගාරයකට වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයක් සපයන ලද අවස්ථාවක, නිෂ්කාශනාගාරයට සපයන ලද එම වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයේ යම් අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවයක් සම්බන්ධයෙන් කිසිදු සිවිල් නඩු කටයුත්තක්, හිමිකම් පෑමක් හෝ ඉල්ලීමක් නිෂ්කාශනාගාරයට එරෙහිව අනුමත නොකළ යුතු ය.

සමපාර්ශ්වීය වෙළෙඳපොළ ඇපය වෙළෙඳ පොළ ගාස්තුවකට අදාළ කිරීම.

**45.** නිෂ්කාශනාගාරය විසින් නිෂ්කාශනාගාර රීතීන්හි නිශ්චිතව දක්වන ලද කාර්ය පටිපාටියට අනුව වෙළෙඳපොළ ගිවිසුමකට හෝ වෙළෙඳපොළ ගාස්තුවකට අදාළ සමපාර්ශ්වීය ඇපය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

පියවීමේ දී සුරැකුම්පත් මාරුකිරීම.

**46.** (1) යම් උපදේශයක් වෙළෙඳපොළ ගිවිසුමක් පියවීමේ කාර්ය සඳහා වන්නේ නම් හෝ නිෂ්කාශනාගාරයේ රීතීන්ට අනුව

වෙළෙඳපොළ ගිවිසුමක් සමඟ වෙනස් ආකාරයකින් ගනුදෙනු කරනු ලැබීම සඳහා වන්නේ නම් මධ්‍යම තැන්පතුගාරය විසින් ගිණුම් හිමියකුගේ සුරැකුම්පත් ගිණුමක් තුළට හෝ පිටතට සුරැකුම්පත් මාරුකිරීම සඳහා නිෂ්කාශනාගාරයෙන් ලැබෙන උපදෙසක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) නිෂ්කාශනාගාරයක් විසින් (1) වන උපවගන්තිය යටතේ වෙළෙඳපොළ ගිවිසුමකට පාර්ශ්වයක් වන ගිණුම් හිමියකුට අදාළ වන හෝ නිෂ්කාශන සාමාජිකයෙක් පාර්ශ්වයක් බවට පත් වී ඇති වෙළෙඳපොළ ගිවිසුමක් ඇති කරනු ලබන වෙළෙඳාමක් ඇති කිරීමට නිෂ්කාශන සාමාජිකයකුට උපදෙස් ලබා දී ඇති ගිණුම් හිමියකුට අදාළ වන සුරැකුම්පත් ගිණුමකට අදාළව පමණක් උපදෙසක් ලබා දිය යුතු ය.

(3) (1) වන උපවගන්තියට අනුව මධ්‍යම තැන්පතුගාරයක් විසින් හෝ වෙළෙඳපොළ ගිවිසුමකට අනුව ගිණුම් හිමියකුගේ සුරැකුම්පත් ගිණුමට හෝ ගිණුමෙන් යම් සුරැකුම්පත් හුවමාරුවක් සිදු කරන ලද අවස්ථාවක, රීතීන් යටතේ සලසන ලද ආකාරයට මිස එම සුරැකුම්පත්හි කිසිදු හිමිකමක් ගිණුම් හිමියාට හිමි නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තියට අනුව ගිණුම් හිමියකුගේ සුරැකුම්පත් ගිණුමට හෝ ගිණුමෙන් සුරැකුම්පත් හුවමාරුවක් සිදුකරන ලද අවස්ථාවක, මධ්‍යම තැන්පතුගාරයක් විසින් එම තැන්පත්කරුගේ නඩුකරයකට හෝ හිමිකම් පෑමකට හෝ එම තැන්පත්කරුට සිදු වූ හානියට වගකීමට යටත් නොවිය යුතු ය.

සුරැකුම්පත් මිලට ගැනීම සහ විකිණීම.

**47.** (1) යම් වෙළෙඳපොළ ගිවිසුමක් පියවීම සඳහා හෝ පැහැර හැරීමේ නීති කෘත්‍ය පහසු කරලීම සඳහා හෝ නිෂ්කාශනාගාරය වෙනුවෙන් අවස්ථාවෝචිත පරිදි සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සිදු කිරීමට හෝ යම් වෙළෙඳපොළ ගාස්තුවක අඩංගු වන යම් වත්කමක් හෝ වෙළෙඳපොළ සමපාර්ශ්වීය ඇපයක් ලෙස සපයා ඇති යම් වත්කමක් උපලබ්ධි කිරීමට හෝ නිෂ්කාශනාගාරයක් විසින් විනිමය ස්ථානයකට නියම කරනු ලැබිය හැකි අතර විනිමය ස්ථානය විසින් එවැනි යම් උපදෙසක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියට අනුව විනිමය ස්ථානයක් විසින් නිෂ්කාශනාගාරයක් වෙනුවෙන් සුරැකුම්පත් විකිණීමක් හෝ මිල දී

ගැනීමක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක, යම් තැනැත්තකුගේ නඩුකරයකට හෝ යම් තැනැත්තකුට සිදු වූ හානියට, වගකීමට විනිමය ස්ථානය යටත් නොවිය යුතු ය.

අපරාධමය සහ සිවිල් වගකීම් සඳහා විත්තිවාචක.

**48.** (1) බැඳීමක් ක්‍රියාත්මක කිරීමකට හෝ ඒ සඳහා කරන ලදැයි අදහස් කරන ලද ක්‍රියාත්මක කිරීමක දී හෝ සිදු කිරීම පැහැර හැරීමක දී ඒ සම්බන්ධව සාධාරණ සැලකිල්ලකින් සහ සද්භාවයෙන් කටයුතු සිදු කිරීම-

(අ) යම් පැහැර හැරීමේ නීති කෘත්‍යයක් සම්බන්ධව නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ රීති යටතේ සිදු කරන ලද බලතල බෙදාහැරීම මත ක්‍රියා කරන ලද තැනැත්තකුට; හෝ

(ආ) (i) (අ) ඡේදයේ සඳහන් කරන ලද තැනැත්තාගේ අධ්‍යක්ෂක මණ්ඩලයේ යම් සාමාජිකයකු; හෝ

(ii) (අ) ඡේදයේ සඳහන් කරන ලද තැනැත්තා විසින් පිහිටුවන ලද යම් කමිටුවක යම් සාමාජිකයකු,

ඇතුළත්ව, (අ) ඡේදයේ සඳහන් කරන ලද තැනැත්තෙක් වෙනුවෙන් ක්‍රියාකරන යම් තැනැත්තකුට,

අපරාධමය හෝ සිවිල් වගකීමක් සම්බන්ධ නඩු කටයුත්තක දී විත්ති වාචකයක් විය යුතු ය.

(2) අදාළ ධුර දරන්නා විසින් බලපත්‍රලාභී නිෂ්කාශනාගාරයක පැහැර හැරීමේ රීතීන්ට අනුව කටයුතු කළයුතු යම් පැහැර හරින්නකුගේ යම් දේපළකට අදාළව ක්‍රියාමාර්ගයක් ගනු ලබන අවස්ථාවක සහ අදාළ ධුර දරන්නා විසින් ඔහුට එම ක්‍රියාමාර්ගයට එළඹීමට අයිතිය ඇති බවට සාධාරණව විශ්වාස කරනු ලබන හෝ විශ්වාස කිරීමට සාධාරණ පදනම් ඇති අවස්ථාවක, අලාභය හෝ පාඩුව අදාළ ධුර දරන්නාගේ නොසැලකිල්ල හේතුවෙන් සිදු වන ලද තාක් දුරට හැර, අදාළ ධුර දරන්නාගේ ක්‍රියාමාර්ගයක් හේතුවෙන් හටගන්නා ලද යම් අලාභයකට හෝ පාඩුවකට අදාළ ව, අදාළ ධුර දරන්නා විසින් කිසිදු තැනැත්තකුට වගකියනු නොලැබිය යුතු ය.

## 3 වන පරිච්ඡේදය

## මධ්‍යම තැන්පතුගාරය

**බලපත්‍ර නොලත් මධ්‍යම තැන්පතුගාරයක් ක්‍රියාත්මක කිරීමට එරෙහි තහනම.**

**49.** (1) යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව සුරැකුම්පත් යම් විනිමය ස්ථානයක ලැයිස්තුගතකර ඇති වුව ද, නැති වුව ද, සුරැකුම්පත් හැසිරවීම සඳහා මධ්‍යම තැන්පතුගාරයක් පිහිටුවීම, පවත්වාගෙනයාම, ක්‍රියාත්මක කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකරුවකු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

**මධ්‍යම තැන්පතුගාරයක් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම් කිරීම.**

**50.** (1) මධ්‍යම තැන්පතුගාරයක් පිහිටුවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රයක් සඳහා කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ ආකෘතියකින් සහ කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරන ලද ගාස්තුව සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මධ්‍යම තැන්පතුගාරයක් පිහිටුවීමට හෝ ක්‍රියාත්මක කිරීමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමක් සංස්ථාවකට පමණක් කරනු ලැබිය හැකිය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් මධ්‍යම තැන්පතුගාරයේ රීතීන්හි පහත කරුණුවලට අදාළ ව ප්‍රමාණවත් විධිවිධාන තිබිය යුතු ය:-

(අ) සුරැකුම්පත් තැන්පත් කිරීම, රඳවා ගැනීම, ආපසු ගැනීම හෝ මාරු කිරීම හෝ සුරැකුම්පත් ලේඛනයේ සටහන් කිරීම කරනු ලැබිය හැකි කොන්දේසි;

(ආ) තැන්පත් කරන ලද සුරැකුම්පත්වල ගනුදෙනු කිරීමේ පිළිවෙළ;

(ඈ) තැන්පත් කරන ලද සුරැකුම්පත් පියවීම සඳහා පහසුකම් සැලසීම;

(ඇ) ගිණුම් හිමියන්ගේ සබඳතා ආරක්ෂා කිරීම සහ තැන්පත් කරන ලද සුරැකුම්පත්වල සහ එහි ගනුදෙනුවල තොරතුරු ආරක්ෂා කිරීම සහ පාලනය කිරීම;

(ඉ) තැන්පතුධාරී සහභාගිවන්නන් ඇතුළත් කර ගැනීම සඳහා විනිවිදභාවයෙන් යුක්ත සහ වෙනස්කම් නොකරන උපමාන සහ ඇතුළත් කරගත හැකි තැන්පතුධාරී සහභාගිවන්නන්ගේ වර්ග;

(ඊ) ඉල්ලුම්කාර සමාගමේ රීතීන් බලාත්මක කිරීම සඳහා සහ කොන්දේසි අධීක්ෂණය කිරීම සඳහා;

(උ) මධ්‍යම තැන්පතුගාරයේ රීතීන් හා අනුකූලවීමට අසමත්වීම හේතුවෙන් තැන්පතුධාරී සහභාගිවන්නන් ඉවත් කිරීම, ඔවුන් අත්හිටුවීම, දඩ නියම කිරීම හෝ විනය පාලනය කිරීම;

(ඌ) මධ්‍යම තැන්පතුගාරය සහ තැන්පතුධාරී සහභාගිවන්නන් අතර සහ තැන්පතුධාරී සහභාගිවන්නන් අතර ගැටුම් සමථය කිරීම; සහ

(එ) ආයෝජකයන්ට අයත් සුරැකුම්පත් තැන්පතුධාරී සහභාගිවන්නන්ගේ සුරැකුම්පත්වලින් වෙන් කරන ලද බව තහවුරු කිරීම.

(4) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම්කරුවකු විසින් ඉල්ලීමට අදාළව අවශ්‍ය වන්නේ යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් තොරතුරු සපයනු ලැබිය යුතු ය.

(5) යෝජිත මධ්‍යම තැන්පතුගාරය සතුව සියලු අවස්ථාවන්හි දී -

(අ) එහි ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් සහ නිසි උපකරණවලින් සැදුම්ලත් පරිශ්‍ර;

(ආ) එහි ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සඳහා සමර්ථ කාර්ය මණ්ඩලයක්; සහ

(ඇ) හදිසි අවස්ථාවලට මුහුණදීම සඳහා ප්‍රමාණවත් හැකියාව, ආරක්ෂා සැලසුම් සහ පහසුකම් සහිත ස්වයංක්‍රීය පද්ධති,

සැපයීම තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍යමය, මානව සහ වෙනත් සම්පත් තිබිය යුතු ය.

(6) මහජන සුභසිද්ධිය උදෙසා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළේ නිසි නියාමනය සඳහා සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන නියම හෝ කොන්දේසිවලට යටත්ව මධ්‍යම තැන්පතුගාරය පිහිටුවීමට හෝ ක්‍රියාත්මක කිරීමට අයදුම්කරුට බලපත්‍රයක් ප්‍රදානය කළ හැකි ය.

(7) (6) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවල ව්‍යාප්තියට සීමා කිරීමකින් තොරව, කොමිෂන් සභාව විසින් ආයෝජකයන්ගේ සුභසිද්ධිය උදෙසා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළේ නිසි නියාමනය සඳහා සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත්වන්නේ නම්, නියම සහ කොන්දේසි සංශෝධනය කිරීම, අහෝසි කිරීම හෝ නියම හෝ කොන්දේසි පැනවීම කළ හැකි ය.

**51.** (1) මධ්‍යම තැන්පතුගාරයක් -

මධ්‍යම තැන්පතුගාරයේ කාර්යයන්.

(අ) සුරැකුම්පත් හැසිරවීම සඳහා සුරක්ෂිත, ඵලදායි සහ කාර්යක්ෂම ක්‍රියා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම;

(ආ) එහි ව්‍යාපාර සහ මෙහෙයුම් හා සම්බන්ධ යම් අවදානම් විචක්ෂණ ලෙස කළමනාකරණය කිරීම; සහ

(ඇ) ගිණුම් හිමියන්ගේ ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතාවයට විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුභසිද්ධිය උදෙසා කටයුතු කිරීම,

කළ යුතු ය.

(2) වෙනත් යම් නීතියක විධිවිධානවල කෙසේ සඳහන් වුව ද, මධ්‍යම තැන්පතුගාරයේ අධ්‍යක්ෂවරයකුගේ වගකීම විය යුත්තේ ගිණුම් හිමියන්ගේ ආරක්ෂාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වමින් මහජන සුභසිද්ධිය උදෙසා සෑම අවස්ථාවක දී ම කටයුතු කිරීම වන අතර, මේ වගකීම සහ වෙනත් යම් නීතියක විධිවිධාන යටතේ

වන අධ්‍යක්ෂවරයාගේ වගකීම් අතර ගැටුමක් ඇති වන අවස්ථාවක දී මේ පනත යටතේ වන වගකීම බලපැවැත්විය යුතු ය.

මධ්‍යම තැන්පතුගාරයක බලපත්‍රය අවලංගු කිරීම.

**52.** (1) කොමිෂන් සභාව විසින් ලිඛිත දැන්වීමක් මගින් -

(අ) දැන්වීමේ නිශ්චිතව දක්වන ලද දිනයේ සිට බලාත්මක වන පරිදි 50 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීමට; හෝ

(ආ) දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනයේ සිට බලාත්මක වන පරිදි, දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති පරිදි එකී පහසුකම් සැපයීම හෝ එකී සේවාවන් සැපයීම අවසන් කිරීම, ක්‍රියාත්මක කිරීම අවසන් කිරීමට,

මධ්‍යම තැන්පතුගාරයට විධාන කළ හැකි ය.

(2) පහත අවස්ථානුගත කරුණු සිදුවන අවස්ථාවක දී, ආයෝජකයන්ගේ ආරක්ෂාව සඳහා හෝ මහජන සුභසිද්ධිය සඳහා හෝ සුරැකුම්පත් වෙළෙඳපොළේ නිසි නියාමනය සඳහා එසේ කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සෑහීමට පත්වන්නේ නම් මිස, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානයක් නිකුත් කිරීම කොමිෂන් සභාව විසින් නොකළ යුතු ය:-

(අ) සුරැකුම්පත්වල මධ්‍යම හැසිරවීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම මධ්‍යම තැන්පතුගාරය විසින් අවසන් කරන ලද අවස්ථාවක දී;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ පිටත දී මධ්‍යම තැන්පතුගාරය ගණන් බේරා වසා දමන ලද හෝ විසිරුවා හරිනු ලබන අවස්ථාවක දී;

(ඇ) මධ්‍යම තැන්පතුගාරය, එහි බලපත්‍රයේ යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝනය කරනු ලබන හෝ මේ පනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලබන අවස්ථාවක දී;

(ඈ) මධ්‍යම තැන්පතුගාරය, මේ පනත යටතේ නිකුත් කරන ලද කොන්දේසියක්, අවශ්‍යතාවයක් හෝ විධානයක් උල්ලංඝනය කරනු ලැබ ඇති අවස්ථාවක දී;

(ඉ) 50 වන වගන්තියේ කාර්යය සඳහා සපයන ලද වැදගත් තොරතුරක් අසත්‍ය හෝ නොමඟ යවන සුලු වන හෝ වැදගත් තොරතුරක් සපයා නොමැති අවස්ථාවක දී;

(ඊ) මධ්‍යම තැන්පතුගාරයට එරෙහි නිශ්චිත ණයක් සම්පූර්ණයෙන් හෝ කොටසක් සම්පූර්ණයෙන් තෘප්ත කර නොමැති අවස්ථාවක දී;

(උ) මධ්‍යම තැන්පතුගාරයේ යම් දේපළක් සම්බන්ධයෙන් හෝ දේපළකට අදාළ ව, ශ්‍රී ලංකාව තුළ දී හෝ පිටත දී, භාර ගැනුම්කරුවකු, භාර ගැනුම්කරුවකු සහ කළමනාකරුවකු, ඈවරකරුවෙකු හෝ සමාන තැනැත්තකු පත්කරනු ලැබ ඇති අවස්ථාවක දී;

(ඌ) මධ්‍යම තැන්පතුගාරය ශ්‍රී ලංකාව තුළ දී හෝ පිටත දී, එහි ණය හිමියන් සමඟ සමථයකට හෝ යෝජනා ක්‍රමයකට එළඹී තිබෙන අවස්ථාවක දී;

(එ) මධ්‍යම තැන්පතුගාරය, සිය මෙහෙයවීම මත, එයට ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීම සඳහා ඉල්ලුම් කිරීම සහ එසේ අවලංගු කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව සිතන අවස්ථාවක දී.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්යය සඳහා, මධ්‍යම තැන්පතුගාරය විසින් සුරැකුම්පත්වල මධ්‍යම හැසිරවීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබා නොගෙන සති දෙකක් ඉක්ම වූ කාලසීමාවක් සඳහා නවත්වා ඇත්නම් මධ්‍යම තැන්පතුගාරය එම පහසුකම සැපයීම නවත්වා ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානයක් නිකුත් කිරීම නොසලකා, කොමිෂන් සභාව විසින් -

(අ) මධ්‍යම තැන්පතුගාරයේ මෙහෙයුම් නවතාලීමට හෝ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති සේවාවන් සැපයීම අවසන් කිරීම;

(ආ) තැන්පතුකරුවන් ආරක්ෂා කිරීම; හෝ

(ඇ) මහජන සුභසිද්ධිය,

යන කාර්යය සඳහා දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි අවලංගු කිරීම හෝ විධානය මඟින් බලපෑමට ලක් වී ඇති එම කටයුතු පවත්වාගෙන යාම සඳහා, අවලංගු කිරීම හෝ විධානය බලාත්මක වන දිනයේ හෝ එම දිනයට පසු දිනයේ සිට කරගෙන යාමට මධ්‍යම තැන්පතුගාරයට කොමිෂන් සභාව විසින් අවසර ලබා දිය හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලබන අවස්ථාවක දී, නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරනු ලබන තුරු මධ්‍යම තැන්පතුගාරයේ කටයුතු කළමනාකරණය කිරීමට, අතුරු අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් කිරීම සුදුසු යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන අවස්ථාවක දී, වසර එකක කාලයක් සඳහා දීර්ඝ කළ හැකි අතුරු අධ්‍යක්ෂ මණ්ඩලයක් මාස හයක කාලයක් සඳහා පත් කරනු ලැබිය හැකි ය.

(6) (4) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් මධ්‍යම තැන්පතුගාරයට අවසරය ප්‍රදානය කර ඇති අවස්ථාවක දී, එම අවසරය අනුව එහි කටයුතු ක්‍රියාත්මක කිරීම යන හේතුව මත, මධ්‍යම තැන්පතුගාරය (1) වන උපවගන්තිය උල්ලංඝනය කරනු ලැබුවේ යැයි සලකනු නොලැබිය යුතු ය.

(7) කොමිෂන් සභාව විසින්, මධ්‍යම තැන්පතුගාරයට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීමෙන් තොරව (1) වන උපවගන්තිය යටතේ යම් පියවරක් නොගත යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ගනු ලැබූ තීරණයකින් අගතියට පත් මධ්‍යම තැන්පතුගාරයකට, එම තීරණය දැනුම් දෙනු ලැබීමෙන් දින දාහතරක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ අභියාචනාවක් ගොනු කිරීම නොසලකා, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ගනු ලබන යම් තීරණයක්, අමාත්‍යවරයාගේ තීරණය ලැබෙනතුරු බලාත්මක විය යුතු ය.

(10) (8) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ අභියාචනයක දී අමාත්‍යවරයා විසින් -

(අ) අභියාචනය පිළිගෙන බලපත්‍රය අවලංගු කිරීම හෝ විධානය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට නියම කිරීම; හෝ

(ආ) අභියාචනය පිළිනොගැනීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(11) කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ විධානය බලාත්මක කරනු ලැබිය යුතු ය.

(12) (11) වන උපවගන්තියට යටත්ව කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද යම් විධානයක් පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් ලබා දිය යුතු ය.

මධ්‍යම තැන්පතුගාරයේ බලපත්‍රය අවලංගු කිරීමේ බලපෑම.

**53.** 52 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන යම් බලපත්‍රයක් අවලංගු කිරීමක් හෝ නිකුත් කරන ලද විධානයක් -

(අ) 52 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කිරීමට හෝ විධානයක් නිකුත් කිරීමට පෙර හෝ 52 වගන්තියේ (4) වන උපවගන්තිය අදාළ වන අවස්ථාවක දී හෝ ඉන්පසුව මධ්‍යම තැන්පතුගාරය විසින් මෙහෙයවනු ලබන පරිගණක පද්ධතියක් මගින් එළඹෙන ලද ගිවිසුමක්, ගනුදෙනුවක් හෝ සැලසුමක් වැළැක්වීමට හෝ බලපෑම් කිරීමට; හෝ

(ආ) එවැනි ගිවිසුමක්, ගනුදෙනුවක් හෝ සැලසුමක් යටතේ පැනනගින යම් අයිතියකට, බැඳීමකට, වගකීමකට බලපෑමක් වන ලෙසට,

ක්‍රියාත්මක නොවිය යුතු ය.

සුරැකුම්පත් ගිණුම.

**54.** මධ්‍යම තැන්පතුගාරය විසින් විවිධ වර්ගයන්හි සුරැකුම්පත් ගිණුම් පිහිටුවිය හැකි අතර, මධ්‍යම තැන්පතුගාරයේ විවෘත කරන

ලද එවැනි සෑම සුරැකුම්පත් ගිණුමක්ම තැන්පත් කරන ලද සුරැකුම්පත්හි අර්ථලාභී හිමිකරුගේ නමින් හෝ නාමිකයකුගේ නමින් තිබිය යුතු ය.

මධ්‍යම සුරැකුම්පත් තැන්පතුගාරයේ සහතිකවල ගොනු කරන ලද පොත් සටහන් සුරැකුම්පත්.

**55.** මධ්‍යම තැන්පතුගාරයේ පවතින සියලු සුරැකුම්පත් ගනුදෙනු, භෞතික බෙදාහැරීමකින් තොරව, මධ්‍යම තැන්පතුගාරයේ ගිණුම්වල පොත් සටහන් මාර්ගයෙන් සෑදිය යුතු ය.

තැන්පතුකරුගේ ගිණුමේ සටහන් ඇතුළත් කිරීම.

**56.** මධ්‍යම තැන්පතුගාරය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමක සටහන් ඇතුළත් කිරීම, වාර්තා කිරීම, එම කාරණය පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සත්‍යභාවයේ සාක්ෂියක් විය යුතු ය.

මධ්‍යම තැන්පතුගාරය විසින් භාරයක් ලෙස දරනු ලබන සුරැකුම්පත්වල බලපෑම.

**57.** (1) මධ්‍යම තැන්පතුගාරය විසින් එහි සුරැකුම්පත් දරන්නන් වෙනුවෙන් සුරැකුම්පත් භාරයක් ලෙස දරන අවස්ථාවක දී කවර තැනැත්තකුගේ අර්ථලාභය සඳහා භාරයකින් එම සුරැකුම්පත් දරනු ලබන්නේ නම් එම තැනැත්තා-

(අ) එකී සුරැකුම්පත්වල දරන්නා ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) ඔහු එම සුරැකුම්පත් දරන්නා නම්, අවස්ථාවෝචිත පරිදි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ එම සුරැකුම්පත්වලට අදාළව හෝ ඒ මගින් පැනනගින සියලු අයිතීන් සහ වරප්‍රසාදයන් විඳිය යුතු අතර, එයට අදාළ හෝ එවැනි සියලු වගකීම් සහ බැඳීම්වලට යටත් විය යුතු ය.

(2) නාමිකයෙකු විසින් දරනු ලබන මධ්‍යම තැන්පතුගාරයේ ගිණුම්වල පවත්වාගෙන යනු ලබන සුරැකුම්පත්වලට අනුබද්ධිත අයිතීන් සහ වගකීම්, මධ්‍යම තැන්පතුගාරයේ අදාළ ගිණුමේ අර්ථලාභී හිමිකරු ලෙස හඳුනාගෙන ඇති තැනැත්තා, එම සුරැකුම්පත්වල දරන්නා ලෙස ක්‍රියාත්මක කළ යුතු ය.

(3) තැන්පතුධාරී සහභාගිකරුවකුගේ යම් බුන්වත්භාවය හෝ වස්තුභංගත්ව පිළිබඳ නඩු කටයුත්තකට අදාළව භාර ගැනුම්කරුවකුගේ, භාර ගැනුම්කරුවකුගේ හෝ කළමනාකරුවකුගේ, ඇවරකරුවකුගේ හෝ යම් සමාන තැනැත්තකුගේ පත්කිරීම, එම මධ්‍යම තැන්පතුගාරය විසින් භාරයක් ලෙස දරන ඒ තැන්පතුධාරී සහභාගිවන්නාගේ සුරැකුම්පත්වල දරන්නන්ගේ අයිතීන්ට බලපෑමක් නොවිය යුතු ය.

වලංගු කිරීම.

**58.** මේ පනත බලපැවැත්වීමට ප්‍රථමව තැන්පතුගාරය විසින් කරන ලද යම් සුරැකුම්පත් ලියාපදිංචි කිරීමක්, මේ පනතේ විධිවිධාන සහ මේ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානවලට අනුකූල නොවන ලෙස එකී ලියාපදිංචි කිරීම සිදු කිරීම යන හේතුව මත පමණක් අවලංගුවීමට හේතු නොවිය යුතු ය.

4 වන පරිච්ඡේදය

**සාමාන්‍ය විධිවිධාන**

වෙළෙඳපොළ ආයතනයක රීති.

**59.** (1) වෙළෙඳපොළ ආයතනයක රීති, කොමිෂන් සභාව විසින් අනුමත කළ යුතු අතර කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද එවැනි වෙළෙඳපොළ ආයතනයේ රීති -

(අ) වෙළෙඳපොළ ආයතනය සහ එක් එක් සුරැකුම්පත් නිකුත් කරන්නා අතර;

(ආ) වෙළෙඳපොළ ආයතනය සහ අවස්ථාවෝචිත පරිදි එක් එක් වෙළෙඳපොළ සහභාගිවන්නෙක්, නිෂ්කාශන සාමාජිකයෙක් හෝ තැන්පතුධාරී සහභාගිවන්නෙක් අතර;

(ඇ) එක් එක් සුරැකුම්පත් නිකුත්කරන්නා සහ එක් එක් වෙළෙඳපොළ සහභාගිවන්නෙක් අතර; සහ

(ඈ) වෙළෙඳපොළ සහභාගිවන්නන්, නිෂ්කාශන සාමාජිකයන් හෝ තැන්පත්ධාරී සහභාගීවන්නන් අතර,

වන බවට සැළකිය යුතු අතර අනුගම්‍ය ගිවිසුමක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

(2) වෙළෙඳපොළ ආයතනය, එක් එක් සුරැකුම්පත් නිකුත් කරන්නන්, එක් එක් වෙළෙඳපොළ සහභාගිවන්නන්, නිෂ්කාශන සාමාජිකයන් සහ තැන්පතුධාරී සහභාගිවන්නන් පිළිවෙළින් අවස්ථාවෝචිත පරිදි එම විධිවිධාන වෙළෙඳපොළ ආයතනයකට, සුරැකුම්පත් නිකුත් කරන්නකුට, වෙළෙඳපොළ සහාගිවන්නකුට, නිෂ්කාශන සාමාජිකයකුට හෝ තැන්පතුධාරී සහභාගිවන්නකුට අදාළ වන තාක්දුරට රීතිවල විධිවිධාන යටතේ වන බැඳීම් පිළිපැදීම සහ සිදුකිරීම කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන තාක් දුරට, වෙළෙඳපොළ ආයතනයක රීතීන්, කොමිෂන් සභාවේ පූර්ව අනුමතයෙන් තොරව සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකළ යුතු ය.

(4) වෙළෙඳපොළ ආයතනයක් එහි රීතීන් සංශෝධනය කිරීමට යෝජනා කරන අවස්ථාවක දී, වෙළෙඳපොළ ආයතනය යෝජිත සංශෝධනය කොමිෂන් සභාව වෙත ලිඛිතව යොමු කළ යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් යෝජිත සංශෝධනය ලැබී දින අනූවක් ඇතුළත වෙළෙඳපොළ ආයතනයට සවන් දීමෙන් පසු, වෙළෙඳපොළ ආයතනය වෙත රීතීන් සඳහා එකී සංශෝධනයන්ට-

(අ) ඉඩ ලබා දීම; හෝ

(ආ) ඉඩ ලබා නොදීම,පිළිබඳ ලිඛිත නිවේදනයක් ලබා දිය යුතු ය.

(6) යෝජිත සංශෝධනය සඳහා අවසර ලබා නොදෙන විට, කොමිෂන් සභාව විසින් එකී අවසර ලබා නොදීම පිළිබඳව හේතු දක්වනු ලැබිය යුතු ය.

(7) කොමිෂන් සභාව විසින් දින අනූවක් ඇතුළත එකී රීති පිළිබඳව වෙළෙඳපොළ ආයතනය වෙත ප්‍රත්‍යාවර්තනය කිරීමට අසමත් වන අවස්ථාවක දී (4) වන උපවගන්තිය යටතේ එකී රීති සඳහා වන යෝජිත සංශෝධන දින අනූව අවසන් වූ වහාම බලාත්මක විය යුතු ය.

(8) (5) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලැබුණු වහාම වෙළෙඳපොළ ආයතනය විසින් එකී රීති ක්‍රියාත්මක කළ යුතු ය.

(9) (5) වන සහ (8) වන උපවගන්තිවල විධිවිධානවල කෙසේ සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් යම් වෙළෙඳපොළ ආයතනයක රීතීන් ඕනෑම අවස්ථාවක සංශෝධනය කළ හැකි අතර එකී රීතීන් වහාම ක්‍රියාත්මකභාවයට පත් විය යුතු හෝ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මකභාවයට පත් වියයුතු ය.

වෙළෙඳ පොළ ආයතනයක රීති අනුගමනය කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට අණ කිරීමට අධිකරණයට ඇති බලය.

**60.** (1) වෙළෙඳ පොළ ආයතනයක රීතින්වලට අනුකූලවීමේ, අනුගමනය කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ වගකීමකට යටත් යම් තැනැත්තෙක් එසේ කිරීමට අපොහොසත් වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් එසේ අපොහොසත්වීමට හේතු දක්වන ලෙස එකී තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

(2) එකී තැනැත්තා විසින් සපයනු ලැබූ හේතූන් පිළිබඳව කොමිෂන් සභාව සෑහීමකට පත් නොවන අවස්ථාවක, (3) වන උපවගන්තිය යටතේ නියමයක් කරන ලෙස කොමිෂන් සභාව විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) අධිකරණය විසින් වෙළෙඳපොළ ආයතනයේ රීතීන්ට අනුකූලවීමට, අනුගමනය කිරීමට, ක්‍රියාත්මක කිරීමට හෝ බලාත්මක කිරීමට පළමුව සඳහන් තැනැත්තාට නියම කරමින් නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

වෙළෙඳපොළ ආයතනයක සැළකිය යුතු කොටස්කරුවන් පාලනය.

**61.** (1) රජයේ නියෝජිතයකු නොවන කිසිදු තැනැත්තෙක් විසින්, කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගැනීමෙන් තොරව වෙළෙඳපොළ ආයතනයේ මුළු ඡන්ද බලය හිමි කොටස්වල සමස්තයේ සියයට පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉක්මවමින්, තනිව හෝ ඔහු සමග එකඟව ක්‍රියාකරනු ලබන වෙනත් යම් තැනැත්තෙක් සමග හෝ වෙළෙඳපොළ ආයතනයේ යම් ඡන්ද බලය හිමි කොටස් ලබාගැනීමට යම් ගිවිසුමකට හෝ සැලැසුමකට නොඑළඹිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් නිශ්චිත සබඳතාවයක් නියෝජනය කරනු ලබන තැනැත්තන් කණ්ඩායමක් මගින් සෘජුව හෝ අන්‍යාකාරයකින් දරනු ලැබිය හැකි උපරිම ඡන්දබලය හිමි කොටස් සමානුපාතය සඳහා කොමිෂන් සභාව විසින් සීමා පැනවිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කිරීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී, සුරැකුම්පත් වෙළෙඳපොළ වර්ධනයේ අදියර හෝ මහජන සුභසිද්ධිය සලකා බැලීමෙන් පසු (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ සීමාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අනුමතය සඳහා වන ඉල්ලීමක්, මෙහි සඳහන් කරන ලද ඡන්ද බලය හිමි කොටස් ලබා ගැනීමට අදහස්කරන තැනැත්තා විසින් කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකෘතියකින් සහ ආකාරයකින් කොමිෂන් සභාව වෙත එම ඉල්ලීම යැවිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් හැකි ආකාරයෙන් සහ එය නිශ්චිතව දක්වනු ලැබිය හැකි එකී තැනැත්තන්ගෙන් -

(අ) ඉල්ලීම සම්බන්ධිත වෙනත් තොරතුරු ලබාදීමට; සහ

(ආ) ඉල්ලුම්කරුගේ පිරිවැය මත ඉල්ලුම්පත්‍රයේ ආධාර පිණිස ඉදිරිපත් කරනු ලැබූ යම් තොරතුරක සත්‍යතාවය පරීක්ෂා කිරීමට,

අයදුම්කරුට නියම කළ හැකි ය.

(6) කොමිෂන් සභාව විසින්, පැනවීමට සුදුසු යැයි එය අදහස් කරන එවැනි නියම සහ කොන්දේසිවලට යටත්ව එහි අනුමතය ප්‍රදානය කළ හැකි ය.

තහනමක් පැනවීමට මූලික නියෝගයක් කිරීමේ කොමිෂන් සභාවේ බලය.

**62.** (1) 2007 අංක 7 දරන සමාගම් පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධානවල කෙසේ සඳහන් වුව ද, මේ පනතේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින්, යම් තැනැත්තෙක් 61 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලැබඇති බවට සෑහීමට පත්වන අවස්ථාවක දී, උල්ලංඝනයේ විෂයය වන යම් කොටස්වලට අදාළව උල්ලංඝනීය අවස්ථාගත තත්ත්වවල දී අදාළ වන හෝ ප්‍රමාණවත් වන පහත සඳහන් තහනම් කිරීම් හෝ සීමා කිරීම් එකක් හෝ කිහිපයක් පනවමින් ලිඛිතව මූලික නියෝගයක් එය විසින් සෑදිය හැකි ය:-

(අ) එකී ඡන්ද බලය හිමි කොටස් මිල දී ගැනීම හෝ මිල දී ගැනීම සඳහා වන ගිවිසුමක් හෝ සැලසුමක් ක්‍රියාත්මක

කිරීමට හෝ නිකුත් නොකරන ලද කොටස්වලට අදාළව මිල දී ගැනීමට ගිවිසුමක් හෝ සැලසුමකට එළඹීමට හෝ නිකුත් නොකරන ලද කොටස් සමග නිකුත් කිරීමට ඇති අයිතිය මිල දී ගැනීම තහනම් කිරීම;

(ආ) එකී කොටස්වලට අදාළව යම් ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතීන් ක්‍රියාත්මක කිරීම තහනම් කිරීම;

(ඇ) එකී කොටස්වල අයිතියේ ඇති යම් වැඩිදුර කොටස් නිකුත් කිරීම හෝ ඒවායේ දරන්නන් වෙත සිදුකරනු ලැබූ යම් අර්පණයක් ක්‍රියාවේ යෙදවීම තහනම් කිරීම;

(ඈ) ඈවර කිරීමේ දී හැර, ප්‍රාග්ධනය, ලාභාංශ හෝ වෙනත් යමකට අදාළව හෝ එවැනි කොටස් මත, වෙළෙඳපොළ ආයතනය විසින් ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම තහනම් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද මූලික නියෝගයක් හැකිතාක් ඉක්මනින් ප්‍රායෝගිකව (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන ලද තැනැත්තාට ලබා දිය යුතු අතර එය ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය බවට කොමිෂන් සභාව අදහස් කරන්නේ නම්, කොමිෂන් සභාව විසින් සුදුසුයැයි අදහස් කරන ආකාරයකින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(3) මූලික නියෝගයක්, (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන තැනැත්තෙක් මත, ඒ නියෝගය අදාළ වන ඡන්දහිමි කොටස් තත්කාලයේ දරන යම් තැනැත්තෙක් මත, සහ නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් තැනැත්තෙක් මත හෝ නියෝගය විධානය කරනු ලබන්නේ කා වෙත ද, ඔහු මත බැඳීමක් ඇති කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ මූලික නියෝගයක් සාදනු ලබන්නේ යම් තැනැත්තකුට එරෙහිව ද, එම තැනැත්තා විසින් හෝ එවැනි නියෝගයක් මගින් අගතිගාමීව බලපෑමට ලක්වනු ලැබූ වෙනත් යම් තැනැත්තෙක් විසින්, (1) වන උපවගන්තිය උල්ලංඝනය කරනු ලබන තැනැත්තා වෙත නියෝගය භාරදී දින දාහතරක් ඇතුළත, නියෝගය සාදනු ලැබූ අදාළ විධිවිධාන ඔහු විසින් උල්ලංඝනය නොකරන ලද්දේය, යන හේතුව මත නියෝගය අවලංගු කිරීම සඳහා හෝ කරුණු දැක්වීමේ නිශ්චිතව දක්වන හේතූන් සඳහා එය වෙනස් කිරීම නිසි සහ යෝග්‍ය විය යුතු ය, යන හේතූන් මත නියෝගය වෙනස් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ලිඛිතව කරුණු දැක්විය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින් (4) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ කරුණු දැක්වීමක් සලකා බැලීමෙන් පසු, එය සුදුසුයැයි සිතන එම ආකාරයෙන් මූලික නියෝගය ස්ථිර කිරීම, අවලංගු කිරීම, හෝ වෙනස් කිරීම කළ හැකි ය.

(6) කොමිෂන් සභාව මූලික නියෝගයක් ස්ථිර කරන අවස්ථාවක දී, කොටස් බැහැර කිරීම සඳහා එකී දරන්නාට විධාන කිරීම සඳහා, මූලික නියෝගය අදාළ වන කොටස් දරන්නා වෙත නියෝගයන් සෑදිය හැකි ය.

(7) එකී නියෝගයට ආනුෂංගික අනුභූතික, හෝ අවස්ථාගත තත්ත්ව අනුව විය හැකි හෝ මේ වගන්තිය යටතේ වන කොමිෂන් සභාවේ යම් නියෝගයක් බලාත්මක කිරීමට අවශ්‍යවන පරිදි හෝ නියම කරන පරිදි, වෙළෙඳපොළ ආයතනයේ අධ්‍යක්ෂවරුන්ට හෝ නිලධරයන්ට උපදෙස් ලබාදීම හෝ විධාන නිකුත් කිරීම කළ හැකි ය.

(8) මූලික නියෝගය හෝ (5) වන උපවගන්තිය යටතේ ස්ථිර කරන ලද යම් නියෝගයක් හෝ (7) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ලබාදෙනු ලබන උපදෙසක් හෝ නිකුත් කරනු ලබන විධානයක් උල්ලංඝනය කරන යම් කොටස් සම්බන්ධයෙන් වන යම් ගිවිසුමක හෝ සැලැසුමක ඇතුළත්වන්නා වූ යම් ගනුදෙනුවක් අවලංගු ලෙසට සලකනු ලැබිය යුතු ය.

(9) මූලික නියෝගයක්, (5) වන උපවගන්තිය යටතේ සහතික කරන ලද යම් නියෝගයක් හෝ (7) වන උපවගන්තිය යටතේ ලබා දෙන ලද යම් උපදෙසක් හෝ නිකුත් කරන ලද විධානයක් උල්ලංඝනය කරන තැනැත්තෙක්, වරදක් සිදුකරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හෝ දඩය යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

වෙළෙඳ පොළ ආයතනයකට අධ්‍යක්ෂවරුන් පත්කිරීම.

**63.** (1) 2007 අංක 7 දරන සමාගම් පනතේ යම් විධිවිධානයක කෙසේ සඳහන් වුව ද, යම් තැනැත්තෙක් විසින් කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ලබාගෙන ඇත්නම් මිස වෙළෙඳපොළ ආයතනයක

අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ ප්‍රධාන නියාමන නිලධරයකු, ලෙස පත්වීමක්, නැවත පත්කිරීමක්, තෝරා ගැනීමක් හෝ නැවත තෝරා ගැනීමක් භාරගැනීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ අනුමතය අවශ්‍යවන අවස්ථාවක දී -

(අ) යම් යෝජිත අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ ප්‍රධාන නියාමන නිලධරයකු, ශ්‍රී ලංකාව තුළදී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී මුදවනු නොලැබූ වස්තුභංගත්වයට පත්වූවකු නම්;

(ආ) යෝජිත අධ්‍යක්ෂවරයෙකුට, ප්‍රධාන විධායක නිලධරයාට හෝ ප්‍රධාන නියාමන නිලධරයාට එරෙහි විනිශ්චිත ණයක් සම්පූර්ණයෙන් හෝ කොටසක් ගෙවා තෘප්ත කර නොමැති නම්;

(ඇ) යෝජිත අධ්‍යක්ෂවරයාට, ප්‍රධාන විධායක නිලධරයා හෝ ප්‍රධාන නියාමන නිලධරයා -

(i) ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී වංචාව හෝ වෙන යම් වංකභාවයක් ඇතුළත්වන්නා වූ වරදකට වරදකරු කරනු ලැබ තිබීම හෝ ඔහු වරදකරු කරනු ලැබූ අවස්ථාවේ දී වංචාවෙන් හෝ වංක ලෙස ක්‍රියාකර ඇති බවට සොයා ගැනීමක් පවතී නම්;

(ii) මේ පනත යටතේ වරදකට වරදකරුවකු කරනු ලැබ ඇත්තේ නම්;

(iii) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ගන්නා ලද පරිපාලන ක්‍රියාමාර්ගයකට යටත් කරනු ලැබ ඇත්තේ නම්;

(iv) සදාචාරාත්මක දුරාචාරය ඇතුළත් වන්නා වූ වරදකට වරදකරු කරනු ලැබ ඇත්තේ නම්; හෝ

(v) සබඳතාවල ගැටුම් ඇති වීමට ඉඩ ඇත්තේ නම්;

(ඈ) වෙළෙඳපොළ ආයතනයේ අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නියාමන නිලධරයකු, ප්‍රධාන විධායක නිලධරයකු, වීමට, (3) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි යෝජිත අධ්‍යක්ෂවරයා, ප්‍රධාන විධායක නිලධරයා, හෝ ප්‍රධාන නියාමන නිලධරයා කීර්තිය හෝ ස්ථාවරබව සහ සුදුසු

හෝ යෝග්‍ය තැනැත්තෙක් බවට කොමිෂන් සභාව විසින් සෑහීමට පත් නොවන්නේ නම්,

අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් අනුමත කිරීම නොකළ යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ ආයතනයක යෝජිත අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ ප්‍රධාන නියාමන නිලධරයකු පත්කිරීම අනුමතකිරීම සලකා බැලීමේ දී පහත සඳහන් උපමාන සැලකිල්ලට ගත යුතු ය:-

(i) ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය පිළිබඳව අතීත පළපුරුද්ද හෝ නිපුණතාවයක් තැනැත්තාට පැවතීම;

(ii) කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන ක්‍රියා අවබෝධ කරගැනීමට, මෙහෙයුම් කිරීමට සහ කළමනාකරණය කිරීමට ප්‍රමාණවත් කුසලතා පරාසයක් සහ පළපුරුද්දක් තැනැත්තාට පැවතීම; සහ

(iii) හඳුනාගත් වෘත්තීය සුදුසුකම් සහ අදාළ වෘත්තීය ආයතනයන්හි සාමාජිකත්වය ඇතුළුව ඔවුන් නියැලෙන කටයුතු සඳහා වන නිශ්චිතව දක්වන ලද කාර්යයන් සිදු කිරීමට තාක්ෂණික දැනුමක් සහ හැකියාවක් තැනැත්තකුට පැවතීම.

(4) තැනැත්තෙක්, එම තැනැත්තා විසින් මේ පනතේ විධිවිධාන, යටතේ සාදන ලද නියෝග, රීති හෝ නියම උල්ලංඝනය කරනු ලැබ ඇති අවස්ථාවක දී, අධ්‍යක්ෂවරයාගේ හෝ ප්‍රධාන විධායක නිලධරයාගේ හෝ ප්‍රධාන නියාමන නිලධරයාගේ ධුරය නොදැරිය යුතු ය.

(5) (2) වන සහ (3) වන උපවගන්ති වල අධ්‍යක්ෂවරුන්ගේ පත්කිරීමේ දී නිශ්චිතව දක්වන ලද උපමාන වෙළෙඳපොළ ආයතනයක කළමනාකරුට හෝ පාලකවරයකුට අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කර ගත යුතු ය.

**64.** අයදුම්පත්‍රයේ නිශ්චිතව සඳහන් තත්ත්වයේ වෙනසක් සිදු වන හෝ බලපත්‍රය අලුත් කිරීමට අදහස් කරන අවස්ථාවක දී, වෙළෙඳපොළ ආයතනයක සංස්ථා පත්‍රය හෝ එවකට සපයා ඇති වෙනත් යම් වැදගත් තොරතුරුවල වෙනසක් සිදු කරන හෝ වෙනසක් සිදු කිරීමට අදහස් කරන වෙළෙඳපොළ ආයතනය විසින් ඒ වෙනස් කිරීම හෝ වෙනස ඇති කිරීම බලාත්මක කිරීම කරනු ලැබීමට පෙර කොමිෂන් සභාවේ අනුමතය ලබා ගත යුතු ය.

වෙළෙඳ පොළ ආයතනයක වැදගත් තොරතුරු වෙනස් කිරීම.

**විනිමය ස්ථානයක හෝ නිෂ්කාශනාගාරයක අයිතීන්.**

**65.** ගිවිසුම්වලට අදාළ යම් ලිඛිත නීතියක සඳහන් කිසිවක් මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ රීති හෝ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක, ව්‍යුත්පන්න විනිමය ස්ථානයක හෝ නිශ්කාශනාගාරයක රීති හා අනනුකූල වන ප්‍රමාණයට -

(අ) අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ හෝ මේ යටතේ සාදනු ලබන වෙනත් නියෝග, රීති හෝ විධාන යටතේ සුරැකුම්පත්වලට අදාළව විනිමය ස්ථානයට හෝ නිෂ්කාශනාගාරයට පැවරිය යුතු වන යම් අයිතීන්;

(ආ) අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ හෝ මේ යටතේ සාදනු ලබන යම් නියෝග, රීති හෝ විධාන යටතේ විනිමය ස්ථානයක රීතීන් හෝ බලපත්‍රලාභී නිෂ්කාශනාගාරයන්හි රීතීන් යටතේ එළඹෙනු ලැබූ සුරැකුම්පත් ගණුදෙනුවක පාර්ශ්වයන් මත පැවරිය යුතු වන අයිතීන්; හෝ

(ඇ) අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ හෝ මේ යටතේ සාදන ලද යම් නියෝග, රීති හෝ විධාන යටතේ එළඹෙනු ලැබූ විනිමය ස්ථාන මත, සුරැකුම්පත් ගණුදෙනුවක් යටතේ හෝ ඊට අදාළව කරන ලද හෝ නොකර හරින ලද කළ යුතු වන යමක්,

බලාත්මකවීම වැලැක්වීම නොකළ යුතු ය.

**අපරාධමය සහ සිවිල් වගකීම් සඳහා වින්තිවාචක.**

**66.** (අ) විනිමය ස්ථානය විසින්; හෝ

(ආ) (i) විනිමය ස්ථානයක යම් අධ්‍යක්ෂවරයෙක්; හෝ

(ii) විනිමය ස්ථානයක් විසින් පිහිටුවනු ලැබූ යම් කමිටුවක යම් සාමාජිකයෙක්,

ඇතුළුව විනිමය ස්ථානය වෙනුවෙන් ක්‍රියාකරන යම් තැනැත්තෙක් විසින්,

මේ පනත යටතේ, ඒ යටතේ සාදන ලද නියෝග, රීතී හෝ විධාන හෝ එකී විනිමය ස්ථානයේ රීතීන් යටතේ එහි බැඳීම් ඉටුකිරීම හෝ ඉටුකිරීමට අදහස් කරනු ලැබීමකට හෝ ඊට අදාළව යම් දෙයක් කිරීම හෝ කිරීම නොසලකාහැරීම සම්බන්ධයෙන් නිශ්කාශනාගාරය හෝ (ආ) ඡේදය යටතේ වන තැනැත්තා විසින් සියලු ක්‍රියා සද්භාවයෙන් ක්‍රියා කළ බව සහ සාධාරණව හැකි

අයුරින් කටයුතු කළ බව ඔප්පු කිරීම, යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්ක දී විත්ති වාචකයක් විය යුතු ය.

කොමිෂන් සභාවට සහාය සැපයීම.

**67.** (1) වෙළෙඳපොළ ආයතනයක් විසින් කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව වෙනුවෙන් කටයුතු කරන තැනැත්තකුට හෝ කොමිෂන් සභාවේ බලය ලබා දෙනු ලැබූ තැනැත්තකුට, කොමිෂන් සභාව හෝ එකී තැනැත්තාට සාධාරණව අවශ්‍ය වන පරිදි, මේ පනතේ මනා පරිපාලනය උදෙසා කොමිෂන් සභාවට හෝ එකී තැනැත්තාට අවශ්‍ය විය හැකි පරිදි වෙළෙඳපොළ ආයතනයේ ක්‍රියාකාරීත්වයට අදාළ එකී වාර්තා සැපයීම සහ එකී තොරතුරු සැපයීම ඇතුළත්ව එකී සහාය ලබා දිය යුතු ය.

(2) කොමිෂන් සභාව වෙනුවෙන් කටයුතු කරන තැනැත්තෙක් හෝ කොමිෂන් සභාව විසින් බලය ලබාදෙනු ලැබූ තැනැත්තකුට මේ පනතේ යම් කාර්යයන් සඳහා විනිමය ස්ථානයක ව්‍යාපාර පහසුකම් සඳහා සියලු සාධාරණ වේලාවන් හී දී සම්පූර්ණ සහ නිදහස් ප්‍රවේශයකට හිමිකමක් තිබිය යුතු ය.

(3) කොමිෂන් සභාව වෙනුවෙන් කටයුතු කරනු ලබන හෝ කොමිෂන් සභාව විසින් බලය ලබාදෙනු ලැබූ තැනැත්තකුට විනිමය ස්ථානයක ව්‍යාපාර පහසුකමකට, (2) වන උපවගන්තියට අනුකූලව ප්‍රවේශයට, නීතිමය කරුණකින් තොරව ප්‍රතික්ෂේප කරන හෝ අසමත් කරවන තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලැබිය යුතු ය.

වාර්ෂික වාර්තා.

**68.** (1) වෙළෙඳපොළ ආයතනයක් විසින්, එහි ශේෂ පත්‍රයේ දිනයේ සිට මාස පහක් ඇතුළත පහත සඳහන් කරුණු ඇතුළත් වාර්ෂික වාර්තාවක් කොමිෂන් සභාව වෙත ගොනු කළ යුතු ය:-

(අ) වෙළෙඳපොළ ආයතනයේ සාංගමික පාලන ප්‍රතිපත්ති පිළිබඳ වාර්තාවක් සහ කොමිෂන් සභාව විසින් නියමකරන ලද වෙනත් යම් තොරතුරක්;

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සාදන ලද විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයක් සහ රීතීන්හි නිශ්චිතව දක්වා තිබිය හැකි එවැනි වෙනත් අවශ්‍යතාවයන්; සහ

(ඇ) නියමිත අවස්ථාවක දී, වෙළෙඳපොළ ආයතනය පාලනය කරන අනෙක් සමාගම්වල කොටස් දැරීමට පාලක

සමාගමක් හෝ පාලිත සමාගමක් වන අවස්ථාවක දී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන.

(2) (1) වන උපවගන්තිය යටතේ වාර්ෂික වාර්තාවක ඇතුළත් කළ යුතු වන මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුව විගණනය කළ යුතු ය.

(3) නිෂ්කාශනාගාරයේ සහ මධ්‍යම තැන්පතුගාරයේ වාර්ෂික වාර්තාවට අවදානම් කළමනාකරණ කාර්ය පටිපාටිය සහ ඒවායේ අදාළ කිරීම, සහ කොමිෂන් සභාව විසින් නියම කරන ලද වෙනත් යම් තොරතුරු ඇතුළත් විය යුතු ය.

(4) වාර්ෂික වාර්තාවට, මේ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති යටතේ අවශ්‍ය කරනු ලබන තොරතුරුවලට අමතරව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නියම කරන ලද තොරතුරු ද ඇතුළත් කරනු ලැබිය යුතු ය.

වෙළෙඳපොළ ආයතනයක විගණකවරයකුගේ කාර්යයන්.

**69.** (1) වෙළෙඳපොළ ආයතනයක, විගණකවරයකුට සාමාන්‍ය පරිදි ඔහුගේ කාර්ය සාධනය ඉටුකිරීමේ දී -

(අ) ඔහුගේ මතයට අනුව, වෙළෙඳපොළ ආයතනයක මූල්‍ය තත්ත්වයට වැදගත් ප්‍රමාණයකට අහිතකර ලෙස බලපාන හෝ අහිතකර ලෙස බලපෑ හැකි යම් කරුණක්;

(ආ) ඔහුගේ මතයට අනුව, මේ පනතේ විධිවිධාන ඒ යටතේ ලැබූ නියෝග, රීති හෝ විධාන කඩකිරීමක් ඇති කරන හෝ කඩකිරීමක් ඇතිකරනු ලැබිය හැකි හෝ වැදගත් ප්‍රමාණයට වෙළෙඳපොළ ආයතනයක මූල්‍ය ස්ථාවරභාවයට බලපාන වංක සහගත බව හෝ වංචාවක් ඇතුළත් වන්නා වූ යම් වරදක් ඇති කරන හෝ ඇතිකරනු ලැබිය හැකි යම් කරුණක්; හෝ

(ඇ) සුරැකුම්පත්වල ආයෝජකයන්ගේ අරමුදල් හෝ දේපළවලට අහිතකර ලෙස බලපාන හෝ අහිතකර ලෙස බලපෑ හැකි යම් අක්‍රමිකතාවක් ඇතුළුව වෙළෙඳපොළ ආයතනයක ගිණුම් මත වැදගත් බලපෑමක් ඇති හෝ ඇතිවිය හැකි යම් අක්‍රමිකතාවක්,

දැනගැනීමට ලැබුණු විට විගණකවරයා විසින් කාරණය පිළිබඳ හෝ අක්‍රමිකතාවය පිළිබඳ ලිඛිත වාර්තාවක්, කොමිෂන් සභාවට පිටපත් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයට නොපමාව යැවිය යුතු ය.

(2) ආයතනයක විගණකවරයෙක්, විගණකවරයා සද්භාවයෙන් ක්‍රියාකරනු ලැබ ඇති අවස්ථාවක (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ වාර්තාවේ සෑදූ යම් ප්‍රකාශනයකට අදාළව යම් තැනැත්තෙක් විසින් පවරනු ලැබූ නඩුවකට යටත් නොවිය යුතු ය.

(3) මේ වගන්තියට පරිබාහිරව, වෙළෙඳපොළ ආයතනයක විගණකවරයාට අපහාස නඩුවක විත්තිකරු වශයෙන් තිබිය හැකි යම් අයිතියක්, වරප්‍රසාදයක් හෝ මුක්තියක් (2) වන උපවගන්තිය විසින් සීමා කිරීම හෝ එයට බලපෑමක් කිරීම නොකළ යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ ආයතනයක විගණකවරයාට පහත දැක්වෙන සියලු හෝ යම් කාර්යයන් පැනවිය හැකි ය:-

(අ) කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන විගණකවරයාගේ විගණනයට අදාළ එකී අමතර තොරතුරු සහ වාර්තා ඉදිරිපත් කිරීමේ කාර්යය;

(ආ) වෙළෙඳපොළ ආයතනයේ ව්‍යාපාර සහ කටයුතුවල ඔහුගේ විගණනයේ විෂයය ක්ෂේත්‍රය විශාලනය කිරීමේ, දීර්ඝ කිරීමේ හෝ වෙනස් කිරීමේ කාර්යය;

(ඇ) යම් විශේෂ අවස්ථාවක දී වෙනත් යම් විභාගයක් ක්‍රියාවට නැංවීමේ හෝ යම් කාර්ය පටිපාටියක් පිහිටුවීමේ කාර්යය; හෝ

(ඈ) (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් කරනු ලබන, ඔහුගේ විගණනය, විභාගය හෝ කාර්ය පටිපාටිය පිහිටුවීමෙන් පැනනගින යම් කරුණකට වාර්තාවක් ලබාදීමේ කාර්යය සහ මූල්‍ය ප්‍රකාශවලට නිදහස් මතයක් නිකුත් කිරීම සඳහා ඔහුගේ සාමාන්‍ය විගණන විෂයය ක්ෂේත්‍රය ව්‍යාප්ත කිරීමක් ලෙස විගණකවරයා විසින් එකී කාර්යයන් ක්‍රියාවට නැංවිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ සඳහන් කරනු ලබන සියලු හෝ යම් කාර්යයන් ඔහු විසින් ඉටුකිරීමට අදාළව, කොමිෂන් සභාව විසින් පළකරනු ලබන ගාස්තු උපලේඛනය ප්‍රකාරව, වෙළෙඳපොළ

ආයතනය විසින් විගණකවරයාට ගෙවීමක් කරනු ලැබිය යුතු වන අතර නිශ්චිත අවස්ථානුගත කරුණුවල දී වැඩිදුර විමර්ශනය අවශ්‍ය වන අවස්ථාවක කොමිෂන් සභාවේ අරමුදල මගින් ගෙවීම් කරනු ලැබිය යුතු ය.

ආවර්ත වාර්තා ඉදිරිපත් කිරීමට ඇති වගකීම.

**70.** කොමිෂන් සභාව විසින් නිශ්චිතව දැක්විය හැකි පරිදි අවදානම් කළමනාකරණ විගණනයක් ඇතුළත් යම් වාර්තා වෙළෙඳපොළ ආයතනයක් විසින් යම් ආකෘතියෙන්, ආකාරයෙන් සහ වාර ගණනින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

වාර්ෂික ගාස්තු ගෙවීම.

**71.** කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වෙළෙඳපොළ ආයතනයක් විසින් නිශ්චිත වාර්ෂික ගාස්තුවක් කොමිෂන් සභාවට ගෙවනු ලැබිය යුතු ය.

තත්ත්වයකින් පෙනී සිටීම සඳහා වන තහනම.

**72.** (1) යම් තැනැත්තකු විසින් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක්, ව්‍යුත්පන්න විනිමය ස්ථානයක්, නිෂ්කාශනාගාරයක් හෝ මධ්‍යම තැන්පතුගාරයක් ලෙස තත්ත්වයකින් පෙනී නොසිටිය යුතු අතර "ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය", "ව්‍යුත්පන්න විනිමය ස්ථානය", "අනාගතයන් විනිමය ස්ථානය", "ව්‍යාපාර වස්තු වෙළෙඳපොළ", "ව්‍යුත්පන්න වෙළෙඳ පොළ", "අනාගතයන් වෙළෙඳ පොළ", "නිෂ්කාශනාගාරය", "නිෂ්කාශන පහසුකම", "මධ්‍යම තැන්පතුගාරය", "සුරැකුම්පත් ව්‍යාපාර වෙළෙඳපොළ", "ව්‍යුත්පන්න ව්‍යාපාර වෙළෙඳපොළ" හෝ "අනාගතයන් ව්‍යාපාර වෙළෙඳ පොළ" වල නාමය, වර්ගය හෝ විස්තරය ලබාගැනීම හෝ යොදාගැනීම හෝ සඳහනකින් යොදාගැනීම නොකළ යුතු අතර එම තැනැත්තා, ව්‍යාපාර විනිමය ස්ථානයක්, ව්‍යුත්පන්න විනිමය ස්ථානයක්, නිෂ්කාශනාගාරයක් හෝ මධ්‍යම තැන්පතුගාරයක් යන මතය සඳහන් කරමින් හෝ සෑදීමට යොමුකරමින් යම් නාමයක්, වර්ගයක් හෝ විස්තරයක්, යම් ස්ථානයක දී ලබාගැනීම හෝ යොදාගැනීම හෝ අමුණා තිබීම හෝ ඉදිරිපත් කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන තැනැත්තකු වරදක් සිදු කරනු ලැබිය යුතු ය.

සිය තීරණය සමාලෝචනය කිරීමට කොමිෂන් සභාව සතු බලය.

**73.** (1) කොමිෂන් සභාවේ තීරණයක් මගින් අගතියට පත්වන යම් තැනැත්තකු විසින්, ඔහුට එම තීරණය පිළිබඳ දැනුම් දී දින තිහක් ඇතුළත එම තීරණය සමාලෝචනය කිරීම සඳහා කොමිෂන් සභාවට ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ඉල්ලීම ලැබුණු දින සිට දින අනූවකට නොවැඩි කාලයක දී කොමිෂන් සභාව විසින් සිය තීරණය ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු ය.

## III වන කොටස

## සුරැකුම්පත් නිකුත් කිරීම

මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ.

**74.** මේ කොටසේ පරමාර්ථය සහ අරමුණ ලෙස -

(අ) සුරැකුම්පත් නිකුත් කිරීම නියාමනය කිරීම;

(ආ) ලැයිස්තුගත පොදු සමාගම් විසින් මූල්‍ය තොරතුරු අනාවරණය සහතික කිරීම;

(ඇ) මූල්‍ය අක්‍රමිකතා අනාවරණය කිරීමට විගණකවරුන්ට නියම කිරීම;

(ඈ) වෙළෙඳපොළ අතරමැදියන්ට බලපත්‍ර ලබාදීම සහ ඔවුන්ගේ නියෝජිතයන් ලියාපදිංචි කිරීම; සහ

(ඉ) සේවාලාභීන්ගේ වත්කම් ආරක්ෂා කිරීම,

විය යුතු ය.

### 1 වන පරිච්ඡේදය

### සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම

සුරැකුම්පත් අර්පණය කිරීම.

**75.** (1) කොමිෂන් සභාවේ හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තැනැත්තකු විසින් අනුමත කරන ලද්දේ නම් මිස, මහජනතාවගෙන් අරමුදල් ඉල්ලීමේ කාර්ය සඳහා සංස්ථා ප්‍රකාශනයක් හෝ සමාන ලේඛනයක් මගින් හෝ අන්‍යාකාරයකින් ලැයිස්තුගත කළ හෝ ලැයිස්තුගත නොකළ සංස්ථා අස්ථිත්වයක් විසින් ඍජුව හෝ තුන්වන පාර්ශ්වයක් හරහා සුරැකුම්පත්වල පොදු අර්පණයක් ඉදිරිපත් නොකළ යුතු ය.

(2) මහජන අර්පණයක් යනුවෙන් පිළිගත් ආයෝජකයකුට ඉදිරිපත් කරන ලද අර්පණයක් හැර (3) වන උපවගන්තියේ සපයා ඇති උපමාන මගින් මහජනතාවට දෙන ලද අර්පණයක් අදහස් වේ. එකී පිළිගත් ආයෝජකයා විසින් එම සුරැකුම්පත් පසුව මහජනතාවට විකිණීම තහනම් විය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ සුරැකුම්පත්වල ප්‍රමාණයට, සුරැකුම්පත්වල පන්තියට, ආයෝජකයින්ගේ ප්‍රමාණයට සහ වර්ගයට, නිකුත් කරන්නාගේ වර්ගයට සහ ස්වභාවයට, සුරැකුම්පත් වෙළෙඳපොළේ වර්ගයට හෝ එම මහජන අර්පණය ආනුෂංගික නියාමකයකු විසින් නියාමනය කරන්නේ ද යන්නට සඳහන් කරමින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ රීති මගින් පොදු අර්පණවල වර්ගය නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) *ගැසට් පත්‍රයේ* රීති ලෙස පළ කරන ලද එකී නියම හා කොන්දේසිවලට යටත්ව, ලැයිස්තුගත කළ පොදු සමාගම්වල සහ ලැයිස්තුගත කළ විදේශ අස්ථිත්වයන්ගේ සුරැකුම්පත් හැර, වර්ගය, කාණ්ඩය, අගය, සීමිත ස්වරූපය හෝ ස්වභාවයට සඳහනක් මගින් යම් සුරැකුම්පත් හෝ යම් සුරැකුම්පත් පන්තියක්, කොමිෂන් සභාව විසින් මේ පනතේ විධිවිධානවලින් නිදහස් කළ හැකි ය.

සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා කොමිෂන් සභාවේ අනුමතය.

**76.** (1) ලැයිස්තුගත පොදු සමාගමක් හැර යම් තැනැත්තකු විසින් සුරැකුම්පත්වල මහජන අර්පණයක් ඉදිරිපත් කිරීමට පෙර කොමිෂන් සභාවේ හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකුගේ අනුමතය ලබාගත යුතු ය.

(2) (අ) යම් නව නිකුත් කිරීමක් හෝ විකිණීම සඳහා අර්පණය, මහජන අර්පණයක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ වූව ද, ඒ නව නිකුත්කිරීම් හෝ මහජනතාව වෙත සුරැකුම්පත් විකිණීම සඳහා අර්පණයකට;

(ආ) සුරැකුම්පත්වල පෞද්ගලික නිකුතුවකට;

(ඇ) සුරැකුම්පත් පිළිබඳ හිමිකම් නිකුත් කිරීමකට;

(ඈ) සුරැකුම්පත් පිළිබඳ ප්‍රසාද නිකුත් කිරීමකට; හෝ

(ඉ) වැඩපිළිවෙළ පිළිබඳ යෝජනා ක්‍රම, ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රම, අත්කරගැනීමේ යෝජනා ක්‍රම, කොටස් මනාප යෝජනා ක්‍රම සහ සුරැකුම්පත් නිකුත් කිරීම මගින් වත්කම් අත්පත්කර ගැනීමකට,

අදාළව, ලැයිස්තුගත පොදු සමාගමක් විසින්, කොමිෂන් සභාවේ හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකුගේ අනුමතය ලබාගත යුතු ය.

(3) අන්‍යාකාරයෙන් ලිඛිතව දන්වා ඇත්නම් මිස, එකී සුරැකුම්පත් අර්පණයක් පිළිබඳ අනුමතයක් යම්ලිත් දින විස්සක් නොඉක්මවන කාලවකවානුවක් තුළ සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(4) විනිමය ස්ථානයක ලැයිස්තුගත කරනු ලබන අවස්ථාවක, ලැයිස්තුගත විදේශීය අස්ථිත්වයක් විසින්, සුරැකුම්පත් පිළිබඳ පොදු අර්පණයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකුගේ අනුමතය ලබාගත යුතු ය.

(5) සෑම ලැයිස්තුගත පොදු සමාගමක සහ ලැයිස්තුගත විදේශ අස්ථිත්වයක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක සමාගම ලැයිස්තුගතව පවතින තාක් සියලු කාලයන්හි දී ඒවා ලැයිස්තුගතකරතිබෙන ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ රීති සහ අවශ්‍යතාවයන්ට අනුකූලව එම සමාගම හෝ අස්ථිත්වය ක්‍රියාකළ යුතු බව සහතික විය යුතු ය.

සංස්ථා ප්‍රකාශය හෝ සමාන ලේඛනය.

**77.** (1) මහජනතාවට අර්පණයක් ඉදිරිපත් කරන තැනැත්තකු විසින් සාදනු ලබන සංස්ථා ප්‍රකාශය හෝ ඊට සමාන ලේඛනය, 2007 අංක 7 දරන සමාගම් පනතේ නිශ්චිතව සඳහන් කර ඇති නියමයන්ට සහ කොමිෂන් සභාව විසින් සහ විනිමය ස්ථානයක රීතිවල නිශ්චිතව සඳහන් කර ඇති වෙනත් යම් නියමයන්ට අනුකූල විය යුතු ය.

(2) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නියම කර ඇති පරිදි සංස්ථා ප්‍රකාශය හෝ ඊට සමාන ලේඛනය ලියාපදිංචි කිරීමට පෙර, මහජනතාවට සුරැකුම්පත් නිකුත් කිරීමක් සිදුකරන තැනැත්තකු විසින් ඒ කාර්ය සඳහා කොමිෂන් සභාවේ හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකු භාරයේ සංස්ථා ප්‍රකාශයේ හෝ ඊට සමාන ලේඛනයේ පිටපතක් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මහජනතාවගෙන් අරමුදල් ලබා ගැනීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් සුරැකුම්පත්වල පොදු අර්පණයක් ඉදිරිපත් කරනු ලබන විට යම් සංස්ථා ප්‍රකාශයක් හෝ ඊට සමාන ලේඛනයක් පරීක්ෂා කිරීමේ බලය කොමිෂන් සභාව සතු විය යුතු ය.

කොමිෂන් සභාව විසින් තහනම් නියෝග නිකුත් කිරීම.

**78.** (1) (අ) මේ පනතේ 77 වන වගන්තියේ (1) වන උපවගන්තියට සංස්ථා ප්‍රකාශයක් හෝ ඊට සමාන ලේඛනයක් එකඟ නොවන බව හෝ එම

උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි සකසා නොමැති බව;

(ආ) සංස්ථා ප්‍රකාශයක හෝ ඊට සමාන ලේඛනයක, යම් අසත්‍ය හෝ නොමග යවන සුලු ප්‍රකාශයක් හෝ තොරතුරක් අඩංගු වන බව හෝ එය වැදගත් විස්තර බැහැර කිරීමකින් යුක්ත වන බව; හෝ

(ඇ) මේ පනත යටතේ හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝග, රීති හෝ විධාන හෝ විනිමය ස්ථානයක රීතිවල හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පනවන ලද නියමයන්ට නිකුත් කරන්නා එකඟ වී නොමැති බව,

කොමිෂන් සභාවේ මතය වන්නේ නම්, කොමිෂන් සභාව විසින් සුරැකුම්පත් වෙන් කිරීම, නිකුත් කිරීම, අර්පණය කිරීම හෝ දායකත්වය සඳහා ආරාධනාවක් කිරීම හෝ මිල දී ගැනීම හෝ මහජන අර්පණයන්ට අදාළ සුරැකුම්පත් තවදුරටත් විකිණීම සිදු නොකිරීමට නිකුත් කරන්නා වෙත නියෝගයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන නියෝගය සෑදීමේ දී වන යම් ප්‍රමාදයක් මහජන සුභසිද්ධිය සඳහා අගතිගාමී වන බව කොමිෂන් සභාව විසින් සලකනු ලබයි නම්, කොමිෂන් සභාව විසින් අතුරු නියෝගයක් සාදනු ලැබිය හැකි ය.

(3) යම් නියෝගයක් සෑදිය යුතු ද යන්න තීරණය කිරීම සඳහා යම් බලපෑමකට ලක්වූ තැනැත්තකුට කරුණු දැක්වීමට සාධාරණ අවස්ථාවක් කොමිෂන් සභාව විසින් දී ඇත්නම් මිස, (2) වන සහ (4) වන උපවගන්තිවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් එම නියෝගය සාදනු නොලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ සාදන ලද අතුරු තහනම් නියෝගය, කලින් ප්‍රත්‍යාදිෂ්ට කර ඇත්නම් මිස, අතුරු නියෝගය සාදන ලද දිනයට පසු දින විසිඑකක් අවසන් වන දිනය හෝ (3) වන උපවගන්තිය යටතේ කරුණු දැක්වීම අවසන් වන දිනය යන දින දෙකෙන් පසුව යෙදෙන දිනයක දී බලපැවැත්විය යුතු ය.

(5) නියෝගය සෑදීමට හේතු වූ අවස්ථානුගත කරුණු තවදුරටත් නොපවතින බවට කොමිෂන් සභාව විසින් සෑහීමකට පත්වේ නම්,

(2) වන උපවගන්තිය යටතේ සාදන ලද අතුරු නියෝගයක්, විධානයක් මගින් කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(6) (1) වෙනි උපවගන්තිය යටතේ සාදන ලද අතුරු නියෝගයට පෙර, සංස්ථා ප්‍රකාශය හෝ ඊට සමාන ලේඛනය අදාළ වන සුරැකුම්පත් සඳහා දායකත්වය ලබා ගැනීමට හෝ සුරැකුම්පත් මිල දී ගැනීමට ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අවස්ථාවක -

(අ) ඉල්ලුම්කරුවන්ට සුරැකුම්පත් නිකුත් කරනු ලැබ නොමැති අවස්ථාවක, ඉල්ලුම්පත්‍ර ඉල්ලා අස්කරගෙන ඇති ලෙස සහ අවලංගුකර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර නිකුත් කරන්නා හෝ මුදල් ලබන එවැනි වෙනත් තැනැත්තකු විසින් ඉල්ලුම්කරුවන්ගෙන් ලද සියලු මුදල් පොලී රහිතව වහාම ආපසු ගෙවිය යුතු ය. තහනම් නියෝගයේ දින දාහතර ඇතුළත මුදල් ආපසු ගෙවා නොමැති නම්, නිකුත් කරන්නා කොමිෂන් සභාව විසින් නිශ්චිතව දැක්විය හැකි පරිදි වූ පොලී සහිතව එම කාලය ඉකුත්වීමෙන් පසු මුදල් නැවත ගෙවීමකට යටත් විය යුතු ය.

(ආ) ඉල්ලුම්කරුවන්ට සුරැකුම්පත් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක, සුරැකුම්පත් නිකුත් කිරීම බල රහිත ලෙස සලකනු ලැබිය යුතු අතර, නිකුත් කරන්නා හෝ එවැනි වෙනත් තැනැත්තකු විසින් ඉල්ලුම්කරුවන්ගෙන් ලද සියලු මුදල් පොලී රහිතව වහාම ආපසු ගෙවිය යුතු ය. තහනම් නියෝගය බාරදීමෙන් දින දාහතරක් ඇතුළත එම මුදල් ආපසු නොගෙවන්නේ නම්, නිකුත් කරන්නා කොමිෂන් සභාව විසින් නිශ්චිතව දැක්විය හැකි පරිදි වූ පොලී සහිතව එම කාලය ඉකුත්වීමෙන් පසු එම මුදල නැවත ගෙවීමකට යටත් විය යුතු ය.

(7) සංස්ථා පත්‍රය හෝ ඊට සමාන ලේඛනය අදාළ වන සුරැකුම්පත්වලින් යම් ප්‍රමාණයක් විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇත්නම් සහ ඒවායේ වෙළෙඳාම ආරම්භ කර ඇත්නම් මේ වගන්තියේ විධිවිධාන යම් නිකුත්කරන්නකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

සුරැකුම්පත් මිල දී ගැනීම, විකිණීම හෝ පැවරීම.

**79.** (1) ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත සමාගමක සුරැකුම්පත් දරන තැනැත්තකු විසින් ව්‍යාපාර වස්තු විනිමය ස්ථාන විසින් අදාළ කරගත් වෙළෙඳාමේ කාර්යපටිපාටිය සමග අනුකූලව ක්‍රියාකිරීමට හැර කොමිෂන් සභාවේ පූර්ව අනුමතය නොමැතිව වෙළෙඳ භූමියෙන් පිටත එම සුරැකුම්පත් මිල දී ගැනීම, විකිණීම, තෑගි දීම හෝ අන්‍යාකාරයකින් ගනුදෙනු කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුට එම වෙළෙඳාමේ කාර්ය පටිපාටිය සමග අනුකූලව ක්‍රියා කිරීම හැර ඔහු විසින් කොමිෂන් සභාවට ඒ පිළිබඳ පූර්ව දැනුම්දීමක් සහ යෝජිත ත්‍යාගයට අදාළ විස්තර විනිමය ස්ථානයට ලබාදෙන්නේ නම් එම සුරැකුම්පත් ඥාතියෙකුට තෑගිකරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ "ඥාතියා" යනුවෙන් දෙමාපියෙක්, කළත්‍රයෙක්, දරුවෙක් (සුළුදරුවන් සමග) හෝ එම තැනැත්තාගේ සහෝදරයෙක් හෝ සහෝදරියක් (සුළුසහෝදරයා හෝ සුළුසහෝදරිය සමග) හෝ තැනැත්තාගේ ළමයෙකුගේ කළත්‍රයෙක් අදහස් වේ.

ලේඛන ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමට කොමිෂන් සභාවට ඇති බලය.

**80.** (1) (අ) (i) වංචාකාරී හෝ නීතිවිරෝධී කටයුත්තක් සඳහා;

(ii) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති, විධාන හෝ වෙළෙඳපොළ ආයතනයක රීති උල්ලංඝනය වන ආකාරයකින්; හෝ

(iii) ආයෝජකයන්ගේ සුභසිද්ධියට අගතිගාමී වන ආකාරයකින්,

ලැයිස්තුගත පොදු සමාගමක ව්‍යාපාරයක් පවත්වාගෙන යන බව මහජනතාවට කරන ලද අනාවරණවලින් යෝජනාකරන බවට අවස්ථානුගත කරුණු පවතින බව කොමිෂන් සභාවට පෙන්නුම් කරන අවස්ථාවක;

(ආ) වංචාකාරී හෝ නීතිවිරෝධී කටයුත්තක් සඳහා සමාගමක් ලැයිස්තුගත කරන ලද බව යෝජනාකරන අවස්ථානුගත කරුණු පවතින බව කොමිෂන් සභාවට පෙන්නුම් කරන අවස්ථාවක;

(ඈ) සමාගමක ලැයිස්තුගත කිරීමට හෝ ලැයිස්තුගත කිරීමට අදාළ කටයුතුවල කළමනාකරණය හෝ එහි කටයුතුවල කළමනාකරණයට සම්බන්ධ තැනැත්තන්, වංචා කිරීමට, නීතිවිරෝධී හැසිරීමට හෝ වෙනත් වැරදි හැසිරීමට වරදකරු වී ඇති බව යෝජනා කරන අවස්ථානුගත කරුණු පවතින බව කොමිෂන් සභාවට පෙන්නුම් කරන අවස්ථාවක;

(ඇ) ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂවරයා හෝ කළමනාකරණය, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ සැපයීමට නියම කරන ලද සමාගමේ කටයුතුවලට අදාළ තොරතුරු මහජනතාවට සාධාරණ ලෙස මුදාහැරීමට බලාපොරොත්තු විය හැකි පරිදි මුදාහැරීමෙන් තොරව සිතාමතාම යටපත් කර ඇති බව යෝජනා කරන අවස්ථානුගත කරුණු පවතින බව කොමිෂන් සභාවට පෙන්නුම් කරන අවස්ථාවක,නිශ්චිත වෙලාවක සහ ස්ථානයක විධානයේ නිශ්චිතව සඳහන් කරන ලද ලේඛන, විද්‍යුත් වාර්තා හෝ වෙනත් තොරතුරු ඉදිරිපත් කරන ලෙස එම සමාගමට දන්වමින් කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත පොදු සමාගමට විධාන නිකුත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා ලේඛන, විද්‍යුත් වාර්තා හෝ වෙනත් තොරතුරු ඉදිරිපත් කිරීම නියම කිරීම සඳහා යම් තැනැත්තකුට අවසර දීමට (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ අධිකාරි බලය කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව හෝ බලය පවරන ලද තැනැත්තා විසින්, ලැයිස්තුගත පොදු සමාගමකට, ලේඛන සහ විද්‍යුත් වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කළ හැකිය.

(4) එම ලේඛන සහ විද්‍යුත් වාර්තා සන්තකයේ තිබෙන බවට කොමිෂන් සභාවට හෝ බලය පවරන ලද තැනැත්තාට පෙනී යන යම් තැනැත්තකුගෙන් එම ලේඛන සහ විද්‍යුත් වාර්තා ඉදිරිපත්

කරන ලෙස කොමිෂන් සභාව හෝ බලය පවරන ලද තැනැත්තා විසින් නියම කළ හැකි අතර එම ලේඛන සහ විද්‍යුත් වාර්තා යම් තැනැත්තකුගේ සන්තකයේ තිබෙන බවට කොමිෂන් සභාවේ හෝ බලය පවරන ලද තැනැත්තාගේ මතය වන විට එම ලේඛන සහ විද්‍යුත් වාර්තා ඉදිරිපත් කරන ලෙස එකී තැනැත්තාට කොමිෂන් සභාව හෝ බලය පවරන ලද තැනැත්තා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(5) (1) වන, (2) වන හෝ (3) වන උපවගන්ති යටතේ සඳහන් කරනු ලැබූ එකී ලේඛන හෝ විද්‍යුත් වාර්තා ඉදිරිපත් කරනු ලැබූ විට,පොදු ලැයිස්තුගත සමාගමට කොමිෂන් සභාව හෝ බලය පවරන ලද තැනැත්තා විසින් -

(අ) එම ලේඛන හෝ විද්‍යුත් වාර්තාවල පිටපත් හෝ උද්ධෘත ලබාගැනීමට; සහ

(ආ) එම ලේඛන හෝ විද්‍යුත් වාර්තා අතුරින් යමක් පිළිබඳ පැහැදිලි කිරීමක් සැපයීමට එම තැනැත්තා හෝ ලැයිස්තුගත පොදු සමාගමේ වර්තමාන හෝ අතීත නිලධරයකු වන හෝ ලැයිස්තුගත පොදු සමාගම විසින් යම් කාලයක දී සේවයේ යොදවන ලද වෙනත් තැනැත්තකුට නියම කිරීමට;

(ඇ) වාර්තා සහ ලේඛන සහ විද්‍යුත් වාර්තා ඉදිරිපත් කරනු නොලබන අවස්ථාවක, ඒවා ඉදිරිපත් කිරීමට නියම කරන ලද තැනැත්තා විසින් ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම පිළිබඳව හේතු සැපයීමට; හෝ

(ඈ) ලේඛන හා විද්‍යුත් වාර්තා ඉදිරිපත් කරනු නොලබන අවස්ථාවක ඒවා ඉදිරිපත් කිරීමට නියම කරන ලද තැනැත්තා විසින් ඔහුගේ දැනුමට හා අවබෝධයට අනුව එහි පිහිටීම අනාවරණය කිරීමට,නියම කරනු ලැබිය යුතු ය.

(6) යම් ලැයිස්තුගත පොදු සමාගමක්, මේ වගන්තියට අනුකූලවීමට අපොහොසත් වන අවස්ථාවක, මේ පනතේ 81 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත පොදු සමාගමට විධානයක් නිකුත් කළ යුතු ය.

ලැයිස්තුගත පොදු සමාගම්වලට විධාන නිකුත් කිරීමට කොමිෂන් සභාව සතු බලය.

**81.** (1) පනතේ යම් විධිවිධාන, නියෝග, රීති හෝ විධානවලට අනුකූලව කටයුතු කිරීමට අදහස් කිරීමේ දී, ලැයිස්තුගත පොදු සමාගමක් විසින් එකී විධිවිධාන, නියෝග, රීති හෝ විධාන උල්ලංඝනය කර ඇති බව හෝ ඒවාට අනුකූලවීමට අපොහොසත් වී ඇති බව සහ අසත්‍ය, වැරදි හෝ නොමගය වන සුලු තොරතුරු කොමිෂන් සභාවට සපයා ඇති බව කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවක -

(අ) මේ පනත හා ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩකිරීම නතර කිරීමට හා ඉන් වැළකීමට;

(ආ) මේ පනත හා ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි යම් දෙයක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට; හෝ

(ඇ) මේ පනත හා ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේදී කොමිෂන් සභාවට අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකන යම් වෙනත් කරුණකට අදාළව,

කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත පොදු සමාගමට විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවට අසත්‍ය තොරතුරු ඉදිරිපත් නොකරසිටීමේ වගකීම.

**82.** (1) මේ පනත හා ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ කොමිෂන් සභාවට තොරතුරු සපයන හෝ තොරතුරු සැපයීමට කටයුතු සලස්වන යම් තැනැත්තකු විසින්, යම් වැදගත් විස්තරයක ඇති එම තොරතුරු අසත්‍ය හෝ නොමග යවන සුලු නොවන බවට සහතිකවීමට ඒ පිළිබඳ නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

(2) (අ) කොමිෂන් සභාවේ ගොනු කර තබා ඇති යම් ලේඛනයක් අත්සන් කරන; හෝ

(ආ) කොමිෂන් සභාව විසින් ඔහුට පවරනලද යම් හඳුනාගැනීමේ හෝ වෙනත් සහතික කිරීමේ ක්‍රමයක් හෝ කාර්ය පටිපාටියක් යොදාගෙන ලේඛනයක්, විද්‍යුත් මාධ්‍යයක් මාර්ගයෙන් කොමිෂන් සභාවේ ගොනුකර තබන,

යම් තැනැත්තකු විසින් යම් වැදගත් තොරතුරක් අසත්‍ය හෝ නොමග යවනසුලු නොවන බවට සහතිකවීමට ඒ පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

(3) (2) වන හෝ (3) වන උපවගන්ති උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලැබිය යුතු ය.

වෙළෙඳපොළ ආයතනවලට වැරදි ප්‍රකාශයන් නොකිරීමේ වගකීම.

**83.** හිතාමතා රැවටීමක් කිරීමේ අදහසින්, මේ පනත හා ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන යටතේ ලැයිස්තුගත පොදු සමාගමක් විසින් සැපයීමට නියමකරන ලද යම් තොරතුරකට අදාළව, මේ පනත යටතේ බලපත්‍රලාභී වෙළෙඳපොළ ආයතනයකට යම් නොමගය වන සුලු ප්‍රකාශයක් හෝ වාර්තාවක් සාදන හෝ සපයන හෝ දැනුවත්ව සහ හිතාමතාම බලය පවරන හෝ සැදීමට හෝ සැපයීමට අවසර ලබාදෙන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධරයා පත්කිරීම.

**84.** (1) විනිමය ස්ථානයක රීති මගින් නිශ්චිතව සඳහන් කර ඇති පරිදි ලැයිස්තුගත පොදු සමාගමක් විසින් ලැයිස්තුගත පොදු සමාගමේ තත්ත්වය පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) ලැයිස්තුගත පොදු සමාගමේ අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධරයා, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ලද සුදුසු හෝ නිසි උපමානවලට හෝ විනිමය ස්ථානයක රීතිවල උපමානවලට ලැයිස්තුගත පොදු සමාගමට අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධරයා පත්කිරීමේ දී හෝ පවත්වාගෙන යාමේ දී අනුකූල විය යුතු ය.

ලැයිස්තුගත පොදු සමාගමක විගණකවරයාගේ කාර්යයන්.

**85.** (1) විගණකවරයෙක්, ලැයිස්තුගත පොදු සමාගමක විගණකවරයකු වශයෙන් සාමාන්‍ය පරිදි ඔහුගේ කාර්ය සාධනය ඉටුකිරීමේ දී, ලැයිස්තුගත පොදු සමාගමේ මූල්‍ය තත්ත්වයට යම් තාක්දුරට අහිතකර ලෙස බලපෑ හැකි මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන හෝ විනිමය ස්ථානයක යම් රීතියක් හෝ කරුණක් කඩකිරීමක් හෝ ඉටුකිරීමට අපොහොසත්වීමක් ඇති බව ඔහුගේ වෘත්තීමය මතය වන්නේ නම්, විගණකවරයා විසින් එම කරුණ කඩ කිරීම හෝ ඉටුකිරීමට අපොහොසත් වීම පිළිබඳව විගණක කමිටුවට ඉක්මනින්ම ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු අතර සති දෙකක් ඇතුළත එයට

ප්‍රතිකර්මදායී පියවරක් ගනු නොලබන්නේ නම්, කඩකිරීම නිවැරදි කිරීමට හෝ එවැන්නක් තවම සිදුවී නොමැති අවස්ථාවක, කඩකිරීමක් සිදුවීමෙන් වළක්වනු ලැබීමට ලිඛිතව එම කරුණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(2) සති දෙකක් ඇතුළත කඩකිරීම හෝ ඉටුකිරීමට අපොහොසත් වීම නිවැරදි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ කිසිදු පියවරක් ගෙන නොමැති නම්, විගණකවරයා විසින් ඒ කරුණ පිළිබඳ ලිඛිත වාර්තාවක්, ඉක්මනින් -

(අ) මේ පනතේ යම් නියමයක් හෝ විධිවිධානයක්, ඒ යටතේ නිකුත් කරනු ලබන නියෝග, රීති හෝ විධාන කඩකිරීමක් හෝ ඒවා ඉටුකිරීමට අපොහොසත් වීමක් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය;

(ආ) විනිමය ස්ථානයක රීතීන් කඩකිරීමකට හෝ ඒවා ඉටුකිරීමට අපොහොසත් වීමක් වන අවස්ථාවක දී, අදාළ විනිමය ස්ථානයට සහ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු ය; හෝ

(ඇ) යම්තාක්දුරට ලැයිස්තුගත පොදු සමාගමක මූල්‍ය තත්ත්වයක සැලකිය යුතු හානියකට හේතුවන නීතියක් හෝ නියෝගයක් කඩකිරීමට ආසන්න වීමක් හෝ වංචාකාරී ක්‍රියාවක් කිරීමක් පිළිබඳව විගණකවරයා සතුව විශ්වාස කළ හැකි හේතු පවතින, සමාගමේ සැබෑ හෝ අපේක්ෂිත ක්‍රියාව පිළිබඳ විගණකවරයකු දැනුවත්භාවයට පත්වන අවස්ථාවක දී, අදාළ විනිමය ස්ථානයට සහ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

(3) මේ පනත යටතේ විගණකවරයා විසින් සද්භාවයෙන් ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක් සඳහා සහ මේ වගන්තිය යටතේ විගණකවරයාට පවරන ලද යම් කාර්ය සාධනය සඳහා, විගණකවරයකු යම් උසාවියක නඩු පැවරීමකට යටත් නොවිය යුතු ය.

(4) (අ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි ඔහුගේ විගණනයට අදාළව එකී අමතර තොරතුරු ඉදිරිපත් කිරීමට;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි එකී ආකාරයෙන් හෝ එකී ප්‍රමාණයට ලැයිස්තුගත පොදු සමාගමේ ව්‍යාපාර සහ කටයුතු පිළිබඳව ඔහුගේ විගණනය විශාලනය කිරීමට හෝ ව්‍යාප්ත කිරීමට;

(ඇ) යම් විශේෂිත අවස්ථාවක දී යම් නිශ්චිත විභාගයක් ක්‍රියාවට නැංවීමට හෝ යම් කාර්ය පටිපාටියක් පිහිටුවීමට;

(ඈ) (අ) සිට (ඇ) දක්වා ඡේදවල සඳහන් කරනු ලබන යම් කරුණක් පිළිබඳ අතුරු වාර්තාවක් ඉදිරිපත් කිරීමට,

කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත පොදු සමාගමක විගණකවරයකු වෙත, විගණනයක් අතරතුර හෝ විගණනයකින් පසුව යන ඕනෑම වෙලාවක නියම කරනු ලැබිය හැකි අතර කොමිෂන් සභාව විසින් එකී නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතු බව දක්වන කාලසීමාව නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.

(5) විගණකවරයා විසින් (4) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ යම් නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු අතර මේ වගන්තිය යටතේ ඔහු විසින් ඉටුකරනු ලැබිය යුතු සියලු අමතර කාර්යයන්ට අදාළව කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනුපාතයන්ට ලැයිස්තුගත පොදු සමාගම විසින් විගණකවරයාට ගෙවීමක් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ විගණකවරයා විසින් ඉටුකරනු ලැබිය යුතු සියලු අමතර කාර්යයන්ට අදාළව විගණකවරයා විසින් නියම කරනු ලැබිය යුතු පරිදි ලැයිස්තුගත පොදු සමාගම විසින් එම තොරතුරු සපයනු ලැබිය යුතු අතර එම තොරතුරුවලට ප්‍රවේශ ලබා දිය යුතු ය.

අනිසි බලපෑම සඳහා වන තහනම.

**86.** (1) (අ) යම් තැනැත්තකු විසින් ලැයිස්තුගත පොදු සමාගමක හෝ ඊට අදාළ සමාගම්වල මූල්‍ය ප්‍රකාශ සැදීමේ; හෝ

(ආ) ලැයිස්තුගත පොදු සමාගම හෝ ඊට අදාළ සමාගම්වල මූල්‍ය ප්‍රකාශවල විගණනයේ කාර්ය සාධනයේ,

නිරත වන යම් තැනැත්තකුට, මූල්‍ය ප්‍රකාශ හෝ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශවල වැදගත් කරුණක් අසත්‍ය හෝ නොමග යවනසුලු වීමට හේතුවිය හැකි බවට ඔහු විසින් දන්නා හෝ

සාධාරණ ලෙස දැනගත හැකි විය යුතු වූ යම් දෙයක් කිරීම සඳහා එම තැනැත්තාට බලපෑම් කිරීම, බලෙන් නම්මා ගැනීම, නොමග යැවීම හෝ බලය පැවරීම කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබයි.

2 වන පරිච්ඡේදය

**වෙළෙඳපොළ අතරමැදියන්**

වෙළෙඳපොළ අතරමැදියකු සේ පෙනී සිටීමට එරෙහි තහනම.

**87.** (1) කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව තැනැත්තකු විසින් වෙළෙඳපොළ අතරමැදියකු සේ පෙනී නොසිටිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

කොමිෂන් සභාවේ බලපත්‍රයක් ලබා ගැනීමට වන නියමය.

**88.** (1) වෙළෙඳපොළ අතරමැදියකු ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන හෝ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අපේක්ෂා කරන යම් තැනැත්තකු සතුව, එම කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකට වරදකරු කිරීමේ දී රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක කාලයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

වෙළෙඳපොළ අතරමැදියෙකු ලෙස බලපත්‍රයක් ලබාගැනීම සඳහා හෝ බලපත්‍රය අලුත්කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

**89.** (1) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් ලබාගැනීමට හෝ මේ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ බලපත්‍රය අලුත්කිරීමේ කාර්ය සඳහා හෝ ඉල්ලුම්පත්‍රයක්, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දැක්විය හැකි පරිදි යම් ආකෘතියකින්, යම් ලේඛන හා යම් ගාස්තු ද සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් ඉල්ලුම්කරුට -

(අ) ඉල්ලුම්පත්‍රයේ නිශ්චිතව දැක්විය හැකි පරිදි එකී ආකෘතියෙන් සහ ආකාරයෙන් ඉල්ලීමට සම්බන්ධ වැඩිදුර තොරතුරු සැපයීමට; සහ

(ආ) ඉල්ලුම්පත්‍රය මගින් නිශ්චිතව දැක්විය හැකි පරිදි ඉල්ලුම්පත්‍රයේ කරුණු තහවුරු කිරීමට ඉදිරිපත් කරන ලද යම් තොරතුරු, ඉල්ලුම්කරුගේ වියදමින් යම් ආකාරයෙන් සහ යම් තැනැත්තන් විසින් නිවැරදි දැයි පරීක්ෂා කිරීමට,

නියම කරනු ලැබිය හැකිය.

(3) මේ වගන්තිය යටතේ බලපත්‍රයක් අලුත්කිරීම සඳහා ඇති ඉල්ලුම්පත්‍රයක්, බලපත්‍රයක් වලංගු කාලය ඉකුත්වීමට මාස තුනකට පෙර කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි අලුත් කිරීමේ ගාස්තු ද සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) බලපත්‍රයක වලංගු කාලය ඉකුත්වීමෙන් පසු ඉල්ලුම්කරුවකු විසින් බලපත්‍රය අලුත්කිරීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් අලුත් කිරීම ප්‍රමාද වන සෑම දිනයක් සඳහාම නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි බලපත්‍ර දීමේ ගාස්තුවෙන් සියයට පහකට නොවැඩි, ප්‍රමාදව අලුත් කිරීමේ ගාස්තුවක් බලපත්‍රය අලුත් කිරීමේ ගාස්තුවට අමතරව පනවනු ලැබිය හැකිය.

(5) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සිතන පරිදි යම් කොන්දේසි හෝ සීමාවලට යටත්ව, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම කරනු ලැබිය හැකිය.

බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම.

**90.** (1) වෙළෙඳපොළේ අතරමැදියකු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන හේතුන්ගෙන් යම් හේතුවක් මත ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය:-

(අ) මේ පරිච්ඡේදයට අනුකූලව ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර නොමැතිවීම;

(ආ) ඉල්ලුම්කරු මේ පරිච්ඡේදයේ යම් නියමයන්ට, ඒ යටතේ සාදන ලද නියෝගයන්ට සහ රීතීන්ට අනුකූලව ක්‍රියාකිරීමට අපොහොසත් වී තිබීම;

(ඇ) ඉල්ලුම්කරුවකු විසින් කොමිෂන් සභාවට සපයනු ලබන යම් තොරතුරක් හෝ ලේඛනයක් අසත්‍ය හෝ නොමගයවන සුලු හෝ එහි යම් විස්තර බැහැර කිරීමක් පැවතීම;

(ඈ) ඉල්ලුම්කරු ඈවර කිරීමෙහි හෝ අන්‍යාකාරයකින් විසුරුවා හැරීමේ ක්‍රියාවලියේ පැවතීම හෝ ඉල්ලුම්කරු බුන්වත්භාවයෙන් නිදහස් නොකළ තැනැත්තකු වීම;

(ඉ) ඉල්ලුම්කරුට අදාළ විනිශ්චිත ණයක් වෙනුවෙන් දේපළ අත්පත් කර ගැනීමට ක්‍රියා කිරීමේ දී, එම ණය සම්පූර්ණයෙන් හෝ එම ණයෙන් කොටසක් තෘප්ත කර ගැනීමට නොහැකිව නැවත පැවතීම;

(ඊ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ඉල්ලුම්කරුගේ යම් දේපළකට අදාළව භාරගැනුම්කරුවකු, භාරගැනුම්කරුවකු සහ කළමනාකරුවකු හෝ ඊට සමාන තැනැත්තකුපත් කරනු ලැබ තිබීම;

(උ) ඉල්ලුම්කරුවකු එහි ණයහිමියන් සමග දැනට ක්‍රියාත්මක වන සමථයක් හෝ සැලසුම් යෝජනා ක්‍රමයක් වන සමථයකට හෝ සැලසුම් යෝජනා ක්‍රමයකට ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත දී හෝ එළඹ තිබීම;

(ඌ) ඉල්ලුම්කරු හෝ එහි යම් අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා, කළමනාකරුවන් හෝ පාලකයා විසින් -

(i) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සාපරාධී වංචාවක් හෝ වෙනයම් වංකභාවයක් ඇතුළත් වන්නාවූ වරදකට වරදකරු කරනු ලැබ තිබීම හෝ එකී තැනැත්තා වරදකරු කරනු ලැබූ අවස්ථාවේ දී, වංචාවෙන් හෝ වංකලෙස ක්‍රියාකර ඇති බවට වූ සොයාගැනීමක් පැවතීම;

(ii) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ගනු ලැබූ පරිපාලනමය ක්‍රියාමාර්ගයකට යටත් වීම;

(iii) මේ පනත යටතේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ක්‍රියාත්මකවන සුරැකුම්පත් නීති යටතේ වරදකරු කරනු ලැබූ හෝ යම් තැනැත්තකු චෝදනා ලැබ සිටි වරදක් සමථයකට පත් වූ අවස්ථාවක;

(iv) මූල්‍ය සේවාවන් සැපයීමේ හෝ සමාගම් කළමනාකරණයේ නියුතු තැනැත්තන්ගේ වංකභාවය, අශක්නුතාව හෝ අයුතු ක්‍රියා හේතුවෙන් වන මූල්‍ය පාඩුවලින් මහ ජනතාව ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත හෝ පනවන ලද යම් නීතියක් යටතේ හෝ ඒ මගින් සාදන ලද යම් විධිවිධානයක් උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක;

(v) වංචාකාරී හෝ පීඩාකාරී හෝ අන්‍යාකාරයකින් අනුචිත හෝ ව්‍යාපාර කිරීමේ ක්‍රමවේදය මත අපකීර්තිය පිළිබිඹු වන්නා වූ යම් ව්‍යාපාර පරිචයන්හි නිරත වන්නා වූ අවස්ථාවක;

(vi) එකී තැනැත්තකු ශක්නුතාව සහ අවංකභාවය මත සැක පහළ වන්නා වූ ආකාරයකින් වෙනයම් ව්‍යාපාර පරිචයක නිරත වන හෝ අන්‍යාකාරයකින් එසේ හැසිරීමේ දී ඒ හා සම්බන්ධවන අවස්ථාවක; හෝ

(vii) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත නිදහස් නොකළ බුන්වත්භාවයට පත්වූවකු වන අවස්ථාවක;

(ඵ) ගනුදෙනුකරුවාගේ ඉහළම සුභසිද්ධිය සඳහා ක්‍රියා කිරීම ඉල්ලුම්කරුට හෝ එහි වෙනයම් අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධරයාට හෝ පාලකවරයාට නොහැකි විය හැකි බවට විශ්වාස කිරීමට එම ඉල්ලුම්කරුගේ හෝ අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධරයාගේ හෝ පාලකවරයාගේ කීර්තිය, මූල්‍ය අවංකභාවය සහ විශ්වසනීයත්වය පිළිබඳව සැලකිලිමත්ව, කොමිෂන් සභාවට හේතු පවතින අවස්ථාවක;

(ඒ) ඉල්ලුම්කරුගේ මූල්‍ය ස්ථාවරය හෝ ඉල්ලුම්කරුගේ ව්‍යාපාරය සිදු කිරීමට නියමිත වන්නා වූ ක්‍රමවේදය පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවන විට;

(ඔ) බලපත්‍රය දරන ඉල්ලුම්කරු විසින් කරගෙන යා හැකි ව්‍යාපාරයේ ස්වභාවය පිළිබඳව සැලකිලිමත්ව, ඉල්ලුම්කරුගේ අතීත කාර්ය සාධන වාර්තාව හෝ විශේෂඥ ඥානය පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවන අතර-

(i) ඉල්ලුම්කරු විසින් හෝ එහි වෙන යම් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධරයා හෝ පාලකවරයා විසින් අනුචිත ව්‍යාපාර හැසිරීමකට යොමු කළ හැකි; හෝ

(ii) ඉල්ලුම්කරුගේ ව්‍යාපාරය කිරීමේ ආකාරය මත අපකීර්තිය පිළිබිඹු වන,

අවස්ථාගත තත්ත්වයන් පවතින විට;

(ඕ) ඉල්ලුම්කරු හෝ එහි වෙනයම් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධරයා හෝ පාලකවරයා විසින් ව්‍යාපාරය කාර්යක්ෂමව, අවංකව හෝ අපක්ෂපාතීව කරගෙන නොයනු ඇති බවට විශ්වාස කිරීමට කොමිෂන් සභාවට හේතු පවතින විට;හෝ

(ක) බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අලුත්කිරීම ආයෝජකයන්ගේ යහපතට පටහැනි විය හැකි බව කොමිෂන් සභාවේ මතය වන විට.

(2) කොමිෂන් සභාව විසින් ඉල්ලුම්කරුවාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා නොදී, බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අලුත්කිරීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

අවම මූල්‍ය නියමයන්.

**91.** යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දැක්විය හැකි හෝ විනිමය ස්ථානයක රීති මගින් විධිවිධාන සැපයිය හැකි අවම මූල්‍ය නියමයන් සපුරා නොමැති නම්, කොමිෂන් සභාවේ ලිඛිත එකඟත්වය නොමැතිව මේ පරිච්ඡේදය යටතේ එම වෙළෙඳපොළ අතරමැදියා විසින් බලපත්‍ර ලත් එම ව්‍යාපාරය ක්‍රියාත්මක නොකළ යුතු ය.

කොමිෂන් සභාවේ ලියාපදිංචි වීම සඳහා වන නියමය.

**92.** (1) වෙළෙඳපොළ අතරමැදියකු සඳහා හෝ ඒ වෙනුවෙන් ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු කරන්නා වූ යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාවේ ලියාපදිංචි විය යුතු අතර, ඔහු එම කාර්යය සඳහා ලියාපදිංචිය ලත් තැනැත්තා ලෙසින් හඳුන්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචිය බලාපොරොත්තු වීමේ කාර්ය සඳහා, යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් එම තැනැත්තා වෙනුවෙන් කොමිෂන් සභාව වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

ලියාපදිංචි වීම හෝ ලියාපදිංචිය අලුත් කරවා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රය.

**93.** (1) ලියාපදිංචි වීම හෝ ලියාපදිංචිය අලුත්කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකුගේ ඉල්ලුම්පත්‍රය, කොමිෂන් සභාව විසින් රීති මගින් නිශ්චිතව දැක්විය හැකි නියමිත ආකෘති පත්‍රයකින්, නියමිත ලේඛන හා නියමිත ගාස්තුව ද සමග කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

(2) (අ) කොමිෂන් සභාව විසින් දැක්විය හැකි ආකෘති පත්‍රයකින් සහ ආකාරයකින් ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සැපයීමට ; සහ

(ආ) ඉල්ලුම්කරුගේ වියදමින් කොමිෂන් සභාව විසින් දැක්විය හැකි ආකාරයකින් සහ තැනැත්තන් මගින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රය හා ඉදිරිපත් කරන ලද යම් තොරතුරු සනාථ කිරීමට,

කොමිෂන් සභාව විසින් ඉල්ලුම්කරුට නියම කළ හැකි ය.

(3) මේ වගන්තිය යටතේ ලියාපදිංචිය අලුත් කරවා ගැනීම සඳහා වන ඉල්ලුම්පත්‍රයක් ලියාපදිංචිය අවලංගු වීමට මාස තුනකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

(4) ඉල්ලුම්කරුගේ ලියාපදිංචි කාලය ඉකුත් වීමෙන් පසුව, ලියාපදිංචිය අලුත් කරවා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, අලුත් කිරීමේ ගාස්තුවට අමතරව කොමිෂන් සභාව විසින් ඉල්ලුම්පත්‍රය අලුත් කරවා ගැනීම ප්‍රමාද වන්නා වූ සෑම දිනයක් සඳහා ම නියමිතව දැක්විය හැකි පරිදි ලියාපදිංචි කිරීමේ ගාස්තුවෙන් සියයට පහ නොඉක්මවන අලුත් කරවා ගැනීමේ ප්‍රමාද ගාස්තුවක් ඉල්ලුම්පත්‍රය අලුත් කරනු ලබන තෙක් පනවනු ලැබිය හැකි ය.

(5) කොමිෂන් සභාව විසින් මෙම කොටසේ කාර්ය සඳහා සුදුසු යැයි සිතන පරිදි නියමිත කොන්දේසි සීමාකිරීම්වලට යටත්ව, ලියාපදිංචි ප්‍රදානය කිරීම හෝ එය අලුත්කිරීම සිදු කළ හැකි ය.

ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු.

**94.** (1) මේ කොටස යටතේ ලියාපදිංචිය ලත් තැනැත්තකු වශයෙන් ලියාපදිංචිය ප්‍රදානය කිරීම හෝ එය අලුත් කරවා ගැනීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවක කොමිෂන් සභාව විසින් පහත සඳහන් යම් හේතුවක් මත එම ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ හැකි ය:-

(අ) 93 වන වගන්තියට අනුකූලව ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් නොකිරීම;

(ආ) ඉල්ලුම්කරු, 93 වන වගන්තියේ යම් නියමයක් අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වීම;

(ඇ) ඉල්ලුම්කරු විසින් කොමිෂන් සභාවට සපයා ඇති යම් තොරතුරු හෝ ලේඛන අසත්‍ය වීම හෝ නොමග යවන සුලු වීම හෝ ඒ මගින් යම් වැදගත් කරුණු ප්‍රකාශ කිරීමක් පැහැර හැරීම;

(ඈ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත බුන්වත්භාවයෙන් නිදහස් නොකළ හෝ වස්තු භංගත්වයෙන් නිදහස් නොකළ තැනැත්තකු වීම;

(ඉ) ඉල්ලුම්කරුට එරෙහිව ක්‍රියාත්මක වන යම් විනිශ්චිත ණයක් පූර්ණ වශයෙන් පැවතීම හෝ අර්ධ වශයෙන් තෘප්ත කර නොමැතිව නැවත පැවතීම;

(ඊ) ඉල්ලුම්කරු -

(i) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත වංචාවක් හෝ වෙනයම් වංකභාවයෙන් සම්බන්ධ වූ වරදකට වරදකරු කරනු ලැබීම හෝ එකී තැනැත්තා වරදකරු කරනු ලැබීමේ දී වංචාකාරී ලෙස හෝ වංක ලෙස ක්‍රියා කර ඇති බවට සොයාගැනීම;

(ii) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ගනු ලබන පරිපාලනමය ක්‍රියාමාර්ගයකට යටත් වීම;

(iii) මේ පනත යටතේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ක්‍රියාත්මක වන සුරැකුම්පත් නීති යටතේ වරදකරු කරනු ලැබීම හෝ වරදක් සම්බන්ධව සමථයකට පත් වීම;

(iv) මූල්‍යසේවාවක් සැපයීමේ හෝ සමාගම් කළමනාකරණයේ නියුතු තැනැත්තන්ගේ වංකභාවය, අශක්නුතාව හෝ අයථා ක්‍රියා හේතුවෙන් සිදුවන මූල්‍ය පාඩුවලින් හෝ නිදහස් කළ හෝ නිදහස් නොකළ වස්තු භංගත්වයට පත් තැනැත්තන්ගේ හැසිරීමෙන් සිදුවනු ලබන මූල්‍ය පාඩුවලින් මහජනතාව ආරක්ෂා කිරීම සඳහා පනවන ලද බවට කොමිෂන් සභාවට පෙනීයන ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත වන යම් ලිඛිත නීතියක් යටතේ හෝ එමගින් සාදන ලද යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීම;

(v) වංචාකාරී හෝ අන්‍යාකාරයකින් අනුචිත, නීතිවිරෝධී හෝ එසේ නොවූ හෝ වෙනත් ආකාරයකින් ව්‍යාපාර කිරීමේ ක්‍රමවේදය මත අපකීර්තිය පිළිබිඹු වන්නා වූ බවට කොමිෂන් සභාවට පෙනී යන යම් ව්‍යාපාර පරිචයන්හි නිරත වීම; හෝ

(vi) විනිශ්චයක ශක්නුතාව සහ අඛණ්ඩතාව පිළිබඳ සැක පහළ වන්නා වූ ආකාරයකින් වෙනයම් ව්‍යාපාර පරිචයක නිරත වීම හෝ ඒ හා සම්බන්ධ වීම හෝ අන්‍යාකාරයකින් එසේ හැසිරීම;

(උ) වෙළෙඳපොළ අතරමැදියා සඳහා සහ ඒ වෙනුවෙන් සිදුකිරීමට නියමිත කාර්යයන්ගේ ස්වභාවය පිළිබඳව සැළකිලිමත්ව, ඉල්ලුම්කරුගේ අධ්‍යාපනික හෝ වෙනයම් සුදුසුකමක් හෝ පළපුරුද්ද පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවීම;

(ඌ) ඉල්ලුම්කරුගේ කීර්තිය, චරිත ස්වභාවය, මූල්‍ය අවංකභාවය සහ විශ්වසනීයත්වය පිළිබඳව සැලකිලිමත්ව, වෙළෙඳපොළ අතරමැදියාගේ ගණුදෙනුකරුවන්ගේ ඉහළම සුභසිද්ධිය සඳහා ක්‍රියා කිරීමට ඉල්ලුම්කරුට නොහැකි විය හැකි බවට විශ්වාස කිරීමට කොමිෂන් සභාවට හේතු පැවතීම;

(එ) වෙළෙඳපොළ අතරමැදියා සඳහා හෝ ඒ වෙනුවෙන් සිදු කිරීමට නියමිත කාර්යයන්ගේ ස්වභාවය පිළිබඳව සැලකිලිමත්ව, ඉල්ලුම්කරුගේ අතීත කාර්ය සාධන වාර්තාව හෝ විශේෂඥ ඥානය පිළිබඳව කොමිෂන් සභාව සෑහීමට පත් නොවීම;

(ඒ) ඉල්ලුම්කරු අවංකව හෝ අපක්ෂපාතීව ක්‍රියාකර නොමැති බවට විශ්වාස කිරීමට කොමිෂන් සභාවට හේතු පැවතීම; හෝ

(ඔ) ලියාපදිංචිය ප්‍රදානය කිරීම හෝ එය අලුත්කිරීම ආයෝජකයින්ගේ යහපතට පටහැනි විය හැකි බව කොමිෂන් සභාවේ මතය වීම.

(2) කොමිෂන් සභාව විසින් ඉල්ලුම්කරුට කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබා නොදී, ලියාපදිංචිය කිරීම ප්‍රදානය කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතු ය.

කොන්දේසි හෝ සීමා කිරීම් වෙනස් කිරීමේ බලය.

**95.** කොමිෂන් සභාව විසින් ඕනෑම අවස්ථාවක දී වෙළෙඳපොළ අතරමැදියකුට හෝ ලියාපදිංචියලත් තැනැත්තකුට ලිඛිත දැන්වීමක් මගින් ආයෝජකයින්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය යැයි සැලකෙන යම් කොන්දේසියක් හෝ සීමා කිරීමක් වෙනස් කිරීම හෝ යම් වැඩිදුර කොන්දේසියක් හෝ සීමා කිරීමක් පැනවීම කරනු ලැබිය හැකි ය.

බලපත්‍රයේ හෝ ලියාපදිංචියේ කාලසීමාව.

**96.** (1) මේ කොටස යටතේ ප්‍රදානය කරනු ලැබූ බලපත්‍රයක් එකී බලපත්‍රය නිකුත් කළ දිනයේ සිට මාස දොළහක කාලසීමාවක් දක්වා වලංගු විය යුතු ය.

(2) එම අලුත්කිරීම සිදු නොවූයේ නම්, එම බලපත්‍රයේ කාලය ඉකුත් වන්නා වූ දිනයෙන් ආරම්භ වී මාස දොළහක වැඩිදුර කාලසීමාවක් දක්වා හෝ කොමිෂන් සභාව විසින් නිශ්චිතව දැක්විය හැකි යම් පසු දිනයක් දක්වා මේ කොටස යටතේ අලුත් කරනු ලැබූ යම් බලපත්‍රයක් බලාත්මකව පැවතිය යුතු ය.

(3) මාස දොළහකට වැඩි කාලසීමාවක් දක්වා යම් බලපත්‍රයක් අලුත් කරනු ලබන අවස්ථාවක, (2) වන උපවගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් නිශ්චිතව දැක්වෙන බලපත්‍ර ගාස්තුව වෙළෙඳපොළ අතරමැදියා විසින් කොමිෂන් සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) සිට (3) දක්වා වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ කොටස යටතේ ලියාපදිංචියලත් තැනැත්තකුට ප්‍රදානය කරන ලද ලියාපදිංචියේ කාලසීමාව සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අසත්‍ය සහ නොමඟ යවන සුලු ප්‍රකාශ.

**97.** (1) මේ කොටස යටතේ කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු -

(අ) අසත්‍ය හෝ නොමඟ යවන සුලු බව දන්නා හෝ දන්නා බවට සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි යම් ප්‍රකාශයක් කොමිෂන් සභාවට සිදු කිරීම හෝ එසේ සිදු කිරීමට සැලැස්වීම; හෝ

(ආ) ප්‍රකාශ කිරීම පැහැර හැරීම හේතුවෙන් යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් වන යම් ප්‍රකාශයක් නොමඟ යවන සුලු වනු ඇති බව දන්නා හෝ දන්නා බවට සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි අවස්ථාවක එය කොමිෂන් සභාවට ප්‍රකාශ කිරීම පැහැර හැරීම,නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් කරනු ලැබේ.

කොමිෂන් සභාවට දැනුම් දීමේ වගකීම.

**98.** (1) යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් බලපත්‍රයක් සඳහා හෝ බලපත්‍රයක් අලුත්කර ගැනීම සඳහා වන ඉල්ලීමක දැනටමත් සපයා ඇති වැදගත් විස්තර වෙනස් කිරීමට යෝජනා කරන හෝ එහි නිශ්චිතව සඳහන් විස්තර කිසිවක් වෙනස් කරනු ලබන හෝ වෙනස් කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක, එවැනි වෙනසක් කිරීමට හෝ වෙනස් කිරීම ක්‍රියාත්මක කිරීමට පෙර කොමිෂන් සභාව වෙත ඒ බව දන්වා එහි පූර්ව කැමැත්ත ලබා ගැනීම එකී අතරමැදියකුගේ වගකීම විය යුතු ය.

(2) ලියාපදිංචියලත් තැනැත්තකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා හෝ ලියාපදිංචිය අලුත් කරවා ගැනීම සඳහා වන ඉල්ලීමක දැනටමත් සපයා ඇති යම් වැදගත් විස්තර වෙනස් කිරීමට යම් ලියාපදිංචියලත් තැනැත්තකු විසින් යෝජනා කරන හෝ එහි සඳහන් විස්තර කිසිවක් වෙනස් කරනු ලබන හෝ වෙනස් කිරීමට අදහස් කරනු ලබන හෝ ඉල්ලුම්පත්‍රයෙහි නිශ්චිතව දක්වා ඇති තත්ත්වයෙන් වෙනසකට පත්වන්නා වූ අවස්ථාවක, එවැනි වෙනසක් කිරීම සම්බන්ධයෙන්

කොමිෂන් සභාව වෙත වහාම දැනුම් දීම එකී ලියාපදිංචිය ලත් තැනැත්තාගේ සහ එකී ලියාපදිංචියලත් තැනැත්තා විසින් ක්‍රියා කරන්නා වූ හෝ සේවය කරන්නා වූ වෙළෙඳපොළ අතරමැදියාගේ වගකීම විය යුතු ය.

නියෝජිතයකු වශයෙන් පෙනී සිටීම සඳහා වන තහනම.

**99.** කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ අතරමැදියකුගේ නියෝජිතයකු වශයෙන් ක්‍රියා කිරීමට එකී තැනැත්තාට නිසි ලෙස බලය පවරන ලද්දේ නම් හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද තැනැත්තෙක් නම් මිස, යම් තැනැත්තකු බලපත්‍රලත් වෙළෙඳපොළ අතරමැදියකුගේ ව්‍යාපාරයක් කරගෙන යාමේ දී නියෝජිතයකු වශයෙන් ක්‍රියා කිරීම හෝ එසේ ක්‍රියා කරන ලෙස පෙනී සිටීම නොකළ යුතු ය.

බලපත්‍රය හෝ ලියාපදිංචිය අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

**100.** (1) (අ) කොමිෂන් සභාව බලපත්‍රයක් සඳහා වූ යම් ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකි හේතුවක් පවතින බවට;

(ආ) වෙළෙඳපොළ අතරමැදියාගේ බලපත්‍රය සම්බන්ධයෙන් යම් කොන්දේසියක් හෝ සීමා කිරීමක් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් එකී තැනැත්තාට නිකුත් කරන ලද යම් විධානයක් වෙළෙඳපොළ අතරමැදියා විසින් උල්ලංඝනය කරන ලද බවට;හෝ

(ඇ) වෙළෙඳපොළ අතරමැදියාට බලපානු ලබන යම් රීතියක් අවස්ථාවෝචිතව එකී වෙළෙඳපොළ අතරමැදියා විසින් උල්ලංඝනය කරන ලද බවට,

කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක,කොමිෂන් සභාව විසින් මේ කොටස යටතේ යම් අතරමැදියකුට ප්‍රදානය කරන ලද එම බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව, වෙළෙඳපොළ අතරමැදියකුට ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට පෙර, එකී අතරමැදියාට හේතු දැක්වීමට අවස්ථාවක් ලබා දෙනු ලැබිය යුතු ය.

(3) වෙළෙඳපොළ අතරමැදියකුට ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කරන අවස්ථාවක, තම බලපත්‍රය නොපමාව කොමිෂන්

සභාව වෙත භාර දීම එම වෙළෙඳපොළ අතරමැදියාගේ යුතුකම විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමෙන්, මේ පනත යටතේ එකී වෙළෙඳපොළ අතරමැදියාට එරෙහිව යම් නීතිමය ක්‍රියා මාර්ගයක් යටතේ නඩු පැවරීම හෝ එකී නඩු පවත්වාගෙන යාමට බලපෑමක් හෝ එයට අගතියක් සිදු නොවිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් නියම කරන ලද රීතීන්ට අනුකූලව, මේ පනත යටතේ ලියාපදිංචියලත් තැනැත්තකුට ප්‍රදානය කරන ලද ලියාපදිංචිය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

(6) මේ වගන්තියේ (1) සිට (4) දක්වා වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ කොටස යටතේ ලියාපදිංචිය ලත් තැනැත්තකු හට ප්‍රදානය කරන ලද යම් ලියාපදිංචියක් අවස්ථාවෝචිතව අත්හිටුවීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

වෙළෙඳපොළ අතරමැදියන් විසින් සුරැකුම්පත් වෙළඳාමේ යෙදීම.

**101.** යම් වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචියලත් තැනැත්තකු විසින් -

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමතය නොමැතිව, තමා වෙළෙඳාම සඳහා සහභාගිවන්නකුව සිටින විනිමය ස්ථානයෙන් බාහිරව සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම හෝ අන් ආකාරයකින් ගණුදෙනු කිරීම හෝ කරනු නොලැබිය යුතු ය;

(ආ) කොමිෂන් සභාවේ රීති හෝ වෙළෙඳපොළ ආයතනයේ රීති උල්ලංඝනය වන ආකාරයට සුරැකුම්පත් වෙළෙඳාම් කරනු නොලැබිය යුතු ය;

(ඇ) වෙළෙඳාම සඳහා සහභාගිවන්නකු වන වෙළෙඳපොළ ආයතනයක් විසින් දක්වා ඇති නියමයන්ට පටහැනි වන ආකාරයට ආන්තික ගිණුමක ගනුදෙනු කිසිවක් කරනු නොලැබිය යුතු ය; හෝ

(ඇ) සුරැකුම්පත් කිසිවක් මිලට ගැනීමට හෝ විකිණීමට පෙලඹවීම පිණිස හෝ පෙලඹවීමට තැත් කිරීම පිණිස කිසියම් උපක්‍රමශීලී, මුලාකාරී හෝ වෙනත් වංචාකාරී ක්‍රමයක් නැතහොත් ප්‍රයෝගයක් මගින් කිසියම් ගනුදෙනුවක් කරනු නොලැබිය යුතු ය.

**102.** වෙළෙඳපොළ අතරමැදියකු විසින් ගනුදෙනුකරුවාගේ ලිඛිත කැමැත්ත නොමැතිව එකී ගනුදෙනුකරුවාගේ ගිණුමෙහි පවතින යම් සුරැකුම්පත් ණයට දීම හෝ ණයට දීමට කටයුතු සැලැස්වීම නොකළ යුතු අතර, ගනුදෙනුකරුවාගේ ලිඛිත කැමැත්ත නොමැතිව සමපාර්ශ්වීය ලෙසින් යම් ගනුදෙනුකරුවකුගේ ගිණුමෙහි පවතින සුරැකුම්පත් භාවිතයෙන් ණයට ගැනීම හෝ ණයට ගැනීමට කටයුතු සැලැස්වීම නොකළ යුතු ය.

ගණුදෙනුකරුවාගේ කැමැත්ත නොමැතිව සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම.

**103.** (1) වෙළෙඳපොළ අතරමැදියකුගේ විගණකවරයකු වශයෙන් තම කාර්ය සාධනය සාමාන්‍ය පරිදි ඉටු කිරීමේ දී යම් විගණකවරයකු මේ පනතේ යම් නියමයන් හෝ විධිවිධාන, එය යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් හෝ ඒවාට අනුකූල නොවීමක් හෝ වෙළෙඳපොළ ආයතනයක යම් රීති කඩකිරීමක් හෝ වෙළෙඳපොළ අතරමැදියාගේ මූල්‍ය තත්ත්වයට වැදගත් ප්‍රමාණයකට අහිතකර ලෙස බලපානු ලැබිය හැකි යම් කරුණක් පවතින බවට වෘත්තීය මතයක් දරන්නේ නම් විගණකවරයා විසින් අදාළ කරුණ පිළිබඳව ලිඛිත වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වහාම ඉදිරිපත් කළ යුතු අතර, එකී ලිඛිත වාර්තාවේ පිටපතක් බැගින් -

වෙළෙඳපොළ අතරමැදියකුගේ විගණකවරයාගේ වගකීම.

(අ) මේ පනතේ යම් නියමයක් හෝ විධිවිධානයක්, එය යටතේ නිකුත් කරන ලද නියෝග, රීති හෝ විධාන කඩකරනු ලැබූ හෝ ඒවාට අනුකූල නොවූ අවස්ථාවක කොමිෂන් සභාවට;

(ආ) වෙළෙඳපොළ ආයතනයේ යම් රීති කඩ කරනු ලැබූ හෝ ඒවාට අනුකූල නොවූ අවස්ථාවක, අදාළ වෙළෙඳපොළ ආයතනයට සහ කොමිෂන් සභාවට; හෝ

(ඇ) වෙළෙඳපොළ අතරමැදියාගේ මූල්‍ය තත්ත්වයට වැදගත් ප්‍රමාණයකට අහිතකර ලෙස බලපානු ලබන වෙනයම් අවස්ථාවක අදාළ ආයතනයට සහ කොමිෂන් සභාවට, ඉදිරිපත් කළ යුතු ය.

(2) විගණකවරයා විසින් සද්භාවයෙන් ඉදිරිපත් කරනු ලැබූ යම් වාර්තාවක් සඳහා සහ මේ වගන්තිය යටතේ විගණකවරයා මත පනවනු ලබන යම් කාර්යයක් අදහස් කරනු ලබන පරිදි සිදු කිරීම සම්බන්ධයෙන් යම් අධිකරණයක දී පවරනු ලබන නඩුවක දී විගණකවරයා වග කියනු නොලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් විගණනයක් අතරතුර දී හෝ ඉන් පසුව ඕනෑම අවස්ථාවක දී -

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කළ හැකි පරිදි ඔහුගේ විගණනය සම්බන්ධයෙන් යම් අතිරේක තොරතුරු ඉදිරිපත් කිරීමට;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කළ හැකි පරිදි නියමිත ආකාරයකින් හෝ නියමිත ප්‍රමාණයකින් තම වෙළෙඳපොළ අතරමැදියකුගේ ව්‍යාපාර කටයුතු විගණනයේ විෂයය පථය විශාල කිරීමට හෝ දීර්ඝ කරනු ලැබීමට;

(ඇ) යම් විශේෂ අවස්ථාවක, යම් විශේෂ පරීක්ෂණයක් පැවැත්වීමට හෝ යම් කාර්ය පටිපාටියක් සකස් කිරීමට; හෝ

(ඈ) (අ) සිට (ඇ) දක්වා වූ ඡේදවල සඳහන් යම් කරුණක් පිළිබඳව වාර්තාවක් හෝ අතුරු වාර්තාවක් ඉදිරිපත් කිරීමට,

යම් වෙළෙඳපොළ අතරමැදියකුගේ විගණකවරයකුට නියම කරනු ලැබිය හැකි අතර, විගණකවරයා විසින් එකී නියමයන්ට අනුකූලව එකී කටයුතු සිදු කළ යුතු කාලය කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කළ හැකි ය.

(4) විගණකවරයා විසින් (3) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ යම් නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතු අතර, වෙළෙඳපොළ අතරමැදියා විසින් මේ වගන්තිය යටතේ ඔහු විසින් ඉටු කරන්නා වූ සියලු අතිරේක කාර්යයන් පිළිබඳව කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනුප්‍රමාණවලින් විගණකවරයා වෙත පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

(5) වෙළෙඳපොළ අතරමැදියා විසින් මේ වගන්තිය යටතේ විගණකවරයකු විසින් ඉටු කරන්නා වූ සියලු අතිරේක කාර්යයන් සම්බන්ධයෙන් විගණකවරයාට අවශ්‍ය වන්නා වූ යම් තොරතුරු සපයනු ලැබීම සහ එම තොරතුරුවලට ප්‍රවේශ වීම සඳහා ඉඩ සලසනු ලැබීම සිදු කරනු ලැබිය යුතු ය.

3 වන පරිච්ඡේදය

**ගණුදෙනුකරුවන්ගේ වත්කම්වල ආරක්ෂාව**

අර්ථ නිරූපණය.

**104.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා-

වෙළෙඳපොළ අතරමැදියකු සම්බන්ධයෙන් "ගනුදෙනුකරුවා" යන්නෙන්, යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් වෙළඳාම් කරනු ලබන්නේ හෝ එම වෙළෙඳපොළ අතරමැදියා විසින්, සුරැකුම්පත් ගනුදෙනු කිරීම සඳහා උපදෙස් පිළිපදින්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද, එම තැනැත්තා අදහස් වේ.

ගනුදෙනුකරුවාගේ වත්කම්වල ආරක්ෂාව.

**105.** (1) යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් ගණුදෙනුකරුවාගේ ගිණුම මත හෝ එම ගිණුමෙන් ලබා ගන්නා මුදල් හෝ වෙනත් වත්කම්වල ප්‍රමාණයට -

(අ) මුදල් හෝ වෙනත් වත්කම් ලබා දීමේ දී හෝ ලබා දීමට පෙර ගනුදෙනුකරුවා විසින් එකඟ විය හැකි යම් කාර්යයක් සඳහා පමණක් එම මුදල් හෝ වෙනත් වත්කම් අදාළ විය යුතු බව පදනම් කර ගනිමින් එසේ සිදු කළ යුතු ය;

(ආ) ගනුදෙනුකරුවාගේ අර්ථලාභය සඳහා එකී ගනුදෙනුකරුවාගේ ගිණුම මත ලබාගත් මුදල් සහ වෙනත් වත්කම් භාරයක් සේ දැරිය යුතු ය;

(ඇ) ගනුදෙනුකරුවාගේ ගිණුමක් මත ලබාගත් මුදල්, තම අරමුදල් සමඟ සම්මිශ්‍රණය කිරීම හෝ එකී මුදල් ආන්තිකව හෝ ඇප වශයෙන් භාවිත කිරීම හෝ එහි යම් ගණුදෙනුවක් අත්කර ගැනීමට හෝ ගනුදෙනුකරුවාගේ හැර වෙන යම් තැනැත්තකුගේ ණයවර දීර්ඝ කිරීම ගනුදෙනුකරුවාගේ ලිඛිත කැමැත්ත නොමැතිව,නොකළ යුතු ය;

(ඇ) මේ කොටසේ විධිවිධානවලට හෝ එකී ගනුදෙනුකරුවාගේ මුදල් හෝ වෙනත් වත්කම් සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කළ හැකි යම් රීතියකට අනුකූලව එක් එක් ගනුදෙනුකරුවකු සඳහා වෙන වෙනම පොත් සටහනක් වාර්තා කිරීම සහ පවත්වාගෙන යාම කළ යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් සිදු කරනු ලබන මුදල් හෝ වෙනත් වත්කම් හැසිරවීම ද ඇතුළුව, (1) වන උපවගන්තියේ වන කරුණු සියල්ල හෝ ඉන් කිසිවකට ද අදාළව රීති සාදනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සාදන ලද රීති මගින් හෝ මේ වගන්තියේ අන්‍යාකාරයකින් විධිවිධාන සලසා ඇති පරිදි හැර, ගනුදෙනුකරුවාගේ ගිණුමට ලැබුණු හෝ ගිණුමෙන් ලබා ගත් හෝ වෙළෙඳපොළ අතරමැදියකු සමඟ තැන්පත් කරන ලද සියලු මුදල් හෝ වෙනත් වත්කම් -

(අ) වෙළෙඳපොළ අතරමැදියාගේ ණය පියවීම සඳහා යොදවා ගැනීමට සලස්වනු නොලැබිය යුතු ය; සහ

(ආ) එකී වෙළෙඳපොළ අතරමැදියාගේ යම් බැඳීමකට අදාළව යම් අධිකරණ ක්‍රියාවලියක් හෝ නියෝගයක් යටතේ ක්‍රියාත්මක වීමේ දී ගෙවනු ලැබීමට හෝ ලබාගනු ලැබීමට වග කියනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය, (3) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් රීතියක් උල්ලංඝනය කරනු ලබන යම් වෙළෙඳපොළ අතරමැදියකු වරදකට වරදකරුවකු විය යුතු ය.

ව්‍යාපාර චර්යාව පිළිබඳ රීති.

**106.** (1) කොමිෂන් සභාව විසින් ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සහ වෙළෙඳපොළ අතරමැදියකුගේ සහ ලියාපදිංචිය ලත් තැනැත්තකුගේ වෘත්තීය ප්‍රමිතීන් උසස් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකන පරිදි, වෙළෙඳපොළ අතරමැදියකුගේ ව්‍යාපාර චර්යාව හෝ ලියාපදිංචිය ලත් තැනැත්තකුගේ ව්‍යාපාර චර්යාව නියාමනය කිරීමට රීති සකස් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීති උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරුවකු විය යුතු ය.

**අසාධාරණ නිර්දේශ කිරීම් සඳහා වගකීම.**

**107.** (1) යම් ප්‍රතීත වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචිය ලත් තැනැත්තකු ආයෝජකයකු, යම් තැනැත්තකුට සුරැකුම්පත් සම්බන්ධයෙන් නිර්දේශයක් කිරීම සඳහා යම් සාධාරණ පදනමක් නොමැති නම්, වෙළෙඳපොළ අතරමැදියකුගේ හෝ ලියාපදිංචියලත් තැනැත්තකුගේ නිර්දේශ කිරීම මත විශ්වාසය තැබීමට සාධාරණව අදහස් කරනු ලැබිය හැකි යම් සුරැකුම්පතකට අදාළව කිසිදු තැනැත්තකුට නිර්දේශ කිරීම නොකළ යුතු අතර, සුරැකුම්පත්වල වටිනාකම උච්චාවචනය විය හැකි බවට අනතුරු හැඟවීම ද සිදු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, යම් වෙළෙඳපොළ අතරමැදියකුට හෝ ලියාපදිංචිය ලත් තැනැත්තකුට -

(අ) යම් තැනැත්තකුගේ ආයෝජන අරමුණු, මූල්‍ය තත්ත්වය සහ විශේෂ අවශ්‍යතා පිළිබඳව සැලකිල්ලක් දක්වමින් එම නිර්දේශය කිරීම යෝග්‍ය දැයි තීරණය කිරීම සඳහා ඔහු සන්තකයේ ඇති තොරතුරු නිරවද්‍ය සහ සම්පූර්ණ නම්; සහ

(ආ) ඔහු විසින් නිර්දේශ කිරීමේ විෂයය කරුණ සම්බන්ධයෙන් සෑම අවස්ථානුගත තත්ත්වයක දී ම සාධාරණ ලෙසින් නිසි උද්‍යෝගයක් යොදවා ඇත්තේ නම් සහ ඒ අනුව නිර්දේශ කිරීම සිදු කර ඇත්තේ නම්,

මිස, යම් තැනැත්තකු නිර්දේශ කිරීම සඳහා සාධාරණ පදනමක් නොමැති විය යුතු ය.

(3) වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචියලත් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය උල්ලංඝනය කර ඇති අවස්ථාවක, එකී වෙළෙඳපොළ අතරමැදියා හෝ ලියාපදිංචියලත් තැනැත්තා විසින් -

(අ) නිර්දේශය මත විශ්වාසය තබන්නා වූ තැනැත්තා විසින් කිසියම් ක්‍රියාවක් සිදු කිරීමේ දී හෝ කිසියම් ක්‍රියාවක් සිදු කිරීමෙන් වැළකී සිටීමේ දී;

(ආ) නිර්දේශය සහ අදාළ වන්නා වූ අනෙකුත් සියලු අවස්ථානුගත තත්ත්වයක් පිළිබඳව සැලකිලිමත්ව, නිර්දේශය මත විශ්වාසය තබා කිසියම් ක්‍රියාවක් සිදු කිරීම හෝ කිසියම් ක්‍රියාවක් සිදු කිරීමෙන් වැළකී සිටීම එම තැනැත්තාට යුක්ති සහගත වන අවස්ථාවක;සහ

(ඇ) එම තැනැත්තාට අදාළ කරගත හැකි වෙනයම් පිළියමකට අගති විරහිතව අවස්ථාවෝචිතව යම් ක්‍රියාවක් සිදු කිරීමේ හෝ සිදු නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එකී තැනැත්තාට පාඩුවක් හෝ හානියක් විඳින්නට සිදු වූ අවස්ථාවක,

යම් සෘජු පාඩුවක් හෝ හානියක් වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා වග කියනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාව, කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කළ හැකි යම් කොන්දේසි මත යම් වෙළෙඳපොළ අතරමැදියකු හෝ වෙළෙඳපොළ අතරමැදියන් පන්තියක් මේ වගන්තිය අදාළ වීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(5) එකී තැනැත්තා (1) වන උපවගන්තිය යටතේ වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලියාපදිංචිය ලත් තැනැත්තකු විසින් සිදු කරන ලද නිර්දේශ කිරීම නොසලකා, අවස්ථානුගත තත්ත්වයක දී යම් ක්‍රියාවක් සිදු කරන ලද හෝ සිදු කිරීම පැහැර හරින ලද බවට සනාථ වුයේ නම්, වෙළෙඳපොළ අතරමැදියා හෝ ලියාපදිංචියලත් තැනැත්තා විසින් (3) වන උපවගන්තිය යටතේ වගකියනු නොලැබිය යුතු ය.

(6) වෙළෙඳපොළ අතරමැදියා හෝ ලියාපදිංචියලත් තැනැත්තා විසින් නිර්දේශය සිදු කරනු ලබන අවස්ථාවක, සියලු අවස්ථානුගත තත්ත්වයන් වල දී ගනුදෙනුකරුවාගේ ආයෝජන අරමුණු, මූල්‍ය තත්ත්වය සහ විශේෂ අවශ්‍යතා පිළිබඳව වෙළෙඳපොළ අතරමැදියා හෝ ලියාපදිංචිය ලත් තැනැත්තා සන්තකයේ වූ තොරතුරු පිළිබඳව සැලකිලිමත්ව සිදු කරන ලද නිර්දේශය පිළිබඳව සෑහීමට පත්විය හැකි බව සනාථ කර ඇත්තේ නම්, (1) වන උපවගන්තිය උල්ලංඝනය වූ අවස්ථාවක, වෙළෙඳපොළ අතරමැදියා හෝ ලියාපදිංචිය ලත් තැනැත්තා වග කියනු නොලැබිය යුතු ය.

සුරැකුම්පත්වල ඇතැම් සම්බන්ධතා අනාවරණය කිරීම.

**108.** (1) වෙළෙඳපොළ අතරමැදියා විසින් චක්‍රලේඛයක් හෝ වෙනයම් සමාන සන්නිවේදනයක් මගින් යම් සුරැකුම්පතක් පිළිබඳව නිර්දේශයක් සිදු කර යොමු කරන්නා වූ අවස්ථාවක චක්‍රලේඛය හෝ වෙනයම් සන්නිවේදනය යොමු කරන ලද දිනය වන විට

ඔහුට හෝ ඔහුට සම්බන්ධයක් ඇති හෝ ඔහුට බැඳී ඇති යම් තැනැත්තකුට එම සුරැකුම්පත් අත්කර ගැනීමේ දී හෝ බැහැර කිරීමේ දී ඇති යම් සබඳතාවක ස්වභාවය පිළිබඳව සංක්ෂිප්ත ප්‍රකාශයක් ඔහු විසින් එම චක්‍රලේඛයේ හෝ වෙන යම් සන්නිවේදනයේ ඇතුළත් කළ යුතු ය.

(2) වෙළෙඳපොළ අතරමැදියකු විසින් (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන අවස්ථාවක, ඔහු විසින් (1) වන උපවගන්තිය උල්ලංඝනය කිරීම පිළිබඳව වූ වරදකට චෝදනා ලැබිය යුතු අතර, චක්‍රලේඛය හෝ වෙනයම් සන්නිවේදනය යොමු කරන ලද අවස්ථාවේ දී වන විට -

(අ) සුරැකුම්පත් අත්කර ගැනීමට හෝ බැහැර කිරීමට යම් අයිතියක් ඔහුට තිබූ බව; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි, සුරැකුම්පත් අත්කර ගැනීමට හෝ බැහැර කිරීමට හෝ සුරැකුම්පත් අත්කර ගැනීමේ දී හෝ බැහැර කිරීමේදී ඔහුට අයිතියක් ඇති හෝ ඔහුට බැඳී ඇති තැනැත්තාට යම් අයිතියක් තිබූ බව,

ඔහු විසින් නොදැන සිටි බව සහ දැන සිටින බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ නොහැකි බව සනාථ කිරීම වෙළෙඳපොළ අතරමැදියාට විත්ති වාචකයක් විය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල කාර්ය සඳහා -

(අ) සුරැකුම්පත් අත්කර ගැනීමේ දී හෝ බැහැර කිරීමේ දී යම් තැනැත්තකුගේ අයිතිය යන්නෙන්, සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම මත හෝ එමගින් යම් තැනැත්තකුට කෙළින්ම හෝ අන්‍යාකාරයකින් උපචය වන්නා වූ හෝ උපචය විය හැකි යම් මූල්‍යමය අර්ථලාභයක් හෝ වාසියක් ඇතුළත් වේ;

(ආ) (අ) ඡේදයේ ව්‍යාප්තියට සීමා විරහිතව, සුරැකුම්පත් පිළිබඳව ප්‍රතිරක්ෂණ සම්මුතියකට එළඹ සිටින්නා වූ යම් තැනැත්තකුට සුරැකුම්පත් අත්කර ගැනීමේ දී හෝ බැහැර කිරීමේ දී යම් අයිතියක් ඇති බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ඇ) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය නොතකා චක්‍රලේඛය හෝ වෙනයම් සන්නිවේදනයක් යොමු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු සහ වෙනත් තැනැත්තකු හවුලේ ක්‍රියා කරන්නේ නම් හෝ අන්‍යාකාරයකින් ඔවුන් දෙදෙනා අතර ඇති කර ගන්නා ලද වැඩපිළිවෙළක් යටතේ හෝ එයට අනුකූලව කටයුතු කරන්නේ නම් මිස, යම් තැනැත්තකු වෙනත් තැනැත්තකු සමඟ බැඳීමක් හෝ සම්බන්ධතාවක් ඇති කරගෙන නොමැති විය යුතු ය.

(4) වෙළෙඳපොළ අතරමැදියා විසින් (1) වන උපවගන්තිය අදාළ වන්නා වූ යම් චක්‍රලේඛයක් හෝ වෙනයම් සන්නිවේදනයක් යම් තැනැත්තකු වෙත යොමු කරන අවස්ථාවක, වෙළෙඳපොළ අතරමැදියා විසින් එකී චක්‍රලේඛයේ හෝ වෙනයම් සන්නිවේදනයක පිටපතක් අවුරුදු හයක් දක්වා සංරක්ෂණය කළ යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකු වෙත යොමු කරන ලද චක්‍රලේඛයක් හෝ වෙන යම් සන්නිවේදනයක්, වෙළෙඳපොළ අතරමැදියකුගේ නිලධරයකු විසින් අත්සන් කර ඇත්තේ නම්, වෙළෙඳපොළ අතරමැදියා විසින් යොමු කරනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරනු ලැබිය යුතු ය.

අභ්‍යන්තර කාර්ය පටිපාටි සහ ක්‍රියාවලි.

**109.** වෙළෙඳපොළ අතරමැදියාට එහි ව්‍යාපාරයන් හි අවදානම් අධීක්ෂණයට හැකියාව ලබා දිය හැකි වන පරිදි මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානවලට අනුකූලව අධීක්ෂණය කිරීමේ කාර්ය සඳහා වූ සාධාරණ කාර්ය පටිපාටි සහ ක්‍රියාවලි, වෙළෙඳපොළ අතරමැදියකු විසින්, ලිඛිතව, ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම කළ යුතු ය.

වෙළෙඳපොළ අතරමැදියන් සහ ලියාපදිංචි තැනැත්තන්ගේ නාම ලේඛනය.

**110.** (1) කොමිෂන් සභාව විසින්, එය නිශ්චය කරන යම් ආකාරයෙන් මහජන පරීක්ෂාව සඳහා ලබා ගත හැකි ලෙස සකස් කළ යුතු වෙළෙඳපොළ අතරමැදියන්ගේ සහ ලියාපදිංචි තැනැත්තන්ගේ නාම ලේඛනයක් එය නිශ්චය කළ හැකි යම් ආකෘතියෙන් හා ආකාරයෙන් තබා ගත යුතු ය.

(2) නාම ලේඛනය ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් විය යුතු අතර කොමිෂන් සභාව විසින් සෑම කාලයකදීම නාම ලේඛනය යාවත්කාලීන කළ යුතු ය.

(3) වෙළෙඳපොළ අතරමැදියා සහ ලියාපදිංචිය ලත් තැනැත්තා සඳහා වන නාම ලේඛනයෙහි-

(අ) වෙළෙඳපොළ අතරමැදියාගේ හෝ ලියාපදිංචිය ලත් තැනැත්තාගේ නම;

(ආ) වෙළෙඳපොළ අතරමැදියාගේ හෝ ලියාපදිංචිය ලත් තැනැත්තාගේ ව්‍යාපාර ලිපිනය;

(ඇ) වෙළෙඳපොළ අතරමැදියා විසින් දරනු ලබන බලපත්‍ර වර්ගය හෝ ලියාපදිංචිය ලත් තැනැත්තා විසින් දරනු ලබන ලියාපදිංචියේ වර්ගය;

(ඈ) වෙළෙඳපොළඅතරමැදියාට බලපත්‍රය ප්‍රදානය කරන ලද දිනය හෝ ලියාපදිංචිය ලත් තැනැත්තාට ලියාපදිංචිය ප්‍රදානය කරන ලද දිනය;

(ඉ) වෙළෙඳපොළ අතරමැදියා වෙනුවෙන් ක්‍රියාකරන හෝ වෙළෙඳපොළ අතරමැදියා විසින් සේවයෙහි යොදවන ලද ලියාපදිංචිය ලත් තැනැත්තන්ගේ නම්; සහ

(ඊ) කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකන වෙනත් යම් කාරණා,

අඩංගු විය යුතු ය.

(4) මේ පනත යටතේ වෙළෙඳපොළ අතරමැදියා විසින් දරනු ලබන බලපත්‍රයක් අවලංගුකර හෝ අත්හිටුවා ඇති අවස්ථාවක දී හෝ ලියාපදිංචිය ලත් තැනැත්තකු විසින් දරනු ලබන ලියාපදිංචියක් අවලංගුකර හෝ අත්හිටුවා ඇති අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් එම වෙළෙඳපොළ අතරමැදියා සම්බන්ධයෙන් හෝ ලියාපදිංචිය ලත් තැනැත්තා සම්බන්ධයෙන් නාම ලේඛනය සුදුසු ලෙස සංශෝධනය කළ හැකි ය.

IV වන කොටස

## ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම

**111.** මේ කොටසේ පරමාර්ථ සහ අරමුණ විය යුත්තේ- මේ කොටසේ පරමාර්ථ සහ අරමුණ.

(අ) දේශීය සහ විදේශීය ආයෝජකයන්ට, ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විනිවිදභාවයෙන් යුතු ව විකිණීමේ සහ මිල දී ගැනීම සඳහා පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු හරහා ශ්‍රී ලංකාව තුළ පරිශ්‍රයක් සැපයීම; සහ

(ආ) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු හරහා විනිවිදභාවයෙන් යුතු ව ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් සම්බන්ධව දේශීය සහ විදේශීය ආයෝජකයන්ට තොරතුරු අනාවරණය කර ගැනීමට පහසුකම් සැපයීම,

1 වන පරිච්ඡේදය

## පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු පිහිටුවීම

**112.** මේ පනත යටතේ යම් තැනැත්තකු, එකී තැනැත්තා කොමිෂන් සභාවෙහි ලියාපදිංචි කර හෝ ලියාපදිංචි කිරීමෙන් නිදහස් කර ඇත්නම් මිස, වෙළෙඳපොළ මෙහෙයවන්නකු ලෙස ක්‍රියා නොකළ යුතු ය. පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු පිහිටුවීම.

**113.** (1) 112 වන වගන්තියේ කාර්ය සඳහා, කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකු විසින් කරන ලද ඉල්ලුම්පත්‍රයක් මත, කොමිෂන් සභාව අවශ්‍ය යයි සලකනු ලබන යම් නියමයන්ට හෝ කොන්දේසිවලට යටත් ව එම තැනැත්තා වෙළෙඳපොළ මෙහෙයවන්නකු වශයෙන් ලියාපදිංචි කළ හැකි ය. වෙළෙඳපොළ මෙහෙයවන්නකු ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද යම් නියම හෝ කොන්දේසි, කොමිෂන් සභාව විසින්, කලින් කල, එකතු කිරීම, වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම කරනු ලැබිය හැකි ය.

**114.** (1) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කළ හැකි පරිදි එකී ආකාරයෙන් සහ එකී ලේඛන සහ තොරතුරුවලින් සමන්විත විය යුතු ය. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම.

(2) මේ වගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා එකී තැනැත්තා විසින් කරන ලද ඉල්ලුම් පත්‍රයෙහි කොමිෂන් සභාව සෑහීමට පත් කරන පරිදි පරිශ්‍රය මත සිදු කරන වෙළෙඳාම් පිළිබඳ එකී තැනැත්තා සතු අත්දැකීම් සනාථ කරන ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

(3) මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචිය සඳහා එකී තැනැත්තා විසින් කරනු ලබන ඉල්ලුම්පත්‍රයෙහි කොමිෂන් සභාව සෑහීමට පත් කරන පරිදි පරිශ්‍රය මත සිදු කරනු ලබන වෙළෙඳාම් නිදහස් කිරීම සහ නිරවුල් කිරීම සඳහා එකී පරිශ්‍රය මගින් කරන ලද විධිවිධාන පිළිබඳව සනාථ කරන ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

## 2 වන පරිච්ඡේදය

## පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකුගේ කාර්යභාරය

පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකුගේ කර්තව්‍ය සහ කාර්ය.

**115.** (අ) ශ්‍රී ලංකාව තුළ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විකිණීම සහ මිල දී ගැනීම සඳහා පරිශ්‍රයක් සැපයීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් සම්බන්ධ තොරතුරු දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය ප්‍රජාවට සැපයීම;

(ඇ) එහි වෙළෙඳපොළ සාමාජිකයන් ඇතුළත් කිරීම සඳහා සහ නියාමන කිරීම සඳහා වූ නිර්ණායක සැපයීම;

(ඈ) කොමිෂන් සභාව විසින් නිකුත් කරන සාමාන්‍ය හෝ විශේෂ ස්වරූපයේ වූ, යම් විධාන සමඟ අනුකූලව ක්‍රියා කිරීම; සහ

(ඉ) කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාවේ අධිකාරිය සමඟ සහ කොමිෂන් සභාව වෙනුවෙන් ක්‍රියාකරන තැනැත්තකුට, කොමිෂන් සභාව හෝ එකී තැනැත්තා සාධාරණව අපේක්ෂා කරන සහයෝගය ලබා දීම,පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකුගේ කර්තව්‍ය සහ කාර්ය විය යුතු ය.

පරිශ්‍රයක් මත වෙළෙඳාම.

**116.** පරිශ්‍රයක් මත සුරැකුම්පත් මිල දී ගැනීම හෝ විකිණීම සිදු කරන යම් තැනැත්තකු පරිශ්‍රය විසින් ඇතුළත් කරගනු ලැබූ වෙළෙඳපොළ සාමාජිකයන් හරහා ඔවුන්ගේ ඇණවුම් ක්‍රියාත්මක කළ යුතු ය.

**කොමිෂන් සභාව විසින් සැකසිය යුතු රීති.**

117. කොමිෂන් සභාව විසින්,-

(අ) පරිශ්‍රයක් මත වෙළෙඳාම් කළ හැකි ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් වර්ගය නිශ්චය කිරීමට;

(ආ) පරිශ්‍රයකට වෙළෙඳාම් වාර්තා කළ හැකි නිකුත්කරන්නන් වර්ගය නිශ්චය කිරීමට;

(ඇ) පරිශ්‍රය මත වෙළෙඳාම් කළ හැකි ආයෝජකයන් වර්ගය නිශ්චය කිරීමට;

(ඈ) පරිශ්‍රය මත වෙළෙඳාම් කළ හැකි වෙළෙඳපොළ සාමාජිකයන් වර්ගය නිශ්චය කිරීමට;

(ඉ) පරිශ්‍රය මත වෙළෙඳපොළ සාමාජිකයන් ඇතුළත් කර ගැනීමට;

(ඊ) පරිශ්‍රය මගින් සැපයිය යුතු බවට නියම කරන ලද අනාවරණය කිරීම් මට්ටම නිශ්චය කිරීමට; සහ

(උ) ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීමේ දී වෙළෙඳ කටයුතු පිළිබඳ ප්‍රමිති නිශ්චය කිරීමට,

රීති සෑදිය යුතු ය.

**ලියාපදිංචිය ඉවත් කර ගැනීම.**

118. (1) (3) වන උපවගන්තිය යටතේ, ආයෝජකයන්ගේ යහපත සඳහා හෝ විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් සඳහා එසේ කිරීමට සුදුසු යයි කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයක සිට බලපැවැත්වෙන පරිදි, ලිඛිත දැන්වීමක් මගින්, ලියාපදිංචිය ඉවත් කර ගැනීම කළහැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් එකී දැන්වීමෙහි ඉවත් කර ගැනීමට බලපෑ හේතු සඳහන් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි යටතේ වූ ඉවත්කර ගැනීම නොසලකා-

(අ) ඉවත් කිරීමට සම්බන්ධ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකුගේ කටයුතු නවතා දැමීමට; හෝ

(ආ) ආයෝජකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට,

යන කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් ඉවත් කිරීම බලපවත්වන දින හෝ එම දිනයට පසු, කොමිෂන් සභාව විසින් දැන්වීමේ

නිශ්චිතව සඳහන් කළ හැකි පරිදි ඉවත් කිරීම මගින් බලපාන එකී ක්‍රියාකාරකම් අඛණ්ඩව කරගෙන යාමට තැනැත්තාට අවසර ලබා දිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ, කොමිෂන් සභාව විසින් තැනැත්තකුට අවසරය ප්‍රදානය කර තිබෙන අවස්ථාවක දී, අවසරයට අනුකූලව සිය ක්‍රියාකාරකම් සිදු කිරීම හේතුවෙන්, එම තැනැත්තා, මේ පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කර තිබෙන ලෙස සලකනු නොලැබිය යුතු ය.

(5) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකුට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දී තිබෙන්නේ නම් මිස කොමිෂන් සභාව විසින් පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ වූ එහි බලතල ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ කරන ලද යම් ලියාපදිංචිය ඉවත් කිරීමක්-

(අ) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු විසින් එළඹුණු යම් එකඟතාවක්, ගනුදෙනුවක් හෝ සැලසුමක්, එම එකඟතාව, ගනුදෙනුව හෝ සැලසුම (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචිය ඉවත් කිරීමට පෙර හෝ පසු එළඹුණ ද, එය නිශ්ප්‍රභා කිරීමට හෝ එයට බලපෑම් කිරීමට; හෝ

(ආ) එකී එකඟතාව, ගනුදෙනුව හෝ සැලසුම යටතේ හටගත් යම් අයිතිවාසිකමක්, වගකීමක් හෝ බැඳීමකට බලපෑම් කිරීමට,

සඳහා ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකුගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම.

**119.** (1) මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් කලින් කළ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකුගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම සිදු කළ හැකි ය.

(2) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකුගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමේ දී පහත සඳහන් කොන්දේසි සැලකිල්ලට ගෙන තිබිය හැකි ය:-

(අ) පරිශ්‍රයට ආවේණික සංස්ථානික අවදානම;

(ආ) මහජන සුබසාධනය;

(ඈ) පරිශ්‍රයෙහි ප්‍රමාණය හා ව්‍යුහය;

(ඇ) පරිශ්‍රයේ වෙළෙඳාම් කළ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් පන්ති; සහ

(ඉ) පරිශ්‍රය භාවිත කරන ආයෝජකයන්ගේ සහ සහභාගිවන්නන්ගේ ස්වභාවය.

(3) පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදීමකින් තොරව කොමිෂන් සභාව විසින් (1) වන වගන්තිය යටතේ එහි බලතල ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

වෙළෙඳපොළ මෙහෙයවන්නකු සඳහා ලැබෙන නිදහස් කිරීම.

**120.** කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත් ව 117 වන වගන්තිය යටතේ නිශ්චිතව සඳහන් නිර්ණායක සැලකිල්ලට ගනිමින් කොමිෂන් සභාවට 114 වන වගන්තිය යටතේ වෙළෙඳපොළ මෙහෙයවන්නකු ලියාපදිංචි කිරීමෙන් නිදහස් කළ හැකි ය.

පනතේ විධිවිධාන ලැයිස්තුගත නොකළ සුකුම්පත්වලට අදාළ වීම.

**121.** (1) මේ පනතේ විධිවිධාන 75 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ රීතීන් හි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි නිදහස් කළ සුරැකුම්පත් සඳහා සහ පිළිගත් වෙළෙඳපොළ මෙහෙයවන්නකු විසින් පරිශ්‍රයක් මත ස්ථාපිත 75 වන වගන්තියේ (3) වන උපවගන්තිය මගින් නිශ්චිතව සඳහන් කළනිර්ණායක සැලකිල්ලට ගනිමින් ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විකිණීමකට, මිල දී ගැනීමකට සහ පැවරීමකට අදාළ නොවිය යුතු ය.

(2) මේ වෙළෙඳපොළ පරිශ්‍රයට අදාළ වන මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් සම්බන්ධයෙන් වන රීති, කොමිෂන් සභාව විසින් සාදන ලද වෙනත් යම් රීති, අභිබවා බලපැවැත්විය යුතු ය.

## V වන කොටස

### වෙළෙඳපොළ විෂමාචාරය

මේ කොටසේ පරමාර්ථ සහ අරමුණ

**122.** මේ කොටසේ පරමාර්ථ සහ අරමුණ වනුයේ-

(අ) සාධාරණ ක්‍රමවත් සහ විනිවිදභාවයෙන් යුත් සුරැකුම්පත් වෙළෙඳපොළක් පිහිටුවීමේ අදහස ඇතිව ව්‍යාජ වෙළෙඳාම් කිරීම, වෙළෙඳපොළ මිල ගණන් කෘත්‍රිම ලෙස උස් පහත් කිරීම සහ වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම වැළැක්වීම; සහ

(ආ) සාධාරණ ක්‍රමවත් සහ විනිවිදභාවයෙන් යුත් සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇති කිරීමේ අදහස ඇතිව අභ්‍යන්තර තැනැත්තන් විසින් කරනු ලබන වෙළෙඳාම වැළැක්වීම.

මේ කොටස අදාළවීම.

**123.** මේ කොටස පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය:-

(අ) සුරැකුම්පත් සම්බන්ධයෙන්-

(i) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද හෝ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ලැයිස්තුගත කර ඇති යම් සංස්ථාවක සුරැකුම්පත්වලට අදාළව සිදුවන ක්‍රියා හෝ අත්හැරීම්; සහ

(ii) ශ්‍රී ලංකාවේ තුළ පිහිටුවන ලද හෝ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන යම් සංස්ථාපිත ආස්ථිත්වයක සුරැකුම්පත්වලට අදාළ ව ශ්‍රී ලංකාව තුළ සිදුවන ක්‍රියා හෝ අත්හැරීම්;

(ආ) ව්‍යුත්පන්න සම්බන්ධයෙන් -

(i) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත වෙළෙඳාම් කරනු ලබන ව්‍යුත්පන්නවලට අදාළව ශ්‍රී ලංකාව තුළ සිදුවන ක්‍රියා; සහ

(ii) ශ්‍රී ලංකාව තුළ වෙළෙඳාම් කරන ව්‍යුත්පන්නවලට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත සිදුවන ක්‍රියා.

1 වන පරිච්ඡේදය

**තහනම් ක්‍රියා**

ව්‍යාජ වෙළෙඳාම් කිරීමේ හා වෙළෙඳපොළ මිළ ගණන් කෘත්‍රිම ලෙස උස් පහත් කිරීමේ ගනුදෙනු.

**124.** (1) 129 වන වගන්තියට යටත්ව ශ්‍රී ලංකාව තුළ විනිමය ස්ථානයක සුරැකුම්පත් පිළිබඳ සක්‍රීය වෙළෙඳාම්වල ව්‍යාජ හෝ නොමග යවන සුලු පෙනුමක් ඇති කිරීමට එවැනි යම් සුරැකුම්පත්වල මිල සඳහා හෝ වෙළෙඳපොළ සම්බන්ධයෙන් නොමඟ යවන සුලු පෙනුමක් ඇති කිරීමට අදහස් කරනු ලබන යම් දෙයක්, යම් තැනැත්තකු විසින් නිර්මාණය කිරීම හෝ නිර්මාණය කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

(2) තැනැත්තකු විසින් සුරැකුම්පත්වල ප්‍රතිලාභී අයිතියෙහි වෙනසක් ඇති නොකරන සුරැකුම්පත් මිල දී ගැනීම හෝ අලෙවිය මගින් හෝ ව්‍යාජ ගනුදෙනු හෝ ක්‍රමෝපායක් මගින් යම් සුරැකුම්පත්වල වෙළෙඳපොළ මිල පවත්වාගෙන යාම වැඩි කිරීම, අඩු කිරීම හෝ උච්චාවචනය කිරීම සැලැස්වීම නොකළ යුතු ය.

(3) 1 වන උපවගන්තියේ ව්‍යාප්තියට අගති විරහිතව -

(අ) සුරැකුම්පත්වල ප්‍රතිලාභී අයිතියෙහි යම් වෙනසක් සිදු නොවන පරිදි සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම පිළිබඳ ගනුදෙනුවක් ඍජුව හෝ අන්‍යාකාරයකින් සිදු කරන, ඊට සහභාගි වන හෝ ඒ හා සම්බන්ධ වන හෝ එම ගනුදෙනුව සිදු කරන යම් තැනැත්තෙක්; හෝ

(ආ) පළමුවෙන් සඳහන් මිලට සාරානුකූල වන මිලකට එම සුරැකුම්පත් සංඛ්‍යාව ම හෝ සාරානුකූලව එම සංඛ්‍යාව ම මිල දී ගැනීමට අර්පණය කර ඇති හෝ ඔහු හා සම්බන්ධ පුද්ගලයකු අර්පණය කර ඇති බව දන්නා අවස්ථාවක විශේෂිත මිලකට එම සුරැකුම්පත් සංඛ්‍යාව මිල දී ගැනීමට හෝ විකිණීමට අර්පණය කර ඇති හෝ අර්පණය කිරීමට සලස්වා ඇති යම් තැනැත්තෙක්,

කොටස් වෙළෙඳපොළක සුරැකුම්පත් පිළිබඳ සක්‍රීය වෙළෙඳාමේ ව්‍යාජ හෝ නොමඟ යවනසුලු පෙනුමක් ඇති කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියෙහි කාර්යය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී පහත දැක්වෙන පරිදි ඔප්පු කිරීම යම් තැනැත්තකුට විත්ති වාචකයක් වන්නේ ය:-

(අ) ඔහු සිදුකළ ක්‍රියාවේ අරමුණට විනිමය ස්ථානයක සක්‍රීය වෙළෙඳාම් පිළිබඳ ව්‍යාජ හෝ නොමග යවනසුලු පෙනුමක් ඇති කිරීමේ කාර්යය ඇතුළත් නොවූ බව; සහ

(ආ) විනිමය ස්ථානයක දී සක්‍රිය වෙළෙඳාම පිළිබඳ ව්‍යාජ හෝ නොමග යවනසුලු පෙනුමක් ඔහු විසින් ඇති කළ ද, ඔහු නොසැලකිලිවන්තව ක්‍රියා නොකළ බව.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා යම් තැනැත්තකුට හෝ ඔහු සමඟ සම්බන්ධ යම් තැනැත්තකුට මිල දී ගැනීමට හෝ විකිණීමට

පෙර සුරැකුම්පත් සම්බන්ධව අයිතියක් තිබීම, සහ මිල දී ගැනීමෙන් හෝ විකිණීමෙන් පසුව ද, සුරැකුම්පත් සම්බන්ධව අයිතියක් ඇත්නම් සුරැකුම්පත් මිල දී ගැනීමට හෝ විකිණීමට සම්බන්ධව ප්‍රතිලාභී අයිතියෙහි වෙනසක් සිදු නොවේ.

(6) සුරැකුම්පත්වල ප්‍රතිලාභී අයිතියෙහි වෙනසක් සිදු නොවන සුරැකුම්පත් මිල දී ගැනීමට හෝ විකිණීමට අදාළව (2) වන උපවගන්තිය උල්ලංඝනය කිරීමක් පිළිබඳව කටයුතු කිරීමේ දී සුරැකුම්පත් මිල දී ගත් හෝ විකුණනු ලැබූ කාර්යයට, කාර්යයවලට සුරැකුම්පත්වල වෙළෙඳපොළ සම්බන්ධයෙන් හෝ සුරැකුම්පත්වල මිල සම්බන්ධයෙන් ව්‍යාජ හෝ නොමග යවනසුලු පෙනුමක් ඇති කිරීමේ කාර්යය ඇතුළත් නොවූ බව එම තැනැත්තා ඔප්පු කරන්නේ නම්, එය විත්තිවාචකයක් වන්නේ ය.

(7) සුරැකුම්පත් විකිණීමේ හෝ මිල දී ගැනීමේ ගනුදෙනුවක් සම්බන්ධව (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ ඇති සඳහනකට-

(අ) සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා අර්පණයක් කිරීම; සහ

(ආ) සුරැකුම්පත් විකිණීම හෝ අලෙවි කිරීම සඳහා අර්පණය කරන ලෙස ප්‍රකාශිතව හෝ ව්‍යංජිතව යම් තැනැත්තකුට ආරාධනයක් කිරීම,

ඇතුළත් වේ.

කොටස් වෙළෙඳපොළ අයුතු ලෙස හැසිරවීම.

**125.** (1) 129 වන වගන්තියට යටත්ව යම් සමාගමක හෝ සම්බන්ධිත සමාගමක සුරැකුම්පත් මිල දී ගැනීමට හෝ බැහැර කිරීමට යම් තැනැත්තකු පොළඹවනු ලැබූව ද, එසේ නැති වුවද එවැනි තැනැත්තන් පෙළඹවීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ යම් සමාගමක සුරැකුම්පත්වල මිල හෝ ප්‍රමාණය කෘත්‍රිම ලෙස-

(අ) ඉහළ නැංවීමේ;

(ආ) අඩු කිරීමේ; හෝ

(ඇ) වෙළෙඳපොළ උස් පහත් කිරීමේ, හැසිරවීමේ, පවත්වාගෙන යාමේ හෝ ස්ථාවර කිරීමේ,

ප්‍රතිඵලය ඇති හෝ එම ප්‍රතිඵලය ඇති කිරීමට ඉඩ ඇති සමාගමක සුරැකුම්පත් පිළිබඳ යම් ගනුදෙනු සංඛ්‍යාවක්, යම් තැනැත්තකු විසින් සෘජුව හෝ අන්‍යාකාරයකින් සිදු කිරීම හෝ සිදු කිරීමට සම්බන්ධවීම නොකළ යුතු ය.

(2) සමාගමක සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනුවක් සම්බන්ධව මේ වගන්තියේ කර ඇති සඳහනකට-

(අ) එම සමාගමේ සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා අර්පණයක් කිරීම; සහ

(ආ) එම සමාගමේ සුරැකුම්පත් විකිණීම හෝ මිල දී ගැනීම සඳහා සඳහා අර්පණය කරන ලෙස යම් තැනැත්තකුට ප්‍රකාශිතව හෝ ව්‍යංජිතව ආරාධනා කිරීම,

ඇතුළත් වේ.

**126.** (අ) ප්‍රකාශයේ හෝ තොරතුරේ නිරවද්‍යභාවය පිළිබඳව පරීක්ෂා කිරීමට යම් තැනැත්තකු සාධාරණ සැලැකිල්ලක් නොදක්වන්නේ නම්; හෝ

ව්‍යාජ හෝ නොමඟ යවන සුළු ප්‍රකාශ.

(ආ) වැදගත් කරුණක් පිළිබඳ ව ප්‍රකාශය හෝ තොරතුර අසත්‍ය හෝ නොමඟ යවනසුලු බව යම් තැනැත්තකු දන්නේ නම් හෝ සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිව සිටියේ නම්,

වැදගත් කරුණක් පිළිබඳ අසත්‍ය හෝ නොමඟ යවනසුලු නැතහොත් සුරැකුම්පත්වල මිල හෝ ප්‍රමාණය වැඩි කිරීමේ, අඩු කිරීමේ, පවත්වාගෙන යාමේ හෝ ස්ථාවර කිරීමේ බලපෑම ඇති කරවන ප්‍රකාශයක් කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු අතර, එවැනි අසත්‍ය හෝ නොමඟ යවනසුලු තොරතුරු විසුරුවා හැරීම නොකළ යුතු ය.

**127.** (1) (අ) නොමඟ යවනසුළු, ව්‍යාජ හෝ රැවටිලිකාරී බවට තමන් දන්නා ප්‍රකාශයක් කිරීම හෝ පළ කිරීම මගින් හෝ එවැනි අනාවැකියක් පළ කිරීමෙන්;

සුරැකුම්පත් පිළිබඳ ව කටයුතු කිරීමට වංචනික ලෙස පුද්ගලයන් පෙළඹවීම.

(ආ) වැදගත් සිද්ධිමය කරුණ වංක ලෙස සැඟවීම මගින්;

(ඇ) නොමඟ යවනසුළු, ව්‍යාජ හෝ රැවටිලිකාර ප්‍රකාශයක් හෝ අනාවැකියක් වංක ලෙස හෝ අන්‍යාකාරයකට නොසැලකිලිමත්ව ප්‍රකාශයට පත් කිරීමෙන් හෝ පළ කිරීමෙන්; හෝ

(ඈ) වැදගත් සිද්ධිමය කරුණක් පිළිබඳ ව අසත්‍ය හෝ නොමඟ යවනසුලු බවට තමන් දන්නා යම් තොරතුරක් යාන්ත්‍රික වශයෙන් හෝ ඉලෙක්ට්‍රොනික ක්‍රම මගින් හෝ වෙනත් උපකරණයක් මගින් වාර්තාගත කිරීම හෝ ගබඩා කිරීම මගින්,

යම් තැනැත්තකු සුරැකුම්පත් වෙළෙඳාමට පෙළඹවීම හෝ පෙළඹවීමට උත්සහ කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ කාර්ය සඳහා අදාළ තොරතුර වාර්තාගත කළ විට හෝ ගබඩා කළ විට යම් තැනැත්තකුට එම තොරතුරු ලැබෙන බව විශ්වාස කිරීමට එම තැනැත්තාට සාධාරණ හේතු නොතිබුණ බව ඔප්පු කරන්නේ නම් (1) වන උප වගන්තියේ (ඈ) ඡේදයේ සඳහන් තැනැත්තකුට එසේ ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

අයුතු ලෙස හැසිරවීම සහ රැවටීමේ උපක්‍රම භාවිත කිරීම.

**128.** සුරැකුම්පත්වලට දායකවීම, මිල දී ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් සෘජුවම හෝ අන්‍යාකාරයකින්-

(අ) වංචා කිරීම සඳහා යම් උපකරණයක්, යෝජනා ක්‍රමයක් හෝ භාණ්ඩයක් භාවිත නොකළ යුතු ය;

(ආ) යම් තැනැත්තකුට වංචාවක් හෝ රැවටීමක් සිදු කිරීමක් ලෙස ක්‍රියාත්මක වන යම් ක්‍රියාවක, පරිචයක හෝ ව්‍යාපාර කටයුත්තක කිසිම තැනැත්තකු නොයෙදිය යුතු ය; හෝ

(ඇ) වැදගත් කරුණක් පිළිබඳ යම් අසත්‍ය ප්‍රකාශයක් නොකළ යුතු අතර, ප්‍රකාශයක් කිරීම සඳහා අවශ්‍ය වැදගත් කරුණක් සඳහන් කිරීම අත්හරිනු නොලැබිය යුතු ය.

ඇතැම් ගනුදෙනු පන්ති නිදහස් කිරීම.

**129.** 124 වන හෝ 125 වන වගන්ති අදාළ නොවන සුරැකුම්පත්වලට අදාළව යම් විශේෂිත තැනැත්තන් පන්ති, වර්ග හෝ විස්තරයකට අයත් තැනැත්තන් හෝ ගනුදෙනුවලට අදාළ යම් විශේෂිත පන්ති, වර්ග හෝ විස්තරයන්ට අයත් ගනුදෙනු නිදහස් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

වැරදි සඳහා දණ්ඩනය.

**130.** 124 වන, 125 වන, 126 වන, 127 වන හෝ 128 වන යන වගන්ති උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදක් සිදු කරන අතර, වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන දහයකට නොඅඩු දඩයකට හෝ අවුරුදු දහයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ එම තැනැත්තා යටත් විය යුතු ය.

2 වන පරිච්ඡේදය

**අභ්‍යන්තර තැනැත්තන් විසින් වෙළෙඳාම් කිරීම**

තොරතුරු.

**131.** මේ පරිච්ඡේදයේ "තොරතුරු" යන්නට-

(අ) මහජනතාව දැනසිටීමට තරම් ප්‍රමාණවත් නිශ්චිතභාවයකින් තොරව, පොදු ලැයිස්තුගත සමාගම් සම්බන්ධ පරිකල්පන සහ වෙනත් කරුණු ද;

(ආ) යම් තැනැත්තකුගේ අරමුණුවලට හෝ අරමුණුවීමට ඉඩ ඇති කරුණුවලට අදාළ කරුණු ද;

(ඇ) (i) වානිජ කටයුතු සම්බන්ධයෙන් වූ; හෝ

(ii) සුරැකුම්පත් පිළිබඳ ගනුදෙනු සම්බන්ධයෙන් වූ,

ගිවිසීම්වලට හෝ යෝජනාවලට අදාළ කරුණු;

(ඈ) සමාගමක මූල්‍ය කාර්ය සාධනයට අදාළ තොරතුරු;

(ඉ) සුරැකුම්පත්වලට අදාළව යම් තැනැත්තකු ඇතුළත්වීමට අදහස් කරන හෝ කලින් ඇතුළත් වූ ගනුදෙනු හෝ ගිවිසුමකට හෝ ගිවිසුම් වැඩි ප්‍රමාණයකට අදාළ තොරතුරු නැතහොත් එම සුරැකුම්පත්වලට අදාළ ප්‍රකාශයක් නිකුත් කිරීම සුදානම් කර ඇති හෝ නිකුත් කිරීමට අදහස් කර ඇති තොරතුරු; සහ

(ඊ) අනාගතයට අදාළ කරුණු,

ඇතුළත් වේ.

සාමාන්‍යයෙන් ලබා ගැනීමට හැකි තොරතුරු.

**132.** (1) තොරතුරු ප්‍රචාරණය වී සාධාරණ කාලයක් එම තොරතුරු යම් තැනැත්තකු විසින් අන්තර්ග්‍රහණය කරගැනීමට ගත වී ඇති සහ එම තොරතුරු මඟින් සුරැකුම්පත්වල මිල හෝ වටිනාකම කෙරෙහි බලපෑමක් ඇති කරනු ලැබිය හැකි නම්, එවැනි සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලබන තැනැත්තන්ගේ අවධානයට යම් ආකාරයකින් යොමු කරවනු ලබන එම තොරතුරු මේ පරිච්ඡේදය යටතේ සාමාන්‍යයෙන් ලබාගත හැකි තොරතුරු වේ.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරුවලට එම තොරතුරුවලින් ලබාගත් හෝ සාදන ලද නිගමන හෝ තීරණවලින් සමන්විත වන තොරතුරු ඇතුළත් වේ.

සුරැකුම්පත්වල මිල හෝ වටිනාකමට වැදගත් වෙනසක් සිදු වීම.

**133.** මේ පරිච්ඡේදයෙහි තොරතුරු සාමාන්‍යයෙන් ලබා ගැනීමට හැකිවීමේ දී සුරැකුම්පත්වල මිල හෝ වටිනාකම කෙරෙහි වැදගත් බලපෑමක් ඇති කරන්නේ නම්, හෝ ඇති කිරීමට ඉඩ ඇත්නම්, එම තොරතුරු සාමාන්‍යයෙනේ ලබා ගැනීමට හැකිවීමේ දී සුරැකුම්පත්වල ආයෝජනය කරන සාධාරණ තැනැත්තන් විසින් එම සුරැකුම්පත් අත්කර ගැනීමට හෝ බැහැර කිරීමට තීරණය කිරීමේ දී හෝ එම සුරැකුම්පත් මිල දී ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහස ඇතිව ගිවිසුමකට ඇතුළත්වීමට තීරණය කිරීමේ දී එම තොරතුරු සාමාන්‍යයෙන් ලබාදීම මගින් වැදගත් බලපෑමක් සිදු වේ.

"සිදු කරවා ගැනීම" පිළිබඳ යොමුව.

**134.** 135 වන වගන්තියේ කාර්ය සඳහා, යම් තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකු ලවා යම් ක්‍රියාවක් හෝ අත්හැරීමක් සිදු කිරීමට පෙළඹවීම් කරන්නේ නම් හෝ දිරි ගැන්වීම් කරන්නේ නම් හෝ යොමු කරන්නේ නම් එම තැනැත්තා විසින් දෙවන වරට සඳහන් කළ තැනැත්තා ලවා යම් ක්‍රියාවක් හෝ අත්හැරීමක් සිදු කරවා ඇති ලෙස සලකනු ලබන්නේ ය.

අභ්‍යන්තර තොරතුරු සන්තකයේ තබා සිටිනා යම් තැනැත්තකු විසින් සිදු කිරීමට තහනම් ක්‍රියා.

**135.** (1) අදාළ සමාගමට සම්බන්ධ හෝ සම්බන්ධ නොවන යම් තැනැත්තකු-

(අ) සාමාන්‍යයෙන් ලබා ගත නොහැකි තොරතුරු සන්තකයේ තබාගෙන සිටී නම්, සහ එම තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත හැකිව තිබුණේ නම්, සුරැකුම්පත්වල මිල හෝ වටිනාකම කෙරෙහි එම තොරතුරුවලින් වැදගත් බලපෑමක් සිදුවිය හැකි බව යම් සාධාරණ තැනැත්තකු අපේක්ෂා කරන්නේ නම්; සහ

(ආ) එම තොරතුරු සාමාන්‍යයෙන් ලබාගත හැකි තොරතුරු නොවන බව එම තැනැත්තා දන්නේ නම් හෝ සාමාන්‍යයෙන් ලබාගත හැකි තොරතුරු නොවන බව දැනගැනීම සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්,

එම තැනැත්තා "අභ්‍යන්තර තැනැත්තකු" වේ.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු අදාළ වන සුරැකුම්පත් සම්බන්ධයෙන් අභ්‍යන්තර තැනැත්තකු ප්‍රධානයා හෝ අනුයෝජිතයා වශයෙන්-

(අ) එම සුරැකුම්පත් අත්පත් කර ගැනීම හෝ එම සුරැකුම්පත් බැහැර කිරීම, එම සුරැකුම් අත්පත් කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහස ඇතිව ගිවිසුමකට ඇතුළත්වීම නොකළ යුතු ය; හෝ

(ආ) එම සුරැකුම්පත් අත්පත් කර ගැනීම හෝ බැහැර කිරීම හෝ එසේ අත්පත් කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහස ඇතිව ගිවිසුමකට ඇතුළත්වීම සඳහා සෘජුවම හෝ අන්‍යාකාරයකින් සිදු කරවා ගැනීම නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු අදාළ වන සුරැකුම්පත් යම් විනිමය ස්ථානයක සුරැකුම්පත් වෙළෙඳපොළහි වෙළෙඳාම් කිරීම සඳහා අවසර ලැබ ඇති අවස්ථාවක, අන් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය අදාළ වන තොරතුරු මත-

(අ) සුරැකුම්පත් අත්පත් කර ගැනීමට, බැහැර කිරීමට හෝ එම සුරැකුම්පත් අත්පත් කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහස ඇතිව ගිවිසුමකට ඇතුළත්වීමට යන බව; හෝ

(ආ) තුන්වන පාර්ශ්වයේ තැනැත්තකු යොදවා සුරැකුම්පත් අත්පත් කර ගැනීමට, බැහැර කිරීමට හෝ එම සුරැකුම්පත් අත්පත් කර ගැනීමේ හෝ බැහැර කිරීමේ අදහස ඇතිව ගිවිසුමකට ඇතුළත්වීමට කටයුතු කරන බව,

අභ්‍යන්තර තැනැත්තා දන්නේ නම් හෝ ඔහු එසේ දන්නා බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම් එම අභ්‍යන්තර තැනැත්තා විසින් (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු සෘජුවම හෝ අන්‍යාකාරයකට හෝ වෙනත් තැනැත්තකුට සන්නිවේදනය කිරීම හෝ සන්නිවේදනය කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

(4) (2) වන හෝ (3)වන උපවගන්ති උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදුකරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන දහයකට අඩු නොවන දඩයකට හෝ අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(5) මේ වගන්තිය අදාළ නොවන්නා වූ සුරැකුම්පත්වලට අදාළ යම් විශේෂිත පුද්ගල පන්තියක්, වර්ගයක් හෝ විස්තරයක් සම්බන්ධයෙන් නැතහොත් යම් විශේෂිත ගනුදෙනු පන්තියක්, වර්ගයක් හෝ විස්තරයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

සමාගමක නිලධරයකුගේ සන්තකයේ ඇති තොරතුරු.

**136.** (1) මේ පරිච්ඡේදයෙහි පහත දැක්වෙන අවස්ථාවල දී යම් තොරතුරක්-

(අ) එම සමාගමේ නිලධරයකු විසින්-

(i) සන්තකයේ දරා සිටින සහ සමාගමේ නිලධරයකු වශයෙන් තම කාර්ය ඉටු කිරීමේ දී තමාගේ සන්තකයට පත් වූ තොරතුරු; හෝ

(ii) එම නිලධරයා සමාගමේ නිලධරයකු වශයෙන් දැන සිටින හෝ එම නිලධරයා සමාගමේ නිලධරයකු බැවින් දැන සිටිනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි තොරතුරු;

(ආ) යම් සමාගමක නිලධරයකුගේ සන්තකයට පත්ව ඇති සහ පළමුවෙන් සඳහන් කළ සමාගමේ සම්බන්ධිත සමාගමක නිලධරයකු වශයෙන් තම කාර්යය කරන අතරතුර දී තම සන්තකයට පත් වූ තොරතුරු; එනම්-

(i) එම තොරතුරු සන්තකයේ තබා ගැනීමේ හේතුව මත එම නිලධරයා අභ්‍යන්තර තැනැත්තකු වන අවස්ථාවක;

(ii) පළමුව සඳහන් කළ සමාගම විසින් සුරැකුම්පත් අත්පත් කර ගැනීමේ දී හෝ බැහැර කිරීමේ දී පළමුව සඳහන් කළ සමාගම සමඟ තීරණ ගැනීමට, ගනුදෙනු කිරීමට හෝ එකඟත්වයට පැමිණීමට අදාළ නිලධරයා සම්බන්ධ වී ඇති අවස්ථාවක සහ එම නිලධරයා එම ගනුදෙනුව

සම්බන්ධයෙන් අභ්‍යන්තර තැනැත්තකු වන අවස්ථාවක හෝ එම සුරැකුම්පත් අත්පත් කර ගැනීමේ හෝ බැහැර කිරීමේ ගිවිසුමකට ඇතුළත් වන අවස්ථාවක නැතහොත් 135 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණුවල දී සුරැකුම්පත් අත්පත් කර ගැනීමට හෝ බැහැර කිරීමට නැතහොත් තත්කාර්යය සඳහා ගිවිසුමකට ඇතුළත්වීම නැතහොත් තොරතුරු සන්නිවේදනය කිරීමට වෙනත් තැනැත්තකු ලවා කටයුතු සලස්වන අවස්ථාවක; හෝ

(iii) එම තොරතුරු ඇත්ත වශයෙන්ම සන්නිවේදනය නොකළ බව ඔප්පු කරන්නේ නම් මිස එම නිලධරයා පළමුවෙන් සඳහන් කළ සමාගමේ තවත් නිලධරයකුට එම තොරතුරු ලබා දෙනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලබන අවස්ථාවක,

යම් සමාගමක් එම තොරතුරු තම සන්තකයේ දරනු ලබන බවට සලකනු ලැබේ.

(2) මේ වගන්තියෙහි "තොරතුරු" යන්නෙන් සමාගමක් විසින් සන්තකය දරනු ලබන්නා වූ ලෙස සලකනු ලබන තොරතුරු ද, එම තොරතුරු සන්තකයෙහි ඇති තැනැත්තා "අභ්‍යන්තර තැනැත්තා" ලෙස ද අදහස් කරනු ලැබිය යුතු ය.

(3) (අ) ගනුදෙනුවට හෝ එකඟත්වයට ඇතුළත්වීම සඳහා වූ තීරණය තොරතුරුවල සන්තකය ඇති සමාගමේ නිලධරයකු වන තැනැත්තකු හැර, වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සමාගම වෙනුවෙන් ගනු ලැබුවේ නම්; සහ

(ආ) (i) ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත්වීම සඳහා හෝ ඊට මැදිහත් වීම සඳහා වූ තීරණය ගැනීමට සම්බන්ධ වූ හෝ එම තීරණය ගනු ලැබූ තැනැත්තාට හෝ තැනැත්තන්ගෙන් එක් අයෙකුට තොරතුරු සන්නවේදනය නොකරන ලද බවට;

(ii) තොරතුරුවල සන්තකය තිබූ තැනැත්තා විසින් ඉහත කී තැනැත්තාට ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත් වීම සඳහා හෝ මැදිහත්වීම සඳහා වූ තීරණය සම්බන්ධයෙන් කිසිදු උපදෙසක් නොදුන් බවට; හෝ

(iii) ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත් වීම සඳහා හෝ මැදිහත් වීම සඳහා වූ තීරණය ගැනීමට තොරතුරුවල සන්තකය තිබූ තැනැත්තා මැදිහත් නොවන බවට,

සහතිකවීම සඳහා සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි වැඩපිළිවෙළක් එම අවස්ථාවේ දී සමාගම තුළ ක්‍රියාත්මක ව තිබුණේ නම්; සහ

(ඇ) තොරතුරු සන්නිවේදනය නොකරන ලද්දේ නම්, යම් උපදේශයක් ලබා නොදුන්නේ නම් සහ තොරතුරු සන්තකයේ දරන තැනැත්තා ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත් වීම සඳහා හෝ මැදිහත් වීම සඳහා වන තීරණයට සම්බන්ධ නොවූයේ නම්,

එකී සමාගම ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත් වන අවස්ථාවේ දී සමාගම සන්තකයේ තොරතුරු පැවතීම පමණක් හේතුවෙන් එම සමාගම විසින් 135 වන වගන්තියේ (2) වන උපවගන්තිය උල්ලංඝනය කිරීමක් කරනු නොලබන්නේ ය.

**137.** (1) මේ පරිච්ඡේදයේ-

හවුල් කරුවකුගේ හෝ හවුල් ව්‍යාපාරයක සේවා නියුක්තයකුගේ සන්තකයේ ඇති තොරතුරු.

(අ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකුගේ සන්තකයෙහි තොරතුරු තිබුණේ නම් සහ එම තොරතුරු වෙනත් හවුල්කරුවකුට හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකුවීමේ තත්ත්වය හේතු කොටගෙන ඔහු සන්තකයට පත් වූයේ නම්;

(ආ) හවුල් ව්‍යාපාරයක සේවා නියුක්තයකුගේ සන්තකයේ එම තොරතුරු තිබුණේ නම් සහ එම තොරතුරු සේවා නියුක්තයාගේ සන්තකයට පත් වූයේ ඔහුගේ කාර්යය අතරතුර දී නම්; හෝ

(ඇ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු හෝ සේවා නියුක්තයකු යම් කරුණක් හෝ දෙයක් දැන සිටිනුයේ හෝ දැන සිටින බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි වනුයේ වෙනත් හවුල්කරුවකු හෝ සේවා නියුක්තයකු නිසා නම්, පටහැනිව ඔප්පු කළහොත් මිස, එම කරුණු හෝ දෙය හවුල් ව්‍යාපාරයක සියලු හවුල්කරුවන් දන්නා බව

හෝ දැන සිටින බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි යැයි උපකල්පනය කරනු ලැබිය හැකි නම්,

හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු එම තොරතුරු සන්තකයේ දරනු ලබන බවට සලකනු ලැබේ.

(2) පහත දැක්වෙන අවස්ථාවල දී තොරතුරුවල සත්‍ය වශයෙන් වූ සන්තකය හවුල් ව්‍යාපාරයක සියලු හවුල්කරුවන් විසින් නොව එක් හවුල්කරුවකු හෝ වැඩි පිරිසක් විසින් නැතහොත් එම හවුල් ව්‍යාපාරයේ සේවා නියුක්තයකු හෝ සේවා නියුක්තයන් විසින් දැන සිටීම හේතු කොටගෙන පමණක් 135 වන වගන්තියේ (2) උපවගන්තිය එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු විසින් උල්ලංඝනය කරනු නොලබන්නේ ය:-

(අ) හවුල් ව්‍යාපාරය වෙනුවෙන් ගනුදෙනුව හෝ ගිවිසුමට ඇතුළත් වීම සඳහා වූ තීරණය ගනු ලැබුවේ පහත දැක්වෙන තැනැත්තන් එක් අයෙකු හෝ වැඩි දෙනෙකු විසින් නම්-

(i) හවුල් ව්‍යාපාරයේ වෙනත් හවුල්කරුවකුගේ හෝ සේවා නියුක්තයකුගේ සන්තකයෙන් තොරතුරු තිබීම නිසා පමණක් තම සන්තකයෙහි එම තොරතුරු ඇති බවට සළකනු ලබන හවුල්කරුවකු; හෝ

(ii) එම තොරතුරුවල සන්තකය නොතිබුණ හවුල් ව්‍යාපාරයක සේවා නියුක්තයකු;

(ආ) (i) ගනුදෙනුවට හෝ ගිවිසුම ඇතුළත්වීම සඳහා හෝ ඊට මැදිහත්වීම සඳහා වූ තීරණයට සම්බන්ධ වූ හෝ එම තීරණය ගනු ලැබූ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකුට හෝ සේවා නියුක්තයකුට හෝ හවුල්කරුවන්ගෙන් එක් හවුල්කරුවකුට හෝ සේවා නියුක්තයන්ගෙන් එක් සේවා නියුක්තයකුට තොරතුරු සන්නිවේදනය නොකරන ලද බවට;

(ii) තොරතුරුවල සන්තකය තිබූ හවුල්කරුවකු හෝ සේවා නියුක්තයකු විසින් එම හවුල්කරුට හෝ සේවා නියුක්තයාට ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත් වීම සඳහා වූ තීරණය සම්බන්ධයෙන් කිසිදු උපදෙසක් නොදුන් බවට; හෝ

(iii) තොරතුරුවල සන්තකය ඇති හවුල්කරු හෝ සේවා නියුක්තයා ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත්වීම සඳහා හෝ ඊට මැදිහත්වීම සඳහා වූ තීරණයට සම්බන්ධ නොවුණ බවට,

සහතික කිරීම සඳහා සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි වැඩපිළිවෙළක් එම අවස්ථාවේ දී හවුල් ව්‍යාපාරය තුළ ක්‍රියාත්මකව තිබුණේ නම්; සහ

(ඇ) ගනුදෙනුව හෝ ගිවිසුමට ඇතුළත්වීම සඳහා හෝ ඊට මැදිහත්වීම සඳහා වූ තීරණයට තොරතුරු සන්නිවේදනය නොකළේ නම්, කිසිදු උපදෙසක් ලබා නොදෙන්නේ නම්, සහ තොරතුරුවල සන්තකය තිබූ හවුල්කරු හෝ සේවා නියුක්තයා එම තීරණයට අදාළ නොවූයේ නම්.

(3) හවුල් ව්‍යාපාරයේ වෙනත් හවුල්කරුවකුගේ හෝ සේවා නියුක්තයකුගේ සන්තකයේ තිබූ බවට සලකනු ලැබීම නිසාම පමණක් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් හැර, අන් ආකාරයකට 135 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත්වීම මගින් එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු 135 වන වගන්තියේ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරනු නොලබන්නේ ය.

(4) මේ වගන්තියෙහි "තොරතුරු" යන්නෙන් හවුල් ව්‍යාපාරයක තොරතුරු සන්තකයේ ඇති හවුල්කරුවකු හෝ සේවා නියුක්තයකු අභ්‍යන්තර තැනැත්තකු වන අවස්ථාවක දී එම තොරතුරුවල සන්තකය ඇති බවට සලකනු ලබන හවුල් ව්‍යාපාරයක තොරතුරු අදහස් වේ.

ප්‍රතිරක්ෂණයට සහ උපප්‍රතිරක්ෂණයට අදාළ ව්‍යතිරේක.

**138.** (1) 135 වන වගන්තියේ (2) උපවගන්තිය-

(අ) ප්‍රතිරක්ෂණ ගිවිසුමකට හෝ උපප්‍රතිරක්ෂණ ගිවිසුමකට ඇතුළත්වීම සම්බන්ධයෙන්; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් ගිවිසුමක දී තත්කාර්ය සඳහා වූ බැඳීමක් යටතේ එම සුරැකුම්පත් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන්,

අදාළ නොවිය යුතු ය.

(2) (අ) සුරැකුම්පත් සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුමකට හෝ උපප්‍රතිරක්ෂණ ගිවිසුමකට ඇතුළත්වීමට, හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් ගිවිසුමක දී තත්කාර්යය සඳහා වූ බැඳීමක් යටතේ සුරැකුම්පත් අත්පත් කර ගැනීමට,

යම් තැනැත්තකුට තොරතුරු සැපයීමේ කාර්යය සඳහා පමණක් එම තැනැත්තාට සුරැකුම්පත්වලට අදාළව තොරතුරු සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන් 135 වන වගන්තියේ (3) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

**139.** (1) සමාගම් පිළිබඳ වැඩපිළිවෙළ යෝජනා ක්‍රමවලට අදාළව, නැවත ප්‍රතිසංවිධානය කිරීමට අදාළව සහ සමාගම් අත්කර ගැනීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සිදු කරනු ලබන සුරැකුම්පත් අත්කර ගැනීමකට හෝ බැහැර කිරීමකට නැතහොත් තොරතුරු සන්නිවේදනය කිරීමට 135 වන වගන්තිය අදාළ නොවිය යුතු ය.

වැඩපිළිවෙළක යෝජනා ක්‍රමවලට අදාළව වූ ව්‍යතිරේක.

(2) සුරැකුම්පත් අත්කර ගැනීම හෝ බැහැර කිරීම නිෂ්කාශනාගාරයක ස්ථානයක රීතිවලට අනුකූලව සිදු කරනු ලබන අවස්ථාවක වෙළෙඳපොළ ගිවිසුමක් බේරුම් කිරීමේ කාර්යය සඳහා සුරැකුම්පත් අත්කර ගන්නා හෝ බැහැර කරනු ලබන නිෂ්කාශනාගාරයකට හෝ වෙළෙඳපොළ ගිවිසුමක් බේරුම් කිරීමට අදාළව නීති කෘත්‍යයක් සම්බන්ධයෙන් හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් සම්බන්ධයෙන් සුරැකුම්පත් අත්කර ගන්නා හෝ බැහැර කරන නිෂ්කාශනාගාරයකට 135 වන වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(3) නිෂ්කාශනාගාරයක උපදෙස් මත සුරැකුම්පත් විකිණීමට හෝ මිල දී ගැනීමට ක්‍රියා කරන විනිමය ස්ථානයකට 135 වන වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

**140.** (1) සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ වැඩි ප්‍රමාණයකට ඇතුළත්වීමට යම් සමාගමක් යෝජනා කරන බව හෝ එකී සමාගම කලින් ඇතුළත් වී ඇති බව එකී සමාගම දැන සිටීම නිසාම පමණක් එකී සමාගමේ සුරැකුම්පත් හැර වෙනත් සුරැකුම්පත්වලට අදාළව ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත් වීම මගින් එකී සමාගම විසින් 135 වන වගන්තියේ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරනු නොලබන්නේ ය.

ස්වකීය අරමුණු පිළිබඳ දැනුමක් ඇති සමාගමක් සඳහා වූ ව්‍යතිරේකය.

(2) (3) වන උපවගන්තියට යටත්ව, යම් සමාගමක සුරැකුම්පත් හැර, වෙනත් සුරැකුම්පත්වලට අදාළ ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ වැඩි ප්‍රමාණයකට ඇතුළත්වීමට එකී සමාගම යෝජනා කරන බව හෝ එකී සමාගම කලින් ඇතුළත් වී ඇති බව එකී සමාගමේ නිලධරයකු දැන සිටීම නිසා එකී සමාගමේ සුරැකුම්පත් හැර, වෙනත් සුරැකුම්පත්වලට අදාළව ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත් වීම මගින් එකී සමාගම 135 වන වගන්තියේ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරනු නොලබන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කරුණ පිළිබඳව සමාගමේ අදාළ නිලධරයා ඔහුගේ කාර්යභාරය අතරතුර දී එම කරුණ පිළිබඳ ව ඔහුට දැන ගැනීමට ලැබුණේ නම් මිස (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(4) (5) වන උපවගන්තියට යටත්ව සමාගමේ සුරැකුම්පත් හැර, වෙනත් සුරැකුම්පත්වලට අදාළව ගනුදෙනු හෝ ගිවිසුම් එකකට හෝ වැඩි ප්‍රමාණයකට ඇතුළත් වීමට සමාගම යෝජනා කරන බව නැතහොත් සමාගම කලින් ඇතුළත් වී ඇති බව යම් තැනැත්තකු දැන සිටීම නිසාම පමණක් එකී සමාගමේ සුරැකුම්පත් හැර වෙනත් සුරැකුම්පත්වලට අදාළව එකී සමාගම වෙනුවෙන් එම තැනැත්තා ගනුදෙනුවකට හෝ ගිවිසුමට ඇතුළත්වීම මගින් එකී තැනැත්තා 135 වන වගන්තියේ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරනු නොලබන්නේ ය.

(5) (4) වන උපවගන්තියේ සඳහන් කරුණු යම් තැනැත්තකු පළමුව සඳහන් සමාගමේ නිලධරයකු වශයෙන් තම කාර්යභාරය අතරතුර දී දැන ගැනීමට ලැබුණේ නම් හෝ පළමුව සඳහන් සමාගමේ අනුනියෝජිතයකු වශයෙන් ක්‍රියා කිරීමේ දී එම තැනැත්තාට දැන ගැනීමට ලැබුණේ නම් හෝ මිස, (4) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

පුද්ගලයකුට අදාළව ව්‍යතිරේකය.

**141.** සුරැකුම්පත්වලට අදාළව ගිවිසුම් එකකට හෝ වැඩි ප්‍රමාණයකට ඇතුළත් වීමට යම් පුද්ගලයකු අදහස් කරන බව හෝ ඔහු එසේ කලින් ඇතුළත් වී ඇති බව එම පුද්ගලයා දැන සිටීම නිසා ම පමණක් එම සුරැකුම්පත්වලට අදාළව එම පුද්ගලයා ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත්වීම මගින් එම පුද්ගලයා 135 වන වගන්තියේ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරනු නොලබන්නේ ය.

වෙළෙඳපොළ අතරමැදියන් විසින් ස්වේච්ඡාවෙන් කරන ලද ගනුදෙනුව.

**142.** (1) (අ) ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත් වූයේ වෙනත් තැනැත්තකුගේ නිශ්චිත උපදෙස් යටතේ නම් සහ එකී ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත්වීමට සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරයේ නිරතව සිටින වෙළෙඳපොළ අතරමැදියකු විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පෙලඹවීමක් සිදු කරනු නොලැබූ වේ නම්;

(ආ) සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරයේ නිරතව සිටින වෙළෙඳපොළ අතරමැදියෙකු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ගනුදෙනුවට හෝ ගිවිසුමට අදාළව වෙනත් තැනැත්තකුට උපදෙස් ලබා දී නැත්නම් හෝ ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත්වීම සඳහා වෙනත් තැනැත්තකුගේ උපදෙස් ඉල්ලා නැත්නම්; සහ

(ඇ) සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරයේ නිරතව සිටින වෙළෙඳපොළ අතරමැදියෙකු සමග හෝ ඔහුගේ නියෝජිතයකු සමඟ වෙනත් තැනැත්තකු සම්බන්ධ වී ඇත්නම්,

විනිමය ස්ථානයක සුරැකුම්පත් වෙළෙඳපොළ මත ඇතුළත් වූ ගනුදෙනුවක් හෝ ගිවිසුමක් වන්නා වූ ද, වෙනත් තැනැත්තකු සඳහා නියෝජිතයකු වශයෙන් ද ගනුදෙනුවකට හෝ ගිවිසුමකට ඇතුළත් වීම මගින් ආයෝජකයන් වෙනුවෙන් සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරයේ නිරතව සිටින වෙළෙඳපොළ අතරමැදියකු හෝ ඔහුගේ නියෝජිතයකු 135 වන වගන්තියේ (2) උපවගන්තිය උල්ලංඝනය කරනු නොලබයි.

(2) ප්‍රධානයා වශයෙන් ස්වකීය තත්ත්වයෙන් සුරැකුම්පත් මිල දී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් මේ වගන්තියේ (1) වන උපවගන්තියට අදාළව වෙළෙඳපොළ අතරමැදියකුගේ වගකීම්වලට මේ වගන්තියේ සඳහන් කිසිවකින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

සාමූහික ආයෝජන යෝජනා ක්‍රමවලට අදාළව ව්‍යතිරේකය.

**143.** පාදක වූ වත්කම්වල වටිනාකමින් සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ බැරකම් අඩු කිරීමෙන් පසු සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ ඒකක මිල දී ගැනීමේ සාධාරණ ගාස්තුවක් අඩු කිරීමෙන් පසු ඉතිරි වටිනාකමට යොමු කිරීම මගින් ප්‍රායෝගිකව

හැකිතාක් දුරට සාධාරණ ලෙස ගණනය කිරීමට භාර ඔප්පුව මගින් නියම කර ඇති මිලකට භාර ඔප්පුවේ අන්තර්ගත හෝ අන්තර්ගත බවට සලකනු ලබන කොටස් නැවත මිල දී ගැනීමේ ප්‍රතිඥාභාරයකට අනුකූලව සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයකට අදාළව භාර ඔප්පුවක් යටතේ භාරකරු මගින් බේරුම් කිරීමක් සම්බන්ධයෙන් 135 වන වගන්තියේ (2)වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

**144.** (1) (අ) ගනුදෙනුවට හෝ ගිවිසුමට ඇතුළත්වීමට පෙර තොරතුරු පිළිබඳව ගනුදෙනුවේ හෝ ගිවිසුමේ අනෙක් පාර්ශ්වය දැන සිටි බවට හෝ දැන සිටි බව සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්;සහ

තොරතුරු විත්තිවාචකයේ සාමාන්‍යය.

(ආ) යම් නියමයන් මත සහ යම් අවස්ථානුගත කරුණු මත එම තැනැත්තා විසින් එම සුරැකුම්පත් අත්කරගනු ලැබේ නම්; හෝ බැහැර කරනු ලැබුවේ නම්,එනම්:-

(i) සාමාන්‍යයෙන් තිබෙන තොරතුරුවලින් ඇතිවීමට ඇති බලපෑමේ හේතුවෙන් තමාටම හෝ වෙනත් තැනැත්තකුට අවස්ථාවෝචිත පරිදි සුරැකුම්පත්වල මිලේ හෝ වටිනාකමේ ලබා නොගත් සාක්ෂාත් නොකළ ලාභ හෝ සාක්ෂාත් නොකළ ලාභ පාඩුව මගහැරීම ඇතුළු යම් ලාභයක් ඔහු ලබා නොගන්නේ නම් හෝ යම් පාඩුවක් මග නොහරින්නේ නම්; සහ

(ii) සුරැකුම්පත් අත්කර ගැනීමේ හෝ බැහැර කිරීමේ කාර්යයට තොරතුරු සාමාන්‍ය ලෙස තිබීම නිසා තොරතුරු මගින් ඇතිවිය හැකි බලපෑමේ හේතුවෙන් තමාටම හෝ වෙනත් යම් තැනැත්තකුට අවස්ථාවෝචිත පරිදි යම් ලාභයක් ලබා ගැනීමේ හෝ පාඩුවක් මග හැරීමේ කාර්ය ඇතුළත් නොවන්නේ නම්,

එම තැනැත්තා විසින් 135 වන වගන්තියේ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරනු නොලබන්නේ ය.

(2) යම් තැනැත්තකු විසින් තොරතුරු සන්නිවේදනය කරනු ලැබූ අවස්ථාවක දී හෝ වෙනත් තැනැත්තකුට තොරතුරු

සන්නිවේදනය කිරීමට සළස්වනු ලැබූ අවස්ථාවක දී 135 වන වගන්තියේ (3) වන උපවගන්තිය උල්ලංඝනය කරනු ලැබුවේ නම්-

(අ) 132 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු සාමාන්‍යයෙන් තිබෙන ආකාරයට එම තොරතුරු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස පමණක් එම තොරතුරු සන්නිවේදනය කරන තැනැත්තාගේ සන්තකයට එම තොරතුරු පත්වූයේ නම්;හෝ

(ආ) තොරතුරු සන්නිවේදනය කිරීමට පෙර අනික් පාර්ශ්වය එම තොරතුරු දැන සිටියේ නම් හෝ දැන සිටි බව සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්,

එය එම තැනැත්තාට විත්ති වාචකයක් විය යුතු ය.

පැමිණිල්ල මගින් විත්තිවාචක වැරදි බව ඔප්පු කිරීම අවශ්‍ය නොවන බව.

**145.** 135 වන වගන්තිය යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්තකුට එරෙහිව කොමිෂන් සභාව විසින් පවරන ලද අපරාධ නඩුවක දී හෝ සිවිල් ක්‍රියාත්මක කිරීමේ නඩුවක දී 136 වන, 137 වන, 138 වන, 139 වන, 140 වන, 141 වන, 142 වන, 143 වන හෝ 144 වන වගන්ති ප්‍රකාරව හෝ 135 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් රීති ප්‍රකාරව සිද්ධිමය කරුණු හෝ අවස්ථානුගත කරුණු තිබුණේ නම් එමගින් 135 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති උල්ලංඝනය කිරීමක් සංයුක්ත වන ක්‍රියා වැළැක්වීමට එම සිද්ධිමය කරුණු හෝ අවස්ථානුගත කරුණු නොතිබුණ බව පැමිණිල්ල විසින් හෝ කොමිෂන් සභාව විසින් ඔප්පු කිරීම අවශ්‍ය නොවේ.

අධිකරණවල අධිකරණ බලය.

**146.** 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, මේ කොටස යටතේ සිදු කරන ලද සෑම වරදක්ම ශ්‍රී ලංකාවේ කවර හෝ අධිකරණ කලාපයක පවත්වනු ලබන මහාධිකරණයක් මගින් විභාග කරනු ලැබිය හැකි අතර මේ පනත මගින් විධිවිධාන සලසා ඇති උපරිම දණ්ඩනය පැනවීමට එම අධිකරණවලට අධිකරණ බලය ඇත.

පැමිණිල්ල මෙහෙය විය හැක්කේ කවුරුන් විසින් ද.

**147.** මේ පනතේ මේ කොටස යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ සෑම අපරාධ නඩුවක් ම නීතිපතිවරයා විසින් හෝ නීතිපතිවරයා විසින් විශේෂයෙන් ලිඛිතව බලය පවරනු ලැබූ වෙනත් නිලධරයකු විසින් මෙහෙයවනු ලැබිය යුතු ය.

යම් වගන්ති උල්ලංඝනය කිරීම වෙනුවෙන් වන සිවිල් වගකීම.

**148.** (1) 124 වන, 125 වන, 126 වන, 127 වන, 128 වන හෝ 135 වන වගන්ති උල්ලංඝනය කරනු ලැබූ යම් තැනැත්තකුගේ ක්‍රියා කලාපය හේතුවෙන් හෝ ඒ මත විශ්වාසය තැබීමෙන් පාඩුවක් හෝ අලාභයක් සිදු වූ යම් තැනැත්තකු විසින් එම තැනැත්තාට එරෙහිව සිවිල් නඩු කටයුතු පැවරීම මගින් පාඩුව හෝ අලාභය අය කර ගනු ලැබිය හැකි අතර එසේ නඩු පැවරීමේ දී එම වගන්ති උල්ලංඝනය කළ තැනැත්තාට එරෙහිව එම උල්ලංඝනය කිරීමේ වරද සම්බන්ධයෙන් නඩු පවරා ඇති වුව ද එසේ නැති වුව ද නැතහොත් එම උල්ලංඝනය කිරීම අපරාධ නඩුවක දී ඔප්පු කර ඇති වුව ද එසේ නැති වුවද මුදල් අය කර ගැනීම සඳහා ඉහත කී පරිදි සිවිල් නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

(2) උල්ලංඝනය කිරීම සංයුක්ත වන ක්‍රියා කලාපය සම්බන්ධයෙන් වෙනත් යම් නීතියක් යටතේ වූ වගකීමකට මේ වගන්තිය මගින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

කොමිෂන් සභාව මගින් සිවිල් නඩු කටයුතු පැවරීම.

**149.** (1)124 වන, 125 වන, 126 වන, 127 වන හෝ 128 වන වගන්ති යම් තැනැත්තකු විසින් උල්ලංඝනය කර ඇති බව කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවක කොමිෂන් සභාව විසින් මහජනතාවගේ යහපත උදෙසා එම තැනැත්තාට එරෙහිව සිවිල් දඩයක් ලබා ගැනීමට අධිකරණයේ සිවිල් නඩු කටයුතු පවරනු ලැබීම අවශ්‍ය බව පෙනී යන විට, එසේ සිවිල් නඩු කටයුත්තක දී -

(අ) එම තැනැත්තා ලබා ගත් මූල්‍ය ලාභයේ හෝ මඟ හැරිපාඩුවේ දල වටිනාකමේ තුන් ගුණයක් නොඉක්මවන මුදලක්; හෝ

(ආ) උල්ලංඝනය කිරීමේ බරපතළකම හෝ වැදගත්කම සැලකිල්ලට ගෙන අධිකරණය විසින් උචිත යයි සලකනු ලබන රුපියල් මිලියන දහයකට නොඅඩු සහ රුපියල් මිලියන සියයකට නොවැඩි මුදලක්,

සිවිල් දණ්ඩන මුදලක් වශයෙන් අය කර ගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවරන ලද නඩුවක දී කොමිෂන් සභාව විසින් අය කර ගනු ලබන මුදලක් -

(අ) පළමුවෙන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ සහ නඩු පැවරීමේ සියලු ගාස්තු කොමිෂන් සභාවට ප්‍රතිපූරණය කරනු ලැබීමට; සහ

(ආ) දෙවනුව උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පාඩුවක් හෝ අලාභයක් සිදු වූ තැනැත්තන්ට වන්දි ගෙවීමට,

අදාළ කරගනු ලැබිය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි එක් එක් තැනැත්තාට ගෙවිය යුතු මුදල හෝ වන්දි ගෙවීම සඳහා උචිත යයි සලකනු ලබන තැනැත්තන් හඳුනාගැනීමේ හෝ ඔවුන්ට දැනුම් දීමේ දුෂ්කරතාවය හේතු කොට ගෙන (2)වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තන්ට වන්දි මුදල් ගෙවීම ප්‍රායෝගික නොවන බව කොමිෂන් සභාව සලකන්නේ නම් (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තන්ට වන්දි මුදල් බෙදා නොහැරිය යුතු බවට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබ එකී මුදල් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) අභ්‍යන්තර තැනැත්තකු විසින් 135 වන වගන්තියේ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් සුරැකුම්පත් මිල දී ගෙන ඇත්නම් හෝ මිල දී ගැනීමට එකඟ වී ඇත්නම් හෝ නැතහොත් සුරැකුම්පත් මිල දී ගැනීමට හෝ මිල දී ගැනීම සඳහා එකඟ කරවා ගැනීමට තවත් තැනැත්තකු පොළඹවනු ලැබ ඇත්නම් නැතහොත් 135 වන වගන්තියේ (3) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් එම අභ්‍යන්තර තැනැත්තා විසින් 135 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු වෙනත් තැනැත්තකුට සන්නිවේදනය කර ඇත්නම් සහ එම සුරැකුම්පත් විනිමය ස්ථානයක වෙළෙඳාම් කිරීමට අවසර ලබා දී ඇත්නම් එම අභ්‍යන්තර තැනැත්තාට එරෙහිව කොමිෂන් සභාව විසින් එම උල්ලංඝනය කිරීමට අදාළව සිවිල් දණ්ඩන මුදලක් ලෙස ලබා ගැනීමට ආඥාවක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් එම අභ්‍යන්තර තැනැත්තාට එරෙහිව මහජන යහපත උදෙසා පහත දැක්වෙන සියලු ක්‍රියා හෝ ඉන් යම් ක්‍රියාවක් අනුගමනය කරනු ලැබිය හැකි ය:-

(අ) අභ්‍යන්තර තැනැත්තා හෝ වෙනත් තැනැත්තකු විසින් සුරැකුම්පත් අත්කර ගත් හෝ අත්කර ගැනීමට එකඟ වූ මිල සහ තොරතුරු සාමාන්‍ය වශයෙන් ලැබී තිබුනේ නම් අවස්ථාවෝචිත පරිදි අත්කර ගැනීමේ හෝ එකඟ වීමේ අවස්ථාවේ දී එම සුරැකුම්පත් අත්කර ගැනීමට ඉඩ තිබූ මිල අතර වෙනස මෙන් තුන් ගුණයකට සමාන මුදලක් අත්කර ගැනීම සඳහා; හෝ

(ආ) උල්ලංඝනය කිරීමේ බරපතළකම සම්බන්ධයෙන් අධිකරණය විසින් උචිත යැයි සලකනු ලබන සහ රුපියල් මිලියන සියයකට වඩා වැඩි නොවන මුදලක් අයකර ගැනීම සඳහා.

(5) අභ්‍යන්තර තැනැත්තකු විසින් 135 වන වගන්තියේ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් සුරැකුම්පත් බැහැර කර ඇත්නම් හෝ බැහැර කිරීමට එකඟ වී ඇත්නම් හෝ නැතහොත් සුරැකුම්පත් බැහැර කිරීමට වෙනත් තැනැත්තකු පොලඹවා ඇත්නම් හෝ බැහැර කිරීමට එකඟ කර ගෙන ඇත්නම් නැතහොත් 135 වන වගන්තියේ (3) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් අභ්‍යන්තර තැනැත්තකු විසින් 135 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු වෙනත් තැනැත්තකුට සන්නිවේදනය කර ඇත්නම් සහ එම සුරැකුම්පත් විනිමය ස්ථානයක වෙළෙඳාම් කිරීමට අවසර ලබා දී ඇත්නම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වූ වරදට කොමිෂන් සභාව විසින් මහජන යහපත උදෙසා අභ්‍යන්තර තැනැත්තාට එරෙහිව එම උල්ලංඝනය කිරීමට අදාළව සිවිල් දණ්ඩන මුදලක් ලෙස ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ආඥාවක් ලබා ගැනීමේ පහත දැක්වෙන සියලු ක්‍රියා හෝ ඉන් යම් ක්‍රියාවක් කරනු ලැබිය හැකි ය:-

(අ) අභ්‍යන්තර තැනැත්තකු හෝ වෙනත් නැතැත්තෙකු විසින් සුරැකුම්පත් වෙනත් තැනැත්තකුට බැහැර කරනු ලැබූ මිල හෝ බැහැර කිරීමට එකඟ වූ මිල සහ එම තොරතුරු සාමාන්‍යයෙන් ලැබී තිබුණේ නම් අවස්ථාවෝචිත පරිදි බැහැර කරන අවස්ථාවේ දී හෝ බැහැර කිරීමට එකඟ වූ අවස්ථාවේ දී එසේ බැහැර කිරීමට ඉඩ තිබූ මිල අතර වෙනස මෙන් තුන් ගුණයකට සමාන වූ මුදලක් අයකර ගැනීම සඳහා; හෝ

(ආ) උල්ලංඝනය කිරීමේ බරපතළකම සළකා අධිකරණය විසින් උචිත යැයි සලකනු ලබන රුපියල් මිලියන සියයකට වැඩි නොවන මුදලක් අයකර ගැනීම සඳහා.

(6) (අ) මේ කොටසේ යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ විධිවිධාන සලසා ඇති පදනම මත එක් එක් වන්දි සඳහා ගණනය කරනු ලැබූ මුල්‍ය ප්‍රතිලාභය හෝ මග හරිනු ලැබූ අලාභය මෙන් තුන් ගුණයකට වැඩි නොවන මුදලක් ගෙවීම සඳහා වූ

වගකීම පිළිගැනීම පදනම මත යම් තැනැත්තකු සමග කොමිෂන් සභාව ගිවිසුමකට ඇතුළත්වීම මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින් වළක්වනු ලබන බවට තේරුම් නොගත යුතු ය; සහ

(ආ) ගිවිසුමට ඇතුළත්වීම පාර්ශ්වයන් විසින් පැහැර හරිනු ලැබුවහොත් හෝ ගිවිසුම යටතේ වූ යම් බැඳීමක් ඉටු කිරීම පාර්ශ්වයන් විසින් පැහැර හරිනු ලැබුවහොත් (අ) ඡේදයේ සඳහන් යම් වගකීම් පිළිගැනීමක්, කොමිෂන් සභාව විසින් පසු අවස්ථාවක අධිකරණයේ පවරනු ලබනු නඩුවක දී ආවේශ්‍ය කරනු නොලැබිය යුතු ය.

(7) (2) වන සහ (3) වන උපවගන්ති, මේ වගන්තියේ (4) වන, (5) වන සහ (6) වන උපවගන්ති යටතේ කොමිෂන් සභාව විසින් අයකර ගනු ලබන මුදල් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(8) මේ පනතේ වෙනත් යම් වගන්තියක හෝ වෙනත් යම් නීතියක් යටතේ පාඩුවක් හෝ අලාභයක් සිදු වී ඇති තැනැත්තකු වෙත පවරා ඇති නඩු පැවරීමේ අයිතියට මේ වගන්තිය යටතේ පවරා ඇති නඩු පැවරීමේ අයිතිය මගින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

## VI වන කොටස

## මුදල්

මේ කොටසේ පරමාර්ථ සහ අරමුණු.

**150.** මේ කොටසේ පරමාර්ථ සහ අරමුණු විය යුත්තේ-

(අ) කොමිෂන් සභාවේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා විවිධ අරමුදල් පිහිටුවීම; සහ

(ආ) වෙනත් ප්‍රතිකර්මයක් නොමැති ආයෝජකයන්ට සීමිත වන්දි සැපයීමට අරමුදලක් පිහිටුවීම.

### 1 වන පරිච්ඡේදය

### කොමිෂන් සභාවේ අරමුදල්

සෙස් බද්දක් පැනවීම.

**151.** (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන අනුප්‍රමාණයකට අනුව වූ සෙස් බද්දක්, ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක වාර්තාගත හෝ

එහි රීති යටතේ එවැනි ගැනුම්කරුවකු සහ විකුණුම්කරුවකු යන දෙදෙනාම විසින් ඊට දන්වන ලද හෝ, සුරැකුම්පත් පිළිබඳ සෑම මිල දී ගැනීමක් හෝ විකිණීමක් සම්බන්ධයෙන් නියම කිරීම, අය කිරීම සහ ගෙවීම කරනු ලැබිය යුතු ය. එකිනෙකට වෙනස් පන්තිවලට අයත් සුරැකුම්පත් සඳහා එකිනෙකට වෙනස් අනුප්‍රමාණ නියම කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්ති යටතේ පනවනු ලබන සෙස් බද්ද, වෙනත් යම් නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතු ය.

සෙස් බදු අරමුදල.

**152.** (1) 151 වන වූ වගන්තිය යටතේ පනවන ලද සෙස් බද්දෙන් ලත් මුදල් සෙස් බදු අරමුදල යනුවෙන් හඳුන්වා පිහිටුවනු ලැබූ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) සෙස් අරමුදලින් පහත දැක්වෙන කාර්ය සඳහා උදෙසා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබූ යම් මුදල් ගෙවනු ලැබිය යුතු ය:-

(අ) සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම;

(ආ) මේ කොටස යටතේ පිහිටුවන ලද වන්දි අරමුදලේ හෝ කොමිෂන් සභාවේ අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම; සහ

(ඇ) කොමිෂන් සභාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා එහි බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම.

(3) සෙස් බදු අරමුදල සුරක්ෂිත කිරීමේ කාර්ය සඳහා, සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයට, ආයෝජනය කළ හැකි ය.

කොමිෂන් සභාවේ අරමුදල.

**153.** (1) කොමිෂන් සභාවට, සභාවේ ම අරමුදලක් තිබිය යුතු ය.

(2) ඒ අරමුදලට-

(අ) කොමිෂන් සභාවේ භාවිතය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ සියලු පරීක්ෂණ සිදු කරගෙන යාමේ දී දරන ලද වියදම් වශයෙන් අය කරනු ලබන හෝ මේ පනතේ විධිවිධාන යටතේ ගාස්තුවක් වශයෙන් ගෙවන ලද සියලු මුදල් ප්‍රමාණයන්;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ අරමුදලට බැර කළ යුතු මුදල් ප්‍රමාණයන්;

(ඈ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර කවර වූ හෝ ප්‍රභවයකින් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදානයක් වශයෙන් කොමිෂන් සභාවට ලැබෙන සියලු යම් මුදල් ප්‍රමාණයන්; සහ

(ඉ) සෙස් අරමුදලින් බැර කරනු ලබන යම් මුදල් ප්‍රමාණයන්,ගෙවනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය ඉටු කිරීමේ දී හෝ කාර්ය කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලු මුදල් ප්‍රමාණයන් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ අරමුදලට අයත් මුදල් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයෙන් කොමිෂන් සභාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

මුදල් වර්ෂය.

**154.** කොමිෂන් සභාවේ මුදල් වර්ෂය, එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භ වන මාස දොළහක කාලසීමාව විය යුතු ය.

ගිණුම් විගණනය කිරීම.

**155.** (1) කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් හා වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ ඇති විධිවිධාන කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

2 වන පරිච්ඡේදය

## ආයෝජකයින්ට වන්දි ප්‍රදානය සඳහා වන අරමුදල

**156.** (1) වෙළෙඳපොළ අතරමැදියකුගේ යම් වංචනික හෝ නොසැලකිලිමත් ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍යමය පාඩුවකට පත්වන යම් ආයෝජකයකුට, එම ආයෝජකයාට වෙනත් ප්‍රතිකර්මයක් නොමැති නම් සීමිත වන්දියක් ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා වන්දි අරමුදල නම් වූ අරමුදලක් පිහිටවනු ලැබිය යුතු ය. වන්දි අරමුදල.

(2) වන්දි අරමුදල-

(අ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන යම් මුදල් ප්‍රමාණයන්ගෙන්;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ අරමුදලට බැර කළ යුතු යම් මුදල් ප්‍රමාණයන්ගෙන්; සහ

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සෙස් අරමුදලින් බැර කරනු ලබන යම් මුදල් ප්‍රමාණයන්ගෙන්,

සමන්විත විය යුතු ය.

(3) වන්දි අරමුදලට අයත් මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකි ය.

**157.** (1) කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින් අතුරින් පත් කරනු ලැබිය යුතු සාමාජිකයින් තිදෙනෙකුගෙන් (මෙහි මින්මතු"කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) කොමිෂන් සභාවේ වන්දි කමිටුව සමන්විත වියයුතු ය. වන්දි කමිටුව පත් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කමිටුව 158 වන වගන්තිය යටතේ කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම හා ප්‍රදානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතු අතර එවැනි තක්සේරු කිරීමක් හෝ ප්‍රදානයක් සම්බන්ධයෙන් කමිටුවේ තීරණය මේ පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

වන්දි සඳහා ඉල්ලීම් කිරීම.

**158.** (1) යම් ආයෝජකයකු කෙරෙහි වූ ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට නොහැකි වූ යම් වෙළෙඳපොළ අතරමැදියකු හේතු කොටගෙන යම් ආයෝජකයකුට මූල්‍යමය පාඩුවක් සිදු වී ඇති අවස්ථාවක, එකී ආයෝජකයා විසින් කමිටුව වෙත නියමිත ආකෘතිය අනුව වන්දි අරමුදලින් වන්දි හිමිකම් පෑමේ ඉල්ලීමක් කළ හැකි ය.

(2) වන්දි සඳහා හිමිකම් පෑමක් කර ඇති යම් ඉල්ලුම්කරුවකුගේ හිමිකම් සනාථ කරනු පිණිස යම් ලේඛනයක් හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් කලින් කල එම ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය. ඒ නියමය අනුව කටයුතු කිරීමට ඉල්ලුම්කරු අසමත් වන අවස්ථාවක ඔහුගේ හිමිකම්පෑම කමිටුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) ඉල්ලුම්කරුගේ හිමිකම්පෑම සම්බන්ධයෙන් විභාගයක් පැවැත්වීමට අවශ්‍ය යයි කමිටුව යම් අවස්ථාවක අදහස් කරන්නේ නම්, කමිටුව විසින් එසේ කරනු ලැබිය හැකි අතර, ලිඛිත දැන්වීමක් මගින් එහි සඳහන් කරනු ලබන යම් දිනයක, යම් වේලාවක හා ස්ථානයකට පැමිණෙන ලෙස ඉල්ලුම්කරු වෙත දන්වනු ලැබිය යුතු ය. දැන්වීමෙහි සඳහන් දිනයේ දී එකී විභාගය සඳහා පෙනී සිටීමට ඒ ඉල්ලුම්කරු අසමත්වන අවස්ථාවක කමිටුව විසින් ඔහුගේ හිමිකම්පෑම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

වන්දි ගෙවීම.

**159.** (1) ඉල්ලුම්කරුවකු විසින් තම හිමිකම්පෑම සනාථ කරනු පිණිස ඉදිරිපත් කරන ලද ලේඛන හෝ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසුව හෝ විභාගයක් පවත්වනු ලැබූ යම් අවස්ථාවක ඒ විභාගය සමාප්ත වූ විට වන්දි සඳහා වූ එකී හිමිකම්පෑම පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කමිටුව විසින් කරනු ලැබිය හැකි ය.

(2) කමිටුව යම් හිමිකම්පෑමක් පිළිගන්නා අවස්ථාවක, ගෙවිය යුතු සීමිත වන්දි ප්‍රමාණය පිළිබඳ තක්සේරුවක් කමිටුව විසින් කරනු ලැබිය යුතු ය. එකී ප්‍රදානය පිළිබඳ දැන්වීම ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

## VII වන කොටස

### සාමාන්‍ය

මේ කොටසේ පරමාර්ථ සහ අරමුණු.

**160.** මේ කොටසේ පරමාර්ථ සහ අරමුණු විය යුත්තේ-

(අ) ලේඛන සැපයීම සම්බන්ධ මේ පනතේ විධිවිධාන ඵලදායීව ක්‍රියාත්මක කිරීම, තොරතුරු අනාවරණය කිරීම, පැමිණිලි කළමනාකරණය කිරීමේ කමිටුවක් පිහිටුවීම, විමසුම් හා විමර්ශන පවත්වා ගෙන යාම, තොරතුරු බෙදා හැරීම, ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීම සහ කොමිෂන් සභාව විසින් ආයෝජකයන් වෙනුවෙන් අලාභ අයකර ගැනීම තහවුරු කිරීම; සහ

(ආ) මේ පනතේ විධිවිධාන කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම තහවුරු කිරීම,

1 වන පරිච්ඡේදය

**ආයතනික මූලික ව්‍යුහයට අදාළ විධිවිධාන**

ලේඛන ඉදිරිපත් කිරීම සහ තොරතුරු අනාවරණය කිරීම.

**161.** (1) කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද තැනැත්තකු විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාවක් ඇතුළත (යම් බද්දක් පැනවීම සහ අය කර ගැනීම සඳහා විධිවිධාන සලස්වන යම් නීතියක් යටතේ අනාවරණය කිරීමට හෝ ඉදිරිපත් කිරීමට තහනම් කර ඇති තොරතුරක් හෝ ලේඛනයක් හැර) මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල නිසි ලෙස ක්‍රියාත්මක කිරීම හෝ එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් අදහස් කරනු ලබන දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් තොරතුරු සපයන ලෙස හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කළ හැකි ය.

(2) යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත එම දැන්වීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලබන යම් තැනැත්තකුගේ කාර්යය විය යුතු ය. එවැනි දැන්වීමක් අනුව ක්‍රියා කරමින් එම තැනැත්තා යම් නීතියක් යටතේ හෙළිදරව් කිරීම හෝ ඉදිරිපත් කිරීම තහනම් කර ඇති යම් තොරතුරක් හෙළිදරව් කරන හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කරන අවස්ථාවක, එම නීතියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, එම හෙළිදරව් කිරීම හෝ ඉදිරිපත් කිරීම එම නීතියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් මේ වගන්තිය යටතේ නිකුත් කළ දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම සඳහා සපයන ලද යම් ලේඛනයක් හෝ විද්‍යුත් වාර්තාවක අන්තර්ගතයන් -

(අ) මේ පනතේ විධිවිධාන අනුව;

(ආ) කොමිෂන් සභාව පාර්ශ්වයක් වන නඩු කටයුත්තක දී;

(ඇ) කොමිෂන් සභාවේ කර්තව්‍යයන් ඉටු කිරීමේ දී; හෝ

(ඈ) එකී තොරතුර, ලේඛනය හෝ විද්‍යුත් වාර්තාව සපයන තැනැත්තාගේ කැමැත්ත මත,

හැර වෙනත් යම් තැනැත්තකුට ප්‍රකාශ කිරීම හෝ පළ කරනු ලැබීම නොකළයුතු ය.

(4) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග, රීති හෝ විධාන උල්ලංඝනය කිරීමක් සඳහා කොමිෂන් සභාව විසින් තොරතුරු, ලේඛන හෝ විද්‍යුත් වාර්තා ඉදිරිපත් කරන තැනැත්තකු විමර්ශනය කරමින් සිටින අවස්ථාවක දී (3) වන උපවගන්තියේ (ඈ) පරිච්ඡේදය යටතේ වූ කැමැත්ත ලබා ගැනීමට නියම අවශ්‍ය කරනු නොලැබිය යුතු ය.

**විමසුම් සහ විමර්ශන.**

**162.** (1) මේ පනත යටතේ වූ කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්යයන් සිදු කිරීම හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය බවට සලකනු ලැබිය හැකි විමර්ශන කටයුතු කරගෙන යාම හෝ විමසුම් පැවැත්වීම කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් නිසි ලෙස බලය පවරන ලද යම් තැනැත්තකු විසින් සිදු කළ හැකි අතර එකී කාර්යය සඳහා -

(අ) යම් තැනැත්තකු විසින් ආයෝජකයන්ට හෝ කොටස් වෙළෙඳපොළට අනර්ථකාරී ආකාරයෙන් කොටස් ගනුදෙනු කරගෙන යන බවට; හෝ

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීති හෝ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ විධානයක් යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු, ආයෝජකයකු හෝ යම් තැනැත්තකු උල්ලංඝනය කර තිබෙන බවට,

විශ්වාස කිරීමට කොමිෂන් සභාව සතුව සාධාරණ හේතු පවතින අවස්ථාවක දී එකී තැනැත්තා සතුව පවතින හෝ පාලනයේ පවතින එකී විමර්ශන හෝ විමසුම් කාර්ය සඳහා අවශ්‍ය යම් පොත් හෝ ලේඛන ඉදිරිපත් කිරීමට හෝ ඔහුගේ සාක්ෂි ලබා දීමට කොමිෂන්

සභාව හෝ බලය පවරන ලද තැනැත්තා ඉදිරියේ පෙනී සිටීම සඳහා යම් තැනැත්තකුට අණ කිරීම හෝ කැඳවීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව හෝ නිසි පරිදි බලය පවරන ලද යම් තැනැත්තකු විසින් එය ඉදිරියේ පෙනී සිටීමට අණ කරනු ලැබූ හෝ කැඳවන ලද යම් තැනැත්තකු වාචිකව පරීක්ෂා කරනු ලැබිය හැකි අතර එසේ කරන ලද තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රකාශනයක් ලේඛනගත කරනු ලැබිය හැකි ය. එසේ ලේඛනගත කරනු ලබන සෑම ප්‍රකාශනයක් ම එසේ පරීක්ෂාවට ලක්වූ තැනැත්තා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. එසේ වුව ද, අත්සන් කිරීමට පෙර, එම ප්‍රකාශනය එම තැනැත්තා වෙත කියවනු ලැබිය යුතු අතර ඔහුට එම ප්‍රකාශනය ලියා ඇති භාෂාව තේරුම් ගත නොහැකි නම් ඔහුට තේරුම් ගත හැකි භාෂාවකින් ඔහු වෙත එම ප්‍රකාශය තේරුම් කර දිය යුතු වන අතර ඔහුට එම ප්‍රකාශනය පැහැදිලි කිරීමට හෝ ඊට යමක් එකතු කිරීමට නිදහස තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව හෝ බලය පවරනු ලැබූ තැනැත්තා ඉදිරියේ පෙනී සිටීමට නියම කර ඇති අවස්ථාවක දී, එසේ කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකුම හෝ කොමිෂන් සභාව හෝ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් ඔහු වෙත යොමු කරනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන තැනැත්තකු හෝ කොමිෂන් සභාව විසින් හෝ නිසි පරිදි බලය පවරන ලද තැනැත්තා විසින් ඔහු සතුව හෝ ඔහුගේ පාලනය යටතේ පවතින ඕනෑම පොතක්, ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් ඉදිරිපත් කිරීමට හෝ ඒවායෙහි පිටපත් ලබා ගැනීමට නියම කරන ලද අවස්ථාවක දී එය ප්‍රතික්ෂේප කරන හෝ කොමිෂන් සභාව හෝ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් අසනු ලබන ඕනෑම ප්‍රශ්නයකට දැන දැනම සාවද්‍ය පිළිතුරු ලබාදෙන තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් විමසුමක් හෝ විමර්ශනයක් පැවැත්වීමේ කාර්ය සඳහා, මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද වෙනත් නියෝගයක් හෝ රීතියක් හෝ විධානයක් යටතේ හෝ එම ව්‍යාපාරය සම්බන්ධයෙන් වෙනත් යම් නීතියක් යටතේ තබාගැනීම සඳහා නියමකරන ලද යම් ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවේ පිටපත් ලබා ගැනීම සඳහා සහ මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා එම

තොරතුරු අවශ්‍ය බවට විශ්වාස කිරීමට කොමිෂන් සභාවට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී සාක්ෂි ලබා ගැනීම සඳහා ඔවුන්ගේ පරිගණක පද්ධති වෙත ප්‍රවේශවීම සඳහා යම් වෙළෙඳපොළ ආයතනයක හෝ වෙළෙඳපොළ අතරමැදි ආයතනයක හෝ ලැයිස්තුගත පොදු සමාගමකට ඇතුල්වීම සඳහා නියමකර ඇත්තා වූ 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත යටතේ පිළිගෙන ඇති යම් නිලධරයකු හෝ ප්‍රවීණයකු වෙත කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබිය හැකි ය.

(5) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා, (1) වන උපවගන්තිය යටතේ බලය පවරන ලද සෑම නිලධරයකුම සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) ඉලෙක්ට්‍රොනික වාර්තාවකට හෝ ලේඛනවලට අදාළව (4) වන උපවගන්තිය යටතේ හෝ මේ පනතේ වෙනත් යම් වගන්තියක යටතේ හෝ යම් විමර්ශනයක් හෝ විමසුමක් පවත්වාගෙන යාමේ දී 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

ක්‍රියා විරහිත කිරීමේ නියෝග නිකුත් කිරීම.

**163.** (1) මේ පනතේ යම් විධිවිධානයක්, ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානයන් උල්ලංඝනය කිරීම පිළිබඳව සාධාරණ සැක කිරීමක් මත, 162 වන වගන්තියේ කොන්දේසිවලට අනුව යම් තැනැත්තකු විමර්ශනයට ලක් කරනු ලබන හෝ යම් විමසුමක් පවත්වාගෙන යනු ලබන ඕනෑම අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්-

(අ) යම් තැනැත්තකු, එම තැනැත්තා සතු වත්කම් හෝ ඒවායෙන් යම් කොටසක් බැහැර කිරීම තහනම් කරමින්;

(ආ) යම් තැනැත්තකු කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ගනුදෙනුවකට හෝ ගනුදෙනු පන්තියකට ඇතුළත් වීම තහනම් කරමින්; හෝ

(ඇ) යම් තැනැත්තකු මහජනතාවගෙන් අරමුදල් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීම තහනම් කරමින්,

(මෙහි මින්මතු "ක්‍රියා විරහිත කිරීමේ නියෝගය" යනුවෙන් සඳහන් කරනු ලබන) විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද ක්‍රියාවිරහිත කිරීමේ නියෝගයක් එය නිකුත් කිරීමේ දින සිට වෙළෙඳ දින හතක් ඉක්මවා යන කාලසීමාවක් දක්වා බල නොපැවැත්විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ක්‍රියා විරහිත කිරීමේ නියෝගයක් නිකුත් කිරීමෙන් පසුව, එම ක්‍රියා විරහිත කිරීමේ නියෝගය පිළිබඳව තහවුරු කිරීමක් බලාපොරොත්තුවෙන් අධිකරණය වෙත අයදුම් කිරීමක් සිදු කළ යුතු අතර එම කාලසීමාවට යම් දීර්ඝ කිරීමක් අවශ්‍ය වන්නේ නම්, අගතියට පත් තැනැත්තාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීමෙන් පසු ඒ සඳහා අවශ්‍ය වන පරිදි ඉල්ලීමක් ද සිදු කරනු ලැබිය හැකි ය.

(4) ක්‍රියා විරහිත කිරීමේ නියෝගයක් නිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බවට අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, අධිකරණය විසින් ක්‍රියාවිරහිත කිරීමේ නියෝගය ස්ථිර කරනු ලැබිය හැකි අතර එහි දීර්ඝ කිරීමක් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බවට අධිකරණයට සෑහීමට පත් වන්නේ නම් අධිකරණය විසින් උචිත යැයි සලකනු ලබන යම් කාල පරිච්ඡේද සඳහා දීර්ඝ කිරීම් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(5) (3) වන උපවගන්තියේ කොන්දේසිවලට අනුව කොමිෂන් සභාව විසින් අධිකරණය වෙත සිදු කරනු ලබන අයදුම් කිරීමක් සම්බන්ධයෙන් අධිකරණය විසින් යම් ක්‍රියාවිරහිත කිරීමේ නියෝගයක් යටතේ ඇති වත්කම්වල කළමනාකාරිත්වය සම්බන්ධයෙන් සුදුසු නියෝගයක් ලබා දිය යුතු ය.

**164.** (1) කොමිෂන් සභාව විසින් යම් වෙළෙඳපොළ ආයතනයකට, වෙළෙඳපොළ අතරමැදියකුට, ලැයිස්තුගත පොදු සමාගමකට හෝ ලියාපදිංචි තැනැත්තකුට නිකුත් කරන ලද විධානයන් සම්බන්ධයෙන් හෝ මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග, රීති හෝ උල්ලංඝනය කිරීම් හෝ වෘත්තීය විෂමාචාර වලට අදාළව යම් තැනැත්තකු විසින් සිදු කරන ලද පැමිණිලි විභාග කිරීමට සහ හඳුනාගැනීමට කොමිෂන් සභාව විසින් පැමිණිලි කළමනාකරණ කමිටුවක් පිහිටුවනු ලැබිය හැකි ය.

පැමිණිලි කළමනාකරණ කමිටුව විසින් විමසුම් පැවැත්වීම.

(2) කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් නිසි පරිදි බලය පවරන ලද යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ උචිත ලෙස සලකනු ලැබිය

හැකි විමසුම් පවත්වනු ලැබිය හැකි අතර එම කාර්යය සඳහා යම් තැනැත්තකු, සාක්ෂි දීම සඳහා අවශ්‍ය විය හැකි එම තැනැත්තා සතුව හෝ එම තැනැත්තාගේ පාලනය යටතේ පවතින යම් පොත් හෝ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා කමිටුව ඉදිරියේ පෙනී සිටීමට අණ කිරීමක් හෝ කැඳවීම සිදු කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් පැමිණිලි මෙහෙයවීම, පැමිණිලි පිළිබඳ තීරණය කිරීම සහ ඒ සඳහා අදාළ වන සියලු කාරණා සඳහා රීති මාර්ගයෙන් සුදුසු ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටිය සකස් කරනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් ලිඛිත පැමිණිල්ලක් පැමිණිලි කළමනාකරණ කමිටුව වෙත ලැබුණ විට දී, පැමිණිලි කළමනාකරණ කමිටුව විසින්, ඉදිරිපත් කරන ලද සාක්ෂි පරීක්ෂාවට ලක් කරනු ලැබිය යුතු අතර මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද රීති, නියෝග හෝ විධාන හෝ වෙළෙඳ ආයතනයක යම් රීතීන් උල්ලංඝනය වී ඇතිද යන්න තීරණය කරනු ලැබිය හැකි ය.

(5) පැමිණිලි කළමනාකරණ කමිටුව විසින් එම වෙළෙඳපොළ ආයතනයට, වෙළෙඳපොළඅතරමැදියාට, ලැයිස්තුගත පොදු සමාගමට හෝ ලියාපදිංචි තැනැත්තා හට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් තොරව යම් තීරණයක් ගනු නොලැබිය යුතු ය.

(6) මේ පනත යටතේ ඇති යම් විධිවිධානයක්, මේ පනත යටතේ නිකුත් කරන ලද නියෝගයක්, රීතියක් හෝ විධානයක් හෝ යම් වෙළෙඳ ආයතනයක රීති, යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු, ලැයිස්තුගත පොදු සමාගමක හෝ ලියාපදිංචි තැනැත්තකු විසින් උල්ලංඝනය කර ඇති බවට පැමිණිලි කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාවට එවැනි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට හෝ එම කාරණය වැඩිදුර විමර්ශනය සඳහා සුදුසු අධිකාරයක් වෙත යොමු කිරීමට අභිමතය තිබිය යුතු ය.

(7) පැමිණිලි කළමනාකරණ කමිටුවේ තීරණය මගින් අතෘප්තියට පත් යම් පාර්ශ්වයකට එම තීරණය නැවත සමාලෝචනය කිරීම සඳහා කොමිෂන් සභාව වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

**165.** (1) යම් වෙළෙඳපොළ ආයතනයක්, වෙළෙඳපොළ අතරමැදියකු හෝ ලැයිස්තුගත පොදු සමාගමක් සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන වෘත්තීය සේවාවලට අදාළව අතිරේක සේවා සපයන්නන්ගෙන් තොරතුරු, පැහැදිලි කිරීම් හෝ විස්තර කිරීම් ලබා ගැනීමට කොමිෂන් සභාවට හිමිකම තිබිය යුතු ය.

අතිරේක සේවා සපයන්නන්.

(2) යම් වෙළෙඳපොළ ආයතනයකට, වෙළෙඳපොළ අතරමැදියකුට හෝ ලැයිස්තුගත පොදු සමාගමකට සපයන ලද සේවාවන් ආයෝජකයින්ගේ සුභසිද්ධියට හානිදායක වීමට හේතුවන හෝ හානිදායක වීමට හේතු විය හැකි බවට කොමිෂන් සභාව විසින් අදහස් කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් එම අතිරේක සේවා සපයන්නා වෙත කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි ප්‍රතිකාරක ක්‍රියාමාර්ග ගැනීමට විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී නිර්ණායක හෝ රීති මාර්ගයෙන් අතිරේක සේවා සපයන්නන්ගේ කාර්යය සහ කර්තව්‍යයන් සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

**166.** කොමිෂන් සභාව විසින් සුරැකුම්පත් වෙළෙඳපොළවල්වල සුරැකුම්පත් සහ ආයෝජකයන් සම්බන්ධයෙන් වන නියාමන කර්තව්‍යයන් පිළිබඳ තොරතුරු බෙදා ගැනීම සම්බන්ධයෙන් වෙනත් යම් සංවිධාන සමඟ ගිවිසුම්වලට හෝ අවබෝධතා ගිවිසුම්වලට එළඹෙනු ලැබිය හැකි ය.

ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම.

**167.** (1) කොමිෂන් සභාව විසින් ස්වකීය මෙහෙයවීමක් මත හෝ යම් රාජ්‍ය නිලධරයකුගේ හෝ පොලිස් නිලධරයකුගේ ඉල්ලීම මත, නිසි අධිකරණයක් විසින් නිකුත් කළ ආඥාවක් මගින් -

තොරතුරු බෙදා ගැනීම සහ සහයෝගීතාවය.

(අ) මේ පනත යටතේ විමර්ශන නිලධරයකු වෙත ඉදිරිපත් කරන ලද, විමර්ශන නිලධරයකු විසින් අත්කර ගන්නා ලද, රඳවා ගන්නා ලද හෝ හිමිකර ගන්නා ලද යම් දේපළක්, පොතක්, ලේඛනයක්, භාණ්ඩයක්, දෙයක් හෝ විද්‍යුත් වාර්තාවක් හෝ වෙනත් කුමන හෝ ආකාරයෙන් වන මේ දෙයක් වෙත ප්‍රවේශවීම සඳහා සහ ඒවා පරීක්ෂා කිරීම සඳහා යම් පොලිස් නිලධරයකුට හෝ රාජ්‍ය නිලධරයකුට අවසර දෙනු ලැබිය හැකි ය; හෝ

(ආ) කොමිෂන් සභාවේ යම් නිලධරයකු විසින් හෝ යම් විමර්ශන නිලධරයකු විසින් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද යම් පරීක්ෂණයක් අතරතුර දී, යම් තැනැත්තකු සම්බන්ධයෙන් සිය කාර්ය ඉටු කිරීමේ දී හෝ සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී අත්කර ගන්නා ලද, රඳවා ගන්නා ලද හෝ හිමිකර ගන්නා ලද යම් පොතක, ලේඛනයක හෝ විද්‍යුත් වාර්තාවක හෝ වෙනත් කුමන හෝ ආකාරයෙන් වන යම් දෙයක පිටපතක් පොලිස් නිලධරයකුට හෝ යම් රාජ්‍ය නිලධරයකුට ලබා දෙනු හැකි ය.

(2) කොමිෂන් සභාව විසින්, අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී-

(අ) යම් දේශීය හෝ විදේශීය අධීක්ෂණ අධිකාරයකින් යම් තොරතුරක් හෝ ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් ලබා ගැනීමට; සහ

(ආ) යම් දේශීය හෝ විදේශීය අධීක්ෂණ අධිකාරයක් සමඟ සහයෝගීතාවක් ඇති කර ගැනීමට,

යම් දේශීය හෝ විදේශීය අධීක්ෂණ අධිකාරයක් සමඟ සහයෝගීතාවක් ඇති කර ගැනීමට නියාමන සැලසුම්වලට ඇතුළත් විය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, විදේශීය අධීක්ෂණ අධිකාරියක් විසින් ක්‍රියාත්මක කරන හෝ පරිපාලනය කරන යම් නීතිමය හෝ නියාමන නියමයක් පිළිබඳව චෝදනා ලත් කඩකිරීමක් විමර්ශනය කිරීමට සහාය ලබා දීම සඳහා විදේශීය අධීක්ෂණ අධිකාරියකින් ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් පසුව, චෝදනාලත් කඩකිරීම සම්බන්ධයෙන් විමර්ශන සිදු කරගෙන යාම මගින් විදේශීය අධීක්ෂණ අධිකාරය වෙත සහාය ලබාදීම හෝ කොමිෂන් සභාව විසින් කාර්යයන් සඳහා සුදුසු යැයි අදහස් කරනු ලබන පරිදි විදේශීය අධීක්ෂණ අධිකාරිය වෙත එවැනි සහායක් ලබා දීම සිදු කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ සහාය ලබා දීම මහජන සුභසිද්ධිය සඳහා හේතුවේ ද යන්න තීරණය කිරීමේ දී-

(අ) විදේශීය අධීක්ෂණ අධිකාරිය වෙත සහාය ලබා දීමේ දී දරන ලද යම් පිරිවැය සහ වියදම් විදේශීය අධීක්ෂණ අධිකාරිය විසින් කොමිෂන් සභාව වෙත ගෙවීම සිදු කරනු ලබයි ද යන්න; සහ

(ආ) කොමිෂන් සභාව විසින් සහාය ලබා ගැනීම සඳහා සිදුකරනු ලබන ඒ හා සමාන ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් අන්‍යෝන්‍ය සහායක් ලබා දීමට විදේශීය අධීක්ෂණ අධිකාරියට හැකියාව සහ කැමැත්ත තිබේ ද යන්න,

පිළිබඳ කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගත යුතු ය.

(5) මේ වගන්තියේ -

"දේශීය අධීක්ෂණ අධිකාරිය" යන්නෙන්,1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පත්කරනු ලැබූ සමාගම් රෙජිස්ට්‍රාර්, පොලිසිය සහ වෙනත් යම් නියාමන අධිකාරියක් අදහස් වේ;

"විදේශීය අධීක්ෂණ අධිකාරිය" යන්නෙන් මේ පනත යටතේ කොමිෂන් සභාවේ කර්තව්‍යයන් ඉටු කරනු ලබන යම් විදේශීය අධීක්ෂණ අධිකාරියක් හෝ මහජන සුභසිද්ධිය උදෙසා යම් සැලසුමකට එළඹීම හෝ යම් සහායක් ලබා ගැනීම යෝග්‍ය සහ අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන්නා වූ නියාමන කර්තව්‍යයන් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු හෝ ජාත්‍යන්තර සංවිධානයක් අදහස් වේ; සහ

"රාජ්‍ය නිලධරයා" යන්නට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව මගින් එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

ආයතනවල අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීම.

**168.** (1) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝග, රීති හෝ විධානයන් හෝ වෙළෙඳපොළ ආයතනයක යම් රීතියක් උල්ලංඝනය කිරීමක් හෝ සිදු වීමට හැකියාවක් ඇති උල්ලංඝනය කිරීම්වලට අදාළව කොමිෂන් සභාව වෙත තොරතුරු සපයනු ලබන සේවයේ යෙදෙන යම් තැනැත්තකු සේවායෝජකයා විසින් සේවයෙන් නිදහස් කිරීම, සේවය අවසන් කිරීම, තනතුරින් පහතට දැමීම හෝ හිරිහැර සිදු කිරීම සිදු නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාව විසින් බලය පවරන ලද යම් නිලධරයකු වෙත තොරතුරු සපයනු ලබන හෝ තොරතුරු සපයා ඇති යම් තැනැත්තකුට එරෙහිව ප්‍රතිහිංසා කරනු ලබන යම් සේවායෝජකයකු, එම සේවායෝජකයාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීමෙන් පසු පරිපාලන දණ්ඩනයකට යටත් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය කාර්යයන් සඳහා, "සේවයේ යෙදෙන යම් තැනැත්තකු" යන්නට අධ්‍යක්ෂවරයකු, හවුල්කරුවකු, ප්‍රධාන විධායක නිලධරයකු, ප්‍රධාන මූල්‍ය නිලධරයකු, සමාගමේ ලේකම්වරයකු, අභ්‍යන්තර විගණකවරයකු හෝ වෙනත් යම් සේවකයකු ඇතුළත් වන්නේ ය.

(4) සාර්ථක බලාත්මක කරවීමේ ක්‍රියාවක් සඳහා මූලික වන ආයතනවල අකටයුතුකම් පිළිබඳ තොරතුරු සපයනු ලබන යම් අකටයුතුකම් දැනුම්දෙන්නකු වෙත කොමිෂන් සභාව විසින් ඊට අදාළව නිකුත් කරන ලද නිර්ණායක මත පදනම්ව යම් ත්‍යාගයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයා වෙත තොරතුරු සපයා දීම.

**169.** අමාත්‍යවරයා විසින්, කලින් කළ, ඔහු විසින් නියම කරනු ලැබිය හැකි පරිදි කොමිෂන් සභාව විසින් රහසිගත ලෙස සලකනු ලබන තොරතුරු හැර කොමිෂන් සභාවේ කටයුතුවලට සම්බන්ධ වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු ඔහු වෙත සපයන ලෙස කොමිෂන් සභාව වෙත ලිඛිතව ඉල්ලීමක් සිදු කරනු ලැබිය හැකි අතර කොමිෂන් සභාව විසින් එම තොරතුරු සපයනු ලැබිය යුතු ය.

පනත යටතේ සිදු කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

**170.** (1) මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද හෝ කිරීම පැහැර හරින ලද යම් ක්‍රියාවක් වෙනුවෙන් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට එරෙහිව හෝ කොමිෂන් සභාවේ යම් නිලධරයකුට එරෙහිව කිසිදු සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව ගෙන එන ලද ඕනෑම සිවිල් හෝ අපරාධ නඩු පැවරීමක දී කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර යම් සිවිල් හෝ අපරාධ නඩු

පැවරීමක දී කොමිෂන් සභාව වෙත ගෙවනු ලබන හෝ අයකර ගනු ලබන වියදම් කොමිෂන් සභාවේ එම අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය සඳහන් කරනු ලබන පරිදි යම් තැනැත්තකු විසින්, පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානයක් මත සිදු කරන ලද හෝ සිදු කිරීමට අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට එරෙහිව ගෙන එන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු පැවරීමක දී ඔහු විසින් දරනු ලබන වියදම්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය විසින් අනුමත කරනු ලබයි නම් සහ එම සිවිල් හෝ අපරාධ නඩු පැවරීමේ දී එම වියදම් ඔහු විසින් අයකර ගනු ලැබ ඇත්නම් හැර එම වියදම් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

2 වන පරිච්ඡේදය

**බලාත්මක කිරීමේ යාන්ත්‍රණය සම්බන්ධයෙන් වූ විධිවිධාන**

**171.** (1) (අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනතේ විධිවිධාන යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග හෝ රීති හෝ විධාන යටතේ නියම කරන ලද යම් නියමයක් උල්ලංඝනය කරනු ලබන; වැරදි.

(ආ) මේ පනතේ හෝ මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යම් රීතියක් හෝ විධානයක් යටතේ නියම කරන ලද යම් නියමයක කාර්යයන් සඳහා, එම තැනැත්තාගේ දැනුම අනුව අසත්‍ය, වැරදි හෝ නොමග යවන කරුණු ඇතුළත් යම් තොරතුරක් හෝ යම් වාර්තාවක්, ලේඛනයක් හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවක් හෝ ප්‍රකාශයක් සපයනු ලබන හෝ ඉදිරිපත් කරනු ලබන;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ ඔහුගේ කාර්යයන් ඉටු කිරීමේ දී කොමිෂන් සභාව සමග ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු හෝ කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ කොමිෂන් සභාවේ යම් නිලධරයකු හට හිතාමතාම බාධා පමුණුවනු ලබන;

(ඇ) වෙළෙඳපොළ ආයතනයේ, වෙළෙඳපොළ අතරමැදියකුගේ හෝ ලැයිස්තුගත පොදු සමාගමක හෝ ඊට සම්බන්ධ යම් සම්බන්ධිත සමාගමක ව්‍යාපාර සම්බන්ධයෙන් කවර හෝ ආකාරයකින් යම් තොරතුරක හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවල තොරතුරු වංචනික ලෙස වෙනස් කරන හෝ යම් පොතක හෝ ඉලෙක්ට්‍රොනික වාර්තාවල නොමඟ යවන සුලු හෝ අසත්‍ය තොරතුරු ගබඩා කරනු ලබන; හෝ

(ඉ) මේ පනත යටතේ වන බලතල ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම වළක්වන, ප්‍රමාද කරවන හෝ බාධා පමුණුවන හෝ යම් තැනැත්තකුට වංචා කරන අදහස ඇතිව පොත්, ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා හෝ මේ පනත, නියෝග හෝ රීති හෝ ඒ යටතේ සාදන ලද විධාන යටතේ තබා ගැනීමට හෝ පවත්වාගෙන යාමට නියම කරනු ලැබ ඇති ගිණුම් විනාශ කරන, සඟවා තබන, විකෘති කරන, වෙනස් කරන, යවන හෝ යැවීමට උත්සහ කරන හෝ ඒවායේ පරිශ්‍රයන්ගෙන් ඉවත් කිරීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිට කිරීමට වෙනත් යම් තැනැත්තකු සමඟ කුමන්ත්‍රන කරනු ලබන,

යම් තැනැත්තකු මේ වගන්තියට පසු උපවගන්තිවල විධිවිධාන සලස්වා ඇති පරිදි වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනත යටතේ කිසිදු දණ්ඩනයක් ප්‍රකාශිතව සලස්වා නොමැති මේ පනත යටතේ වන වරදකට වරදකරු වී ඇති යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකට වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයකට නොඅඩු රුපියල් මිලියන සියය නොඉක්මවන දඩයකට හෝ වසර දහයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

(3) සංස්ථාවක් මේ පනත යටතේ යම් වරදකට වරදකරු වූ විට දී, එම වරද සිදුවන අවස්ථාවේ දී යම් තැනැත්තකු, එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු හෝ වෙනත් ඒ හා සමාන සංස්ථාවේ නිලධරයකු වන විට,එම වරද ඔහුගේ දැනීමෙන් හෝ අනුබල දීමකින් තොරව සිදුවන ලද්දක් බවට හෝ ඔහුගේ කර්තව්‍යයන් හා එම සිද්ධියේ සියලු කරුණුවල ස්වභාවය පිළිබඳ සැලකිල්ලට ගනිමින් ඔහු විසින් ක්‍රියාත්මක විය යුතු බැවින් එම වරද සිදු වීම වැළැක්වීමට ඔහු විසින් ගත යුතු සියලු කාර්ය සාධනයන් ක්‍රියාත්මක කරන ලද බවට ඔහු විසින් ඔප්පු කරන්නේ නම් මිස ඔහු එම වරදට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් සංස්ථාවක සේවකයකු වන හෝ ඒ වෙනුවෙන් වැඩ බලන යම් තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධානයන් උල්ලංඝනය කරනු ලබන අවස්ථාවක දී, එම සංස්ථාව හෝ සේවකයා විසින් වැඩ බලනු ලබන්නේ කා සඳහා ද එම සංස්ථාව එම වරද එම සංස්ථාවේ දැනීමෙන් හෝ අනුබල දීමකින් තොරව සිදුවන ලද්දක් බවට හෝ එම සිද්ධියේ කරුණු සැලකිල්ලට ගනිමින් එම සංස්ථාව විසින් ක්‍රියාත්මක විය යුතු බැවින් එම වරද සිදුවීම වැළැක්වීමට එය විසින් ගතයුතු සියලු කාර්යය සාධනයන් ක්‍රියාත්මක කරන ලද බවට ඔප්පු කරන්නේ නම් මිස එම විධිවිධාන උල්ලංඝනය කරන ලද බවට සලකනු ලැබිය යුතු ය.

(5) යම් තැනැත්තකු විසින් මේ පනතේ යම් විධිවිධානයක්, නියෝග, රීති හෝ විධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මේ පනත යටතේ පවරන ලද යම් නීතිමය හෝ පරිපාලනමය නීති කෘත්‍යයන් හි දී එම උල්ලංඝනය සම්බන්ධයෙන් ගොනු කරන ලද වෙනත් යම් නීතිමය හෝ පරිපාලනමය නීති කෘත්‍යයන් හෝ ඒ යටතේ එම තැනැත්තාට එරෙහිව පනවනු ලැබූ යම් දණ්ඩන සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් දැක්විය යුතු ය.

**අපරාධ නඩු පැවරීම සඳහා අදාළ විය හැකි පනත්.**

**172.** (1) මේ පනත යටතේ සියලු අපරාධ නඩු පැවරීමකට අදාළව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත අදාළ විය යුතු ය.

(2) ඉලෙක්ට්‍රොනික වාර්තාවල හෝ අනෙකුත් ලේඛනවල සාක්ෂි ආවේශ්‍ය කිරීම සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

**වැරදි සමථයකට පත් කිරීම.**

**173.** මේ පනතේ V වන කොටසේ ලැයිස්තුගත කර ඇති වැරදි හැර, කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ සිදු කරන ලද වරදෙහි ස්වභාවය සැලකිල්ලට ගනිමින්, එවැනි වරදකට නියම කරනු ලැබිය හැකි උපරිම දඩයෙන් භාගයක් නොඉක්මවන මුදල් ප්‍රමාණයකට එම වරද සමථයකට පත් කරනු ලැබිය හැකි වන අතර මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයකට පත් කිරීමේ දී කොමිෂන් සභාව වෙත එසේ ලැබෙන මුදල් කොමිෂන් සභාවේ අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු ය.

**පරිපාලනමය දණ්ඩන නියම කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලය.**

**174.** (1) මේ පනතේ V වන කොටසේ ලැයිස්තුගත කර ඇති වැරදි සඳහා හැර මේ පනතේ විධිවිධාන, මේ පනත යටතේ නිකුත් කරන ලද නියෝග, රීති හෝ විධාන සමග අනුකූල බව සහතික කරන අදහස ඇතිව පාර්ශ්වයන් අතර වන යම් වගකීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් එහි අරමුණු ක්‍රියාවේ යෙදවීමේ දී යම් තැනැත්තකු සමග බලාත්මක කළ හැකි සමථකරණ ගිවිසුම් එකඟතාවයකට එළඹිය හැකි ය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් කරනු ලබන තැනැත්තා විසින් කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව ඕනෑම වේලාවක දී සමථකරණ ගිවිසුමේ කොන්දේසි ඉවත් කර ගනු ලැබීම හෝ වෙනස් කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් (1) වන උප වගන්තියේ සඳහන් කරනු ලබන තැනැත්තා විසින් සමථකරණ ගිවිසුමේ යම් කොන්දේසියක් කඩකර ඇති බවට සලකනු ලබයි නම්, කොමිෂන් සභාව විසින් (4) වන උපවගන්තිය යටතේ නියෝගයක් සඳහා අධිකරණ වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් වගකිව යුතු තැනැත්තා විසින් සමථකරණ ගිවිසුමේ යම් කොන්දේසියක් කඩකර ඇති බවට අධිකරණය විසින් සෑහීමකට පත් වන්නේ නම් අධිකරණය විසින් -

(අ) සමථකරණ ගිවිසුමේ එම කොන්දේසියට අනුකූල වීම සඳහා එකී තැනැත්තා වෙත විධානය කරනු ලබන යම් නියෝගයක්;

(ආ) එම තැනැත්තා විසින් ඍජුව හෝ වක්‍රව ලබා ගන්නා ලද සහ කොන්දේසි කඩ කිරීමට සාධාරණ ලෙස ආරෝපණය කරනු ලැබිය හැකි යම් මූල්‍ය ප්‍රතිලාභයක් දක්වා වූ මුදල් ප්‍රමාණයක් යම් තැනැත්තකුට හෝ කොමිෂන් සභාව වෙත ගෙවීමට එම තැනැත්තා වෙත විධානය කරනු ලබන යම් නියෝගයක්;

(ඇ) යම් තැනැත්තකු විසින් එම කඩ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පාඩු හෝ හානි සිදු වූ වෙනත් යම් තැනැත්තකු හට වන්දි ලබා දීම අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලබයි නම් ඒ සඳහා විධානය කරනු ලබන යම් නියෝගයක්; හෝ

(ඈ) අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් යම් නියෝගයක්,

නිකුත් කරනු ලැබිය හැකි ය.

(5) V වන කොටසේ ලැයිස්තුගත කර ඇති වැරදි සම්බන්ධයෙන් හැර යම් තැනැත්තකු මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග උල්ලංඝනය කරනු ලබයි නම් හෝ මේ පනත යටතේ ප්‍රතිපාදනය කරන ලද බලපත්‍රයක හෝ ලේඛනයක යම් කොන්දේසියකට හෝ තහනමකට අනුකූල වීමට අපොහොසත් වන්නේ නම් හෝ යම් වෙළෙඳපොළ ආයතනයක් සම්බන්ධයෙන් වූ රීතිවල යම් විධිවිධානයක්, කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් ලිඛිත නිවේදනයක්, නිර්ණායක නිකුත් කරන ලද යම් විධානයක් හෝ පනවන ලද යම් කොන්දේසියක් හෝ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් රීතියක් සමග අනුකූල වීමට අපොහොසත් වන්නේ නම්, කොමිෂන් සභාව විසින් පරිපාලනමය දණ්ඩන නියම කරනු ලැබිය හැකි හෝ පහත දැක්වෙන පරිපාලනමය ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකි ය:-

(අ) එම විධිවිධාන, නියෝග, රීති, ලිඛිත නිවේදනය, කොන්දේසි, විධාන හෝ නිර්ණායකවලට අනුකූල වීමට, අනුගමනය කිරීමට, බලාත්මක කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට කඩකරනු ලබන තැනැත්තාට නියෝග කිරීම;

(ආ) කඩකරන ලද තැනැත්තාට එම කඩ කිරීමේ බරපතළකම හෝ බැරෑරුම්කමට අනුපාතික වන පරිදි එහෙත් කිසිදු අවස්ථාවක දී රුපියල් මිලියන පනහ නොඉක්මවන දණ්ඩනයක් නියම කිරීම;

(ඇ) කඩකරන ලද තැනැත්තාට තදින් දෝෂාරෝපණය කිරීම;

(ඈ) කඩකරන ලද තැනැත්තාට, එම කඩ කිරීම මගින් අතෘප්තියට පත් වෙනත් යම් තැනැත්තකුට වන්දි ගෙවීම ඇතුළුව කොමිෂන් සභාව විසින් කඩ කිරීමට පිළියම් කිරීම හෝ කඩ කිරීමෙන් ඇතිවන බලපෑම අවම කිරීම සඳහා පියවර ගැනීම සඳහා නියම කිරීම;

(ඉ) ලැයිස්තුගත පොදු සමාගමක අනුග්‍රාහකයෙක් හෝ අධ්‍යක්ෂවරයෙක් වන අවස්ථාවක දී, ඉහත (අ) සිට (ඈ) දක්වා වූ ඡේදයන් යටතේ ගත හැකි ක්‍රියාමාර්ගවලට අමතරව කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකි ය-

(i) අනුග්‍රාහකයා හෝ අධ්‍යක්ෂවරයා හෝ අනුග්‍රාහකයා හෝ අධ්‍යක්ෂවරයා සමඟ සම්බන්ධ වුනු යම් තැනැත්තන් විසින්, කොමිෂන් සභාව විසින් යෝග්‍ය යැයි සිතනු ලබන ලැයිස්තුගත පොදු සමාගමක සුරැකුම්පත්වල හෝ වෙනත් යම් සුරැකුම්පත්වල වෙළෙඳාම හෝ ගනුදෙනු කිරීම සඳහා තාවකාලික තහනමක් නියම කිරීම හෝ තහනම් කිරීම; හෝ

(ii) කොමිෂන් සභාවේ මතය අනුව, අධ්‍යක්ෂවරයා විසින් එම ධුරයේ රැඳී සිටීම මහජන සුභසිද්ධියට අගතිදායී ලෙස වන බලපෑම පිළිබඳ ප්‍රසිද්ධ ප්‍රකාශනයක් නිකුත් කිරීම.

(6) කඩකරන ලද තැනැත්තා වෙත කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් තොරව කොමිෂන් සභාව විසින් (5) වන උපවගන්තිය යටතේ කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය.

(7) (5) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ කාර්යයන් සඳහා කඩකරන ලද තැනැත්තා විසින් ප්‍රතිස්ථාපනයක් සිදු කළ යුතු ද නැද්ද යන්න තීරණය කිරීමේ දී, කොමිෂන් සභාව විසින් -

(අ) කඩකරන ලද තැනැත්තා වෙත උපචිත වී ඇති ලාභ; හෝ

(ආ) කඩකිරීමේ ප්‍රතිඵලයක් එක් තැනැත්තකුට හෝ ඊට වැඩි තැනැත්තන් ප්‍රමාණයකට පාඩුවක් සිදු වී හෝ අන්‍යාකාරයකින් පීඩාකාරී බලපෑමකට ලක් වී ඇත් ද යන්න,

පිළිබඳව සලකා බැලිය යුතු ය.

(8) වෙළෙඳපොළ ආයතනයක රීති යටතේ යම් තැනැත්තකුට එරෙහිව කොමිෂන් සභාව විසින් (5) වන උපවගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගනු ලබන අවස්ථාවක දී කොමිෂන් සභාව විසින්, ගනු ලැබූ ක්‍රියාමාර්ගය පිළිබඳව වෙළෙඳපොළ ආයතනය වෙත දන්වා සිටිය යුතු ය.

(9) මේ වගන්තියේ කිසිවක් විසින් කොමිෂන් සභාව -

(අ) වෙළෙඳපොළ ආයතනයෙහි රීති කඩ කිරීම සඳහා දඩයක් නියම කිරීම ඇතුළුව, එහි වෙළෙඳපොළ සහභාගීවන්නන්ට, නිෂ්කාශන සාමාජිකයන්ට හෝ තැන්පතුධාරී සහභාගීවන්නන්ට, ලැයිස්තුගත පොදු සමාගමකට,ලැයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂවරයකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට වෙළඳ ආයතනයකට නියෝග කිරීමෙන්; හෝ

(ආ) කඩකරන ලද තැනැත්තාට එරෙහිව මේ පනත යටතේ බලය ලබා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන්,

වැළැක්විය යුතු නොවන්නේ ය.

(10) (5) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන දඩයක් ගෙවීමට යම් තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක දී, එම තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර දඩය වශයෙන් ගෙවිය යුතු මුදල, කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත එම අධිකරණය විසින් නියම කරනු ලබන දඩයක් ලෙස එවැනි ආකාරයකින් අයකර ගනු ලැබිය හැකි ය. එසේ වුවද, එම මුදල් ප්‍රමාණය එම අධිකරණය විසින් එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණය ඉක්මවිය හැකි ය.

(11) වෙනත් යම් ප්‍රතිකර්මයකට අගතියක් නොවන අයුරින්, (5) වන උපවගන්තිය යටතේ වන විධානයක් මගින් කඩකරන ලද තැනැත්තාට මූල්‍ය ගෙවීමක ආකාරයෙන් ප්‍රතිස්ථාපනයක් සිදු කිරීමට නියම කරනු ලැබූ සහ එම කඩකරන ලද තැනැත්තා විසින් එම ප්‍රතිස්ථාපනය කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් ඒ වෙනුවෙන් නඩු පවරනු ලැබිය හැකි අතර, එම කඩ කිරීමෙන් අතෘප්තියට පත් තැනැත්තන්ට ගෙවිය යුතු සිවිල් ණයක් ලෙස එම ප්‍රතිෂ්ඨාපනය අයකරගනු ලැබිය හැකි ය.

(12) (5) වන උපවගන්තිය හෝ (11) වන උපවගන්තිය යටතේ ලබාගන්නා ලද යම් මුදල් ප්‍රමාණයක්, අතෘප්තියටපත් තැනැත්තන් නිශ්චිතව දැන ගැනීමේ හා එම තැනැත්තන් වෙත දැනුම් දීමේ අපහසුතාවය හේතුවෙන් බෙදා දී නොමැති නම්:-

(අ) VI වන කොටස යටතේ පවත්වාගෙන යනු ලබන කොමිෂන් සභාවේ අරමුදල වෙත ගෙවනු ලැබිය යුතු ය; හෝ

(ආ) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමනය කිරීමේ දී දරන ලද වියදම් පියවීම සඳහා කොමිෂන් සභාව විසින් රඳවා තබා ගත යුතු ය.

ආයෝජකයින්ගේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාව සතු බලය.

**175.** (1) මේ පනතේ යම් විධිවිධානයක්, ඒ යටතේ නිකුත් කරන ලද නියෝග හෝ රීති හෝ විධාන උල්ලංඝනය කරනු ලබන තම ව්‍යාපාරයේ දී සේවාදායකයන්ගේ මුදල් හෝ වත්කම් හසුරුවන හෝ භාරයේ තබා ගන්නා යම් වෙළෙඳපොළ අතරමැදියකු විසින් තවදුරටත් සුදුසු හා යෝග්‍ය නොවන සහ ආයෝජකයන්ගේ, වෙළෙඳපොළ අතරමැදියන්ගේ හෝ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයේ ඒකක භාරකරුවන්ගේ, සේවාදායකයන්ගේ අයිතීන් අහිතකර තත්ත්වයකට පත් කරනු ලැබිය හැකි හෝ අහිතකර තත්ත්වයකට පත්ව ඇති බවට කොමිෂන් සභාව විසින් අදහස් කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් පහත මෙහි මින්මතු දැක්වෙන ක්‍රියාමාර්ගවලින් එකක් හෝ වැඩි ප්‍රමාණයක් සැලකිල්ලට ගනු ලැබිය හැකි ය:-

(i) කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි, කොමිෂන් සභාව සුදුසු යැයි සිතන ආකාරයකට යම් ආයෝජකයකුගේ හෝ එහි සේවාදායකයන්ගේ මුදල් සහ

දේපළ සමග ගනුදෙනු නොකිරීමට හෝ එකී ආයෝජකයන්ගේ මුදල් සහ දේපළ හෝ එකී මුදල් සහ දේපළ සම්බන්ධ යම් ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා වෙනත් යම් තැනැත්තකු වෙත නොපැවරීමට වෙළෙඳපොළ අතරමැදියා වෙත නියෝග කිරීම;

(ii) කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි, මුදල් හෝ දේපළ සම්බන්ධ ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා වෙනත් යම් තැනැත්තකු වෙත පැවරීම සඳහා භාරකරුවකු වෙත විධානය කිරීම;

(iii) ගනුදෙනු සඳහා පිවිසීම, තැනැත්තන්ගෙන් ව්‍යාපාර කටයුතු ඉල්ලා සිටීම තහනම් කිරීම හෝ කොමිෂන් සභාව විසින් නිශ්චිත ව දක්වනු ලැබිය හැකි පරිදි, ව්‍යාපාරය පවත්වාගෙන යාමට වෙළෙඳපොළ අතරමැදියාට හෝ භාරකරුට නියම කිරීම; හෝ

(iv) කොමිෂන් සභාව විසින් තීරණය කරන ආකාරයට ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථානයක ඇති දේපළ පවත්වාගෙන යාමට වෙළෙඳපොළ අතරමැදියාට හෝ භාරකරුට නියම කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර එම වෙළෙඳපොළ අතරමැදියාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදීමෙන් තොරව, මේ වගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් කොමිෂන් සභාව විසින් නොගත යුතු ය.

(3) මේ පනත යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගැනීම ප්‍රමාදවීම, ආයෝජකයන්ගේ සුභසිද්ධියට, වෙළෙඳපොළ අතරමැදියාගේ සේවාදායකයන්ගේ සුභසිද්ධියට හෝ මහජන සුභසිද්ධියට අගතිදායක වියහැකි බවට කොමිෂන් සභාව සලකන්නේ නම් (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

යම් නියෝග සඳහා අධිකරණයට අයදුම් කිරීමට කොමිෂන් සභාව සතු බලය.

**176.** (1) කොමිෂන් සභාව විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට දී, යම් තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධාන හෝ නියෝග හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක් උල්ලංඝනය කර ඇති හෝ උල්ලංඝනය කිරීමට සාධාරණ ඉඩක් ඇති බවට අධිකරණයට පෙනීයන්නේ නම්, එවැනි අවස්ථාවක දී හෝ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් විධානයන්ට අනුකූලවීමට යම් තැනැත්තකු අපොහොසත්වූ විටදී හෝ අපොහොසත්වීමක දී, අධිකරණය විසින් -

(අ) උල්ලංඝනය වළක්වාලමින් හෝ උල්ලංඝනය අවසන් කරන ලෙසට නියෝග කරමින් නියෝගයක් කිරීම;

(ආ) නියෝගයේ සඳහන් යම් සුරැකුම්පත් පන්තියක් සම්බන්ධයෙන් ගනුදෙනු කිරීම හෝ වෙළෙඳාම් කිරීම වළක්වාලමින් හෝ වැළැක්වීමට නියෝග කරමින්, නියෝගයක් කිරීම;

(ඇ) සුරැකුම්පත් ගනුදෙනුවක් බල රහිත හැකි බව ප්‍රකාශ කරමින් නියෝගයක් කිරීම;

(ඈ) යම් තැනැත්තකු විසින් වත්කම අත්පත් කරගැනීම හෝ බැහැර කිරීම කරනු ලැබිය හැකි බවට හෝ වෙනත් ආකාරයකින් ඒ සමඟ ගනුදෙනු කරනු ලැබිය හැකි බවට සාධාරණ ශක්‍යතාවක් ඇති බවට අධිකරණය සෑහීමකට පත්වන විටදී, වත්කමක් අත්පත් කරගැනීම, බැහැර කිරීම හෝ වෙනත් ආකාරයකින් ගනුදෙනු කිරීම සිදු කිරීමෙන් එම තැනැත්තා වළක්වමින් නියෝගයක් කිරීම;

(ඉ) නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් සුරැකුම්පත් බැහැර කිරීමට නියෝගයක් කිරීම;

(ඊ) නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් සුරැකුම්පතක් හා සම්බන්ධ ඡන්දය ලබාදීම හෝ අනෙකුත් අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම වළක්වමින් නියෝගයක් කිරීම;

(උ) නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් සුරැකුම්පත් සඳහා දායක වීමට හෝ එම සුරැකුම්පත් මිල දී ගැනීමට අර්පණය කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ දායක වීමට හෝ මිල දී ගැනීමට ආරාධනයක් නිකුත් කිරීම හෝ කොටස් වශයෙන් බෙදා වෙන් කර දීම සිදු කිරීමෙන් තැනැත්තකු වළක්වමින් නියෝගයක් කිරීම;

(ඌ) වෙළෙඳපොළ අතරමැදියකුගේ දේපළ මත හෝ යම් තැනැත්තකු විසින් භාරයක් ලෙස හෝ වෙනත් ලෙසකින් වෙනත් තැනැත්තකු වෙනුවෙන් දරනු ලබන දේපළ මත භාර ගැනුම්කරුවකු හෝ ඇවරකරුවකු පත්කරමින් නියෝගයක් කිරීම;

(එ) නියෝගයේ නිශ්චිතව සඳහන් සුරැකුම්පත් හෝ අනෙකුත් දේපළ අධිකරණය විසින් පත් කරන ලද භාරකරුවකු මත පවරමින් නියෝගයක් කිරීම;

(ඒ) යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ සාදන ලද විධාන යටතේ එම තැනැත්තා විසින් කළ යුතු යම් ක්‍රියාවක් කිරීමට හෝ යම් නියෝගයකට අනුකූලවීමට ප්‍රතික්ෂේප කරන ලද හෝ අපොහොසත් වූ හෝ ප්‍රතික්ෂේප කරමින් සිටින හෝ අපොහොසත් වෙමින් සිටින හෝ ප්‍රතික්ෂේප කිරීමට යෝජනා කර සිටින හෝ අසමත්වීමට යෝජනා කර සිටින අවස්ථාවකදී, එකී ක්‍රියාව කිරීමට හෝ එකී නියෝගයට අනුකූලවීමට එකී තැනැත්තාට නියම කරමින්, නියෝගයක් කිරීම;

(ඔ) උල්ලංඝනය සඳහා චේතනාන්විතව සම්බන්ධවී ඇති බව පෙනීයන යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු වෙත, එකී උල්ලංඝනයට ප්‍රතිකර්ම වශයෙන් හෝ එකී උල්ලංඝනය කිරීමෙන් අතෘප්තියට පත් වෙනත් යම් තැනැත්තකුට වන්දි ගෙවීම ඇතුළුව එහි බලපෑම අවම කිරීම සඳහා අධිකරණය නියම කරන ආකාරයට එකී පියවර ගැනීමට නියම කරමින්, නියෝග කිරීම;

(ඕ) මේ වගන්තිය යටතේ වන යම් නියෝගයකට අනුකූල වීම ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා යම් තැනැත්තකු විසින් නිශ්චිත ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළැක්වීමට නියම කරමින් නියෝග කිරීම;

(ක) කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විධානයකට අවනත වීමට තැනැත්තකුට නියම කරමින් නියෝග කිරීම;

(ග) මේ පනතේ යම් විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වෙත සංචාරක බාධක පනවමින් නියෝග කිරීම; හෝ

(ච) මේ උපවගන්තියේ විධිවිධාන යටතේ නියෝගයක් කිරීමේ දී අවස්ථාවෝචිතව යෝග්‍ය යැයි පෙනී යන යම් අනුයාත නියෝග කිරීම,

සිදු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් සඳහා අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ විට, අධිකරණය විසින් ඉල්ලීම පිළිබඳ තීරණයක් ලබා දෙන තෙක්, ඒකපාර්ශ්වීය අතුරු නියෝගයක් ලබාදෙනු ලැබිය හැකි ය.

(3) අධිකරණය විසින් (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් කිරීමට පෙර අධිකරණයට සුදුසු යැයි හැඟෙන ආකාරයට ඉල්ලුම් කිරීමේ නිවේදනය එකී තැනැත්තන්ට ලබා දීමට නියෝග කිරීම හෝ අධිකරණයට සුදුසු යැයි හැඟෙන ආකාරයට ඉල්ලුම් කිරීමේ නිවේදනය එකී ආකාරයට ප්‍රසිද්ධියට පත් කිරීමට නියෝග කිරීම හෝ ඒ දෙකම සිදු කිරීම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන නියෝගයක් සඳහා කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් නිසි ලෙස බලය පවරන ලද වෙනත් තැනැත්තකු විසින් කරන ලද ඉල්ලීමක දී, නියෝගය ප්‍රදානය කිරීමේ කොන්දේසියක් වශයෙන්, කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව වෙනුවෙන් හානි සඳහා වන යම් භාර ගැනීමක් නියම කරනු නොලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ වන නියෝගයකින් වෙළෙඳපොළ අතරමැදියකුගේ දේපළවල භාර ලැබුම්කරු වශයෙන් පත්කරන ලද තැනැත්තකු -

(අ) විසින් භාර ලැබුම්කරුවකු පත් කරන ලද යම් දේපළක් භාර ලැබුම්කරු වෙත ලබා දීමට හෝ සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි දේපළ සම්බන්ධ සියලු තොරතුරු භාර ලැබුම්කරු වෙත ලබා දීමට වෙළෙඳපොළ අතරමැදියා වෙත නියෝග කරනු ලැබිය හැකි ය;

(ආ) විසින් භාර ගැනුම්කරු ලෙස පත්කරන ලද යම් දේපළක් අත්පත්කර ගැනීම සහ එහි භුක්තිය ලබා ගැනීම කරනු ලැබිය හැකි ය;

(ඇ) විසින් අත්පත් කරගන්නා ලද හෝ භුක්තියට ගනු ලැබූ යම් දේපළක් පිළිබඳව දේපළ දරන්නා විසින් එම දේපළ සමඟ නීත්‍යානුකූලව ගනුදෙනු කරන ලද යම් ආකාරයකින් ඔහු විසින් ගනුදෙනු කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) වෙත අධිකරණය විසින් නියෝගයේ නිශ්චිතව දක්වා ඇති අකාරයට, දේපළ සම්බන්ධ එකී අනෙකුත් බලතල සතුවිය යුතු ය.

(6) මේ වගන්තියේ වෙළෙඳපොළ අතරමැදියකුට සම්බන්ධව ''දේපළ'' යන්නට මුදල්, සුරැකුම්පත් හෝ අනෙකුත් දේපළ සහ සුරැකුම්පත්වල අයිතිය පිළිබඳ ලේඛන හෝ වෙළෙඳපොළ අතරමැදියා විසින් වෙළෙඳපොළ අතරමැදියාගේ ව්‍යාපාරය අතරතුර හෝ ඊට සම්බන්ධ වෙනත් තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් භාරදුන් හෝ ලබාගත් වෙනත් දේපළ අදහස් වේ.

(7) මේ වගන්තිය යටතේ අධිකරණයේ නියෝගයකින් පත්කරනු ලබන භාරකරුවකු -

(අ) විසින් නියෝගයේ නිශ්චිතව සඳහන් යම් සුරැකුම්පතක් හෝ එකී අනෙකුත් දේපළ භාරකරුට භාරදීමට හෝ සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි සුරැකුම්පත් සම්බන්ධ සියලු තොරතුරු භාරකරුට ලබා දීමට යම් තැනැත්තකුට නියෝග කරනු ලැබිය හැකි ය;

(ආ) විසින් සුරැකුම්පත් හෝ එකී අනෙකුත් දේපළ අත්පත් කරගැනීම සහ භුක්තිය ලබාගැනීම කරනු ලැබිය හැකි ය;

(ඇ) විසින් සුදුසු යැයි හැඟෙන ආකාරයකට සුරැකුම්පත් හෝ එකී අනෙකුත් දේපළ සමඟ ගනුදෙනු කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) වෙත අධිකරණය විසින් නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි සුරැකුම්පත් හෝ එකී අනෙකුත් දේපළ සම්බන්ධයෙන් වන අනෙකුත් බලතල පැවතිය යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ සුරැකුම්පත් ගනුදෙනු කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් ලැබිය යුතු මුදල් අධිකරණයට ගෙවනු ලැබිය යුතු අතර, එකී ලැබිය යුතු මුළු මුදලටම හෝ ඉන් යම් කොටසකට අර්ථලාභීව හිමිකම් සහිතව ඉල්ලා සිටින යම් තැනැත්තකු, එකී ගෙවීම අධිකරණයට සිදුකර දින තිහක් ඇතුළත එම ගනුදෙනුවෙන් ලබා ගත් මුදලින් ඔහුට අයවිය යුතු මුදල් ගෙවීම සඳහා අධිකරණයට අයදුම් කරනු ලැබිය හැකි ය.

(9) අධිකරණය විසින් මේ වගන්තිය යටතේ කරන ලද නියෝගයක් අවලංගු කිරීම, වෙනස් කිරීම හෝ නිදහස් කිරීම හෝ අතෘප්තියට පත් පාර්ශ්වයේ ඉල්ලීමක් කොමිෂන් සභාව වෙත කරන ලද පූර්ව දැනුම්දීමක් සමඟ එකී නියෝගයන් අතෘප්තියටපත් පාර්ශ්වයේ ඉල්ලීමක් මත කරන ලද එකී නියෝගයක් ක්‍රියාත්මක වීම අත්හිටුවීම කරනු ලැබිය හැකි ය.

ආයෝජකයන් වෙනුවෙන් හානි පියවීම සඳහා කොමිෂන් සභාව සතු බලතල.

**177.** (1) කොමිෂන් සභාව විසින් එසේ කිරීම මහජන සුභසාධනය සඳහා සුදුසු යයි සලකන්නේ නම්, උල්ලංඝනය සම්බන්ධයෙන් අනෙකුත් තැනැත්තා වරදකරු කර ඇති හෝ නැති හෝ පැමිණිල්ලකදී උල්ලංඝනය ඔප්පු කර ඇති හෝ නැති අනෙකුත් තැනැත්තාට එරෙහිව සිවිල් නඩුකරයක් ගොනු කිරීමෙන් ඇතිවන පාඩුවේ හෝ හානියේ ප්‍රමාණය සුරැකුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් වන යම් විධිවිධානයක්, උල්ලංඝනය කර ඇති අනෙකුත් තැනැත්තකුගේ ක්‍රියාව හේතුවෙන් හෝ ක්‍රියාව මත විශ්වාසය තැබීමෙන්, පාඩු හෝ හානි විඳින එම තැනැත්තා වෙනුවෙන් අයකරගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන නඩුකරයක්, කාලය පිළිබඳ සීමා සම්බන්ධයෙන් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, උල්ලංඝනය පිළිබඳ කොමිෂන් සභාව දැනුවත් වූ දින සිට අවුරුදු හයක් ඇතුළත ගොනු කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් පියවා ගන්නා ලද යම් පාඩුවක් හෝ හානියක් අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර -

(අ) උල්ලංඝනය සම්බන්ධව විමර්ශනය සහ නඩු කෘත්‍ය සඳහා දැරූ සියලු වියදම් කොමිෂන් සභාව විසින් ප්‍රතිපූරණය කරගැනීමට; සහ

(ආ) මේ පනත යටතේ සුරැකුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් වන විධිවිධාන උල්ලංඝනය කර ඇති වෙනත් තැනැත්තකුගේ ක්‍රියාව හේතුවෙන් හෝ ඒ මත විශ්වාසය තැබීමෙන් පාඩු හෝ හානි විඳින තැනැත්තන්ට වන්දි ගෙවීමට,

අදාළ කර ගත යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සිවිල් නඩුකරයකින් නැවත අය කර ගන්නා ලද හෝ ලබාගන්නා ලද යම් මුදල් ප්‍රමාණයක්, (3) වන උපවගන්තියට අනුකූලව බෙදා හරිනු ලැබ නොමැති විට, කොමිෂන්

සභාව විසින් තීරණය කරනු ලබන පරිදි, කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ නියාමනය සඳහා වූ වියදම් ගෙවීම සඳහා රඳවා තබාගනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියට අනුව, සුරැකුම්පත් නිකුත් කිරීමට අදාළ විධිවිධාන උල්ලංඝනය කරන ලද වෙනත් තැනැත්තකුගේ ක්‍රියාව හේතුවෙන්, හෝ ඒ මත විශ්වාසය තැබීමෙන් පාඩුවක් හෝ හානියක් භුක්තිවිඳින යම් තැනැත්තකුට, අනෙකුත් තැනැත්තා උල්ලංඝනය සම්බන්ධ වරදට වරදකරු කර ඇති හෝ නොමැති හෝ පැමිණිල්ලක දී උල්ලංඝනය ඔප්පු කර ඇති හෝ නැති වුව ද, එම තැනැත්තාට එරෙහිව සිවිල් නඩු කටයුතු ආරම්භ කිරීමෙන් පාඩුවූ හෝ හානි වූ ප්‍රමාණය නැවත අය කරගනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තිය යටතේ ප්‍රදානය කර ඇති නඩු පැවරීමේ අයිතිය වෙනත් යම් නීතියක් යටතේ එකී තැනැත්තා සතු යම් අයිතියකට අතිරේකව විය යුතු ය.

තොරතුරු පළකිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතල.

**178.** කොමිෂන් සභාව විසින් මේ පනත, නියෝග, රීති හෝ විධාන යටතේ ගන්නා ලද යම් තීරණයක් හෝ කරන ලද යම් ක්‍රියාවක් හා සම්බන්ධ යම් තොරතුරු මහජන සුභසෙත හෝ ආයෝජකයන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය සහ ඒ සඳහා යෝග්‍ය බවට සලකනු ලබන විට දී යම් ආකෘතියෙන් හෝ ආකාරයෙන් යුතුව කොමිෂන් සභාව විසින් පළකරනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**179.** (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන්, අමාත්‍යවරයා විසින් -

(අ) වෙළෙඳපොළ ආයතනයකට බලපත්‍ර ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා සපුරාලිය යුතු නියම සහ කොන්දේසි;

(ආ) වෙළෙඳපොළ අතරමැදියකුට බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා අනුකූල විය යුතු නියම සහ කොන්දේසි;

(ඇ) ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා සෙස් අරමුදල භාවිතා කළ හැකි කාර්යය;

(ඈ) ශ්‍රී ලංකාවේ විදේශීය ආස්ථිත්‍යයක් ලැයිස්තුගත කිරීම හෝ තොරතුරු බෙදා ගැනීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව සහ එහි විදේශීය සම ආයතනය හෝ වෙන යම් සංවිධානයක් අතර ඇති යම් අවබෝධතා ගිවිසුම් බලාත්මක කිරීම; සහ

(ඉ) මේ පනතේ නියම කර ඇති සියලු කරුණු සම්බන්ධයෙන්,

නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර, එකී පළ කළ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් පරිදි පසු දිනක සිට බලාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසුව හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොවූ යම් නියෝගයක් ඒ යටතේ පෙර කරන ලද කිසිවකට අගති විරහිතව, එකී අනනුමතයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ දිනය පිළිබඳ දැන්වීමක් *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති.

**180.** (1) මේ පනතේ විධිවිධාන සම්පූර්ණයෙන් බලාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ බලතල, අරමුණු සහ කාර්යයන් පවත්වාගෙන යාම ඇතුළුව, කොමිෂන් සභාව විසින් පහත කරුණු ඇතුළත්ව නමුත් එම කරුණුවලට සීමා නොවී කලින් කලට අවශ්‍ය විය හැකි රීති සාදනු ලැබිය හැකි ය:-

(අ) විනිමය ස්ථානයක දී සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම සහ වෙළෙඳාම් කිරීම සහ ලැයිස්තුගත පොදු සමාගමක් විසින් අයිතීන් හෝ ප්‍රසාද වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අමතර සුරැකුම්පත් පසුව නිකුත් කිරීම;

(ආ) විනිමය ස්ථානයක දී ලැයිස්තුගත කිරීම සහ වෙළෙඳාම කිරීම සම්බන්ධයෙන් සහ එහි දී පැනනගින අනෙකුත් සම්බන්ධිත කරුණු සම්බන්ධයෙන් ලැයිස්තුගත විදේශ ආස්ථිත්වයක් නියාමනය කිරීම;

(ඇ) වෙළෙඳපොළ අතරමැදියන් විසින් සුරැකුම්පත් අත්පත් කරගන්නා ලද හෝ බැහැර කරන ලද තැනැත්තන් පිළිබඳ සහ විනිමය ස්ථානයක් විසින් සිදු කරනු ලබන සුරැකුම්පත් ගනුදෙනු පිළිබඳව හෙළිදරව් කිරීම්;

(ඇ) වෙළෙඳපොළ ආයතනයක, වෙළෙඳපොළ අතරමැදියකු විසින් පොත්, වාර්තා, ගිණුම් සහ විගණන ක්‍රමවත්ව පවත්වාගෙන යාම සහ එකී වෙළෙඳපොළ ආයතනය සහ වෙළෙඳපොළ අතරමැදියා විසින් තම සම්බන්ධතා පිළිබඳව කොමිෂන් සභාව වෙත අඛණ්ඩව වාර්තා කිරීම;

(ඉ) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ ප්‍රදානය කරන ලද ලියාපදිංචියක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය;

(ඊ) පොත්, වාර්තා, ගිණුම් වාර්ෂිකව විගණනය කිරීම සහ වෙළෙඳපොළ ආයතනය සහ වෙළෙඳපොළ අතරමැදියා විසින් සකස් කරනු ලබන මූල්‍ය වාර්තා පිළිබඳව;

(උ) පවරා ගැනීම හෝ ඒකාබද්ධ කිරීම ලැයිස්තුගත පොදු සමාගමක් අරමුණු කරගන්නා විටදී එකී පවරා ගැනීම හෝ ඒකාබද්ධ කිරීම නියාමනය කිරීම;

(ඌ) භාරකරු සහ සුරැකුම්පත් නිකුත් කරන්නකු සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රමයක කළමනාකරණ සමාගමක් විසින් පිළිපැදිය යුතු වන විනය නීති සංග්‍රහය සහ සාමූහික ආයෝජන යෝජනා ක්‍රම පිළිබඳ අනුමත සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව වන සංග්‍රහය;

(එ) මේ පනතින් රීති සෑදීම අවශ්‍ය වන්නාවූ කරුණු;

(ඒ) වෙළෙඳපොළ ආයතනයක් සහ වෙළෙඳපොළ අතරමැදියකු විසින් අනුගමනය කළ යුතු විචක්ෂණයෙන් කටයුතු කිරීමේ අවශ්‍යතා, සුදුසු හෝ නිසි උපමානවලට වාර්තා තැබීම සහ අනෙකුත් ප්‍රලේඛන ක්‍රමවේද;

(ඔ) සුරැකුම්පත් නිකුත් කරන්නෙකු ලැයිස්තුගත පොදු සමාගමක් හෝ ලැයිස්තුගත කිරීම සඳහා අයදුම්කර ඇති පොදු සමාගමක් හෝ ලැයිස්තුගත විදේශීය ආස්ථිත්වයක්

විසින් නිකුත් කිරීමට යෝජිත සංස්ථා ප්‍රකාශයේ ආකෘතිය සහ අන්තර්ගතය;

(ඕ) කොටස් තැරැව්කරුවකු හෝ ආන්තික සැපයුම්කරුවකු විසින් ආන්තික ගිණුමක සුරැකුම්පත් මෙහෙයවීම;

(ක) ලැයිස්තුගත සුරැකුම්පත් සහ විනිමය ස්ථානයක් හරහා වෙළෙඳාම් වන ව්‍යුත්පන්න හා සම්බන්ධ, වෙළෙඳපොළ ආයතන සහ වෙළෙඳපොළ අතරමැදියන්ගේ ව්‍යාපාර සම්බන්ධතා සහ කාර්යයන්;

(ග) මේ පනතේ විෂයය පථය තුළට පැමිණෙන ලැයිස්තුගත පොදු සමාගම්, ලැයිස්තුගත විදේශීය ආස්ථිත්ව, සහ අනෙකුත් ලැයිස්තුගත නොකළ සමාගම් විසින් තොරතුරු හෙළිදරව් කිරීම, වාර්තා කිරීම සහ සැපයීම;

(ච) විනිමය ස්ථානයකට ලැයිස්තුගත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම සහ විනිමය ස්ථානයක් මගින් ලැයිස්තුගත කිරීම අත්හිටුවීම සහ අවලංගු කිරීම;

(ජ) බලපත්‍රලාභී ව්‍යුත්පන්න විනිමය ස්ථානයක පහසුකම් භාවිත කරමින් කරගෙන යන්නා වූ ව්‍යුත්පන්න ගිවිසුම්වල වෙළෙඳාම් සම්බන්ධව;

(ට) ව්‍යාපාර වස්තු ණය දෙන්නන්ගේ සහ ව්‍යාපාර වස්තු ණයගැතියන්ගේ ක්‍රියාකාරකම් නියාමනය සහ හිඟ වෙළෙඳාම නියාමනය;

(ඩ) ව්‍යුත්පන්න විනිමය ස්ථානයක් සඳහා සත්‍යානුරූපී අරමුදලක් හෝ වන්දි අරමුදලක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම; සහ

(න) සේවාදායකයා සහ වෙළෙඳපොළ අතරමැදියා අතර සහ අදාළ සහභාගීවන්නන් හෝ සාමාජිකයන් සහ වෙළෙඳපොළ ආයතන අතර ආරවුල් සමථකරණය සඳහා විධිවිධාන සැලසීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක්ම පළකරනු ලැබිය යුතු අතර, එකී පළකරනු ලැබූ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

ව්‍යුත්පන්න, සූදූ හෝ ඔට්ටු ඇල්ලීමේ ගිවිසුම් නොවන බව.

**181.** වෙනත් නීතියක කෙසේ සඳහන් වුවද, විනිමය ස්ථානයක් හරහා වෙළෙඳාම් වූ ව්‍යුත්පන්න ගිවිසුමක් සූදූ හෝ ඔට්ටු ඇල්ලීමේ ගිවිසුමක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

ඉවත් කිරීම්, ඉතිරි කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන.

**182.** (1) (මෙහි මින් මතු "ඉවත් කළ පනත" යනුවෙන් හඳුන්වනු ලබන) 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත ඉවත් කරනු ලැබුව ද -

(අ) (i) මේ පනතේ 1 වන කොටසේ ක්‍රියාත්මක විය යුතු දිනයට පෙරාතුව ම කොමිෂන් සභාව ලෙස ක්‍රියාත්මක වන ඉවත් කළ පනත යටතේ පිහිටුවනු ලැබූ කොමිෂන් සභාව 1 වන කොටස යටතේ නව කොමිෂන් සභාවක් පිහිටුවනු ලබන තුරු මේ පනතේ කාර්යය සඳහා කොමිෂන් සභාව ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ක්‍රියාත්මක විය යුතු ය; සහ

(ii) මේ පනතේ 1 වන කොටසේ ක්‍රියාත්මක විය යුතු දිනයට පෙරාතුවම පත් කරන ලද ධුර දරන සාමාජිකයන් කොමිෂන් සභාවේ පත් කරන ලද සාමාජිකයන් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඔවුන්ගේ ධුර කාලය අවසන් වන තුරු හෝ මේ පනත යටතේ නව සාමාජිකයන් පත් කරනු ලබන තුරු එම සාමාජිකයන් ධුර දරනු ලැබිය යුතු ය;

(ආ) යම් විනිමය ස්ථානයකට, කොටස් තැරැව්කරුවකුට හෝ කොටස් වෙළෙන්දකුට හෝ ඒකක භාරයක් මෙහෙයවීමේ අරමුණින් කළමනාකාර සමාගමකට ඉවත් කළ පනත යටතේ නිකුත් කරනු ලැබූ මේ පනතේ II වන කොටසේ සහ III වන කොටසේ ක්‍රියාත්මක විය යුතු ආරම්භක

දිනයන්ට පෙරාතුවම බලාත්මක පවතින්නා වූ සෑම බලපත්‍රයක්ම, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) මේ පනතේ II වන කොටසේ සහ III වන කොටසේ ක්‍රියාත්මක විය යුතු දිනයන්ට දිනට පෙරාතුවම වූ දිනයේ දී බලාත්මකව පවතින්නාවූ, ඉවත් කළ පනත යටතේ යම් නිෂ්කාශනාගාරයක් හෝ යම් වෙළෙඳපොළ අතරමැදියකු වෙත නිකුත් කරනු ලැබූ සෑම ලියාපදිංචි සහතිකයක් ම මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඈ) මේ පනතේ ආරම්භක දිනට පෙරාතුවම වූ දිනයේ දී බලාත්මකව පවතින්නා වූ සහ මේ පනතේ විධිවිධාන හා අනනුකූල නොවන්නාවූ, ඉවත් කළ පනත යටතේ සාදනු ලැබූ සෑම රීතියක් ම, නියෝගයක් ම සහ විධානයක් ම, ප්‍රදානය කරන ලද අනුමත කිරීම් සහ ගන්නා ලද වෙන යම් ක්‍රියා මාර්ගයක් හෝ නිකුත් කරන ලද නිවේදනයක් කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ සකස් කරන ලද රීති, නියෝග සහ වශයෙන් සලකනු ලැබිය යුතු විධාන සහ ප්‍රදානය කරන ලද අනුමත කිරීම් සහ ගන්නා ලද ක්‍රියාමාර්ග හෝ නිකුත් කරන ලද නිවේදනයන් එපරිද්දෙන් වලංගු ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) මේ පනතේ ආරම්භක දිනට පෙරාතුවම වූ දිනයේ දී ඉවත් කළ පනත යටතේ පවතින්නා වූ සියලු ගිවිසුම්, එකඟතා සහ වෙනත් නීතිමය ලියවිලි කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ එළඹෙන ලද ගිවිසුම්, එකඟතා සහ වෙනත් නීතිමය ලියවිලි වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඊ) මේ පනතේ ආරම්භක දිනට පෙරාතුවම දිනය වන විට අවසන් නොවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද හෝ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට එරෙහිව ගොනු කරන ලද සියලුනඩු,නඩු පැවරීම් සහ අනෙකුත් නීති කෘත්‍යයයන් මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට එරෙහිව ආරම්භ කරන ලද නඩු, නඩු පැවරීම් සහ අනෙකුත් නීති කෘත්‍යයයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(උ) මේ පනතේ ආරම්භක දිනට පෙරාතුව ම දිනය වන විට බලාත්මකව පවතින්නා වූ ඉවත් කළ පනත යටතේ සාදනු ලැබූ වෙළෙඳපොළ ආයතනයන් හි සියලු රීති, මේ පනතේ එකී වෙළෙඳපොළ ආයතනයන් විසින් අලුත් රීති සාදනු ලබන තෙක්, මේ පනත යටතේ එකී වෙළෙඳපොළ ආයතන විසින් සකස් කරන ලද රීති වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඌ) ඉවත් කළ පනත යටතේ ඉදිරිපත් කරන ලද බලපත්‍ර සඳහා වන ඉල්ලුම්පත්‍ර, ආරම්භක දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය;

(එ) මේ පනතේ ආරම්භක දිනට පෙරාතුව ම වූ දිනයේ දී ඉවත් කළ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතු වන සියලු චංචල සහ නිශ්චල දේපළ, මේ පනතේ ආරම්භක දිනයේ සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභාව සතු විය යුතු ය;

(ඒ) මේ පනතේ ආරම්භක දිනයට පෙරාතුව ම වූ දිනයේදී ඉවත් කළ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුදලට බැරව පවතින සියලු මුදල් ප්‍රමාණයන්, ආරම්භක දින සිට බලාත්මක වන පරිදි, මේ පනතේ VI වන කොටස යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවේ පිළිවෙළින් වූ අරමුදල්වලට මාරු කරනු ලැබිය යුතු ය;

(ඔ) මේ පනතේ ආරම්භක දිනයට පෙර උල්ලංඝනය කරනු ලැබූ ඉවත් කරන ලද පනතේ විධිවිධාන, නියෝග, රීති සහ ඒ යටතේ සාදන ලද විධාන සහ ඉවත් කරන ලද පනත යටතේ ආරම්භ කරනු ලැබූ නීති කෘත්‍යයයන්, ආරම්භක දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කළ පනත යටතේ සිදු කරන ලද වැරදි විය යුතු අතර, ඒ අනුව විනිශ්චය කරනු ලැබිය යුතු ය;

(ඕ) මේ පනතේ ආරම්භක දිනට පෙරාතුව ම වූ දිනයේ ඉවත් කළ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතු සියලු අයිතීන්, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය සහ වගකීම්, මේ පනතේ ආරම්භක දිනයේ සිට කොමිෂන් සභාවේ අයිතීන්, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය සහ වගකීම් විය යුතු ය;

(ක) ආරම්භක දිනයට පෙරාතුවම වූ දිනයේ දී ඉවත් කළ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සියලු නිලධරයන් සහ සේවකයන්, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ඔවුන්ගේ සේවා නියමයන්ට වඩා වාසිදායක බවින් අඩු නොවන නියම මත, සලකා බලන නිලධරයාගේ හෝ සේවකයාගේ අනුමතය මත, මේ පනතේ ආරම්භක දිනයේ සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභාවේ නිලධරයන් හෝ සේවකයන් බවට පත්වන බවට සලකනු ලැබිය යුතු ය.

(3) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ ඉවත් කිරීම නොසලකා -

(අ) වෙනත් යම් ලිඛිත නීතියක 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට කරනු ලබන සියලු සඳහන් කිරීම් මේ පනතට කරනු ලබන සඳහන් කිරීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට කරනු ලබන සියලු සඳහන් කිරීම් මේ පනතේ ඇතුළත් වන අනනුරූප්‍යය වගන්තිවලට කරනු ලබන සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**183.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.